## 2019.10.08 වන දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පැවති මාසික සභා රැස්වීම් වාර්තාව

සහභාගීත්වය

| | |
|---|---|
| ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා | ගරුසභාපති |
| කමල් වැල්ලගේ මැතිතුමා | ගරු උප සභාපති |
| ජී.සරත් ශ්‍රීලාල් ද සිල්වා මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ශ්‍රේෂන් කෙරමිණියගේ මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඒ. ඩබ්. ජගත් කුමාර මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඒ.පී. ලක්ෂ්මී හේමන්තා ද සිල්වා මැතිණිය | ගරු නගර සභා මන්ත්‍රී |
| දිනයාදුර ධර්මදාස මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| නන්දන රාජපක්ෂ මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ආර්. එම්. ලසන්ත අජිත් කුමාර මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඩෙනට් පනියන්දුවගේ මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඩබ්.ඒ. සෝභිත රංජිත් මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| මගගේ අතුල ප්‍රියන්ත මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මැතිණිය | ගරු නගර සභා මන්ත්‍රී |
| ජී. ජී. ආර්. පේෂලා කුමාරි මැතිණිය | ගරු නගර සභා මන්ත්‍රී |
| එච්.ඉනෝකා ක්‍රිෂාන්ති මැතිණිය | ගරු නගර සභා මන්ත්‍රී |
| එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඩබ්. එම්. නිලානි මැතිණිය | ගරු නගර සභා මන්ත්‍රී |
| එස්. එම්. සරත්චන්ද්‍ර ද සිල්වා මැතිතුමා | ගරු නගර සභා මන්ත්‍රී |
| මගගේ චම්පා සුමුදු කුමාරි මැතිණිය | ගරු නගර සභා මන්ත්‍රී |

☸ **පන්සිල් සමාදන් වීමෙන් අනතුරුව පෙ.ව. 09.30ට රැස්වීමේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී.**

**(01)**

**01.01** **2019 – 09 – 03 දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරිම**

2019-09-03 දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාව පිළිගත යුතු බවට ගරු නගර සභා මන්ත්‍රි නන්දන රාජපක්ෂ මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා විසින් ස්ථිර කරන ලදී.

ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්
සභා වාර්තාවේ පොඩි පොඩි මුද්‍රණ දෝෂ තිබෙනවා.එක තැනක දෙකක වචනවල වෙනස් වීම් තිබෙන්නේ .එහෙම වුණාම වැරදි අවබෝධයක් යනවා.ඊළඟ සභාවේදි මේ දෝෂ නිවැරදි කර සිදු කරන්න.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**
ගරු මන්ත්‍රීතුමා සංශෝධනය කරන්න අවශ්‍ය යම් දෙයක් තිබෙනවම් ඉදිරිපත් කරන්න. දැන් මේ ඒ අවස්ථාව .ඒ මුද්‍රණ දෝෂය නිවැරදි කරන්න කියන්න.සංශෝධනයක් ඉදිරිපත් කරනවා නම් සංශෝධනය කළ යුතු පිටුව හා පේලිය කියන්න.

**ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්**
සංශෝධනයක් සහිතව සම්මත කළ බව කියන්න. වචන වල පොඩි පොඩි අඩුපාඩුකම් තිබෙන්නේ.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**
ගරු මන්ත්‍රීතුමනි, කියන්න . එහෙම කරන්න බැහැ.

**ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්**
මා කතා කළා. ධර්මාශෝක විද්‍යාලයේ මාගේ සමකාලින මිත්‍රයෙක් කියා ජනතා විමුක්ති පෙරමුණේ සුනිල් හඳුන්නෙත්ති මහතා. එතුමාගේ නමක් සඳහන් කර නැහැ.අන්න ඒ වගේ දේවල්.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**
අන්න ඒවා සුළු දේවල්.ගරු මන්ත්‍රීවරු සියළු දෙනාම කතා කරන විට මයික් එක ඔන්කර කතා කරන්න.සංශෝධනයක් තිබෙනවා නම් මීට පසුව පිටු අංකයයි ජේද අංකයත් සමඟ කියන්න.එතකොට අපි එය සංශෝධනය කරන්නම්.

**ඒ අනුව 2019 – 09 – 03 දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාව සභා සම්මත විය.**

**(02)** සභාපතිවරයා විසින් කරන විශේෂ නිවේදන **:** ඇත

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**
ඒ නිවේදන යටතේ දැනුම් දෙනවා ගරු නගර සභා මන්ත්‍රී ධනසේන මාදුවගේ මහතා විසින් ලිපියක් එවා තිබෙනවා. ඉහත නම සඳහන් මා දැනට බලපිටිය රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ලබන බැවින් 2019.10.08 වන දින පැවැත්වෙන අම්බලන්ගොඩ නගර සභා රැස්වීමට සහභාගි නොවන බව දන්වා තිබෙනවා. ඒ වගේම දුරකථනයෙන් දන්වා තිබෙනවා ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතාත් රෝහලේ ප්‍රතිකාර ගන්නවා කියා. එම නිසා ඔහුත් සහභාගි වන්නේ නැහැ කියා ප්‍රකාශ කර තිබෙනවා.මීළඟට තවත් නිවේදනයක් තිබෙනවා. සියළු දෙනාටම සුහද ආරාධනයයි.අම්බලන්ගොඩ නගර වැසියන් සඳහා රාත්‍රී කාලයේ ශරීර සුවතා සඳහා ව්‍යායාම කිරීම සිදු කිරීම උදෙසාත් පාපන්දු ක්‍රීඩාවේ උන්නතිය උදෙසාත් පොල්වත්ත පියසේන ළමා ක්‍රීඩාංගනය විදුලි ආලෝක වලින් ආලෝකමත් කොට ජනතා අයිතියට පත් කිරීමේ උත්සවය 2019. ඔක්තෝබර් මස 19 වැනි සෙනසුරදා පස්වරු 6.00 එළඹෙන සුබ මොහොතින් පැවැත්වේ.ඒ සඳහා සියළුම ගරු මන්ත්‍රීවරුන්ට අපි ආරාධනා කරනවා.මෙහිදි අපි බලාපොරෝත්තු වන්නේ පාපන්දු තරඟාවලියක් පැවැත්වීම. එකක් අපේ සංචිතයේ තිබෙන පිරිමි කණ්ඩායම් දෙකක් අතර සහ කාන්තා කණ්ඩායම් දෙකක් අතරත් ගමේ සිටින පොල්වත්තේ කණ්ඩායම් දෙකක් අතරත් තරඟාවලියක් පවත්වනවා.මෙය විවෘත කිරීමට පාපන්දු සම්මේලනයේ සභාපති අනුර ද සිල්වා මහත්මයාටත් පාපන්දු සම්මේලනයේ අධ්‍යක්ෂ වෛද්‍ය මනි ප්‍රනාන්දු මහතාටත් අපි ආරාධනා කර තිබෙනවා.සියළුම ගරු මන්ත්‍රීවරු ඒ අවස්ථාවට සහභාගි වන්න.මනිලාල් ප්‍රනාන්දු මහතාගේ පුතා.

**(03)** ලැබී ඇති පැමිණිලි ,පෙත්සම් හා ලිපි සභාවට ඉදිරිපත් කිරීම

**03.01 පටබැඳිමුල්ල සායන මධ්‍යස්ථානයට අත්‍යවශ්‍ය වන උපකරණ ලබා ගැනීම සම්බන්ධව පවුල් සෞඛ්‍ය 2019.08.21 දිනැති ලිපිය සභා ගත කරන ලදී.**

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

පටබැඳිමුල්ල සායන මධ්‍යස්ථානයට අත්‍යවශ්‍ය වන උපකරණ ලබා ගැනීම සම්බන්ධවයි. මෙම ලිපිය ලියා ඇත්තේ පවුල් සෞඛ්‍ය නිලධාරි ඩී.එස්.පි දමගේ මහත්මිය විසිනි. අප සායන මධ්‍යස්ථානයයේ පහත සඳහන් උපකරණ නොමැති බැවින් දුෂ්කරතාවයන්ට මුහුන දීමට සිදුව ඇත. එම නිසා හැකිනම් එම උපකරණ ලබා දීමට කටයුතු කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි

- රුධිර පීඩන මානය
- දැන්වීම් පුවරුවක්
- ඇල්බියුමින් සහ සීනී පරික්ෂ කිරිම සඳහා මුත්‍රා පටි (Urine Strips)
- විදුලි පන්දම (Torch )
- බිත්ති ඔරලෝසුව
- උපකාරක වන්ධ්‍යකෘත කර ගැනීම සඳහා පීඩන තාපක යන්ත්‍රයක් ( මිනි ඔටෝක්ලේඩ් මැෂින්)

<u>**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි , එය ලබා දෙන්න.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

එසේ නම් ඒවා ලබා දෙන්න. දැන් මේවා සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් මේවා දෙන්නේ නැද්ද?

<u>**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**</u>

ඕක පළාත් සභාවට නේද අයිති. දැන් පළාත් සභාව දැන් අවුල්නේ. එකයි.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

මෙය ලබා දෙන්න තීන්දු කරන්න. මේවා නොමැති නිසා පීඩනයට ලක්වෙන්නේ අම්බලන්ගොඩ සමස්ත ජනතාව.එමනිසා මෙම ඉල්ලීම ඉටු කරන්න සභාවේ අනුමැතිය ඉල්ලා සිටිනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**</u>

ඖෂධ සංස්ථාවෙන් අරගෙන දෙන්න.

තීරණය -

පටබැඳිමුල්ල සායන මධ්‍යස්ථානයට අත්‍යවශ්‍ය වන පහත උපකරණ ලබා දීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති ඒකමතිකව සභා සම්මත විය.

- රුධිර පීඩන මානය
- දැන්වීම් පුවරුවක්
- ඇල්බියුමින් සහ සිනි පරික්ෂා කිරිම සඳහා මුත්‍රා පටි ( Urine Strips )
- විදුලි පන්දම (Torch )
- බිත්ති ඔරලෝසුව
- උපකාරක වන්දපකෘත කර ගැනීම සඳහා පිඩන තාපක යන්ත්‍රයක් (මිනි ඔටෝක්ලේව් මැවින්)

**03.02 රිය අනතුරකින් දැඩි සේ රෝගාතුර වී කරාපිටිය රෝහලේ දැඩි සත්කාර ඒකකයේ ප්‍රතිකාර ලබන ගරු ප්‍රාදේශිය සභා ගරු මන්ත්‍රි සමරසිංහ ජයන්ත මහතා හට වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීමට උපකාර කරන ලෙස තවලම ප්‍රාදේශිය සභාවේ ගරු සභාපතිතුමා විසින් 2019.09.06 දිනැති ලිපිය සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>
රිය අනතුරකින් දැඩි සේ රෝගාතුර වී කරාපිටිය රෝහලේ දැඩි සත්කාර ඒකකයේ ප්‍රතිකාර ලබන ගරු ප්‍රාදේශිය සභා ගරු මන්ත්‍රි සමරසිංහ ජයන්ත මහතා හට වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීමට උපකාර කිරීම. තවලම ප්‍රාදේශිය සභාවේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙන් තේරී පත් වූ සමරසිංහ ජයන්ත මැතිතුමා 2019.06.22 දින සිදු වූ රිය අනතුරින් දැඩි සේ රෝගාතුර වී දැනට ගාල්ල කරාපිටිය රෝහලේ දැඩි සත්කාර ඒකකයේ ප්‍රතිකාර ලබමින් සිටින අතර, ඔහුට ස්වසන ක්‍රියාකාරිත්වය සඳහා ස්වසන යන්ත්‍රයක් ලබාදීමට සිදු වී තිබේ. මේ සඳහා රු.ලක්ෂ අටක මුදලක් වැය කිරීමට සිදු වි ඇති අතර , අප සභාව මගින්ද රු.ලක්ෂ එකහමාරක මුදලක් ලබා දීමට සභා තීරණයක් ගන්නා ලදී.අප සභාව සතුව ඒ සඳහා යන සියලු වියදම් දැරීමට හැකියාවක් නොමැති බැවින් , මේ සඳහා ඔබතුමා ඇතුලු ගරු මන්ත්‍රිතුමන්ලාගේ සහයෝගය ලබා දෙන මෙන් ඉතාමත් ගෞරවයෙන් ඉල්ලා සිටින බවට ගරු තවලම ප්‍රාදේශිය සභාවේ ගරු සභාපතිතුමා විසිනි.

<u>ගරු නගර සභා මන්ත්‍රි රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>
ගරු සභාපතිතුමනි, මෙහි නිත්‍යානුකුල තත්ත්වය කොහොමද ?

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>
අපට සභාවෙන් මුදලක් ලබා දෙන්න බැහැ. මා ප්‍රකාශ කරන්නේ පුද්ගලිකව ගරු මන්ත්‍රිවරුන් උදවුවක් කරන්න පුළුවන් නම් ඒ සඳහා තවලම ප්‍රාදේශිය සභා එම ආධාර ලබා දෙන ලෙස අපි ඉල්ලා සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රි එස්.එම්.සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>
ගරු සභාපතිතුමනි, මගෙත් හොඳ මිත්‍රයෙකි. ඔය ශ්වසන ආබාධයකට ලක්වලා. මා ඊයේ බලන්න ගියා.එයා එම යන්ත්‍රය ගෙනවිත් තිබුණේ රු.ලක්ෂ 2කි.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>
මා දන්නේ නැහැ. මා කියවුණු ලැබුවේ එවන ලද ලිපියයි.ඒ අනුව ගරු මන්ත්‍රිතුමා යම් ආර්ථික අපහසුතාවයකින් පෙලෙන නිසා තමයි මේ විදියට සභාවට ලිපියක් එවන්නේ.පුදගලිකව අපි එකතු වෙලා අපි උදවුවක් කරන්න.

**තීරණය -**

රිය අනතුරකින් දැඩි සේ රෝගාතුර වී කරාපිටිය රෝහලේ දැඩි සත්කාර ඒකකයේ ප්‍රතිකාර ලබන ගරු ප්‍රාදේශිය සභා ගරු මන්ත්‍රි සමරසිංහ ජයන්ත මහතා හට වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීමට උපකාර කරන ලෙස තවලම ප්‍රාදේශිය සභාවේ ගරු සභාපතිතුමා විසින් 2019.09.06 දිනැති එවන ලද ලිපියට අනුව ගරු මන්ත්‍රිවරුන්ගේ පෞද්ගලිකව උදවු කිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**03.03 අම්බලන්ගොඩ නගර සභාව වෙත ආරක්ෂක කටයුතු සඳහා සිවිල් ආරක්ෂක නිලධාරින්ගේ සේවය ලබා ගැනිම සම්බන්ධව සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් එවන ලද ලිපිය සභාගත කරන ලදී.**

ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

අම්බලන්ගොඩ නගර සභාව වෙත ආරක්ෂක කටයුතු සඳහා සිවිල් ආරක්ෂක නිලධාරින්ගේ සේවය ලබා ගැනිම. අම්බලන්ගොඩ නගර සභාවට ආරක්ෂක සේවය ලබා ගැනීම පිළිබඳ යොමු කළ ලිපිය වෙතින් විමසිම් කර ඇත.රාජ්‍ය ආයතන වල ආරක්ෂක රාජකාරි යෙදවීම සඳහා රාජ්‍ය ආයතන පිහිටි ප්‍රදේශවල පවතින භට පිරිස් ඌනතාවයන් වලදී මාසිකව මාරු කිරීමේ පදනම මත භට පිරිස් අනුයුක්ත බළකා වෙතින් ගෙන්වා රාජ්‍ය ආයතනවල ආරක්ෂක රාජකාරි යෙදවීම පසුගිය කාල වකාවානුවල සිදුවිය. එහෙත් එසේ ආරක්ෂක රාජකාරි සඳහා ගෙන්වනු ලබන භට පිරිස් තම ගම්බිම්වල එදිනෙදා කටයුතු සහ ගොවිතැන් අඹු දරුවන් අතහැර විත් රාජකාරි යෙදීමේදී තමන්ට සිදුවන ආර්ථික සහ සාමාජීය ගැටළු සම්බන්ධව අතිගරු ජනාධිපතිතුමා වෙත ජනපතිට කියන්න වැඩ සටහන මගින් හා අභියාචනා මගින් නිරන්තරයෙන් දැනුම් දීම් කර ඇත. එබැවින් අම්බලන්ගොඩ ප්‍රදේශයේ පවතින භට ඌණතාවය හේතුවෙන් පිට පළාත්වලින් භට පිරිස් ගෙන්වා ඔබ ආයතනයේ ආරක්ෂක රාජකාරි යෙදවීමට සැලසුම් කළ ද ඉහත 02 ඡේදයේ සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කිරීමෙන් පසු අතිගරු ජනාධිපතිතුමා විසින් පිට පළාත් වෙතින් භට පිරිස් ගෙන්වීම නවතන ලෙස දැනුම් දී ඇත. ජනාධිපති තුමාගේ උපදෙස් අනුව ක්‍රියා කිරීමට සිදුව ඇති බැවින් ඔබ ආයතනයේ ඉල්ලීම ඉටුකළ නොහැකි බව කාරුණිකව දන්වා සිටිමි. මේ සම්බන්ධයෙන් ඔබ ආයතනය යම්කිසි අපහසුතාවයකට පත්වුණි නම් ඒ ගැන කණගාටුව ප්‍රකාශ කරන බවද වැඩි දුරටත් දන්වා සිටින බවට එස්.එල්.ජී.විජේගුණවර්ධන , කර්නල් ,මෙහෙයුම් අධ්‍යක්ෂක විසින් ලිපියක් එවා තිබෙනවා.

ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්

ගරු සභාපතිතුමනි, මේ ලිපියට පසු අපි අම්බලන්ගොඩ සිටින බ්‍රිගේඩියර් අනුර ආර්. ද සිල්වා මහතා විසින් කතා කළා. ඒ අය දෙන්නම් කියා තිබුණා.අපිට දැනුම් දුන්නා මේ අයට නවතින්න තැනක් හදා දෙන්න කියා.ඒ අවස්ථාවට ඒ අය සපයන්නම් කියා.අපේ බස්නැවතුම්පොළේ තිබෙන පොලිස් පුරපොළ වසා තිබෙනවා.මා හිතන්නේ පොඩ්ඩක් සංවර්ධන කටයුතු සිදු කර තිබෙනවා.එය හදා ඒ අයට දන්වන්න කිවුවා.ඒ අනුව ඒ අය ක්‍රියාත්මක වෙන්නම් කිවුවා.

ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්

දැන් ඔතන කාරණා දෙකක්නේ.දැන් ඔබතුමා කිවුවා දෙන්න බැහැ කියා.

ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

මේ ලිපිය අවාට පසු ගරු උප සභාපතිතුමා සාකච්ඡා කර තිබෙනවා බ්‍රිගේඩියර් අනුර ආර්. ද සිල්වා සමඟ.එම සාකච්ඡා කිරිමේදි භට පිරිස් නැවත ලබා දීමට කැමැත්ත ප්‍රකාශ කර තිබෙනවා.ඒ අය පැමිණෙනවා නම් නැවතුම් පොළක් සකසා දිය යුතු බව පවසා තිබෙනවා.මා අම්බලන්ගොඩ පොලිසිය සමඟත් මෙය සාකච්ඡා කළා. පොලිසියත් එකඟ වුණා අම්බලන්ගොඩ පොලිස් මුරපළ ඔවුන්ගේ නවාතැන් සැපයීම සඳහා ලබා දෙන්න.මෙහි රාජකාරි කටයුතු සිදු කිරීම සඳහා අම්බලන්ගොඩ පොලිසියේ දෙදෙනෙකුත් එතැන යොදවන්න .යම් ආරක්ෂිත වැඩපිළිවළක් යොදවන්න තමයි අපේ බලාපොරොත්තුව.

ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්

ගරු සභාපතිතුමනි, මා හිතන්නේ මෙය වැදගත්ම කාරණයකි. මෙය පස්සට දමන්න පුළුවන් එකක් නෙමේ.මොකද බස්නැවතුම්පොළ දිහා බැලුවාම ගොඩක් ප්‍රශ්න ගැටළු තිබෙන තැනකි. එම නිසා මා හිතනවා මෙය ඉක්මනටම කළ යුතු දෙයකි.මෙය කුමන හෝ ආකාරයකින් ඔබතුමන්ලාගේ මැදිහත් වීමෙන් මෙය ඉක්මනින්ම කරන්න කියා අපි ඉල්ලා සිටිනවා.නැතිනම් මේ ගොඩක් ප්‍රශ්න ගැටළු පසුගිය දිනවලත් මා දුටුවා සිදුවෙලා තිබෙනවා.එමනිසා මේ කාර්ය ඉතා ඉක්මනින් මේ කාර්ය ඉටු කරන්න.මොකද දැන් ආරක්ෂක අංශයේ කාලයත් දිර්ඝ කළා.නමුත් එය නිත්‍යානුකුල තත්ත්වයටත් ගැටළුවක් වෙනවා.අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා එය ඉක්මනින් ඉටු කරන්න කියා.

**ගරු නගර සභා මන්ත්‍රී දිනයාදූර ධර්මදාස මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි,බස්නැවතුම්පොළේ සිහමන් යදින කළු මහත පුද්ගලයා බස්නැවතුම්පොළේ නිතරම ඡාරා කරනවා. ඔහු පොලිසියේ මාර්ගයෙන් අයින් කරනවා නම් හොඳයි.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ලේකම්තුමියණිනි, එතැනත් ප්‍රශ්නයකි.පොලිසියට දැනුම් දෙන්න මෙහෙම පුද්ගලයෙක් සිටිනවා කියා. ඒ අය පුනරුප්ථාපනය කරන්න යවන්න කියා. එතකොට ඒ අය මෙහෙන් යවයි.දැන් මේ ආරක්ෂක සේවා ගැන කතා කිරීමේදි අම්බලන්ගොඩ පොලිසියේ තිබෙන නිලධාරි අඩුව පිරවීමටත් මෙයින් අදහස් කළා.මූලස්ථාන පොලිස් පරික්ෂකතුමාත් බලාගෙන හිටියේ. අපි කොහොම හරි මේ වැඩය ඉවර කරනවා.නගර සභාව සහ බස්නැවතුම්පොළ ආරක්ෂා කර ගැනීම පමණක් නෙමේ කළ යුත්තේ තිබෙන සියළු ප්‍රජාවන් හා සියළු කඩ සාප්පු වල ආරක්ෂාව සම්බන්ධවත් ක්‍රමවේදයක් ඇති කරන්න තමයි අපි මේ බලාපොරෝත්තු වෙනවා.පොලිසියත් ඒ සම්බන්ධව එකඟතාවය පල කර තිබෙනවා.ඒ වගේම වෙළඳ සංගමයත් අපට එකඟතාවය පල කර තිබෙනවා. අපේ බලාපොරෝත්තුව තමයි නගරයේ සියළුම මාර්ග වල CCT කැමරා පද්ධතියක් සවි කරනවා . මොනිටර් කරන පද්ධතියක් සවිකර තිබෙනවා. අම්බලන්ගොඩ බස්නැවතුම්පොළේ තිබෙන මුරපොළට අපි සවි කරනවා.ඒ තුළ නිත්‍යානුකූල තත්ත්වයක් සිදු වෙනවා නම් වහාම පොලිසියට ක්‍රියාත්මක වෙන්න පුළුවනි.ඕනෑම පුද්ගලයෙක් , හොරෙක් හඳුනා ගැනීමට හැකිවෙනවා.අපි මේ සඳහා උදවු ඉල්ලුවා. වෙළඳ සංගමයෙන්. ව්‍යාපාරය ඉස්සරහා තිබෙන කැමරාව හරි අරගෙන දෙන්න.අපි නගර සභාව විසින් මෙම මෙහෙයුම් පද්ධතියේ යන්ත්‍ර සූත්‍ර ලබා දීම සුදුසු බවට ගරු සභාවේ මන්ත්‍රීවරුන්ගෙන් ඉදිරියට අපි ඉල්ලීමක් කරන්නම්.ඒ අනුව වෙළඳුන්ගෙනුත් සහායෝගය ගෙන මේ කටයුත්ත නගරය තුළ ක්‍රියාත්මක කරන්න මේ ආරක්ෂක සේවයත් , පොලිසියත් අපි එකතුවෙලා මෙය කරන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, ලේකම්තුමිය, මා ඉතා මහන්සි වුණා මේ සිවිල් ආරක්ෂක සේවාව ලබා ගැනීමට.තුන් හතර පාරක් කතා කළා. එහෙත් එයාගේ ස්ථාවරයේ එයා හිටියා.එනමුත් බ්‍රිගේඩියර් අනුර ආර්. ද සිල්වා මහතා. එතුමා අම්බලන්ගොඩ පදිංචිකරුවෙක්.මේ නගරයට ආදරය කරන මේ පුද්ගලයෙක් වශයෙන් දීර්ඝ වශයෙන් කතා කරලා මේ කටයුත්ත නගර සභාවට කරන්න කටයුතු කළා. මේ අවස්ථාවේ එම අවස්ථාව නගර සභාවට ලබා දීම වෙනුවෙන් අපි බ්‍රිගේඩියර් අනුර ආර්.ද සිල්වා මහතාට පුද කරනවා.

**තීරණය -**

අම්බලන්ගොඩ නගර සභාව වෙත ආරක්ෂක කටයුතු සඳහා සිවිල් ආරක්ෂක නිලධාරින්ගේ සේවය ලබා ගැනිම සම්බන්ධව සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් එවන ලද ලිපියට ආරක්ෂක සේවාව ලබා දීමට නොහැකි බව දන්වා සිටියත් , ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් මේ පිළිබඳව ගරු බ්‍රිගෙඩියර් ශවේන්ද්‍ර ද සිල්වා මහතා සමඟ සාකච්ඡා කිරිමෙන් පසු එම ආරක්ෂක සේවය ලබා දීමට කැමැත්ත දක්වා ඇති අතර ඔවුන්ට නැවතීම සඳහා පොලිස් මුරපළ පිහිටි ස්ථානය නවීකරණය කර ලබා දීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**03.04 නගර සභා ක්‍රීඩා පිටිය ඉදිරිපස ඇති බිම්තීරුව ගාස්තුවක් අයකොට පාසල් රථ 10ක් ගාල් කිරිමට සඳහා ලංකා පෞද්ගලික පාසල් රථ හිමියන්ගේ සංගමය විසින් අවසර ඉල්ලීම් සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

- ✓ **පෙරවරු 09.40 ට ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා සභාවට පැමිණීම.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ලංකා පෞද්ගලික බස්රථ සංගමය.නගර සභා ක්‍රීඩා පිටිය ඉදිරිපස ඇති බිම්තීරුව ගාස්තුවක් අයකොට පාසල් රථ 10ක් ගාල් කිරීම සඳහා අවසර ඉල්ලීම. ලංකා පෞද්ගලික පාසල්රථ හිමියන්ගේ සංගමය GA2223 යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2007 අංක 07 දරණ සමාගම් පණතට අනුකූලව ඇපයෙන් සීමා සහිත සමාගමකි.අප සංගමයට අයත් පාසල් රථ දිනකට 150 පමණ අම්බලන්ගොඩ නගරයට විවිධ ප්‍රදේශවල සිට පැමිණෙන අතර රථවාහන ගාල් කිරීමට ස්ථිර ලැබී ඇත්තේ බෞද්ද මධ්‍යස්ථානය ඇතුළත භූමියේ පමණි. ඒ සඳහා එක් සාමාජිකයෙකු රු250/= බැගින් මාසිකව ගෙවනු ලැබේ. අනිකුත් සියළු රථවාහන ගාල් කරන ස්ථාන ස්ථිර රථ ගාල් නොවේ.නගර සභා ඉදිරිපස එම ස්ථානයෙන් දරුවන් මුලින් ගන්නා පාසල් රථ 10ක් පමණ නගර සභා පාර එක් තැනක නතර කරනු ලබන අතර ඒ හරහා මාර්ග තදබදයක් ඇතිවන බව පෙනීයයි.ඔබතුමාගේ මැදිහත් වීමෙන් දැනට ක්‍රීඩාපිටිය ඉදිරිපස ( ලංකා බැංකුව ඉදිරිපස ) කුඩා බිම් තීරුව මාසික ගාස්තුවක් අයකොට බස්රථ 10 නතර කිරීම සඳහා අවසර ලබාදෙන ලෙස ශ්‍රී ලංකා පෞද්ගලික බස්රථ සංගමයෙන් ඉල්ලීමක් කර සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, කවුරුත් කතා නොකළත් මා කතා කළයුතුයි.මෙය අනවශ්‍ය ලෙඩකි.ඊට පසු මෙයට අයිතිවාසිකම් කියනවා.අපි මෙච්චර කාලයක් හිටියා . අපි බදු ගෙව්වා. අපිට ඔප්පු දෙන්න වෙනවා.එම බිම් තීරුවේ ක්‍රීඩා මණ්ඩපයක් ඉදිකරන්නත් තීරණය වුණා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එහෙම යෝජනා වුණා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

එමනිසා එම අපට අදාල කටයුතු කරගෙන යන්න. මේ අනවශ්‍ය දේවල් දමා ගන්න එපා කියා ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි,බෞද්ධ මධ්‍යස්ථානයට ඉදිරිපස පාරේ බස්රථ දෙක තුනක් ගසා තිබෙනවා අයින දිගේ.එය බොහොම අවදානම්. එය ඉවත් කරනවා නම් හොඳයි.දහවල් 1.00ට විතර ගසා තිබෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි,මෙය මෙහෙම දෙන්න ගියොත් ඊළඟට මේ වගේ ඉල්ලීමක් තව කළහොත් කොහේ හරි තව බිම්තීරුවක් දෙන්න වුණොත් දෙන්න වෙනවා.එමනිසා සම්පූර්ණ මෙතනින්ම මෙය කඩා දමන්න.නැතිනම් ප්‍රශ්නයක් වෙනවා. අපේ ගරු මන්ත්‍රීවරු සියළු දෙනාම විරුද්ධයි මෙයට.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එම ඉල්ලීම ප්‍රතික්ෂේප කරන්න.

**තීරණය -**

ලංකා පෞද්ගලික පාසල් රථ හිමියන්ගේ සංගමය විසින් නගර සභා ක්‍රීඩා පිටිය ඉදිරිපස ඇති බිම්තීරුව ගාස්තුවක් අයකොට පාසල් රථ 10ක් ගාල් කිරිම සඳහා අවසර නොදිමටත් ,එම ඉල්ලිම ප්‍රතික්ෂේප කිරිම සුදුසු බවටත් ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**03.05 මෝදර දේවාලයේ ඇසළ මහා පෙරහැරේ ජලය සපයා ගැනීම සඳහා ජල බවුසරය සභා අනුමතැතියට යටත්ව ලබා දිම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>
මෝදර දේවාල කමිටුවෙන් ලිපියක් එවා තිබෙනවා.එහි ලේකම්වරයා විසින්. ඇසළ මහා පෙරහැරේ ජලය සපයා ගැනීම සඳහා ජල බවුසරය ලබා ගැනිම.අම්බලන්ගොඩ මෝදර දේවාලයේ වාර්ෂික ඇසළ මහා පෙරහැර මංගල්‍යය අභිමානවත් 75 වන වරටත් අති උක්කර්ෂවත් අන්දමින් පැවැත්වීමට සියළු කටයුතු සුදානම් කර ඇති බව සතුටින් දන්වා සිටින අතර සැප්තැම්බර් මස 19,20,21,22 දින නොමිලේ ලබා දෙන්න කියා ඉල්ලිමක් කළා.එය සභා අනුමැතියට යටත්ව අපි ලබා දුන්නා.සභාවේ අනුමැතිය ඉල්ලා සිටිනවා.

**තීරණය -**

මෝදර දේවාලයේ ඇසළ මහා පෙරහැරේ ජලය සපයා ගැනීම සඳහා ජල බවුසරය 2019.09.19,20,21,22 යන දිනවල නොමිලේ සභා අනුමැතියට යටත්ව ජල බවුසරය ලබාදීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**03.06 අම්බලන්ගොඩ ,පටබැදිමුල්ල ,නො 386 ජේ.එල් පියල් ද සිල්වා මයා විසින් මහින්ද ගරාජය ඉදිරිපිට ඇති ලොරි රථගාල ඇතුළත භූමියේ ලොතරැයි කුටියක් ස්ථාපිත කිරිමට අවසර ඉල්ලා ඇති ලිපිය සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>
03.06 ලිපිය ඉවත් කරනවා.

**තීරණය -**

අම්බලන්ගොඩ ,පටබැදිමුල්ල ,නො 386 ජේ.එල් පියල් ද සිල්වා මයා විසින් මහින්ද ගරාජය ඉදිරිපිට ඇති ලොරි රථගාල ඇතුළත භූමියේ ලොතරැයි කුටියක් ස්ථාපිත කිරිමට අවසර ඉල්ලා ඇති ලිපිය ප්‍රතික්ෂේප කරන ලදී.

**03.07 ජාත්‍යාන්තර සිංහ සාමාජ දිස්ත්‍රික් 306A1 සිංහ චාරිකා සඳහා සභා අනුමැතියට යටත්ව ඉදිරිපත් කර ඇති ලිපිය සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>
ජාත්‍යාන්තර සිංහ සාමාජ දිස්ත්‍රික් 306AIL සිංහ චාරිකා. ජාත්‍යාන්තර සංහ සමාජ දිස්ත්‍රික් 306A1 කොල්ලුපිටියේ සිට කතරගම දක්වා මුහුදුබඩ තීරයයි. මෙය දැනට සිංහ සමාජ 74කින් සමන්විතය.මෙම සිංහ දිස්ත්‍රික්කයේ සංභාධිපතිතුමා ඇතුළු සිංහ නායකයින් කතරගම සිට කොළඹ දක්වා යන චාරිකාවේදි 2019.09.29 දින ඉරිදා පෙ.ව.11.30ත් දවල් 12.00ත් අතර අම්බලන්ගොඩ නගරයට පිවිසිමට නියමිතය. මෙම පිරිස උත්සවාකාරයෙන් පිළිගැනීමට අම්බලන්ගොඩ සෙන්ට්ල් සිංහ සමාජය කටයුතු සංවිධානය කර ඇති අතර එය අම්බලන්ගොඩ බස් නැවතුම්පොළ සාප්පු සංකීර්ණය ඉදිරිපිටදී පැවැත්වීමට යෝජනා කර ඇත. මෙහිදි සිංහ දහම ප්‍රවර්ධනය කරන කෙටි විදි

නාට්‍යයක්ද පැවැත්වේ. එබැවින් මේ සඳහා ඔබතුමාගේ අනුමැතිය ලබා දෙන්න. නොමිලේ කොඩි 30ක් සහ එම ස්ථානය නොමිලේ ලබා දෙන ලෙස එහි අම්බලන්ගොඩ සෙන්ට්‍රල් සිංහ සමාජයේ සභාපති එම්.ඩබ්. කුමුදු හේමන්ත මහතා විසින් ඉල්ලීමක් කර තිබෙනවා. සභා අනුමැතියට යටත්ව මෙය ලබා දී තිබෙනවා.එය අනුමත කරන ලෙස ඉල්ලා සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, මෙය දුන්නාට කමක් නැහැ.ඔය සිංහ සමාජය විසින් සංවිධානය කරන ලද පිලිගැනීමේ කෙටි උත්සවයේ මා හිතන්නේ නාමපුවරු හැම දෙයක්ම වගේ බස්නැවතුම්පොළේ කණු වල සිට ගසා තිබෙනවා.ඔබතුමාගේ මැදිහත් වීමෙන් අපි දේශපාලන කටයුත්තකටවත් ගත්තේ නැහැ මෙය.මා දන්නවා ඔබතුමා ඒ ප්‍රතිපත්තයේ හිටියා.අපි සමඟ අමනාප වෙච්ච වෙලාවලුත් තිබුණා.ඒ වැඩය කරන්න දෙන්න එපා. මේ නාමපුවරු ගසා බස්නැවතුම්පොළ වෙළඳ ප්‍රදර්ශනයක් වගේ.වටිනා කියන ස්ථානයක්. අපේ නගර සභාව පිළිබඳ ගෞරුත්වයක් හිමිවන ස්ථානයක්.එමනිසා අපිනම් එයට කැමති නැහැ.කවුරු වුණත් සමාජ කටයුතු කරනවා හෝ වේවා, ව්‍යාපාර කටයුතු සිදු කිරීම හෝ වේවා.සිංහ සමාජයක් හෝ වේවා අපි එතැන තිබෙන අනාන්‍යතාවය තබාගෙන කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා.මොකද ඊළඟ පාර මේ වගේ තත්ත්වයක් ඇතිවුණහොත් එහෙම අනික් අයත් පැමිණ ගැසුවොත් එහෙම මුකුත් කියන්න බැහැ.එමනිසා ඔබතුමා ඒ මතයේ හිටියා.පසුගිය වකවානු තුළ ඒ ගැන කතා කර වැඩක් නැහැ දැන්. යම් යම් ප්‍රශ්න ගැටළු වුණා.එය පූර්වාදර්ශයක් නොවන විදියට වැඩ කටයුතු කරන ලෙස අප ඉල්ලා සිටිනවා.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

එම තත්ත්වය මාත් දුටුවා.පැය භාගයක විතර කාලය ලබා දුන්නේ. නමුත් අපි ඉදිරියට මෙය වලක්වන්නම්.

<u>ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි,මා හිතන්නේ මේ ගැන කතා කරන විට කතා නොකරම බැරි ප්‍රශ්නයක් තිබෙනවා.එම නිසා ගරු නගර සභා මන්ත්‍රී රාහුල මහතා වුණත් ඉදිරිපත් කළේ ගරු සභාපතිතුමාට.ඇත්තටම මෙහි වගකීම ඇත්තේ ගරු සභාපතිතුමාට නෙමේ. අදායම් පරීක්ෂක මහතාටයි.එතුමන්ලා මේ අවසර ලබා දෙන විට එම අවසර ලබා ගැනීමට පැමිණෙන පුද්ගලයන්ට මේ සඳහා තරයේ අවවාද කළ යුතු වෙනවා.මා ඉතාමත්ම කනගාටු වෙනවා අර පැල වල ඇණ ගසා බෝඩ් ගැසීම සම්බන්ධව.මෙයට අවසර දෙන එක නෙමේ ප්‍රශ්නය.බස්නැවතුම්පොළ ඇතුළත ගැසුවානම් මා විරුද්ධ වෙන්නේ නැහැ.එය සභාවේ විරුද්ධ වීම වෙනම කථාවක්.හැබැයි අර අසරණ ගස් ටික යකඩ ඇණ ගසා බෝඩ් එල්ලීමට . හැම ගසකම ඇණ ගසා තිබුණා. එය ඉතාමත්ම බරපතල අපරාදයක්.මෙය මින්මතුවට ආපහු වෙන්න දෙන්නේ නැහැ.බොහොම ආදරයෙන් මේ ගස්ටික අපි හදලා තියෙන්නේ.ඔබතුමා හුඟක් මහන්සි වුණා.අලුතින් හිටවපු ගස් දෙක ආයිත් පැල වෙන්නෙත් නැහැ.එම ගස් දෙකක් ගින්දර අරවා මේවා දමා තමයි මැරුවේ. අර කඩවලට කවර් වෙන නිසා.ජාතික අපරාදකාරයෝ ඒ.මිනිමරණ මිනිසුන්ට වඩා දරුණුයි එය.ගසක් මේ විදියට විනාශ කරන එක.මේ මුළු නගරයම ආලංකාරයට තිබෙන මේ ගස් ටිකට අත තියන්න දෙන්න බැහැ. පොස්ටරයක් ගැසීමට වත් මොනම හේතුවක් නිසා වත් ඉඩ දෙන්න එපා.එමනිසා කරුණාවෙන් ඉල්ලා සිටිනවා අපේ ආදායම් පරීක්ෂක මහත්වරුන්ගෙන් ඉල්ලා සිටිනවා මේ ගැන තමුන්නාසේලා තරයේ අවදියෙන් සිටින්න.කිසිම හේතුවක් නිසා මෙම ගසකට අත තියන්න දෙන්න එපා.එම ආරක්ෂක අංශයටත් දන්වා සිටින්න. මේ ගස් වල මරණ දැන්වීමක් හරි ගහන්න දෙන්න එපා. මේ පිළිබඳව පොලිසියට දන්වා අත්අඩංගුවට ගන්නා ලෙස දැනුම් දෙන්න.මොකද ඒ විනාශය නතර කරගන්න ඕන ගරු සභාපතිතුමනි,

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මේ අවසර දීම් මේ විදියට කරන විට ඒ අදාල අංශයට නිසි උපදෙස් ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.කියන කාරණය සාධාරණයි. මේ කියන ආකාරයට කටයුතු කරන්න .

**ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්. ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි,බස්නැවතුම්පොළේ යතුරුපැදි, පාපැදි ඇතුල් කිරිම තහනම් කියා ගසා ඇති බෝඩ් එක ගැලවි බිම වැටි තිබෙනවා. අදවනතුරු එය පස්සා ගෙනත් දි නැහැ.කණුව වෙනම තිබෙනවා. බෝඩ් එක වෙනම තිබෙනවා.ඒ තරම් හොඳ ආරක්ෂක අංශයක් තමයි බස්නැවතුම්පොළේ සිටින්නේ.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**
හිමාල් මහතාණෙනි , මෙය ගෙනවිත් අපේ වෙල්ඩින් වැඩකරු ලවා පස්සා දි අද සවි කරන්න.

**තීරණය -**

ජාත්‍යාන්තර සිංහ සාමාජ දිස්ත්‍රික් 306AIL සිංහ චාරිකාව 2019.09.29 දින ඉරිදා පෙ.ව.11.30ත් දහවල් 12.30ත් අතර අම්බලන්ගොඩ නගරයට පිවිසිමට නියමිත ඇති අතර එම පිරිස උත්සවාකාරයෙන් පිළිගැනිමට අම්බලන්ගොඩ සෙන්ට්‍රල් සිංහ සමාජය කටයුතු යොදා ඇති බැවින් අම්බලන්ගොඩ බස්නැවතුම්පොළ සාප්පු සංකිර්නය ඉදිරිපිටදි පැවැත්වීමට එම ස්ථානය නොමිලේ ලබා දීමටත් , කොඩිකණු 30ක් සහා අනුමතියට යටත්ව නොමිලේ ලබා දීමටත් , මෙම ස්ථානය මිටපසු ලබා දෙන විට මෙය නිසි විදියට ලබාදීමට එම අංශ වලට උපදෙස් දිම ආදායම් පරික්ෂක මහත්වරු විසින් වගබලා ගත යුතු බවටත් , ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**03.08 ඇස්කෝට් අම්බලන්ගොඩ පුද්ගලික සමාගම යනුවෙන් වූ සමාගම් නාමය වෙනස් කිරිම සම්බන්ධව නිතිඥ ශ්‍රීමල් විජේසේකර මහතා විසින් එවන ලද ලිපිය සභාගත කරන ලදී.**

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**
ඇස්කෝට් අම්බලන්ගොඩ පුද්ගලික සමාගම යනුවෙන් වූ සමාගම් නාමය වෙනස් කිරිම සම්බන්ධව. නිතිඥ ශ්‍රීමල් විජේසේකර මහතා විසින් එවා තිබෙන්නේ.ඔබ විසින් මා වෙත එවින්නට යොදි ඇති උක්ත මැයෙන් යුතු ලිපිය හා ඉන් අනතුරුව ඔබ සමඟ පැවති සාකච්ඡාවේදි මාවෙත ඉදිරිපත් කරන ලද ලිපිලේඛන පිළිබඳව සැලකිල්ලට ගෙන පහත සඳහන් කරුණු ඉදිරිපත් කර සිටි. අම්බලන්ගොඩ නගර සභාව 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ ලියාපදිංචි අංක PV91199 යටතේ ලියාපදිංචි වි ඇති ඇස්කොට් අම්බලන්ගොඩ(ප්‍රයිවට්) ලිමිටඩ්{Ascot Ambalangoda (private)Limited }පුද්ගලික සමාගම සමඟ 2013.12.12 දින මා විසින් ලියා සහතික කල අංක 4523 දරන බදු ගිවිසුමට එකී බදු ගිවිසුමේ සඳහන් කොන්දේසි වලට යටත්ව සහ එකඟව බදු ගිවිසුමේ උපලේඛණයේ විස්තර කර ඇති අම්බලන්ගොඩ නගර සභාවට අයත් දේපල සම්බන්ධව බදු ගිවිසුමකට ඇතුලත් වී ඇත. සමාගම් රෙජිස්ට්‍රාර් ජෙනරාල් විසින් 2018.10.09 වන දින සමාගම් පනතේ 8(3)(ආ) යටතේ සංස්ථාගත කිරිමේ සහතිකය නමින් නිකුත් කොට ඇති සහතිකය ප්‍රකාර එකී ඇස්කොට් අම්බලන්ගොඩ ( ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ නාමය " ලංකා රියල්ටි අම්බලන්ගොඩ (පිවිටි)එල්ටීඩි "( Lanka Realty Ambalangoda (Pvt)Ltd යනුවෙන් වෙනස් කරන ලදුව එකී සමාගමේ නමින් 09.10.2018 දින සිට ඉහත කී ලංකා රියල්ටි අම්බලන්ගොඩ (පිවිටි) එල්ටිඩි ( Lanka Realty Ambalangoda (Pvt)Ltd යනුවෙන් සංස්ථාගත කරන ලද බව තහවුරු කර ඇත. ඒ අනුව මිට පෙර ඇස්කෝට් අම්බලන්ගොඩ ( ප්‍රයිවට් ) ලිමිටඩ් යන නමින් යුතුව සංස්ථාගත කර තිබූ සමාගමේ නාමය ඉහත කී අයුරු ලංකා රියල්ටි අම්බලන්ගොඩ (පිවිටි) එල්ටිඩි යනුවෙන් වෙනස්වීම පමණක් සිදුවී ඇති බව ආනාවරණය වේ. ඒ

අනුව අම්බලන්ගොඩ නගර සභාව සහ ඇස්කෝට් අම්බලන්ගොඩ ( ප්‍රයිවට් ) ලිමිටඩ් (Ascot Ambalangoda (private)Limited) යන සමාගම අතර අත්සන් කරන්නට යෙදි ඇති ඉහත කී අංක 4523 දරනබදු ගිවිසුමේ සියලු කොන්දේසි හා වගකීම් වලට වර්තමාන නාමය පමණක් වෙනස්ව සංස්ථාගත කරනු ලැබ ඇති ලංකා රියැලිටි අම්බලන්ගොඩ (පිවිටි)එල්ටිඩි යන වර්තමාන නාමය සහිත සමාගම එකී සමාගමේ පූර්ව නාමයෙන් පැවතියද ඒ ආකාරයෙන්ම එකී නව සමාගමේ නාමය වෙනස් වූ බවට සංස්ථාගත ගර ඇති 2018.10.09 දින සිටද ඉහත කි අංක 4523 දරන බදුගිවිසුම ප්‍රකාර බදුගැණුම්කරු විසින් ඉටුකිරිමට බැඳි සිටින සියලු වගකීම් වලට යටත්වේ. ඉහත කී සමාගම් රෙජිස්ට්‍රාර්වරයා නිකුත් කල සහතිකය අනුව මුලින් සඳහන් සමාගමේ නම පමණක් වෙන්ස් වී ඇති අතර ඇස්කෝට් අම්බලන්ගොඩ (ප්‍රයිවට්)ලිමිටඩ් (Ascot Ambalangoda (private)Limited) යන සමාගමට දී තිබු ලියාපදිංචි අංකය වෙනස් වී නොමැති බවද ඔබගේ අවධානයට යොමු කරනවා. ඒ අනුව අංක 4523 දරන බදුගිවිසුමේ බදුගැණුම්කරු බවට නීතිය ක්‍රියාත්මක වීමෙන්ම නව නාමය යන්න සමාගම සියලු වගකීම් වලින් බැඳි සිටින බවත් සඳහන් කරනවා. එබැවින් අදාල සමාගමේ නම වෙනස්වීම මත නැවත බදු ගිවිසුමක් ලියා අත්සන් කිරිමට කිසිදු නෛතික අවශ්‍යතාවක් මතු නොවන බව දන්වා සිටිනවා. ඒඅනුව වර්තමාන සමාගම් නාමයෙන් ලංකා රියල්ටි අම්බලන්ගොඩ (පිවිටි )එල්ටිඩි (Lanka Realty Ambalangoda (Pvt)Ltd) යන නව නාමයෙන් ක්‍රියාත්මක සමාගම අම්බලන්ගොඩ නගර සභාව සමඟ එකි නව නාමයෙන් යුතුව සමාගමේ පෙර නාමයෙන් ක්‍රියාත්මක සමාගම අම්බලන්ගොඩ නගර සභාව සමඟ එකි නව නාමයෙන් යුතුව සමාගමේ පෙර නාමයෙන් යුතුව අත්සන් තබා ඇති අංක 4523 කොන්දේසි ඒ ආකාරයෙන්ම ඉදිරියට ක්‍රියාකල යුතු බවත් එම සියලු කොන්දේසි වලට හා බදුගිවිසුමේ සඳහන් වගකීම් වලට යටත්ව එකී බදු ගිවිසුමේ බදුගැණුම්කාර පාර්ශවය ලෙස ඉදිරියට ක්‍රියාකල යුතුව ඇති බවත් එම කොන්දේසි කඩකිරිම හා වගකිම් පැහැර හරිනු ලැබුවහොත් නව නාමය යටතේ වූ සමාගමට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමේ කිසිදු බාධාවක් අම්බලන්ගොඩ නගර සභාවට නොමැති බවත් දන්වා ඇත.කෙසේ වුවද වර්තමාන සමාගමේ නව ලිපි ශිර්ෂය යටතේ මීට පෙර ඇස්කොට් අම්බලන්ගොඩ (ප්‍රයිවට්)ලිමිටඩ් සමාගමේ නම ලංකා රියල්ට් අම්බලන්ගොඩ (පිවිටි) එල්ටිඩි (Lanka Realty Ambalangoda (Pvt)Ltd ලෙස වෙනස් වී ඇති බවත් එකී පෙර නාමයෙන් යුතු අස්කෝට් අම්බලන්ගොඩ ප්‍රයිවට් ලිමිටඩ් සමාගමේ නමින් යුතුව හා අම්බලන්ගොඩ නගර සභාව අතර ඇති කරගෙන ඇති අංක 4523 දරන බදුගිවිසුමේ කොන්දේසි හා වගකිම් වලට වත්මන් නාමයෙන් පවත්වා සමාගම යටත්වන බවත් ඒ අනුව ඉදිරියටද ඔවුන් ඉහත කී බදුගිවිසුමේ සඳහන් කොන්දේසි වලට අනුව බදුගැණුම්කරු ලෙස කටයුතු කරන බවට වු ලිපියක් වත්මන් නාමය සහිත සමාගමෙන් ලබාගන්නා ලෙසද දන්වා සිටින බවට නිතිඥ ශ්‍රිමාල් විජේසේකර මහතා විසින් උපදෙස් එවා තිබෙනවා.මෙම නාමය වෙනස් වීම නිත්‍යානුකූලයි කියා දන්වා තිබෙනවා.ඒ අනුව නව නාමයට අදාල සමාගම නිත්‍යානුකූලව බැඳි සිටින බවත්, ලිපියක් ගෙන ඉදිරි කටයුතු කරන ලෙසත් දන්වා සිටිනවා.

- ✓ පෙරවරු 10.00ට පමණ ටෙන්ඩර් හා මිළ ගණන් විවෘත කරන ලදී.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, හොඳ මාතෘකාවකි.අරෙහෙට බෝලය පාස් කරනවා. මෙහෙට බෝලය පාස් කරනවා. මේ නගරයේ ඓතිහාසික වශයෙන් වැදගත් වන ස්ථානය තමයි අම්බලන්ගොඩ තනායම.අපිට මෙහි කවුරු මොනවා කළත් කමක් නැහැ. මෙහි කලින් ගිවිසුමක් අත්සන් කර තිබුණා යම් ආයතනයක.ඇස්කෝට් අම්බලන්ගොඩ පුද්ගලික සමාගම කියා.එයට කාර්යාවයක් භාර වුණා . කොන්දෙසි කිහිපයක් දමා හදන්න.කටයුතු කර ගිවිසුම් අත්සන් කර.අදවනතුරුත් එය හැදිලා නැහැ.කාගේ උවමනාවකටද මේ ලිපිය ආවේ.ඔය ලියුම එවන්න ශ්‍රිමාල් මහතා එවන්න හේතුව.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

අපි උපදෙස් පැතුවා මෙන්න මෙහෙම සිද්ධ වෙලා තිබෙනවා කියා.නිතිමය. අපේ උවමනාවට තමයි යැව්වේ.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

දැන් මා විමසන්නේ ඔය කලින් ගැසූ ගිවිසුම් මේ නවක ගරු මන්ත්‍රිවරු කිසිම කෙනෙක් දන්නේත් නැහැ.මට මෙහි කිසි ගැටළුවක් නැහැ. මොකද මෙය අවුරුදු ගණනක් හැදිලා නැහැ.වල් වැදිලා ගිහිල්ලා.එහි වැටක් ගසා තිබෙනවා.නගර සභාවෙන් අහලත් නෙමේ ඔය නමත් ගසා තිබෙන්නේ.එතකොට වැටවල් ටිකක් ගසා තිබෙනවා. මහජනතාවට ගමන් කිරිමට ගිවිසුමේ ප්‍රකාරව අඩි 10ක පාරක් තිබෙනවා .නෑම කිරිමට . එම පාරත් දැන් නැහැනේ.ඔබතුමා මා දන්නේ නැහැ ගියාද කියා බලන්න. තනායමත් නැහැ.බදු ගෙවන්න පුළුවන්. ගෙවලත් තිබ්බා.අපි නගර සභාව බලාපොරෝත්තු වෙන බලාපොරෝත්තුව ඒක ඉෂ්ඨ වෙලා නැහැ.එහි තනායමේ තිබුණු තත්ත්වය දැන් ගිහින් බැලුවාම ඒ සියළු දේ සුන්වෙලා තිබෙන්නේ.මා ඉල්ලා සිටිනවා මේ වෙලාවේ මෙයට පිළිතුරක් ගන්න එපා කියා ඉල්ලා සිටිනවා.වෙනම කැඳවා අපේ ගරු මන්ත්‍රිවරු සියළු දෙනාම කැඳවා ඔය සියළු දෙනාගේම අදහස් අරගෙන. කලින් තිබුණු ගිවිසුම ගැන මේ නවක මන්ත්‍රිවරු දන්නේත් නැහැ.එමනිසා මා බැගැපත්ව ඉල්ලා සිටිනවා.මේ නගරයේ වැඩියෙන්ම කතා බහට ලක්වෙන තමුන්නාසේත් බැණුම් අහන අපිත් බැණුම් අහන . මොකද ඒ කාලයේත් අපිත් හිටිය නිසා බැණුම් අසන මාතෘකාවකි මෙය.එමනිසා මෙයට පියවර ගත්තාට කමක් නැහැ. නම වෙනස් කර හරි මොනවා හරි . නමුත් සියළු ගරු මන්ත්‍රිවරුන්ගේ ගෞරුත්වයත් ආරක්ෂා වන විදියට. මේ අම්බලන්ගොඩ නගර සභාව සත පහකට වත් ගණන් ගන්නේ නැති තත්ත්වයකට වැටිලා මේ වැඩය නිසා.අරය දුරකථන ඇමතුම් ලබා දුන්නාම එකක් කරනවා. අනික් කෙනා දුරකථන ඇමතුම් ලබා දුන්නාම තව එකක් කියනවා. එම තත්ත්වයට සභාව යන්න බැහැ.ඔබතුමාගේ ගෞරුත්වයත් , ඔබතුමා නීතිඥවරයෙක්. එමනිසා ඔබතුමා මේ නගරයේ වටිනා වස්තූන් වලට ජනතාවට වගකිව යුතු වෙනවා.ගරු මන්ත්‍රිවරු හැටියට අපිත් වගකියන්න ඕන.මොකද ගරු මන්ත්‍රිවරු 21ක් සිටිනවා මෙතැන.ගොඩක් එනවා නවක මන්ත්‍රිවරු.මේ තිබෙන ප්‍රශ්න පිළිබඳ සාකච්ඡා කර මෙය ඉදිවෙන්නයි අපට ඕන.ඒ කටයුත්ත කරන්න.නැතිනම් අපේ සංවිධායකතුමාත් නැහැ. විපක්ෂ සංවිධායකතුමාත් නැහැ.මේ නම වෙනස් කිරිම සම්බන්ධව වෙනත් සභාවක හරි පසුවට ගන්න කියා හරි වෙනම සාකච්ඡාවක් ඉල්ලා සිටිමින් මේ වැදගත් තීන්දු තීරණ ගැනිම මේ අවස්ථාවේ නොගෙන. ගරු මන්ත්‍රිවරුනගේ ගෞරුත්වයත් ආරක්ෂා කර යම් යම් තින්දු තිරණ ගන්නේ නැතිව එම නිසා ඔබතුමා වෙනම සාකච්ඡාවක් ගන්නා ලෙස මා ඉල්ලා සිටිනවා.

**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, ගරු නගර සභා මන්ත්‍රී රාහුල මහතාගේ යෝජනාවට මා එකඟ වෙනවා. අපේ උවමනාව නව තනායමක් ගොඩ නැගිම මිසක් එය දිලා මේ රු.200000/= ක් මට මතක විදියට ලබා ගෙන බද්දෙන් යැපෙන්න එහෙම උවමනාවක් නැහැ.අපේ මුලික අවශ්‍යතාවය එතැන තනායමක් හැදිම.මෙම කාරණය අපගේ සියළු ගරු මන්ත්‍රිවරු සිටින අවස්ථාවක සාකච්ඡා කර නිසි විසඳුමක් ගන්නා ලෙස මා ඉල්ලා සිටිනවා.මගේ මතකයේ විදියට මේ ගිවිසුම් කාලය අවසානයි .

**ගරු නගර සභා මන්ත්‍රී දිනයාදූර ධර්මදාස මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, මේ සම්බන්ධව මාස 8ක කාලයක් ලබා දුන්නා නේද පසුගිය කාලයේ. එහි තත්ත්වය කුමක්ද?

ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්.නිලානි මෙනවිය කතා කරමින්

ගරු සභාපතිතුමනි,අපේ අම්බලන්ගොඩ තිබෙන ප්‍රධාන ප්‍රශ්නයක් තමයි අම්බලන්ගොඩ තනායම.අපි මේ ගැන මහජන නියෝජිතයන් වශයෙන් වචනයක් කතා නොකොලහොත් එය ජනතාව වෙනුවෙන් කරන ලොකු අපහසුතාවයක් කියා මා හිතනවා. නගර සභාවට පැමිණ යම්කිසි දිමනාවකුත් ලබා ගන්නවා .එම නිසා විශේෂයෙන්ම අම්බලන්ගොඩ ජනතාවගේ ගෞරුවය තැබිය යුතුයි.ඇත්තටම අම්බලන්ගොඩ තනායම ජනතාවට පරිහරනය කරන්න හදන්න ගත් කාලය හොඳටම ඇති කියා මා විශ්වාස කරනවා.ව්‍යාපාරිකයන් තමන්ගේ ව්‍යාපාරික කටයුතු සිදු කර ගැනීමට නොයෙකුත් ආයවනා නොයෙකුත් ඉල්ලීම් සභාවට ඉදිරිපත් කරන්න පුළුවනි.නමුත් ගරු සභාපතිතුමනි, ගරු නගර සභා මන්ත්‍රී රාහුල මහතා කිවු පරිදි මේ සභාවේ වැඩියෙන් සිටින්නේ නවක ගරු මන්ත්‍රීවරුන්. මේ ගිවිසුම සඳහා අත්සන් කළ සමාගම සහ නවක මන්ත්‍රීවරුන් සමඟ සහ සියළු දෙනා සමඟ සාකච්ඡාවක් තබා මේ ගැන හොඳ අවබෝධයක් ලබා ගත යුතුයි. අපි නගරයට ආදරය විය යුතුයි. ප්‍රධානම දේ එයයි. අපි නගරයේ දේපල ඒ දේවල් වලට ආදරය කරලා ජනතාව අපි කෙරෙහි තැබූ විශ්වාසය අනුව කටයුතු කළ යුතුයි.ඒ සඳහා ඔබතුමාගේ විශේෂ අවධානය යොමු කරන්න. ඇත්තටම කතා කළහොත් මළ ගෙදරක ගියත් මොකකට ගියත් කතා කරන්නේ අම්බලන්ගොඩ තනායම.ඇත්තටම ලැජ්ජා විය යුතුයි අපි.වසර ගණනාවක් ගියත් එම ව්‍යාපාරිකයාට කියා හෝ එම ව්‍යාපාරිකයාගෙන් අරගෙන හරි නගර සභාවෙන් හරි ජනතාවට මෙය දැනට පරිහරණය කරන්න පුළුවන් විදියට ඒ අවස්ථාව ලබා දිය යුතුයි.එම සියළුම ගරු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටින්නේ අපට පක්ෂයක් පාටකට වඩා අප බැලිය යුත්තේ අපේ නගරයේ ජනතාවගේ අවශ්‍යතාවය.ඒ වගේම අපි නගරයට ආදරය විය යුතුයි.මේ සියළුම දෙනා මේ සම්බන්ධව එකමුතුව කටයුතු කරන මෙන් ඉල්ලා සිටිනවා.මා අපි වෙනුවෙන් එම වගකීම ඔබතුමාට සාර්ථක ලෙස ඉටු කරන ලෙස ඉල්ලා සිටිනවා.

ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

මේ සම්බන්ධව විතරක් සාකච්ඡා කරන්න සියළුම ගරු මන්ත්‍රීවරුන්ට ලබන 15දා අඟහරුවදා වෙනම සාකච්ඡාවක් තබන්නම්.එතකොට මේ සම්බන්ධව නව මන්ත්‍රීවරුන් සිටින නිසා කලින් සභාව ගනු ලැබූ තීන්දු සහ බදු ගිවිසුමේ පිටපත් පරන ගරු මන්ත්‍රීවරුන්ට අවශ්‍යතාවයක් නැහැ. ඔවුන් දන්නවා.අලුත් ගරු මන්ත්‍රීවරු සියළු දෙනාටම එය ලබා දෙන්න.ඔබතුමාට පුළුවන්නම් එම ලිපි ගොනුව ගරු ලේකම්තුමිය ඉදිරියේ ගෙනවිත් පරීක්ෂා කළ හැකියි.මේ සම්බන්ධව අඟහරුවදා සවස 2.30ට මේ සම්බන්ධව කතා කරන්න.ඒ එක්කම ප්‍රකාශ කළ යුතුයි . මේ සම්බන්ධව ඉදිරි නිත්‍යානුකූල කටයුතු මා කරනවා.නැතිනම් මෙය තවත් කල් දැමිය නොහැකියි.

ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්

ගරු සභාපතිතුමනි, අප දැන් පත්වෙලා වසර 1 ½ පමණ වෙනවා.අපේ මූලික යෝජනාව වූයේ මේ සම්බන්ධව කතා කිරීමයි.එම නිසා මා ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ අපි මාස 8ක් පමණයි ලබා දී තිබෙන්නේ.අපි මේ මාස 8ට ගත් සියළුම දේවල් කතා කළ යුතුයි.

ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

අපි ඒවත් වෙනම කතා කරන්නම්.

ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්

ගරු සභාපතිතුමනි,ඒකමතිකව මේ ඇස්කෝට් සමාගම පිළිබඳව ඔබතුමා මෙතැනට ආයතනික නිලධාරියෙකුත් කැඳෙව්වා.ඊට අමතරව ගරු උප සභාපතිතුමාගේ යෝජනාව මා අනුමත කළා.අපි

මාස 8කට වඩා දුන්නේ නැහැ.මෙය අම්බලන්ගොඩ ජනතාවට බලපාන පොදු කරුණකි.හැමදාම මා මේ ගොනුව නගර සභාවට රැගෙන එනවා. මෙහි තිබෙන්නේ ඇස්කෝට් ලංකා සමාගමේ තිබෙන ඔක්කොම ලිපිලේඛණ. එමනිසා බොහොම කනගාටුයි.මෙහි තිබෙනවා මා ඔබතුමාගෙන් අසන ලද හැමදෙයකටම පිළිතුරු සපයා තිබෙනවා. නැත , ඔව්.නැත, ඔව්. ඒ වගේ පිළිතුරු තමයි තිබෙන්නේ.මා වාචිකව ඉදිරිපත් කරපු දේවල්. මෙයට දුන්නේ මාස 8කි.දැන් මේ මාස 8 ට ඔබතුමා ගරු සභාපතිතුමා විදියට ඔබතුමා ගත් ක්‍රියාමාර්ග මොනවාද?ඒකමතිකව ගත් තින්දුව ගත්ත ක්‍රියාමාර්ගය මොකක්ද මේ පිළිබඳව ? අපි මේ වඩේ කන්නයි ප්ලේන්ටි බොන්නයි නගර සභාවට එන්නේ නැහැ.නගරයේ ජනතාවගේ මුදල් වලින් වඩේ කන්න ප්ලේන්ටි බොන්න මෙතැනට එන්න උවමනා නැහැ.මෙතැන එක එක්කෙනාට උවමනා විදියට නගර සභාව දුවනවානම් මේ කවුරුත් උවමනා නැහැනේ.නිකං දුවන්න පුළුවන්නේ. අපි බොහොම කනගාටුවෙන් කතා කරන්නේ.මොකද ඔබතුමා ගන්නා කිසිම ක්‍රියාමාර්ගයක් පිළිබඳ සැහැහිමකට පත්වෙන්නේ නැහැ. ඔබතුමාට වගකීමක් තිබෙනවා ගරු සභාපතිවරයා විදියට. ගරු උප සභාපතිතුමාත් මාත් මේ යෝජනාව ඉදිරිපත් කිරිම හා ස්ථිර කිරිම කරනු ලැබුවේ. එතකොට ඔබතුමාට වගකීමක් තිබෙනවා. සියළු ගරු මන්ත්‍රිවරු එකඟ වෙලා ගත්තේ. දැන් මෙකට මෙහෙමද යන්න වෙන්නේ. මෙකට ගන්න ක්‍රියාමාර්ගය මොකක්ද? අපිට තිබෙන්නේ පොදු ප්‍රශ්නයකි.මෙයට දේශපාලනයේ මොන යෝජනා මොන විදියට ගත්තාත් කවුරු මොන වැරදි වැඩය කළත් අම්බලන්ගොඩ ජනතාවට හදවත බඳු තිබුණු වස්තුවක් මෙය.අද එය සොහොන් කොතක් බවට පත් කර තිබෙන්නේ. මේ නගර සභාවේ තිබෙන පරිපාලන දුර්වලතාවයන් නිසා.මෙයට ක්‍රියා මාර්ග ගන්න පුළුවනි.ගිවිසුමක් අත්සන් කරන්නේ මේ රටේ ගිවිසුමේ තිබෙන වගන්ති උල්ලංඝණය වුණොත් වගන්ති වලට මෙයට පියවර ගත යුතුයි. ඕනෑම ආයතනයක්. එතකොට ගිවිසුම් ගන්නවා.නගර සභා මන්ත්‍රිවරු ඒකමතිකව තින්දු කරනවා.හත් ඉලව්වේ මොකුතු කරන්නේ නැහැ.කොහේ යන්නද උන්.මොකක්ද මේ කරන්නේ ගර ුසභාපතිතුමා.මෙහෙම යන්න පුළුවන්ද මේ සභාවට.මොකක්ද ගරු මන්ත්‍රිවරුන්ට තිබෙන ගරුත්වය. අපි මෙතැන කතා කර තින්දු ගන්න අවශ්‍ය නැහැ එහෙම නම්. මාස 8යි දුන්නේ. දැන් අවුරුද්දකුත් ඉක්මවා ගිහින්.ගත්ත ක්‍රියා මාර්ගය කුමක්ද?මේ එනකම් තමයි මාත් හිටියේ මෙය බලාගෙන.අපේ ගරු මන්ත්‍රිවරු විමසුවා.මේ ගැන කතා කරන්නේ නැද්ද කියා.මේ ගැන කතා නොකර හිටියේ මේ ඇස්කෝට් ලංකා එක වරෙන්කෝ.එදාට මා අහන්නම් මේ ඔක්කොම උත්තර කියා. දැන් ආවා ප්‍රශ්නය. දැන් කිසිසේත් නම් මාරු කරන්න ඉඩ දෙන්න බැහැ. අපි ගත්ත තින්දුවක් තිබෙනවා මේ ගරු මන්ත්‍රිවරු. ඒ තින්දුව අනුව වැඩ කරන්න කියා කරුණාවෙන් ඉල්ලා සිටිනවා.එහෙම නොවුණහොත් මේ මැතිවරණය අවසන් වූ පසු ජනතාව සමඟ අපි බසිනවා ගාලු පාරට. මොකද මෙය මට වත් ගරු මන්ත්‍රිවරුන්ටවත් නෙමේ. ගරු සභාපතිතුමා හිතන්න මෙය අම්බලන්ගොඩ ජනතාවගේ පොදු ප්‍රශ්නයකි. එතැනට මෙයට පිලියම් ගන්න.ඔබතුමාට අපි සියළු දෙනාම සහායෝගය දෙනවා.ඕනෑම හොඳ දෙයකට කිසිඳු වගන්තියක් නොමැතිව සහායෝගය දෙනවා. ඇයි මේ ප්‍රශ්නයේදි විතරක් කකුළෙන් අදින්නේ. ඇයි පියවරක් නොගන්නේ.කරුණාකරලා ඔබතුමාගේ තනතුරේ තිබෙන වගකීම ඉටු කරන්න. කිසිසේත් අපි මාරු කරන්න දෙන්නේ නැහැ. මාරු කළොත් කියටවත් ඉඩ දෙන්නේ නැහැ.ඔබතුමා කරුණා කරලා ගරු මන්ත්‍රිවරුන්ගේ ගෞරුත්වය තබා ක්‍රියා කරන ලෙස ඉල්ලා සිටිනවා.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

ගරු මන්ත්‍රිවරු කැමතිද මේ ගැන සාකච්ඡා කරන්න. සාකච්ඡා කරන්න. නැතිනම් ඊළඟ දවසේ සාකච්ඡා කරන්නම්.මා එකඟයි. ගරු මන්ත්‍රිවරු එකඟ නම්. දැන් ඔගොල්ලන්නේ කැමති නම් කල් දමන්න.ඔගොල්ලන්ට පරික්ෂණය කරන්න. ගරු මන්ත්‍රිවරුන්ගේ කටේ හයියට සහ ඇඟේ හයියට බැහැ මේවා කරන්න.නීතියක් තිබෙනවා මේ රටේ.එම නිතියට අපි සියළු දෙනා යටත්.ඒ නීතිමය කරුණු පිළිබඳ අධ්‍යයනය කර කතා කරන්න.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මෙයට ඉල්ලා සිටින්නේ වෙනත් දිනයක් ලබා දෙන ලෙසයි. මේ සභාව නැතිනම්

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මා කියා සිටින්නේ සියළු කරුණු . ගිවිසුම, ගත් තීන්දු, සභාව ගත් තීන්දු ,ඒ සියල්ල මේ නවක මන්ත්‍රීවරුන්ට ලබා දෙන්න. දැන් මේ පරණ ගිවිසුම දැකලා නැහැනේ.ඒ ගිවිසුම වූ සියළුම දේවල් අපි දෙන්නම්.ඒ ගිවිසුමත් දුන් පසු විග්‍රහ කර ඒ විග්‍රහ කිරීම තුළ කතා කරන්න.සියළු දේවල් දෙන්නම්. අර 15වෙනිදා දිනය වෙනස් කරන්න වෙනවා . සහිත්‍ය දිනය දමා තිබෙන්නේ එදාට. එම නිසා 17 වෙනිදා 2.30ට අපි කැඳවන්නම්.17 වෙනිදා සියළුම ගරු මන්ත්‍රීවරුන්ට අදාල පිටපත් සහා තීන්දුව සමඟ ලබා දෙන්න.අධ්‍යයනය කර එන්න. අර ගැලරියට කතා කරන්න නෙමේ. නීතියට කතා කරන්න.අපිත් දන්නවා . ගැලරියට කතා කරනවා නම් මේ සම්බන්ධව ඕන තරම් කරුණු තිබෙනවා. මෙය කඩපු අයත් සිටිනවා.එහි අධ්‍යක්ෂකවරුත් මේ සභාවේ ගරු මන්ත්‍රීවරු වශයෙන් වාඩි වී සිටිනවා.අපිට කතා කරන්න පුළුවනි. ගැලරියට කතා කරන්න. එම නිසා එහෙම කතා කරන්න ලැහැස්ති වෙන්න එපා.නීතියට අනුව කතා කරන්න.මෙයට වගකිව යුතු මිනිස්සු ඉන්නවා.අපි වගකියන්න ඕන නැහැ. මෙය අපි කවදාවත් කඩලා නැහැ.අම්බලන්ගොඩ බස්නැවතුම්පොළේ වේදිකාවක් ගසා මේ ගැන කතා කරන්න ලැහැස්තියි අපි.අපි කිසිම වරදක් කරලා නැහැ.ඒ කරුණ අපි මේවා කරනවා. අපිටත් වැඩක් තිබෙනවා අද සවස 2.00ට

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි,කෑ ගසා වැඩක් නැහැ.ඔබතුමා දන්න එක හරි. රැස්වීම තිබෙනවා නම් අපි මෙය වෙන දිනයකට කල් දමන්නම්.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එහෙනම් අපි වෙන දිනයකට කල් දමන්නම්.සියළු ගරු මන්ත්‍රීවරු එකඟ නම් මා කල් දමන්නම්.අපිට ජනාධිපතිතුමා එන රැස්වීමක් තිබෙනවා.

තීරණය -

ඇස්කෝට් අම්බලන්ගොඩ පුද්ගලික සමාගම යනුවෙන් වූ සමාගම් නාමය වෙනස් කිරීම සම්බන්ධව නීතිඥ ශ්‍රීමල් විජේසේකර මහතා විසින් යොමු කරන ලද ලිපිය සම්බන්ධව ගිවිසුම,ගත් තීන්දු , සභාව විසින් ගනු ලැබූ සියළු තීන්දු තීරණ පිළිබඳ විස්තර ගරු නවක මන්ත්‍රීවරුන්ට ලබාදීමටත් , ඒ සඳහා 2019.10.17වන දින සියළු ගරු මන්ත්‍රීවරුන් සමඟ සාකච්ජාවක් පැවැත්වීම සුදුසු බවටත් , ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**03.09 අම්බලන්ගොඩ නගර සභාවේ මුදල් පිළිඳ කාරක සභාවේ සාමාජිකයන් පත්කිරීම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අම්බලන්ගොඩ මුදල් කාරක සභාවේ සාමාජිකයන් පත් කිරීම.අම්බලන්ගොඩ මුදල් කාරක සභාවේ සාමාජිකයන් සිටින්නේ 6 කි.2019.08.06 දින පැවති සභා තීන්දුව අනුව මූල්‍ය කමිටුවේ ස්ථාවර කාරක සභාවේ සාමාජිකයන් මෙසේ ඉදිරිපත් කරනවා.ගරු සභාපති අරුණ ප්‍රදීප් මහතා, ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා , ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා, ගරු නගර

සභා මන්ත්‍රී අතුල ප්‍රියන්ත මහතා, ගරු නගර සභා මන්ත්‍රී සෝභිත රංජිත් මහතා, ගරු නගර සභා මන්ත්‍රීඑස්.එම් සරත් චන්ද්‍ර මහතා, ගරු නගර සභා මන්ත්‍රී එස්.එම් සරත් චන්ද්‍ර මහතා 2019.09.30 සම්බන්ධ ලිපිය පරිදි ඉල්ලා අස්වෙනවා කියා තියෙනවා. ඒ වෙනුවෙන් එක් අයෙකුගේ නමක් යෝජනා කරන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**
ඔබතුමා ඉල්ලා අස්වෙන්න එපා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**
ගරු මන්ත්‍රීවරයෙකුගේ නමක් යෝජනා කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**
ඔබතුමා අයින් වෙන්න එපා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**
ඔබතුමාගේ ලිපිය පරිදි මෙය දමන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම් සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

මොකද ඔය මුදල් සම්බන්ධව ආර්ථික විද්‍යාව මා එච්චර දන්නේ නැහැ.ගනුදෙනු එක්ක මට ටිකක් භයයි.එම නිසා මා කැමති නැහැ ඔය කතාන්දරයට.දන්න දෙයකට නම් මා බෙල්ල තබන්න ලැහැස්තියි.ඔය නොදන්න දේවල් වලට ගිහින් කරදර වෙන්න මා ලැහැස්ති නැහැ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ගරු මන්ත්‍රීතුමනි, මෙතැන සිටින කවුරුත් විශේෂඥයෝ නෙමේ මුදල් සම්බන්ධව.ඒ සම්බන්ධව විශේෂ පිරිස් නගර සභාවේ ගණකාධිකරි ඇතුළු සියළු දෙනා අනුමත කර තමයි අපි ලඟට ඒවා එවන්නේ.අපි තීන්දු කරනවා ගෙවනවාද නැද්ද කියා. එච්චරයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම් සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

ඒ වෙන ගරු මන්ත්‍රීවරුන්ගේ ප්‍රතිපත්තියක් .මාගේ ප්‍රතිපත්තියක් නෙමේ. මාගේ ප්‍රතිපත්තියක් නෙමේ. මා නොදැන දෙයක් කරන්න යන්නේ නැහැ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**
වෙනත් නමක් යෝජනා කරන්න.

**<u>ගරු උප සභාපති කමල් ද සිල්වා මහතා කතා කරමින්</u>**

ගරු නගර සභා මන්ත්‍රී ධර්මදාස මහතාගේ නම යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්. ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්</u>**
එය ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එහෙනම් ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතාගේ නම වෙනුවට ගරු නගර සභා මන්ත්‍රී ධර්මදාස මහතාගේ නම යෝජනා කරනවා. ඔහු පත් කරනු ලබනවා.

තීරණය -

අම්බලන්ගොඩ නගර සභාවේ මුල්‍ය පිළිඳ කාරක සභාවේ සාමාජිකයන් ගණන 06ක් වන අතර ඒ අනුව 2019.08.06 දිනැති සභා තීරණ අංක 11.04 අනුව මුල්‍ය පිළිබඳ ස්ථාවර කාරක සභාවේ දැනට සාමාජිකත්වය දරණ මන්ත්‍රී මණ්ඩලයේ සාමාජිකයන් වන්නේ,

- ගරු සභාපති - එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා
- ගරු නගර සභා මන්ත්‍රී - ජී.සරත් ශ්‍රී ලාල් මහතා
- ගරු නගර සභා මන්ත්‍රී - එම්.ඩබ්.රාහුල ලලිත වික්‍රම මහතා
- ගරු නගර සභා මන්ත්‍රී - එම්.අතුල ප්‍රියන්ත මහතා
- ගරු නගර සභා මන්ත්‍රී - ඩබ්.ඒ. සෝභිත රංජිත් මහතා
- ගරු නගර සභා මන්ත්‍රී - එස්.එම්. සරත් චන්ද්‍ර ද සිල්වා මහතා

යන මහතුන් සාමාජිකත්වය දරන අතර ගරු නගර සභා මන්ත්‍රී එස්.එම් සරත් චන්ද්‍ර මහතා මුල්‍ය කමිටුවෙන් ඉල්ලා අස්වන බවත් , ඒ සඳහා ගරු නගර සභා මන්ත්‍රී ධර්මදාස මහතා සුදුසු බවට ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්. ලසන්ත අජිත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**03.10 මහ අම්බලන්ගොඩ , අම්බලන්ගොඩ ,අංක 35 හි කලාගුරු ටුක්කාවඩු ගුණදාස කෝලම් නාට්‍ය සංසදය විසින් ඉදිරිපත් කරන ලද ලිපිය සභාගත ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ටුක්කාවඩු ගුණදාස කෝලම් සංසදය. ටුක්කාවඩු කෝලම් සංරක්ෂණ කේන්ද්‍රය .දකුණු පළාත් සභා ප්‍රතිපාදන මත අප සංසදය මගින් ඉදිකරන ලද ඉහත සඳහන් කෝලම් වෙස්මුහුණු සංරක්ෂණ කේන්ද්‍රය නැරඹීම සඳහා මේ වන විට විදෙස් සංචාරකයින් පැමිණෙයි.මෙම සංරක්ෂණ කේන්ද්‍ර ය නැරඹීම සඳහා පැමිණෙන සංචාරකයින්ගේ පහසුව සඳහා දොළොස් මහ වෙළඳ සංකීර්ණ ඉදිරිපස ඇති මහ අම්බලන්ගොඩ නාම පුවරුවේ හිස්ව ඇති පහත කොටසෙහි අප සංරක්ෂණ කේන්ද්‍රයෙහි ( කුඩා ප්‍රමාණයේ ) නාම පුවරුවක් ගාස්තු අය කිරීමෙන් තොරව ප්‍රදර්ශනය කිරීම සඳහා අවශ්‍ය අනුමැතිය ලබා දෙන මෙන් ඉතා කාරුණිකව ඉල්ලා ඇත. ප්‍රදර්ශන පුවරුවේ සැලැස්මක්ද මේ සමඟ ඉදිරිපත් කර ඇත.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්. නිලානි මෙනවිය කතා කරමින්</u>**
ගරු සභාපතිතුමනි, එය ලබා දෙන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**
එය නොමිලේ ලබා දෙන්න . අම්බලන්ගොඩ නගරයේ වෙස්මුහුණු සංරක්ෂණ මධ්‍යස්ථානයක් නිසා මෙය නොමිලේ ලබා දෙන්න තීන්දු කරනවා.

තීරණය -

දොළොස් මහ වෙළඳ සංකීර්ණය ඉදිරිපස ඇති මහ අම්බලන්ගොඩ නාම පුවරුවේ හිස්ව ඇති පහත කොටසෙහි මහ අම්බලන්ගොඩ , අම්බලන්ගොඩ ,අංක 35 හි කලාගුරු ටුක්කාවඩු ගුණදාස කෝලම් නාට්‍ය සංසදයේ කුඩා ප්‍රමාණයේ නාම පුවරුවක් ගාස්තු අය කිරීමෙන් තොරව ප්‍රදර්ශනය කිරීම සඳහා අවසර ලබා දීම සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා

යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්.නිලානි මෙනවිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

## 03.11 ගරු නගර සභා මන්ත්‍රී ඉනෝකා ක්‍රිශාන්ති මහත්මිය විසින් කොඩි කණු 40ක් ලබා ගැනීම සම්බන්ධ ලිපිය සභාගත ලදී.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ගරු නාගරික මන්ත්‍රී ඉනෝකා ක්‍රිශාන්ති මහත්මිය විසින් කරන ඉල්ලීම. කොඩි කණු 40ක් ලබා ලබා ගැනීම.අම්බලන්ගොඩ ආසන සංවිධායක ගරු ඩෙනට් පනියන්දුවගේ මහතාගේ අනුදැනුම මත ඉල්ලීම් කරන ලද එක්සත් ජාතික පක්ෂ බලමණ්ඩල උත්සවය සඳහා කොඩි කණු 40ක් ලබා ගැනීම 2019.10.04 වන දින සිට 2019.10.05 වන දින දක්වා ලබා දෙනමෙන් කාරුණිකව ඉල්ලා සිටිනවා.එය සභා අනුමැතියට යටත්ව නොමිලේ ලබා දෙන්න කියා තිබෙනවා.එය ලබා දී තිබෙනවා. එය අනුමත කරන ලෙස ඉල්ලා සිටිනවා.

**තීරණය -**

ගරු නගර සභා මන්ත්රී ඉනෝකා ක්‍රිශාන්ති මහත්මිය විසින් ගරු අම්බලන්ගොඩ ආසන සංවිධායක ගරු ඩෙනට් පනියන්දුවගේ මහතාගේ අනුදැනුම මත කරන ලද එක්සත් ජාතික පක්ෂ බල මණ්ඩල උත්සවය සඳහා කොඩි කණු 40ක් 2019.10.04 වන දින සිට 2019.10.05 දින දක්වා සභා අනුමැතියට යටත්ව නොමිලේ ලබා දීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

## 03.12 කඩ කාමර ගිවිසුම් අළුත් කිරිම සම්බන්ධව නව ගිවිසුම් සම්බන්ධ ගොනුව සභාගත කරන ලදී.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

කඩ කාමර ගිවිසුම අළුත් කිරිම හා නව ගිවිසුම ඉදිරිපත් කර තිබෙනවා.ගරු මන්ත්‍රීවරු එය කියවා එන්නැති කියා මා බලාපොරෝත්තු වෙනවා.ඒ සඳහා යම්කිසි සංශෝධන තිබේනවාද?

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි,මා කතා කරන්නේ මෙම කඩ කාමර බඳු දිමේ ගිවිසුමක් තිබුණා.මෙයට මොනවා හරි ගැටළුවක් තිබෙනවාද? ඇයි මේ වගේ තීරණයක් ගත්තේ කියා දැනගත යුතුයි.එහෙම මොනවා හරි ගැටළුවක් තිබුණා නම් පරණ ගිවිසුම සමඟ අළුත් ගිවිසුමත් ලබා දුන්නානම් ගරු මන්ත්‍රීවරුන්ට එය බලන්න තිබුණා.මොකක්ද කියා මේ වෙනස.මොකක් හින්දාද මෙහි තිබෙන වෙනස. මොකක් හින්දාද මෙය වෙනස් කරන්න තීරණය කරන්නේ.හැබැයි එහෙම ලබා දී නැහැ.මා ඉල්ලා සිටිනවා මෙම ගිවිසුමත් සමඟ පරණ ගිවිසුම ගරු මන්ත්‍රීවරුන්ට ලබා දෙන්න කියා.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

පරණ ගිවිසුමත් එවා තිබෙනවා.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, එක ප්‍රශ්නයක් ඇසුවා ගරු උප සභාපතිතුමා විසින්.මොකද මෙය කඩිමුඩියේ වෙනස් කරන්නේ කියා.මට තිබෙන ගැටළුව නම් ඔබතුමාගේ ගිවිසුමේ 35 වෙනි වගන්තිය.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

පැරණි ගිවිසුමේ 35 වෙනි වගන්තිය

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**
පැරණි ගිවිසුම නෙමේ අළුත් ගිවිසුම.35 වෙනි වගන්තියේ තිබෙනවා. එය මෙයට අළුතින් ඇතුලත් කරන ලද එකක්.මෙම ගිවිසුම හැදුවේ නීතිඥ මහත්මයෙක්ට කියලාද ?

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

නැහැ. අපේ ආදායම් පරික්ෂක මහත්වරු විසින්.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**
මා පලමුවෙන්ම කියා සිටිනවා. මේ ගිවිසුම නිතිඥයකු ලවා හදන්න කියා.ගිවිසුම් තිබුණානත් පසුගිය කාල වකවනුවල අපට සිද්ධ වෙච්ච දේවල් ආරංචියි. ඔබතුමා මාස තුනකින් පිළිතුරු සපයන්නම් කිවුවා. මා දැනගත්තා මෙන්න මේක තමයි ඒ පිළිතුර කියා.මෙන්න මෙකේ තියෙනවා ගිවිසුමේ දෙවන පාර්ශවය විසින් මෙහි සඳහන් කොන්දේසි

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

පරණ ගිවිසුමේ තිබෙන්නෙත් වගන්ති 11යි.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**
පරණ එක ගැන නෙමේ මා කතා කරන්නේ මේ අළුත් එක.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ඔබතුමාගේ ප්‍රශ්නය මට කියන්න.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**
ප්‍රශ්නය තිබෙන්නේ මේ අළුතින් දමන ලද ගිවිසුම අනුව මේ වගන්තිය ඇතුළත් නොවෙන්න කියා තමයි මා කියන්නේ.මෙම ගිවිසුමේ දෙවන පාර්ශවය විසින් මෙහි සඳහන් කොන්දෙසි අංක 11,18 සහ 19 යන ගිවිසුම් අංක කොන්දෙසි කඩ කළ විටක පලමු පාර්ශවය විසින් එය සමථයකට පත් කර නැවත එම පාර්ශවයකදි ගිවිසුම් ගත වීමකදි ගිවිසුම කඩ කිරීමේ වරදට පලමු පාර්ශවයේ අනුමැතිය ප්‍රකාරව  ආදායම් පරික්ෂකගේ වාර්තාවට ආදලව රු.25000/= කට නොඅඩු උපරිමය රු.50000/= ක දඩයක් ගෙවීමට පලමු පාර්ශවය එකඟ වේ. ( ඉහත සඳහන් කොන්දෙසි කඩකල පලමු අවස්ථාවේ පමණක් මෙම දඩයට යටත් වන අතර ඉන් අනතුරුව සිදුවන කුමන හෝ ගිවිසුම් කඩ විමකදි ගිවිසුමේ 24 වගන්තියේ ප්‍රකාරව කටයුතු කරන්න).ඒ කියන්නේ නගර සභාවට පවරා ගන්න කියන එක.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මා මෙයට පිළිතුරක් දෙන්නම්. මා සභාව කාරක අවස්ථා තත්ත්වයට පත් කරනවා. නිලධාරි සියළුම අය එළියට යන්න.

- පෙරවරු 10.25 ට පමණ ගරු සභාව කාරක සභා තත්ත්වයට පත් කරන ලදී.
- පෙරවරු 10.35ට පමණ ගරු සභාවේ වැඩ කටයුතු නැවත ආරම්භ කරන ලදී.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ගරු මන්ත්‍රිතුමා 35 වන වගන්තිය පිළිබඳ ගැටළුවක් තිබෙනවාද?

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, එම දඩ මුදල රු100000/= දක්වා වැඩි කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

**ගරු නගර සභා මන්ත්‍රි ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්**
එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මෙහි තිබෙන්නේ රු.25000/= සිට උපරිමය රු.100000/= දක්වා වැඩි කිරිමට තින්දු කරනවා සභාව.

**ගරු නගර සභා මන්ත්‍රි ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්**
ඊට අමතරව මා තව යෝජනාවක් කරනවා.මේ කඩ කාමරයක් ගත් පලමු පාර්ශවය තවත් පාර්ශවයකට මෙය පවරන්නේ නම් බදු පවරන්නේ නම් හැරවුම් ගාස්තුව අවම වශයෙන් ලක්ෂ විසිපහක් වශයෙන් හැරවුම් ගාස්තුව අයකරන්න.මේ නගර සභාවට ගෙන එනු ලබන අවම ගාස්තුව වගේ එක විසි තිස් ගුණයක් හම්බ කරනවා එම හැරවුම් මුදල වගේ.මේ අපේ නගර සභාවට ලැබෙන්න තිබෙන මුදල තමයි මේ වෙනත් පාර්ශව ලබා ගන්නේ. එම නිසා නගර සභාවට අගතියක් වෙන්න දෙන්න බැහැ.මේ නගර සභාවට අගතියක් නොවෙන්න මේ ගරු මන්ත්‍රිවරුන්ගේ එකමතිකව අරගෙන පහල තට්ටුව අඩුම ගණනේ ලක්ෂ විසිපහක්වත් අරගෙන ඉහළ තට්ටුව ලක්ෂ දොළහක් හරි පහළොවක් හරි අරගෙන අවම වශයෙන් ලක්ෂ විස්සක්වත් අරගෙන පහළ තට්ටුවේ කඩයක් පවරන ලෙස මා යෝජනා කරනවා.

**ගරු නගර සභා මන්ත්‍රි ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්**
එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු නගර සභා මන්ත්‍රි ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**
ගරු සභාපතිතුමනි, මට පොඩි ප්‍රශ්නයක් තිබෙනවා අපේ විපක්ෂනායකතුමා පැවරිම සම්බන්ධව මා අදහස් කළේ කඩය අතුරු බදු දිමද එහෙම නැතිනම් සම්පූර්ණම බදු දීමද?

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

සම්පූර්ණ බදු දීම. ඔබතුමාගේ යෝජනාව මේ අවස්ථාවේදි කරන්න බැහැ. එය අයවැය යෝජනා කිරිමේදි එය ගැසට් කිරිමකට යන්න ඕන.එමනිසා ලබන අවුරුද්දේ එයට යා හැකියි. දැනට ගිය වසරේ ලක්ෂ දෙකයි තිබුණේ. එය අපි ලක්ෂ දහය දක්වා වැඩි කළා. ලක්ෂ දහය කළවිට කියක් හැරෙව්වාද?දෙදෙනෙක් හරවා තිබෙනවා.

**ගරු නගර සභා මන්ත්‍රි ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**
ගරු සභාපතිතුමනි, දැන් මෙතුමන්ලා අදහස් කරන දේ නගර සභාවට ආදායමක් ගැනිමට යානවානම් කරන්න තිබෙන්නේ අතුරු බදු දීමේ ගිවිසුමකට යාම. එම අතුරු බදු දිමේදි සභාවට ආදායමක් එනවා. මොකද මේ කඩ 30ක් තිබෙනවා නම් 29ක්ම අතුරු බදු දී තිබෙනවා.නමුත් සභාවට නිත්‍යානුකුලව බලය තිබෙනවා රාජ සන්තක කරන්න. හැබැයි මෙය සාමාන්‍ය දෙයකි. අපි අම්බලන්ගොඩ නගර සභාව විදියට මේ කඩ බදු දුන්නාට මේ කඩවල බදුකරු වශයෙන් සිටින්නේ බදු අයිතිකරු නෙමේ.මෙය සාමාන්‍ය දෙයකි.අපට නගර සභාවට රු.5000/=ක් රු.6000/= ක් බද්ද ගෙව්වාට ඒ අය සොයනවා සමහර කඩවලින් ලක්ෂ එකහාමාරක් දෙකක්. සමහර කඩවලට ඔය කියන බද්ද ගෙවා ගන්න බැරි කඩත් තිබෙනවා.මා කියන්නේ බදු කරුත් අතුරු බදු කරුත් අතර ගිවිසුමකට අපට අවසර

දෙන්න පුළුවන් කමක් තිබෙනවාද? ප්‍රායෝගික ගැටළු කරුණු.මා දන්නේ නැහැ ගිවිසුමේදි පුළුවන්ද කියන එක.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

නැහැ. එය ටිකක් ගැටළු සහගත තත්ත්වයකි. එක පාරට තීන්දු ගන්න බැහැ.

<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>

එය අදාල නිතිඥ මහතාගෙන් අසා ගිවිසුමට අදාලව තක්සේරු දෙපාර්තමේන්තුවෙන් අහලා එම කටයුත්ත ක්‍රියාත්මක කරන්න පුළුවන් නම් සභාවට ලොකු ආදායමක් ඒවි. දැන් මේ වන විට වරිපණම් වලට එහා ගිය ආදායම තමයි නගර සභාවේ කඩ කුලි.මා කතා කරන්නේ ආදායම. එමනිසා අපි මිටවඩා සැලකිලිමත් විය යුතුයි. අයිතිකරුට කරන බලපෑමක් නෙමේ.දැනට වෙළඳ ව්‍යාපාර පවත්වාගෙන යන අය අයිතිකරුට ලොකු මුදලක් ගෙවනවා. අපේ කඩවලින්. ඉතිං එමනිසා එකෙන් මුදලක් ලබා ගැනීමේ යෝජනාවක් මා කළේ.එය ලබා ගන්න පුළුවන්ද කියා බලන්න ඕන.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

අපි ඒ හින්දා දැනට තින්දුවක් ගන්න හොඳ නැහැ.මේ පිළිබඳව දිර්ඝව සාකච්ඡා කර ගන්න ඕන.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

මෙය නීතිඥ මහතෙකු සමඟ හරියටම මෙවා කර දමා ගන්න. සමහර ඒවාගේ පොඩි පොඩි අඩුපාඩුකම් තිබෙනවා.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

එම 35 වෙනි වගන්තියට යටත්ව එම ගිවිසුම අනුමත කරනවා.

තීරණය -

අම්බලන්ගොඩ නගර සභාව සතු වෙළඳ සංකීර්ණ වල කඩ කාමර ගිවිසුම් අළුත් කිරිම සඳහා නව ගිවිසුමේ 35වන වගන්තියේ සඳහන් වන අවම දඩ මුදල රු.25000/=ක් සහ උපරිම දඩ මුදල රු.100000/= ලෙස විය යුතු බවට ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා යෝජනා කළ අතර එම යෝජනාව සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**03.13 සෞඛ්‍ය අංශයේ ව්‍යාපෘති සේවයේ දෛනික වැටුප් ලබන කම්කරුවන්ගේ හා රියදුරන්ගේ අතිකාල ගෙවීම රාජ්‍ය පරිපාලන චක්‍රලේඛන 3/2016 අනුව ගැලපුම් කිරිම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

| සේවය | 2019 මුලික වැටුප | 2020 මුලික වැටුප |
|---|---|---|
| • කම්කරු PL 1 | 724.87 | 808 |
| • කම්කරු PL 3 | 770.87 | 859.67 |

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

සෞඛ්‍ය අංශයේ ව්‍යාපෘති සේවයේ දෛනික වැටුප් ලබන කම්කරුවන්ගේ හා රියදුරන්ගේ අතිකාල ගෙවීම රාජ්‍ය පරිපාලන චක්‍රලේඛනය අනුව රු.391 ක් හා නමුත් 3/2016 චක්‍රලේඛය අනුව ගැලපුම්

කිරිම මත අතිකාල ගණනය කිරිම මත මූලික වැටුප පහත පරිදි වේ. **කම්කරු වැටුව( 2019) PL1** රු.724.87 ක් ලෙස වුවද 2020 වර්ෂයේ රු.808/=කි. රියදුරු PL3( 2019)770.87ක් ලෙස වුවද 2020 වර්ෂයේ රු.859.67 කි. සේවකයන්ගේ වැටුප රු.324 සිට රු.397 දක්වා වැඩිවීමක් සිදු වෙනවා. ඒ වැඩිවිමට සභාවේ අනුමැතිය ඉල්ලා සිටිනවා. එම වැඩිවීම චක්‍රලේඛණයට ප්‍රකාරව තමයි මේ වැඩිවිම සිදු කරන්නේ.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි ,එය ලබා දෙන්න. එම සේවකයන්ට

තීරණය -

සෞඛ්‍ය අංශයේ ව්‍යාපෘති සේවයේ දෛනික වැටුප් ලබන කම්කරුවන්ගේ හා රියදුරන්ගේ අතිකාල ගෙවීම රාජ්‍ය පරිපාලන චක්‍රලේඛන 3/2016 අනුව ජූලි මස අතිකාල ගණනය කිරිම පහත පරිදි සිදු කිරිම (චක්‍රලේඛ ප්‍රකාරව ) සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

| සේවය | 2019 මූලික වැටුප | 2020 මූලික වැටුප |
|---|---|---|
| • කම්කරු PL 1 | 724.87 | 808 |
| • කම්කරු PL 3 | 770.87 | 859.67 |

**03.14 අම්බලන්ගොඩ නගර සභාවේ පොදු වැසිකිළිය බඳු දීම සම්බන්ධ ගොනුව සභාගත කරන ලදී**

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

අම්බලන්ගොඩ නගර සභාවේ පොදු වැසිකිළිය බඳු දිමේ ගිවිසුම 2019.12.31 දිනෙන් අවසන් වන බැවින් 2020.01.01 සිට 2020.12.31 දින දක්වා කාලය තුළ වැසිකිළිය බඳු දිම සඳහා ටෙන්ඩර් කිරිම සුදුසු බවට යෝජනා කරනවා. එම පොදු වැසිකිළිය ටෙන්ඩර් කිරිම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවෙන් කුලිය මාසික කුලියක් ලබා දෙන තෙක් තවකාලික මාසික කුලිය රු.25000/= ක් ලෙස යෝජනා කරනවා.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, දැන් දිලා තිබෙන්නේ කියද? මේ වන විට.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

කියටද දිලා තිබෙන්නේ මේ වන විට.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

මසයකට රු.8000/=කි. එතකොට රු.96000/= ක මුදලකි අවුරුද්දට .

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

මෙයට පුවත්පත් දැන්වීමක් දමන්න.මොකද දන්නවාද මා එහෙම කිව්වේ දැනට මාතර නගර සභාවේ වැසිකිළිය ලක්ෂ දෙකයි ගණනක් වෙනවා.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, මෙය අපිට ඒ තත්ත්වයට ගන්න බැහැ. හැබැයි මෙය හදන්න ඕන.මෙය හදන්නේ නැතිව ඒ ගාණට යන්න බැහැ.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මෙය හදනවා.මාර්ගස්ථ මගී ප්‍රවාහන දෙපාර්තමේන්තුව සංචාරක ව්‍යාපාර යටතේ ලක්ෂ දහයක මුදලක් වෙන්කරන්නම් කියා තිබුණා.මෙය හදලා දෙන්න.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

විශේෂ සිද්ධිය තිබෙන්නේ මුළු ගම්මානයක්ම පැමිණෙන්නේ ගම්මානයක් හරහා දුම්රිය පොළට.පාසැල් දරුවන් 3000ක් 3500ක් විතර මේ පැත්තෙන් එන්නේ.මා හිතන්නේ ගරු නගර සභා මන්ත්‍රී ලසන්ත මහතා දන්නවා අද වන විට මේ වැසිකිළිය සම්පූර්ණ උතුරා තිබෙන්නේ.ගඳයි සම්පූර්ණ. කලිනුත් මෙය හදලා දුන්නා. මේ ක්‍රමය වෙනස්විය යුතුයි.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

අපි එම ක්‍රමය තාක්ෂණසේවා නිලධාරින්ට දුන්නා . ඒ සම්බන්ධව අපට වාර්තාවක් දුන්නා.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

එම නිසා ගරු සභාපතිතුමනි, මෙය අළුත් වැඩියා කටයුතු සිදු කරලා යම්කිසි මුදලකට ලබා දීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්.ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, බස්නැවතුම්පොළේ කඩ හිමියන්ට පාවිච්චියට දි ඇති වැසිකිළි පද්ධතිය ඔක්කොම කැඩිලා බිදිලා ගිහින් තිබෙන්නේ.ඒ ටික ඔක්කොම සවුත්තු වී තිබෙන්නේ.ඒ අය කැමතියි කවුරු හරි ඉන්දාගෙන මුදලක් ගෙවා පිරිසිදු කිරිමේ කටයුතු සිදු කර ගැනීමට.අනෙක් එක පිටු පස්සේ වැසිකිළියේ වතුර ඔක්කොම උතුරනවා.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

අපි දැන් එය හදනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි,තාක්ෂණසේවා නිලධාරිතුමා කිව්වේ එම සැලැස්ම පිළිබඳ විස්තරයක් ලබා දෙනවා කියා.සංගණයක් කර මෙය පාවිච්චි කළ ප්‍රමාණය කොච්චරක්ද කියා.ඉතාම වැදගත් වන්නේ පාවිච්චි කරන පිරිස වත් සැලැස්මවත් නෙමේ. මේ වතුර මට්ටමේ තියාගෙන මෙම ව්‍යාපෘතිය කොහොමද කරන්නේ කියන එක.මෙය සභා වාර කිහිපයකදි වසර ගණනාවක් තිස්සේ ආපු කාරණාවක්.කලින් පාලන සමයේත් උඩට උස්සා තමයි හැදුවේ.මේ හා සමාන නගර සභාවක හරි ප්‍රාදේශිය සභාවක හරි කරලා තියෙන්නේ මොකක්ද කියන එක සොයා බැලිය යුතුයි.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

දැනට අපි සොයා බලා තිබෙනවා.දැනට ජාපනයේ හඳුන්වා දුන් ක්‍රමවේදයක් හඳුන්වා දී තිබෙනවා.දැනට ලංකාවේ ස්ථාන කිහිපයකම සාර්ථකව ක්‍රියාත්මක වෙනවා. අපිට ටිකක් වැඩි ගණනක් යාවි. වැඩි ගාණක් ගියාට එය උපරිමයෙන්ම කරන්නත් බලාපොරොත්තු වෙමින් තාක්ෂණසේවා නිලධාරි මහතාටත් කිව්වා මේ සම්බන්ධව වාර්තාවක් දෙන්න කියා. අපට ජල සම්පාදන මණ්ඩලයට ගලි බවුසර් 6ක් පමණයි දැමිය හැක්කේ. නමුත් අපෙන් ගනු ලබන්නේ දෙකකි.එතකොට අපි කොච්චර හොඳට වැඩ කළත් දැන් අපට මේ දිනවල ප්‍රශ්නයක් තිබෙනවා. ගංවතුරට හසුවූ අයගේ වැසිකිළි ඉස දෙන්න එදා සභාව තින්දු කළා.සභාව තින්දු කළ මේවා කළාට අපිට අඳින්න පුළුවන් දවසකට දෙකයි.දවසට දෙක වුණාම මෙයට පිළිතුරක් නැහැ.එම නිසා වැසිකිළි පිරිසිදු කරන ක්‍රමවේදයකුත් ඇති කළ යුතුයි. එය ලක්ෂ අසූවක් විතර වෙනවා.අපට වසර තුනකින් විතර එම මුදල හොයා ගන්න පුළුවනි.ඉන්පසු නගර සභාවට එම මුදල ලැබේනවා. හොඳ ක්‍රමවේදයක් තිබෙනවා. අපි එම සමාගමත් සමඟ සාකච්ඡා කරමින් යනවා. එය සිදු කිරිම සම්බන්ධයෙන්.

**ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමා ඔය අපද්‍රව්‍ය බැහැර කරන ස්ථානයේ ගාලු දිස්ත්‍රික්කයට ආපු යෝජනා ක්‍රමයක්. ඇත්තටම අම්බලන්ගොඩට තමයි මෙය ආවේ.අම්බලන්ගොඩ එහි ඉංජිනේරු මහතා මගේ කල්‍යාණ මිත්‍රයෙක් නිසා මා එය දන්නේ.අම්බලන්ගොඩට එහා සමාන ප්‍රමාණයක් නොතිබුණු නිසා තමයි හික්කඩුවට මෙය ගෙන ගියේ.එතකොට ඒ අයට කියන්න පුළුවන්ද අම්බලන්ගොඩට දෙන්නේ දෙකයි , තුනයි , එකයි කියා.මොකක්ද හේතුව.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

දැන් මුළු දිස්ත්‍රික්කයේම නේ . ගාල්ල නගර සභාවෙන් එනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, අපිට ලිඛිතව ගන්න පුළුවන් නම් හරි.මොකද මා දකිනවා දිනකට හත්වතාවක් පුද්ගලික බවුසරය යනවා.මොකට යනවාද කොහේ යනවාද කියා දන්නේ නැහැ.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

පුද්ගලික බවුසර් ටික මට පෙනෙන හැටියට මෙතැනට යන්නේ නැහැ. මගට දමන්නේ.

**ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**

එක විශාල බරපතල ප්‍රශ්නයකි.අනික් එක නගර සභාවේ බවුසරයක් තියෙද්දි එය පාවිච්චි කරපු එක ඊටත් වඩා වරදක් වෙනවා.අපරාදයක් වෙනවා.අනිත් පැත්තෙන් නගර සභාවට අපට තිබෙන අවස්ථාව ඒ අය පාවිච්චි කරනවාද කියා සොයා බලන්න.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

නැහැ .එම යන්ත්‍රයේ දවසකට පිරිපහදු කරන්න පුළුවන් උපරිම ගලි ලෝඩ් 6ක් පමණයි.

**ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, ඕක පටන් ගත්ත කාලේ මෙහෙන් ගලි ලෝඩ් 20ක් ගියත් භාර ගත්තා. එහෙම නීති රීති තිබුණේ නැහැ.දැන් මා දන්නේ නැහැ පස් තැන්පත්වී තිබිලාද පිරිපහදු වෙන්නේ නැද්ද කියා.ඒ හන්දා ලිඛිතව ලබා ගන්න. අපට අයිතියක් තිබෙනවා එය දැන ගන්න.

**ගරු නගර සභා මන්ත්‍රී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්**

ගරු සභාපතිතුමනි, මේ වැසිකිළි ගැන කතා කර නිසා කියන්නේ. අපි කාන්තාවෝ බොහොම කැගහලා වැසිකිළියක් හදා ගත්තා පාවිච්චි කරන්න. පළමුව අපේ එම වැසිකිළිය හරියට හදන්න. එයට යන්න බැහැ සාරියක් ඇඳගෙන. වතුර හැමතැනම.එතැන වතුර ගලනවා. ඔබතුමා දන්නේ නැතිව ඇති.පාවිච්චි කරන්න බැහැ. ඉක්මනටම වැසිකිළියක් හදා දෙන්න.ලක්ෂ 4කට වැඩියේ වියදම් කර හදන ලද වැසිකිළියට තවම හරියට යන්න බැහැ.කනගාටු වෙනවා ඇත්තටම.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

තාක්ෂණසේවා නිලධාරින් බලන්න ඇත්තටම.

**ගරු නගර සභා මන්ත්‍රී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්**

අපට තියෙන අයිතිවාසිකමක්. එය රැක දෙන්න.නැතිනම් අපි මානව හිමිකම් නඩුවක් දමනවා. අපේ අත්‍යවශ්‍ය කටයුතු කරගන්න ඉඩ දෙන්නේ නැහැ කියා.

**තීරණය -**

අම්බලන්ගොඩ බස්නැවතුම්පොළ පොදු වැසිකිළියේ අළුත් වැඩියා කටයුතු සිදු කිරිමෙන් පසු ටෙන්ඩර් කිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**03.15 අම්බලන්ගොඩ නගර සභාවේ බස්නැවතුම්පොළ මගී ආවරණ සහිත කොටස බදුදිම සම්බන්ධ බදු ගිවිසුම සභාගත කරන ලදී.**

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

අම්බලන්ගොඩ නගර සභාවේ බස්නැවතුම්පොළ මගී ආවරණ සහිත කොටස මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියට බදු දිම සම්බන්ධ ගිවිසුම සභාවේ අනුමැතියට ඉදිරිපත් කරනවා.දැනට මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියෙන් බදු මුදලක් ගෙවන්න ඕන. බස්නැවැත්වීම සම්බන්ධයෙන්.එය මෙතෙක් කල් ගෙවා තිබුණේ ගිවිසුමකින් තොරවයි. එම නිසා මාර්ගස්ථ මගි ප්‍රවාහන අධිකාරිය විගණන විමසුමට ලක්වෙලා තිබෙනවා ගිවිසුමකින් තොරව මුදල් ගෙවීම. ඉල්ලිමක් කර තිබෙනවා ගිවිසුම් ගත වෙන්න . අපි ඉතිරි මුදල් ගෙවන්නම් කියා. ඒ අනුව ගිවිසුම් ගත වෙන ගිවිසුම තමයි ඉදිරිපත් කර තිබෙන්නේ.ඒ අනුව එය අනුමත කරන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**
අර 10% අයකරනවාද?ගෙවාපු නැති කාල වල ඒවාත්

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

ඒවා අයකරනවා. නැතිනම් බස්ටික නතර කරනවා කාලයකදි.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, අසනීප වෙලා ගරු මන්ත්‍රීවරයෙක් රෝගාතුර වෙලා හදිසියේම රෝහල්ගත කළා.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

එය කිවුවා.

**තීරණය -**

අම්බලන්ගොඩ  බස්නැවතුම්පොළ මගී ආවරණ සහිත කොටස බදු දීම සම්බන්ධ ගිවිසුම සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට  ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**03.16 ඩබ්.තමරා රුක්මනි තම දියණිය වන වෙඩිසිංහ ආරච්චිගේ නිශාදි දිනේෂිකා යන අයට තෑගි ඔප්පුවක් මගින් ( 2249 දරණ ) ඉඩම් කැබලි ලබා දීමට ආදාලව 1% ක ගාස්තු වන 36900/= ක මුදල නිදහස් කිරිම සම්බන්ධ ගොණුව සභාගත කරන ලදී.**

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

SD/2019/105 දරණ අනුබෙදුම අනුව එහි අයකළ යුතු 1% ගාස්තුව ලෙස රු.36900/= ක මුදලක් ගෙවන්න ඕන. එම අය විසින් තමන්ගේ දියණියටයි මෙය පවරන්නේ.එම නිසා මෙය නිදහස් කර දෙන්න කියා.එම නිසා එම ඔප්පුවේ 1% ගාස්තු නිදහස් කිරිමට ඉල්ලා සිටිනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්**</u>
ගරු සභාපතිතුමනි, මෙහෙම ඔප්පු ලියන විට හැමෝම මෙහෙම ඉල්ලුවොත් එහෙම අපට හැමෝටම දෙන්න වෙනවානේ.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

නම වෙනස් කිරීමේදි අප එය වරිපණම් ලේඛණයේ සඳහන් කරනවා. මෙන්න මේ නමයි තිබෙන්නේ. වෙනත් නමක් පැමිණි ගමන් මෙම රු.36900/= ක මුදල අයකරනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්**</u>
එහෙම අපි එකඟ වෙනවා  මිසක් නගර සභාවට තිබෙන ආදායමක් අහිමි වෙනවා. අනිවාර්යෙන්ම මෙය ළමයාට යනවා නම් පමණක් මෙම මුදල නිදහස් කරන්න. වෙනත් කෙනෙකුට පවරනවා නම් පමණක් මේ මුදල අය කරන්න.එම අයකරන මුදල අයකරන්න එකඟ වෙනවා.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

එහෙම වුණොත් එම මුදල අයකරනවා.

**තීරණය -**

ඩබ්.තමරා රුක්මනි මිය විසින් තම දියණිය වන වෙඩිසිංහ ආරච්චිගේ නිශාදි දිනේෂිකා යන අයට තෑගි ඔප්පුවක් මගින් ( 2249 දරණ ) ඉඩම ලබා දිමට ආදාලව 1% ක ගාස්තු වන 36900/= ක මුදල නිදහස් කිරිමට සුදුසු බවත්, විකිණිමක් සිදු වුවහොත් එම ගාස්තු නිදහස් නොකිරිම සුදුසු  බවටත්,  ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**03.17 පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ පළාත් පාලනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව 2019/2020 නිලධාරින් සඳහා වන පාඨමාලාව හැදැරිම සඳහා ගරු ලේකම් ආර්.යු.ඩබ්.ගුණවර්ධන මිය සහභාගි කරවිම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ පළාත් පාලනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව 2019/2020 නිලධාරින් සඳහා වන පාඨමාලාවේ අයදුම්පත් කැඳවා තිබෙනවා. එහි මුලික අරමුණ වී ඇත්තේ පළාත් පාලන ක්ෂේත්‍රයේ රාජකාරි කටයුතු කරන නිළධාරින්ට පළාත් පාලන විෂයය ක්ෂේත්‍ර 11ක් යටතේ පළාත් පාලන විෂයය පිළිබඳව පුළුල් දැනුමක් ලබා ගැනීමට හැකි වනසේ එම පාඨමාලාව සැලසුම් කර තිබේ. අප නගර සභාවේ ලේකම් ආර්.යූ.ඩබ්.ගුණවර්ධන මහත්මිය ඉල්ලිමක් කර තිබෙනවා. ඒ සඳහා ගාස්තුවක් ගෙවන්න වෙනවා.රු.60000/= ක මුදලක් ගෙවන්න වෙනවා. ඒ සඳහා සභාවේ අනුමැතිය ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

එය ලබා දෙන්න .ගරු ලේකම්තුමිය කරගෙන යන්න එපායි වැඩ.

තීරණය -

පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ පළාත් පාලනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව 2019/2020 නිලධාරින් සඳහා වන පාඨමාලාව හැදැරිම සඳහා ගරු ලේකම් ආර්.යූ.ඩබ්.ගුණවර්ධන මිය සහභාගි කරවිම සුදුසු බවටත්, එම පාඨමාලා ගාස්තු මුදල වන රු.60000/= ක මුදල ගරු සභාවෙන් ගෙවීම සුදුසු බවටත් , ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**03.18 2020 වර්ෂයට අදාලව තක්සේරු නිවේදන මුද්‍රණය හා බෙදැහැරීම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

2020 වර්ෂයට අදාලව තක්සේරු නිවේදන මුද්‍රණය හා බෙදැහැරීම. 2019.12.31 දින ප්‍රථම සිදු කළ යුතුයි.තක්සේරු දැන්වීම් මුද්‍රණය කර බෙදාහැරිම රාජකාරි කටයුතු වලින් බැහැරව සිදු කරන බැවින් ඒ සඳහා ගෙවීම් වලට අදාලව දපපා/පපාකො/2013/01 දරණ චක්‍රලේඛයට අනුව ගෙවීම අනුමත කරන ලෙස ඉල්ලා සිටිනවා.එය ලබා දෙන්න.

**තීරණය -**

2020 වර්ෂයට අදාලව තක්සේරු නිවේදන මුද්‍රණය හා බෙදැහැරීම දෛනික රාජකාරි කටයුතු වලින් බැහැරව සිදු කරන අතර ඒ සඳහා ගෙවිම් කිරිමට දපපා/පපාකො/2013/01 චක්‍ර ලේඛයට අනුව ගරු අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**04.** **යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න** :- ඇත

**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා විසින් යොමුකරන ලද ප්‍රශ්න**

04.01 අම්බලන්ගොඩ දූව ප්‍රදේශයේ තොටුපල අනවසර ගොඩකිරීම සම්බන්ධව පසුගිය සභාවාරයේදි කරුණු දක්වා ඇති අතර ඒ පිළිබඳව නගර සභාව මේ වන විට ගෙන ඇති විසඳුම් හෝ ක්‍රියා මාර්ග මොනවාද ? යන්න ගරු නගර සභා මන්ත්‍රී සරත් චන්ද්‍ර මහතා විසින් ඉදිරිපත් කරල ලද ලිපිය සභාගත කරන ලදී.

ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා ප්‍රශ්නයක් අසා තිබෙනවා. අම්බලන්ගොඩ දූව ප්‍රදේශයේ අනවසර ඉදිකිරිමක් සම්බන්ධයෙන් කරුණු දක්වන්න. ඒ සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග මොනවාද කියා.මේ සම්බන්ධයෙන් 2018.09.10 ලිපිය පරිදි නාගරික සංවර්ධන අධිකාරියට මේ සම්බන්ධව නීතිමය ක්‍රියාමාර්ග ගන්නා ලෙස දන්වා ලිපි ගොණුව යොමු කර ඇත.ඒ අනුව නාගරික සංවර්ධන අධිකාරිය මඟින් කටයුතු කරනවා ඇති.

04.02 අම්බලන්ගොඩ කෙරමිණිය පොකුණ පාර 108ඒ , ඊ. පත්මාල් ද සිල්වා මහතාගේ ඉඩමේ පිහිටි අනතුරුදායක පොල්ගස ඉවත් කිරීමට නගර සභාව විසින් නිකුත් කර ඇති නියෝගය ක්‍රියාත්මක කරන්නේ කවදාද , එසේ නොකරන්නේ නම් ඒ පිළිබඳ නීතිමය ක්‍රියා මාර්ග වලට එළඹෙන්නේ කවදාද ? ගරු නගර සභා මන්ත්‍රී සරත් චන්ද්‍ර මහතා විසින් ඉදිරිපත් කරල ලද ලිපිය සභාගත කරන ලදී.

ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

අම්බලන්ගොඩ කෙරමිණිය පොකුණ පාර 108ඒ , ඊ. පත්මාල් ද සිල්වා මහතාගේ ඉඩමේ පිහිටි අනතුරුදායක පොල්ගස ඉවත් කිරීමට නගර සභාව විසින් නිකුත් කර ඇති නියෝගය ක්‍රියාත්මක කරන්නේ කවදාද , එසේ නොකරන්නේ නම් ඒ පිළිබඳ නීතිමය ක්‍රියා මාර්ග වලට එළඹෙන්නේ කවදාද ?

ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්
එහෙම දෙයක් ආරංචි වුණේ නැහැ.

ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

නැහැ මේ ප්‍රශ්නයක් අසන්නේ.2013.03.18 දින අනුෂා මහත්මිය විසින් ඉදිරිපත් කර තිබෙන දෙයට අනුව ස්ථානය පරික්ෂා කිරිමේදි ගස කපා ඉවත් කරන්න කියා තිබෙනවා.එයට විරුද්ධත්වය පාලා කරුණු 4ක් ඉදිරිපත් කර තිබෙනවා අනික් පාර්ශවය.ඒ අනුව පරික්ෂණය කරාම තාක්ෂණසේවා නිලධාරි විසින් වාර්තා කරනවා ගස කපා අතුබැඳ ඇති බවයි.තවද අනුෂා මහත්මිය උගුරැස්ස ගසේ දිශාවට ඇති අතුකපා ඉවත් කර ඇති බවත් අංක 01 සඳහන් වූ අනුමත සැලැස්මක් නොමැති බැවින් කටුකොහොල් නොමැති බවත් ඒ පිළිබඳව පුද්ගලිකව දෙපාර්ශවය විසින් විසඳා ගත යුතු බවත් දන්වා සිටිනවා.2015.05.26 දිනෙන් පසු ලිපිගොණුව ක්‍රියාත්මක නොමැති අතර ඒ පිළිබඳ කිසිදු සොයා බැලිමක් පැමිණිලිකාර පාර්ශ්වය 2019.09.03 දක්වා කිසිදු සොයා බැලිමක් වසර 4ක කාලයක් සිදු නොකර තිබෙනවා කියා වාර්තා කර ඇත.ලිපිගොණුවේ 2019.03.18 තමයි මේ ප්‍රශ්නය ඉදිරිපත් කර තිබෙන්නේ.ලිපිගොණුවේ මෙම ගස කපන්න කියා තිබෙනවා.ඊට පසු අනික් පාර්ශ්වය විසින් අභියාචනයක් ඉදිරිපත් කර තිබෙනවා.එම අභියාචනයේ කාරණා 4ක් ඉදිරිපත් කර තිබෙනවා.ඒ අනුව නැවත වරක් තාක්ෂණසේවා නිලධාරි විසින් ස්ථානිය පරික්ෂණයක් සිදු කර තිබෙනවා.අතුකපා බැඳ තිබෙන බව සඳහන් කර තිබෙනවා.ඒ අනුව ලිපි ගොණුව අවසන් කර තිබෙනවා.වසර 4ක්ම ඒ අය විමසිමක් කර නැහැ.ඒ කියන්නේ ඒ අය අවුරුදු 4ක් සැහිමකට පත්වුණා කියා හිතනවා .

**04.03 අම්බලන්ගොඩ ප්‍රදේශයට සේවය සපයන 1919 වාහනයේ ආවරණයක් සැදිමට අවශ්‍ය ඇස්තමේන්තුව මෙතෙක් ඉදිරිපත් වී නැත්තේ ඇයි. එමේ විමට හේතු මොනවාද යන්න ගරු නගර සභා මන්ත්‍රී සරත් චන්ද්‍ර මහතා විසින් ඉදිරිපත් කරල ලද ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අම්බලන්ගොඩ ප්‍රදේශයට සේවය සපයන 1919 වාහනයේ ආවරණයක් සැදිමට අවශ්‍ය ඇස්තමේන්තුව මෙතෙක් ඉදිරිපත් වී නැත්තේ ඇයි. එමේ විමට හේතු මොනවාද? මේ සම්බන්ධව මට වාර්තා කර තිබෙන්නේ ස්ථානිය පරික්ෂණයක් සිදු කර තිබෙනවා.ඒ අනුව සැලසුම් සකස් කර තිබෙනවා. ප්‍රමාණපත් මේ වන විට සකස් වෙමින් පවතිනවා.එය සකස් කළ පසු ඇස්තමේන්තුව පොලිසිය වෙත යොමු කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්</u>**
ගරු සභාපතිතුමනි, වසරක් විතර වෙනවා මෙයට.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

වෙන්නැති. දැන් මෙහෙමයි වෙලා තියෙන්නේ . අපේ රාජකාරියට බැහැරව කරන වැඩක්.මෙය ඇත්තටම කරන්න ඕන ප්‍රාදේශිය ලේකම් විසින්.පොලිසියේ තිබෙන ඇස්තමේන්තු කරන්නේ ප්‍රාදේශිය ලේකම් විසින්. මෙය අපිට ඉදිරිපත් කර තිබෙනවා.අපි පොලිසියට කරනවා.නොකර ඉන්නේ නැහැ.

**04.04 අම්බලන්ගොඩ දුම්රිය පල අසල නගර සභා වෙළඳ සංකීර්ණයේ ජලය බැස යාම පිළිබඳ ගැටළුවක් පසුගිය සභා වාර්තාව ඉදිරිපත් කර ඇත. ඒ පිළිබඳව දැනට ගෙන ඇති ක්‍රියා මාර්ග මොනවාද?**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අම්බලන්ගොඩ දුම්රිය පල අසල නගර සභා වෙළඳ සංකීර්ණයේ ජලය බැස යාම පිළිබඳ ගැටළුවක් පසුගිය සභා වාර්තාව ඉදිරිපත් කර ඇත. ඒ පිළිබඳව දැනට ගෙන ඇති ක්‍රියා මාර්ග මොනවාද? මේ සම්බන්ධව වාර්තාව මහජන සෞඛ්‍ය පරික්ෂක මහතා විසින් මට ඊයේ දිනයේ තමයි ලබා දී තිබෙන්නේ. ඒ අනුව සභා වාරයකදි 4.4 අංකය යටතේ ඉදිරිපත් කර ඇති දුම්රිය පොළ අසල නගර සභා වෙළඳ සංකීර්ණයේ ජලය බැස යාම පිළිබඳ ගැටළුවට අදාල ස්ථානය පරික්ෂා කරන ලදී.ඉහත පරික්ෂණයේදි නිරික්ෂණය වුයේ දුම්රිය පොළ අසල ඒ.ඩබ්. දයාන් මහතාට අයත් ඩබ්.ටී රංජිත් මහතා විසින් පවත්වාගෙන යනු ලබන අමල් සැලුන් හි පිටුපස වැසිජලය බැසයාමට සාදා ඇති කාණුව අවහිර වී ඇති බවයි.වැසි අවස්ථාවලදි ජලය බැස යාමට කණුවක් නොමැති බැවින් වැසි අවස්ථාවේදි ජලය බැස යාම ව්‍යාපාරික ස්ථානයෙන් සිදුවන බව පවසන ලදී.දැනට මෙම කාණුව කැඩි ඇති අතර තාප්පයක් මඟින් අවහිර කර ඇති බව දකින්නට ලැබේ.තාප්පය මඟින් අවහිර වූ කොටස් කඩා ඉවත් කර අවහිර වී ඇති කොටස සැකසුවොත් ගැටළුව විසඳෙනු ඇති බව දන්වා සිටිනවා.ප්‍රශ්නයක් නිසා සාකච්ඡා කරන්න අවස්ථාවක් නැහැ. උත්තර දෙන්න පුළුවනි.

**05. යථා පරිදි කල් දී ඇති යෝජනා :-** ඇත

**05.01 ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා**

**05.01.01 අම්බලන්ගොඩ නගර සභාව සඳහා පහත පරිදි ජේනරේටර් මිලදි ගැනීමට කරන ලද යෝජනාව සභා ගත කරන ලදී.**

- **ආදහනාගාර වලට කිලෝ වොට් 05ක ධාරිතාව**
- **කාර්යාලයට කිලෝවොට් 25ක් හෝ 30ක ධාරිතාව**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අම්බලන්ගොඩ නගර සභාව සඳහා පහත පරිදි ජේනරේටර් මිලදී ගැනීමට යෝජනා කරනවා.

- ආදහනාගාර වලට කිලෝ වොට් 05ක ධාරිතාව
- කාර්යාලයට කිලෝවොට් 25ක් හෝ 30ක ධාරිතාව ඇති ජේනරේටර් මිලිදී ගැනිමට යෝජනා කරනවා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

එය ස්ථිර කරනවා.

තීරණය

අම්බලන්ගොඩ නගර සභාව සඳහා පහත පරිදි ජේනරේටර් මිලදී ගැනීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතිකව සභා අනුමැතිය ලබා දෙන ලදී.

- ආදහනාගාර වලට කිලෝ වොට් 05ක ධාරිතාව
- කාර්යාලයට කිලෝවොට් 25ක් හෝ 30ක ධාරිතාව

**05.01.02 අම්බලන්ගොඩ නගර සභාව සතු පහත අංක දරණ ජංගම ගිණුම්වල ශේෂය වැඩියෙන් පවතින අවස්ථාවන්හිදී ස්ථාවර තැන්පත් වල මුදල් ආයෝජනය කිරිම සඳහාත් මුදල් නොමැති අවස්ථාවල ස්ථාවර තැන්පතු අවලංගු කර මුදල් ලබා ගැනීම සඳහා සභාවේ සභාපති, ලේකම් හා ගණකාධිකාරිට හා ගණකාධිකාරි නොමැති අවස්ථාවල ගිණුම් අංශ ප්‍රධානිට බලය පැවරිම සුදුසු බවට යෝජනා කරනවා**

**01) 035-1-001-2-6295234 දරණ පොදු ගිණුම**

**02) 035100180002102 ප්‍රජා**

**03) 0351001-0-6295876 ප්‍රාග්ධන**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අම්බලන්ගොඩ නගර සභාව සතු ජංගම ගිණුම්වල ශේෂය වැඩියෙන් පවතින අවස්ථාවන්හිදි ස්ථාවර තැන්පත් වල මුදල් ආයෝජනය කිරිම සඳහාත් මුදල් නොමැති අවස්ථාවල ස්ථාවර තැන්පතු අවලංගු කර මුදල් ලබා ගැනීම සඳහා සභාවේ සභාපති, ලේකම් හා ගණකාධිකාරිට හා ගණකාධිකාරි නොමැති අවස්ථාවල ගිණුම් අංශ ප්‍රධානිට බලය පැවරිම සුදුසු බවට යෝජනා කරනවා . එම ගිණුම් අංක 035-1-001-2-6295234 දරණ පොදු ගිණුම, 035100180002102 ප්‍රජා, 0351001-0-6295876 ප්‍රාග්ධන

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

එය ස්ථිර කරනවා.

**තීරණය -**

අම්බලන්ගොඩ නගර සභාව සතු පහත අංක දරණ ජංගම ගිණුම්වල ශේෂය වැඩියෙන් පවතින අවස්ථාවන්හිදී ස්ථාවර තැන්පත් වල මුදල් ආයෝජනය කිරිම සඳහාත් මුදල් නොමැති අවස්ථාවල ස්ථාවර තැන්පතු අවලංගු කර මුදල් ලබා ගැනීම සඳහා සභාවේ සභාපති, ලේකම් හා ගණකාධිකාරිට හා ගණකාධිකාරි නොමැති අවස්ථාවල ගිණුම් අංශ ප්‍රධානිට බලය පැවරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

01) 035-1-001-2-6295234 දරණ පොදු ගිණුම

02) 035100180002102 ප්‍රජා

03) 0351001-0-6295876 ප්‍රාග්ධන

**05.01.03 හින්ඇල පාර හා එස්.ජී.ඒ. සිල්වා මාවත ඉදිකරන ලද කාණු පද්ධති හා බෝක්කු වල මාර්ග අලුත්වැඩියා කටයුතු සිදු කිරිම සම්බන්ධ යෝජනාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

හින්ඇල පාර හා එස්.ජී.ඒ. සිල්වා මාවත ඉදිකරන ලද කාණු පද්ධති හා බෝක්කු වල මාර්ග අලුත්වැඩියා කටයුතු සිදු කිරිම සුදුසු බවට යෝජනා කරනවා.

තීරණය -

හින්ඇල පාර හා එස්.ජී.ඒ. සිල්වා මාවත ඉදිකරන ලද කාණු පද්ධති හා බෝක්කු වල මාර්ග අලුත්වැඩියාව සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**05.01.04 අම්බලන්ගොඩ බස්නැවතුම්පොළේ වහල අලුත්වැඩියා කිරිම සම්බන්ධ කරන ලද යෝජනාව සභාගත කරන ලදි.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

අම්බලන්ගොඩ බස්නැවතුම්පොළේ වහල අලුත්වැඩියා කිරිම සුදුසු බවට යෝජනා කරනවා.

තීරණය -

අම්බලන්ගොඩ බස්නැවතුම්පොළේ වහල අලුත්වැඩියා කිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**05.01.05 බුද්ධ දත්ත මාවත අතුරුමාර්ගය කොන්ක්‍රිට් කිරිම සම්බන්ධ කරන ලද යෝජනාව සභාගත කරන ලදි.**

ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්

බුද්ධ දත්ත මාවත අතුරුමාර්ගය කොන්ක්‍රිට් කිරිම සුදුසු බවට යෝජනා කරනවා.

තීරණය -

බුද්ධ දත්ත මාවත අතුරුමාර්ගය කොන්ක්‍රිට් කිරිම සඳහා සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**05.01.06 අම්බලන්ගොඩ මහජන ක්‍රීඩාංගණයේ ළිඳ ඉදිකිරිම ( NO 01 ) සම්බන්ධ කරන ලද යෝජනාව සභාගත කරන ලදි.**

ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්

අම්බලන්ගොඩ මහජන ක්‍රීඩාංගණයේ ළිඳ ඉදිකිරිම ( NO 01 ) සුදුසු බවට යෝජනා කරනවා

තීරණය -

අම්බලන්ගොඩ මහජන ක්‍රීඩාංගණයේ ළිඳ ඉදිකිරිම ( NO 01 ) සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**05.01.07 අම්බලන්ගොඩ මහජන ක්‍රීඩාංගණයේ ළිඳ ඉදිකිරිම ( NO 02 ) සම්බන්ධ කරන ලද යෝජනාව සභාගත කරන ලදි.**

ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්

අම්බලන්ගොඩ මහජන ක්‍රීඩාංගණයේ ළිඳ ඉදිකිරිම ( NO 02 ) සුදුසු බවට යෝජනා කරනවා.

තීරණය -

අම්බලන්ගොඩ මහජන ක්‍රීඩාංගණයේ ළිඳ ඉදිකිරිම ( NO 02 ) සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**05.01.08 අම්බලන්ගොඩ මහජන ක්‍රීඩාංගණයේ ළිඳ ඉදිකිරිම ( NO 03) සම්බන්ධ කරන ලද යෝජනාව සභාගත කරන ලදි.**

ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්

අම්බලන්ගොඩ මහජන ක්‍රීඩාංගණයේ ළිඳ ඉදිකිරිම ( NO 03 ) සුදුසු බවට යෝජනා කරනවා.

**තීරණය -**

අම්බලන්ගොඩ මහජන ක්‍රීඩාංගණයේ ළිඳ ඉදිකිරිම ( NO 03 ) සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**05.01.09 ඕකන්ද විහාරගොඩ මාවත කාණු පද්ධතිය ඉදිකිරිම ( ඒ.එච්.සෝමරත්න මහතාගේ නිවස අසළ) සම්බන්ධ කරන ලද යෝජනාව සභාගත කරන ලදි.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඕකන්ද විහාරගොඩ මාවත කාණු පද්ධතිය ඉදිකිරීම ( ඒ.එච්.සෝමරත්න මහතාගේ නිවස අසළ) සුදුසු බවට යෝජනා කරනවා.

**තීරණය -**

ඕකන්ද විහාරගොඩ මාවත කාණු පද්ධතිය ඉදිකිරීම ( ඒ.එච්.සෝමරත්න මහතාගේ නිවස අසළ) සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**05.01.10 පතිරාජ පාර පටුමග කොන්ක්‍රීට් පුවරු දැමීම (පුවරු 2ක් පමණි ) සම්බන්ධ කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

පතිරාජ පාර පටුමග කොන්ක්‍රීට් පුවරු දැමීම(පුවරු 2ක් පමණි ) සුදුසු බවට යෝජනා කරනවා.

තීරණය -

පතිරාජ පාර පටුමග කොන්ක්‍රීට් පුවරු දැමීම (පුවරු 2ක් පමණි ) සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**05.01.11 පතිරාජ පාර පටුමග කොන්ක්‍රීට් පුවරු දැමීම (සියළුම පුවරු ) සම්බන්ධ කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

පතිරාජ පාර පටුමග කොන්ක්‍රීට් පුවරු දැමීම( සියළුම පුවරු ) සුදුසු බවට යෝජනා කරනවා.

තීරණය -

පතිරාජ පාර පටුමග කොන්ක්‍රීට් පුවරු දැමීම (සියළුම පුවරු ) සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**05.01.12 පොල්වත්ත පාරේ රත්නගිරි නිවස අසළ කාණු පද්ධතියේ කොන්ක්‍රීට් පුවරු දැමීම සම්බන්ධ කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

පොල්වත්ත පාරේ රත්නගිරි නිවස අසළ කාණු පද්ධතියේ කොන්ක්‍රීට් පුවරු දැමීම සුදුසු බවට යෝජනා කරනවා.

තීරණය -

පොල්වත්ත පාරේ රත්නගිරි නිවස අසළ කාණු පද්ධතියේ කොන්ක්‍රීට් පුවරු දැමීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**05.01.13 හිරිකැටිය පාර කොන්ක්‍රිට් බෝක්කුව සෑදීම (නිලානි මන්ත්‍රීතුමියගේ හෝටලය ලඟ ) සම්බන්ධ කරන ලද යෝජනාව සභාගත කරන ලදි.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

හිරිකැටිය පාර කොන්ක්‍රිට් බෝක්කුව සෑදීම (නිලානි මන්ත්‍රීතුමියගේ හෝටලය ලඟ ) සුදුසු බවට යෝජනා කරනවා.

තීරණය -

හිරිකැටිය පාර කොන්ක්‍රිට් බෝක්කුව සෑදීම (නිලානි මන්ත්‍රීතුමියගේ හෝටලය ලඟ ) සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**05.01.14 හල්වතුර කසළ අංගණයේ කසළ තුනිකිරිම ( D4E යන්ත්‍රය සඳහා) සුදුසු බවට යෝජනා කරනවා.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

හල්වතුර කසළ අංගණයේ කසළ තුනිකිරිම ( D4E යන්ත්‍රය සඳහා) සුදුසු බවට යෝජනා කරනවා.

තීරණය -

හල්වතුර කසළ අංගණයේ කසළ තුනිකිරිම ( D4E යන්ත්‍රය සඳහා) සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**05.01.15 පොල්වත්ත පියසේන ළමා ක්‍රීඩාංගණයේ විදුලි ආලෝක ධාරා වලින් ආලෝකමත් කොට ජනතා අයිතියට පත් කිරිම සම්බන්ධ කරන ලද යෝජනාව සභාගත කරන ලදි.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

පොල්වත්ත පියසේන ළමා ක්‍රීඩාංගණයේ විදුලි ආලෝක ධාරා වලින් ආලෝකමත් කොට ජනතා අයිතියට පත් කිරිම සුදුසු බවට යෝජනා කරනවා.

**තීරණය -**

පොල්වත්ත පියසේන ළමා ක්‍රීඩාංගණයේ විදුලි ආලෝක ධාරා වලින් ආලෝකමත් කොට ජනතා අයිතියට පත් කිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**05.01.16 පනියන්දුව හරස් පාර කාණුව ඉදිකිරිම සම්බන්ධ කරන ලද යෝජනාව සභාගත කරන ලදි.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

පනියන්දුව හරස් පාර කාණුව ඉදිකිරිම සුදුසු බවට යෝජනා කරනවා.

තීරණය -

පනියන්දුව හරස් පාර කාණුව ඉදිකිරිම  සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**05.01.17 තල්ගස්ගොඩ සුදුවැල්ල පෙර පාසැලේ සිවිලීම ඉදිකිරිම සම්බන්ධ කරන ලද යෝජනාව සභාගත කරන ලදි.**

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

තල්ගස්ගොඩ සුදුවැල්ල පෙර පාසැලේ සිවිලීම ඉදිකිරිම  සුදුසු බවට යෝජනා කරනවා.

තීරණය -

තල්ගස්ගොඩ සුදුවැල්ල පෙර පාසැලේ සිවිලීම ඉදිකිරිම  සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**05.01.18 පොල්වත්ත පියවර පෙර පාසල සංවර්ධනය කිරිම  සම්බන්ධ කරන ලද යෝජනාව සභාගත කරන ලදි.**

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

පොල්වත්ත පියවර පෙර පාසල සංවර්ධනය කිරිම සුදුසු බවට යෝජනා කරනවා.

තීරණය -

පොල්වත්ත පියවර පෙර පාසල සංවර්ධනය කිරිම  සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**05.01.19 පටබැඳිගෙදර වත්තෙන් අතුරුමාර්ගයේ කාණු පද්ධතිය සංවර්ධනය කිරිම (කොඩිතුවක්කු මහතාගේ නිවස අසළ ) සම්බන්ධ කරන ලද යෝජනාව සභාගත කරන ලදි.**

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

පටබැඳිගෙදර වත්තෙන් අතුරුමාර්ගයේ කාණු පද්ධතිය සංවර්ධනය කිරිම  (කොඩිතුවක්කු මහතාගේ නිවස අසළ ) සුදුසු බවට යෝජනා කරනවා.

තීරණය -

පටබැඳිගෙදර වත්තෙන් අතුරුමාර්ගයේ කාණු පද්ධතිය සංවර්ධනය කිරිම  (කොඩිතුවක්කු මහතාගේ නිවස අසළ ) සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**05.01.20 අම්බලන්ගොඩ නගර සභා ප්‍රධාන කාර්යාලිය ගොඩනැඟිල්ල අලුත්වැඩියාව පලවන අදියර සිදු කිරිම  සම්බන්ධ කරන ලද යෝජනාව සභාගත කරන ලදි.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අම්බලන්ගොඩ නගර සභා ප්‍රධාන කාර්යාලිය ගොඩනැඟිල්ල අලුත්වැඩියාව පලවන අදියර සිදු කිරිම සුදුසු බවට යෝජනා කරනවා.

තීරණය -

අම්බලන්ගොඩ නගර සභා ප්‍රධාන කාර්යාලිය ගොඩනැඟිල්ල අලුත්වැඩියාව පලවන අදියර සිදු කිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**05.01.21 අම්බලන්ගොඩ නගර සභා මහජන ක්‍රීඩාංගනයේ නැරඹුම් පඩිපෙල ඉදිකිරිම පලමු අදියර සිදු කිරිම සම්බන්ධ කරන ලද යෝජනාව සභාගත කරන ලදි.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අම්බලන්ගොඩ නගර සභා මහජන ක්‍රීඩාංගනයේ නැරඹුම් පඩිපෙල ඉදිකිරිම පලමු අදියර සිදු කිරිම සුදුසු බවට යෝජනා කරනවා.

තීරණය -

අම්බලන්ගොඩ නගර සභා මහජන ක්‍රීඩාංගනයේ නැරඹුම් පඩිපෙල ඉදිකිරිම පලමු අදියර සිදු කිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**05.01.22 එල්.සී. ද සිල්වා මාවත කාණු පද්ධතිය ඉදිකිරිම සම්බන්ධ කරන ලද යෝජනාව සභාගත කරන ලදි.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එල්.සී. ද සිල්වා මාවත කාණු පද්ධතිය ඉදිකිරිම සුදුසු බවට යෝජනා කරනවා.

තීරණය -

එල්.සී. ද සිල්වා මාවත කාණු පද්ධතිය ඉදිකිරිම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**05.01.23 එල්.සී. ද සිල්වා මාවත කාණු පද්ධතිය ඉදිකිරිම( තේ.ඩබ්. සේනක මහතාගේ නිවස අසළ ) සම්බන්ධ කරන ලද යෝජනාව සභාගත කරන ලදි.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එල්.සී. ද සිල්වා මාවත කාණු පද්ධතිය ඉදිකිරිම( තේ.ඩබ්. සේනක මහතාගේ නිවස අසළ ) සුදුසු බවට යෝජනා කරනවා.

තීරණය -

එල්.සී. ද සිල්වා මාවත කාණු පද්ධතිය ඉදිකිරීම( තේ.ඩබ්. සේනක මහතාගේ නිවස අසළ ) සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**05.01.24 පතිරාජ මාර්ග සති පාර ABC යොදා සංවර්ධනය කිරීම සම්බන්ධ කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

පතිරාජ මාර්ග සති පාර ABC යොදා සංවර්ධනය කිරීම සුදුසු බවට යෝජනා කරනවා.

තීරණය -

පතිරාජ මාර්ග සති පාර ABC යොදා සංවර්ධනය කිරීම සඳහා සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**05.01.25 කළුවඩුමුල්ල ක්‍රිඩාංගනයේ පස් ඇතිරීම සම්බන්ධ කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

කළුවඩුමුල්ල ක්‍රිඩාංගනයේ පස් ඇතිරීම සුදුසු බවට යෝජනා කරනවා.

තීරණය -

කළුවඩුමුල්ල ක්‍රිඩාංගනයේ පස් ඇතිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**05.01.26 පොල්වත්ත ක්‍රිඩාංගනයේ පස් ඇතිරීම සම්බන්ධ කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

පොල්වත්ත ක්‍රිඩාංගනයේ පස් ඇතිරීම සුදුසු බවට යෝජනා කරනවා.

තීරණය -

පොල්වත්ත ක්‍රිඩාංගනයේ පස් ඇතිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**05.01.27 පොල්වත්ත ජලාශයේ සහ ඇල මාර්ගයේ මඩ ඉවත්කර නඩත්තු කිරීම සම්බන්ධ කරන ලද යෝජනාව සභාගත කරන ලදී.**

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

පොල්වත්ත ජලාශයේ සහ ඇල මාර්ගයේ මඩ ඉවත්කර නඩත්තු කිරීම සුදුසු බවට යෝජනා කරනවා.

තීරණය -

පොල්වත්ත ජලාශයේ සහ ඇල මාර්ගයේ මඩ ඉවත්කර නඩත්තු කිරිම  සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී  නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**05.01.28 මහ අම්බලන්ගොඩ පාරේ සි/ස විදුලි පුද්ගලික සමාගම අසළ කාණුව ( In front of the LECO New Building ) සකස් කිරිම සම්බන්ධ කරන ලද යෝජනාව සභාගත කරන ලදි.**

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

මහ අම්බලන්ගොඩ පාරේ සි/ස විදුලි පුද්ගලික සමාගම අසළ කාණුව ( In front of the LECO New Building ) සකස් කිරිම සුදුසු බවට යෝජනා කරනවා.

**තීරණය -**

මහ අම්බලන්ගොඩ පාරේ සි/ස විදුලි පුද්ගලික සමාගම අසළ කාණුව ( In front of the LECO New Building ) සකස් කිරිම  සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු සභාපති කමල් වැල්ලගේ  මහතා විසින් ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

මිළඟට 05.02.01 යටතේ ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජානාව.

**05.02 ගරු නගර සභා මන්ත්‍රී ජී සරත් ශ්‍රී ලාල් මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා**

**05.02.01 කරිත්තකන්ද ග්‍රාමසේවා වසමට අයත් පැරණි පුස්තකාල ගොඩනැඟිල්ලට අයත් භූමි භාගයෙහි නව තෙමහල් විශේෂ පහසුකම් සහිත වෙළඳ ගොඩනැඟිල්ලක් ඉදිකල යුතු බවට,  යෝජනා කරනවා**

<u>**ගරු නගර සභා මන්ත්‍රී ජී සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, කරිත්තකන්ද ග්‍රාමසේවා වසමට අයත් පැරණි පුස්තකාල ගොඩනැඟිල්ලට අයත් භූමි භාගයෙහි නව තෙමහල් විශේෂ පහසුකම් සහිත වෙළඳ ගොඩනැඟිල්ලක් ඉදිකල යුතු බවට, මා යෝජනා කරනවා

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා කතා කරමින්**</u>

එය ස්ථිර කරනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ජී සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, මා මෙයින් අදහස් කළේ මෙම ස්ථානය අපේ  පැරණි බැඩ්මින්ටන් ක්‍රීඩාංගණය ඇති පරණ ගොඩනැඟිල්ල. මෙය අපේ නගරයේ වෙළඳ හා වානිජ්‍ය කටයුතු සඳහා තිබෙන මරමස්ථාන වලින් හොඳම ස්ථාන වලින් එකක්. එහි අධික වෙළඳ වටිනාකමක් තිබෙනවා. අද වන විට ඉතා සුළු මුදලකට බැඩ්මින්ටන් ක්‍රීඩාංගණය සඳහා බඳු දී තිබෙනවා. ඉතා විශාල ආදායමක් ලබන්නේ

නැහැ.ඒ වගේම රථ ගාලක් සඳහා ලබා දී තිබෙනවා එක කොටසක්.එයිනුත් විශාල ආදායමක් ලබන්නේ නැහැ.මා මීත් අදහස් කළේ, එතැනට ගිහින් මේ පරිශ්‍ර පරික්ෂා කර බැලූ විට ඔබතුමාට පෙනේවි ධර්මාශෝක විද්‍යාලයේ ප්‍රාථමිකයේ සම මට්ටමේ ගොඩනැඟිලි ඉදිකර තිබෙන්නේ.අනෙක් පැත්තෙන් ජේමසිරි බේකරියේ ගොඩනැඟිල්ලක් ඉදිකර තිබෙනවා පොළොව මට්ටමේ.එතකොට අපේ ගොඩනැඟිල්ල විතරයි පොළෝ මට්ටමේ තිබෙන්නේ. ධර්මාශෝක විද්‍යාලයේ පොළෝ මට්ටමට අපිට එම ගොඩනැඟිල්ල ඉදිකරන්න පුළුවන්නම් පාර මට්ටමට සම කිරීමේදී ඉතාම ලස්සන රථ ගාලක් ඉදිකරන්න පුළුවනි.වාහන 20ක් 30ක් ගාල් කළ හැකි. පාරත් සම මට්ටමේ තිබෙනවා. මොකද ජේමසිරි බේකරියට යාම සඳහා අඩි 10ක පාරක් එතැන තිබෙනවා.එතකොට පාරක් සඳහා ඉඩමක් වෙන්කිරීම අවශ්‍ය වන්නේ නැහැ.කෙළින්ම ඒ ගොඩනැඟිල්ලේ රථ ගාල සඳහා එම පාර පාවිච්චි කරන්න පුළුවනි.ඒ අනුව පළමු මහල වෛද්‍ය වරුන් සඳහා චැනල් සේවාවක් ඉදිකිරීම තමයි මා අදහස් කරන්නේ.කිසිම කාරණාවකට නෙමේ. වෛද්‍යවරුන්ට ලෙඩුන් බැලීමට.එක එක ආකාරයට බඳු දුන්නොත් අපි බලාපොරොත්තු වූ දේ ඉෂ්ඨ වෙන්නේ නැහැ.හැබැයි අපිට අත්තිකාරම් මුදල් ලෙස එම මුදල් ලබා ගෙන මෙම ගොඩනැඟිල්ල ඉදිකිරීමට අවස්ථාව තිබෙනවා.ඒ වගේම ප්‍රධාන අරමුණ වෙලා තිබුණ බැඩ්මින්ටන් ක්‍රීඩා කරන දරුවන් සඳහා ක්‍රීඩාගාරයක් සඳහා එහි දෙවැනි මහල අපට ලස්සනට  ලබා දීමේ හැකියාව තිබෙනවා.මා හිතන්නේ මෙය යම් ප්‍රමාණයක මුදලක් යන කර්තව්‍යයක් වුණත් අපට පළමු මහල ඉදිකිරීමට ලබා ගන්නා අත්තිකාරම් මුදලින් වලින් ගොඩක් දුරට එම ගොඩනැඟිල්ල ඉදිකළ හැකි බව මා විශ්වාස කරනවා.එම නිසා මා මේ සභාවට යෝජනා කර සිටිනවා. අනාගතය දිහා බලලා මේ ස්ථානයේ මේ ගොඩනැඟිල්ල ඉදිකළ යුතු බව.

__ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී. ලක්ෂ්මී හේමන්තා මෙනවිය කතා කරමින්__

ගරු සභාපතිතුමනි, ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා කරන ලද යෝජනාවට පලමුව එතුමාට ස්තුතිය පල කරනවා.ඇත්තටම ඔය කියන ස්ථානය අම්බලන්ගොඩ නගරයේ ඉතා වටිනා කියන ස්ථානයකි.එය මිල අධික වටිනාකමක් තිබෙන භූමි භාගයකි.එමනිසා එම ස්ථානයේ දෙමහල් හෝ තෙමහල් හෝ තෙමහල් වුණත් කමක් නැහැ. අපට හදා ලබා ගන්න පුළුවන් විදියට අපි හදලා ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කිවූ පරිදි පහත මහල කොටස බදු දීලා එයින් අපට ඉතිරි කොටස හදා ගන්නත් පුළුවන් වෙවී.රජයෙන් හෝ බැංකුවකින් හෝ ඒ වගේ ක්‍රමයක් හදලා ඒ සම්බන්ධව කරන්න කියා මා ප්‍රකාශ කරනවා.

__ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්__

ගරු සභාපතිතුමනි,කවදා හරි දිනයක අම්බලන්ගොඩ නගරයෙන් ජාත්‍යාන්තරයට බැඩ්මින්ටන් ක්‍රිඩාංගණයෙන් ක්‍රීඩකයන් බිහිකරන ලද වැඩකි.ඉතිං එහෙම එකේ සාප්පු සංකිර්ණය නොගහ අපි පුළුවන් තරම් ඒ බැඩ්මින්ටන් ක්‍රිඩාංගණය ලොකු කරලා උඩ තට්ටුවේ එම උස තබා එම හදන දෙයක් ඊළඟ තට්ටුවේ ඉදිකිරීමෙන් අපට ආදායමක් ගත හැකිය.ඉතිරි කොටස සඳහා යම්කිසි බදු දීම කළ හැකිය.ඒ සඳහා අපට ජාත්‍යාන්තර ණයක් හරි ලංකාවෙන් ලබා දෙන ණය මුදලක් හරි ගෙන මෙය සංවර්ධනය කරන ලෙස මා ඔබතුමාට යෝජනා කරනවා.මා හිතන්නේ නැහැ ඒ සඳහා අපි කිසි කෙනෙකුගේ විරෝධතාවයක් ඇති වෙයි කියා.එහෙම කරන්න පුළුවන් නම් ඒ සඳහා ඔබතුමා අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටිනවා.

__ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්__

ගරු සභාපතිතුමනි,තව වසර 50ක් ඉදිරියට හිතලා මේ සංවර්ධන යෝජනාවක් ලෙස අපේ ප්‍රණාමය හිමි විය යුතුයි.මෙය ඔය බැඩ්මින්ටන් ක්‍රීඩාංගණයත් සුරකෙන සේ තමයි ඉදිවිය යුත්තේ.වෙළඳ නගරයේ ප්‍රවර්ධනයක් ඉදිකිරීමෙන් ඔය කටයුත්ත සිදු කිරීම කළ යුතු බවටයි අපේ අදහස.

**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි,ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා විසින් කරන ලද යෝජනාව ඉතා හොඳ කලෝචිත යෝජනාවක් ලෙස මාත් දකිනවා.මොකද මේ ස්ථානය අම්බලන්ගොඩ නගරයේ තිබෙන හොඳ ස්ථානයකි.පාර පහළ මට්ටමේ රථ ගාලක් සඳහාත්. අම්බලන්ගොඩ නගරයේ දැන් රථ ගාල් නැතිවෙමින් පවතින එක.ඊළඟ මහල හෝ මහල් කිහිපයක් බැඩ්මින්ටන් ක්‍රීඩවට යොදවන හැටියට මාත් යෝජනා කරනවා.එම මහතාගේ යෝජනාව හොඳ යෝජනාවක් හැටියට මා පිළි ගන්නවා.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි,කරිත්ත කන්ද ග්‍රමසේවා වසමට අයත් ඒ පැරණි බැඩ්මින්ටන් ක්‍රීඩාංගණය නවීකරණය කරලා වෙළඳ වටිනාකමක් ඇති ඒ කඩ කාමර ඉදිකරලා ගොඩනැගිල්ලක් ඉදිකිරිමට ගෙන ආ යෝජනාව ඉතාමත් හොඳ යෝජනාවකි.අනික් ගරු මන්ත්‍රීවරුත් ප්‍රකාශ කළ ආකාරයට වාහන නතර කිරිම තමයි වැදගත්ම දේ. අම්බලන්ගොඩ නගරයේ රථ ගාල් නැති නිසා.මා හිතන්නේ නගර සභාවට ගොඩක් ආදායමක් ලබා ගැනීමට පුළුවන් ඒ හරහා.ඒ වාහන අංගනයක් හා ඒ වගේම බැඩ්මින්ටන් ක්‍රීඩාවත් රැඳි පවතින්න ඕන.එමනිසා එයටත් දිය හැකියි . දැනටත් දි තිබෙනවා එම ගොඩනැගිල්ල.එයටත් ඉඩපහසුකම් සලස්වා වෙළඳ වටිනාකම් ලබා දි අපට මුදල් ලබා ගත හැකි ස්ථානයකි. ඒ අනුව කටයුතු කරන්න කියා අපි ඉල්ලා සිටිනවා. මේ යෝජනාව ගෙන එම පිළිබඳව අපි එතුමාට ස්තුතිය පල කරනවා.මා හිතන්නේ මෙයට විශාල මුදලක් යා හැකියි කිවු පරිදි.අත්තිකාරම් මුදලක් එහෙම ලබා ගත හැකියි වෙළඳ වටිනාකමක් තිබෙන නිසා.ප්‍රතිපාදනයක් හෝ ලබාගෙන එය ඉටු කරන්න කියා ඉල්ලා සිටිනවා.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, එතුමා ගෙන එනු ලැබූ යෝජනාව ඉතා හොඳ යෝජනාවකි. මොකද අම්බලන්ගොඩ අප සතුව රථගාල් නොමැති වීම මූලික ගැටළුවක් නිසා.මෙය සභාවට ලොකු මුදලක්. කිවු පරිදි අත්තිකාරම් මුදල් ගෙන මෙය ඉටු කිරිමට හැකි වෙයි කියන එකයි මගෙත් අදහස.

**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි,මා බෙහෙවින් ස්තුති වන්ත වෙනවා මා ගෙන ආ යෝජනාවට ගරු මන්ත්‍රීවරු අදහස් දැක්වීම සම්බන්ධව.එ සමඟම මා කියන්න කැමතියි පාසල් සම්බන්ධව කතා කරන විට බැඩ්මින්ටන් ක්‍රීඩාවේදි අම්බලන්ගොඩ නගරයේ වෙන වෙනම ගෘහස්ථ ක්‍රීඩාංගන සඳහා භූමි භාග වෙන්කර තිබෙනවා.කුලරත්න විද්‍යාලයට අක්කර 5කුත්, ධර්මාශෝක විද්‍යාලයට අක්කර 6කුත් හල්වතුර ප්‍රදේශයේ එම භූමි භාග වෙන් කර තිබෙනවා.ඊට අමතරව බැඩ්මින්ටන් ක්‍රීඩාව සඳහා ශාලාවක් ලබා දී තිබෙනවා නගරයේ ජනතාවගේ දූ දරුවන්ගේ ක්‍රීඩා කටයුතු සිදු කිරිම සඳහා.මා මින් අදහස් කළේ මෙය මර්මස්ථානයක්. බරපතලම ප්‍රශ්නය වන්නේ රථ ගාලක් නොමැති කමය. අද වන විට ඊට වඩා එහා ගිය බරපතල කාරණාවකට මුහුණ දෙනවා.ඒ කියන්නේ වෛද්‍යවරුන් හමුවීමට එන රෝගීන් ගේ ස්ථානයක් බවට පත්වෙලා තිබෙනවා එම හංදියේ.එමනිසා තමයි මා වැඩියෙන්ම මෙම යෝජනාව කරනු ලැබුවේ.රථගාලක් සමඟ රෝගීන් පරික්ෂා කරන වෛද්‍ය මධ්‍යස්ථානයක් බවට පත්කළ හැකියි මෙම ස්ථානය.එම නිසා මේ ගරු සභාවේ මන්ත්‍රීවරුන්ට ඒ ගැනත් හිතන්න කියනවා. ටම් සරලසඅම් හදනවාය අනාගතය ගැනත් හිතලා ඕන හදන්න.එම නිසා සියළුම මන්ත්‍රීවරුන්ට ස්තුති වන්ත විය යුතුයි.

තීරණය -

ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා විසින් කරිත්තකන්ද ග්‍රාමසේවා වසමට අයත් පැරණි පුස්තකාල ගොඩනැඟිල්ලට අයත් භූමි භාගයෙහි නව තෙමහල් විශේෂ පහසුකම් සහිත වෙළඳ ගොඩනැඟිල්ලක් ඉදිකල යුතු බවට යෝජනා කළ අතර, එම යෝජනාව සම්මත කිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**05.03** ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමිණිය මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා

05.03.01 බෞද්ධ වෙහෙර විහාරස්ථානයන්හි බිම ඇතිරීමට මුහුදු වැලි ලබා ගැනීම බලවත් දුෂ්කර කාර්යයක් වී ඇති බැවින් එක් ආයතනයකට කියුබ් 02ක ප්‍රමාණයක්වත් අපහසුතාවයකින් තොරව ලබා ගැනීමට ක්‍රමවේදයක් සකසන ලෙසට වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවට දැන්විය යුතු බවට ගරු සභාවට යෝජනා කරනවා.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මීළඟට ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමිණියගේ මහතා ඉදිරිපත් කරන යෝජනාව.

<u>ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමිණිය මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, අපට මෙවැනි යෝජනාවක් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳ බොහොම ස්තුතියි. බෞද්ධ වෙහෙර විහාරස්ථානයන්හි බිම ඇතිරීමට මුහුදු වැලි ලබා ගැනීම බලවත් දුෂ්කර කාර්යයක් වී ඇති බැවින් එක් ආයතනයකට කියුබ් 02ක ප්‍රමාණයක්වත් අපහසුතාවයකින් තොරව ලබා ගැනීමට ක්‍රමවේදයක් සකසන ලෙසට වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවට දැන්විය යුතු බවට ගරු සභාවට යෝජනා කරනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>

එම යෝජනාව මා ස්ථිර කරනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමිණිය මහතා කතා කරමින්</u>

අපි මින් අදහස් කළේ බෞද්ධයාගේ ශ්‍රාද්ධාව වැඩිකිරීමට හේතු වෙනවා මේ සුදු වැලිතලාව. අපේ නගරයේ ආසන්නයේම කොතරම් වැලිතරයක් තිබුණත් මෙන්න මේ දැඩි නීතිරීති නිසා අපේ විහාරස්ථාන වලට වැලි ටිකක් ලබා ගන්න බැරිවෙලා තිබෙනවා.අපි දකිනවා මේ වෙහෙරවල මැටි කට්ට පැදිලා කුරුරු කෝප හැඟීම් මතුවෙලා තිබෙනවා වැලි නැති නිසා. අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා තත්ත්වය තවත් සුමට බවට පත් කරවලා වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවට දන්වලා දැඩි අවශ්‍යතාවයක් හැටියට අපේ වෙහෙර විහාර වල ගරු ස්වාමීන් වහන්සේලාට වැලි දෙකක් වත් ලබා ගැනීමටයි මෙයින් අපේ මුක්ත අදහස වුණේ.ඒ සම්බන්ධව අපි ඔබතුමාගේ අවධානය යොමු කරන ලෙස පතනවා.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, එතුමා ගෙන ආ යෝජනාව ඉතා හොඳ යෝජනාවකි.ඉදිරි මාස දෙක ඇතුළත ගරු මන්ත්‍රීවරුන්ට අදාල විහාරස්ථාන වල ස්වාමීන් වහන්සේලා කතා කරනවා කඨින පිංකම් සඳහා වැලි ලබා ගැනීමට.එතුමා ගෙන ආ යෝජනාවට ඔබතුමා අවධානය යොමු කරන්න.අපටත් කතා කරනවා පන්සලේන්. හැම ගරු මන්ත්‍රීවරයෙකුටම කතා කරනවා.කඨින පිංකම නිසා වැලි ලබා දෙන්න කියා. එම නිසා එය ඉෂ්ඨ කරන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, එකට මෙහෙම කලාම හරි.ඔබතුමා ප්‍රාදේශිය ලේකම්ලියා පොලිසියට පිටපත් දැම්මාම හරි. එතකොට අදාල විහාරස්ථානයේ ස්වාමින් වහන්සේගේ ඉල්ලිමට අනුව ලබා දිය හැකියි. එහෙම වෙන වෙන අයත් ඉල්ලීමට ගියාම ප්‍රශ්නයක් වෙන නිසා ප්‍රාදේශිය ලේකම්තුමියත් , පොලිසියත් දැනුවත් කරලා නායක ස්වාමින් වහන්සේගේ ඉල්ලිමට ප්‍රාදේශිය ලේකම්තුමියගේ අනුමැතියෙන් මෙය ක්‍රමවත්ව කළානම් හරි. මොකද හොඳ ඉල්ලිමක් කළේ. විහාරස්ථාන වලට පොඩි ප්‍රශ්නයක් තිබෙනවා.එතකොට හැම විහාරස්ථාන වලටම ලබා ගෙන අවශ්‍ය ස්ථාන වලට දැමිය හැකියි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි,ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා ගෙනා ආ යෝජනාව ඉතා හොඳ යෝජනාවකි.අම්බලන්ගොඩ බෞද්ධ පුරවරයේ බෞද්ධයන් විදියට ගරු කළ යුතුව තිබෙනවා.විහරාස්ථාන 13කට වැඩියේ ස්ථාපනය වෙලා තිබෙනවා අම්බලන්ගොඩ නගරයේ.අඩුම වශයෙන් වාර්ෂිකවත් මේ සුදු වැලිතලාවන් මාරු කිරීමේ අවශ්‍යතාවයක් පැන නගිනවා.මොකද මේ අපේ ජනතාව තමයි එය ගිහින් කිලිටි කර එන්නේ.එතකොට විහාරස්ථානයක් කියන්නේ වෙහෙරක් , බෝධියක් , බුදුන් වැඩ සිටින ස්ථානයකි.එතකොට එම ස්ථානය පරම පූජනිය විදියට තිබිය යුතුයි.එම නිසා මේ මුහුදු වැලි මඟින් මේ පිරිසිදු කම ආරෝපනය වෙනවා.ඒ වගේම සංකේතවත් වෙනවා.එම නිසා එය අත්‍යවශ්‍ය කාරණාවකි.අද වන විට ගරු නායක ස්වාමින් වහන්සේලාටත් ප්‍රශ්නයක් වෙලා තිබෙනවා.එමනිසා මෙතුමාගේ යෝජනාවත් ඉතාමත් කලෝචිතයි.එමනිසා ඒ යෝජනාව සක්‍රිය කිරිමට අවශ්‍ය ඒ ස්ථාන වලට දන්වලා ඒ විහාරස්ථාන වලට අවශ්‍ය වැලි ලබා ගැනීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි,කවදාත් හොඳ යෝජනා ගෙන එන අපේ ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා . එමනිසා ඒ පූර්ණ සහාය එතුමාට ලබා දෙනවා.නිත්‍යානුකුල තත්ත්වයන් අනුගමනය කර මෙය කරන්න. මෙතුමාට පුළුවනි මෙය කරන්න.කරාවිද දන්නේ නැහැ. එය කරන්න කියා ඉල්ලා සිටිනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මේ සම්බන්ධව වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවට හා ප්‍රාදේශිය ලේකම්වරයාට දැනුම් දිලි අවශ්‍ය කටයුතු සිදු කරන්න.

**තීරණය -**

ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් තෙරමිණියගේ මහතා විසින් ඉදිරිපත් කරනු ලැබූ බෞද්ධ වෙහෙර විහාරස්ථානයන්හි බිම ඇතිරිමට මුහුදු වැලි ලබා ගැනීම බලවත් දුෂ්කර කාර්යයක් වී ඇති බැවින් එක් ආයතනයකට කියුබ් 02ක ප්‍රමාණයක්වත් අපහසුතාවයකින් තොරව ලබා ගැනීමට ක්‍රමවේදයක් සකසන ලෙසට කරන ලද යෝජනාවට අනුව වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවටත් , ප්‍රාදේශිය ලේකම් කාර්යාලයටත් දන්වා යැවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ් අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ  මහතා විසින් ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා විසින් ඉදිරිපත් කරන යෝජනාව.

**05.04 ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා**

05.04.01 අම්බලන්ගොඩ නගර සභාවට අයත් මාර්ග වලින් නිවාස වලට පිවිසෙන ස්ථාන ( ගේට්ටු ) බොහොමයක බෑවුම මාර්ගය මත සකස් කිරිම නිසා මාර්ග පටුවීම සම්බන්ධව මෙම සභාවට යෝජනා කරනවා

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

අම්බලන්ගොඩ නගර සභාවට අයත් මාර්ග වලින් නිවාස වලට පිවිසෙන ස්ථාන ( ගේට්ටු ) බොහොමයක බෑවුම මාර්ගය මත සකස් කිරිම නිසා මාර්ග පටුවීම සම්බන්ධව මෙම සභාවට යෝජනා කරනවා

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මීට කලිනුත් මා මේ ගැන කතා කළා සභාවේ. ගරු සභාපතිතුමා එකඟ වුණා අම්බලන්ගොඩ පටබඳිමුල්ලෙන් පටන් ගන්නවා කියා.තවම එහෙම පටන් ගෙන නැහැ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

පටබැඳිමුල්ලෙන් පටන් ගන්නේ නැහැ.මාගේ කොට්ඨාශයේ එහෙම තිබ්බාට කමක් නැහැ.එහෙම කරදරයක් නැහැ.අපේ කොට්ඨාශයේ එහෙම කඳ සහිත ඒවා නැහැ. හොඳට තිබෙනවා . ඒවා තිබෙන්නේ ඔබතුමාගේ අල්ලපු ගෙදර.මේ යෝජනාව අල්ලපු නිවසේ ප්‍රශ්නයකි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

එම නිවසේ එක මා කියා කැඩේව්වා.මා ගෙදරට ගිහින් කියලා ඔබතුමා වරදක් කරන්නේ කියා කැඩේව්වා.මෙය පොදුවේ ගත්තාම කඳකර ප්‍රදේශවල එහෙම ප්‍රශ්නයක් තිබෙනවා.ඉතිං එය හසාහයට කරුණක් නෙමේ.පාරක වාහනයක් යනවා නම් අඩි 4ක් අල්ලා තිබිම. උදාහරණයක් වශයෙන් ඉතාලියා.පාර අල්ලා තිබෙන්නේ අඩි 4ක් 5ක්. එක වෙනම ප්‍රශ්නයකි.නමුත් සැබැවයි බොරුවයි කියන්නේ දෙකක්.එය පැහැදිලිව අපි දකින්න ඕන.අපි නගර සභාව හැටියට ජනතාව අපි මෙතැනට එවා තිබෙන්නේ ඔවුන්ගේ අයිතිවාසිකම් රකලා දෙන්න.අපි ඉන් ලිස්සා යනවා නම් එය අපේ වගකීම නෙමේ.එම නිසා නගර සභාවක් හැටියට මේ කටයුත්තේදි හරියට කටයුතු කරන්න.මා වැඩිදුර කතා කරන්න යන්නේ නැහැ. ඔබතුමාලාගේ රැස්විමක් තිබන නිසා.මෙන්න මේ කාරණයත් කිව යුතුයි.අපි මේ යෝජනා ඉදිරිපත් කරනවා. ඊටපසු ඒකමතිකව සම්මත වෙනවා.ඒ අදාල ස්ථානයට එම ලිපිය ගියාද ? එම ලිපියේ පිටපතක් ලැබිය යුතුයි අපිට සතියක් ඇතුළත.මොකද මා දන්නවා පසුගිය එහෙම යෝජනා පසුගිය දිනවල ගිහින් නැහැ.එතකොට ඊට අදාල ලිපියේ පිටපතක් මට ලැබෙන්න ඕන.ලේකම්තුමිය හිනාවෙනවා මට පෙනෙනවා.මොකද මට අදත් ලැබුණු නැහැ පාසල් සම්බන්ධව මා කළ යෝජනාවේ පිටපතක්.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ගරු මන්ත්‍රීතුමනි, එම ලිපි යවන්නේ මා නෙමේ . අපේ ගරු ලේකම්තුමිය හා කාර්ය මණ්ඩලයයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

මා ඉල්ලා සිටින්නේ එහෙම කරන්න එපා. මෙතැන අපි රැස්වෙලා කතා කරලා තීන්දු තීරණ ගන්නවා.ඒවා ක්‍රියාත්මක වෙන්නේ නැතිනම් අපිට එය මදි කමකි.එහෙම කරන්න එපා.අනිවාර්යෙන්ම මේ යෝජනාවේ සතියක් ඇතුළත අපට එහි පිටපතක් ලැබෙන්න සලස්වන්න.එතකොට අපි දන්නවා අදාල ලිපිය අදාල ස්ථානයට ගියා කියලා. නැතිනම් අපි කතා කරන ඒවා වැඩක් නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි,ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා ඉදිරිපත් කළ යෝජනාවට අනුව අම්බලන්ගොඩ සමහර පාරවල් පටුයි.සමහර පාරවල් වල ඉඩ තිබෙනවා.එම පටු පාරක මේ ගරු මන්ත්‍රීතුමා කියන පරිදි එම නිවසට ඇතුල් විම සඳහා දමන ලද කොන්ක්‍රිට් ලෑල්ල පාරේ අඩි 2ක 3කට ආවාම ඇත්තටම එය අනික් අයට බාධාවකි. එතකොට එම මිනිසුන්ට තමන්ගේ වාහනය ගන්න පහසුවට දනවා. එම දමන කොන්ක්‍රිට් ලෑල්ල නිසා පාරේ ගමන් කරන අයට එය කරදරයක් වෙනවා.මෙතුමා ඉදිරිපත් කළේ හොඳ යෝජනාවකි.මේ පිළිබඳව අපේ තාක්ෂණ නිලධාරින් දමා ඒ පිළිබඳව දැනුවත් කරන්න මෙම කොන්ක්‍රිට් ලෑලි දමන විට පාරේ ගමන් කරන අයටත් බාධාවක් නොවන පරිදි කටයුතු කරන්න කියා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ඌන පුරනයක් එකතු කළ යුතුයි මා කියූ දෙයට. ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතාගේ මඟ පෙන්විම යටතේ පනියන්දුව පාර කාපට් කර තිබෙනවා.මා ගියා පාරේ. බලන්න ලස්සනයි වැඩය.ඒ පිළිබඳව මා එතුමාට ස්තුතිවන්ත වෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා විසින් ගෙන එනු ලැබූ යෝජනාව පිළිබඳව යි. මෙහෙමයි , මෙය ප්‍රදේශයට අවේණික වෙන්නත් පුළුවන් කොට්ඨාශයට අදාල වෙන්නත් පුළුවනි.ඔබතුමා මේ පිළිබඳව ලිස්සා යන්නේ නැතිව ඒ පිළිබඳවත් අවධානය යොමු කරන්න.එය ඉටුකරන්න කටයුතු කරන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ගරු නගර සභා මන්ත්‍රිවරුන්ට යෝජනා ගෙන්න පුළුවනි. එය ක්‍රියාත්මක කරන්න ගියාම තමයි ප්‍රශ්න කෙරෙහි අනික් අය දන්නේ නැහැ .එය හරි ගැටළුවකි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ඔබතුමා දක්ෂයි. ඔබතුමා දන්නවා ප්‍රශ්න විසඳන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

පටබැඳිමුල්ල නම් එහෙම ඒවා නැහැ.එහෙනම් කඩන්න ඕන නෑ.ඔබතුමාට ඕන නම් කඩා ගන්න ගිහිල්ලා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ඔබතුමා වැදගත් වැඩකට යන්න හදන නිසා වැඩියේ අනම් මනම් කතා කරන්න යන්නේ නැහැ.මොකද ඔබතුමා යන්න ඕන නිසා.තව පොඩි වැඩක් තිබෙනවා. මේ යෝජනා ගැන කතා කර නිසා කියන්නේ. මමත් යෝජනාවක් දැම්මා .එයට ලිපියක් නම් එවා තිබෙනවා. 2020 අයවැය යෝජනා වලට ඉදිරිපත් කරන්න කියා. හැබැයි ගරු සභාපතිතුමනි,ඔබතුමාට මතක ඇති අයවැයට ගම්වලින් යෝජනා ගෙන යෝජනා සම්මත කරගෙන ඔබතුමාගේ මූලිකත්වය ගෙන මෙම පාර හැදුවේ. මාත් එදා ගියා.වැඩ අධිකාරිතුමා සමඟ ගිහිල්ලා කැලේ ගිහින්පාර අපි අරගෙන පොන්නම්පේරුම මහතා සමඟ සම්බන්ධ වෙලා පාර අරගෙන , තාප්ප කඩලා හරිගස්සා දුන්නේ. අයවැය යෝජනා වලට ඉදිරිපත් කරන විට කල් වැඩියි.මේ පාර ඇළට වැඩියි.මේ පාරේ වියදම් කරන ලද මුදල් අපරාදේ.එමනිසා මට මෙහි වරප්‍රසාදයක් ඕන නැහැ.මට මෙකක්වත් ඕන නැහැ.කොහොම හරි ගිහිල්ලා බලන්න. මෙහි පොඩි වැඩයි තිබෙන්නේ.මීටර් 150යි තිබෙන්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මා ඔය පාරට මුදල් දෙන්නම් කියා ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතාට කිවුවා.එය ලබන පාර යෝජනාවේ නෙමේ. මේ පාර යෝජනාවේත් තිබෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

යෝජනාව කියන්නේ මෙය කලින්ම කරන ලද යෝජනාවකි.මුදල් නොමැති කමින් කොටසින් කොටස තමයි සංවර්ධනය කළේ.මාර්ග සති පාර.ඉදිරි කොටස තිබෙන්නේ මීටර් 50ක් විතර

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මෙතැන තිබෙන ප්‍රශ්නය දන්නවානේ. එක්කෙනෙක් සම්බන්ධයෙන්. එක්කෙනෙකු අඩි 3ක් අල්ලා ගෙන සිටින්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, දැන් මෙහෙමනේ. මහජනතාවගේ ඉල්ලීම තුළ. ඔබතුමියත් එක කොටසක් සංවර්ධනය කර තිබෙනවා.මෙතුමාගේ කාලයේ තමයි. මමත් ගිහිල්ලා ඔය පාර කැලේ තිබුණේ.මෙයට ලක්ෂ විස්සක් විතර වැය කරලා තමයි හදා තිබෙන්නේ.මා හැදුවා නෙමේ . ගරු සභාපතිතුමා හැදුවේ.මා කියන්නේ අපි වියදම් කළ මුදලේ ප්‍රයෝජන ගන්න ඕන.නැතිනම් ඔබතුමලා ගිහිල්ලා බලන්න. නැතිනම් ඇළට යනවා පාර අනිවාර්යෙන්ම.මගේ දේවල් කරන්නේ නැහැ. එක තමයි මෙය මේ එවන්න ඇත්තේ ඔබතුමා.මෙය සංවර්ධන යෝජනාවලට නෙමේ.ඔබතුමා හරි ගෙන මෙය කරන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මේ එක පුද්ගලයෙක් නිසා පවුල් විස්සක් විතර මෙයට අමනාප වෙලා තිබෙන්නේ.තරහාවෙලා නෙමේ. එක පුද්ගලයෙක් නිසා අකරතැබ්බියකට පවුල් විස්සක් විතර මුහුණ දිලා තිබෙන්නේ මේ ප්‍රශ්නයට.මෙය ඉතා ඉක්මනින් කරන්න. මෙය හැමෝටම පොදු දෙයක්.මෙය ඉතා ඉක්මනින් කඩා ඉවත් කරන්න.මේ තැනැත්තා සිදු කර ඇත්තේ ඉතාමත් අසාධාරණ ක්‍රියාවක් බව ඕනැම පුද්ගලයෙකුට ගියාම පෙනෙනවා.වැසිකිළියක් තබා සිටිනවා පාරේ හරියට.මෙය බලහත්කාරයෙන් හරි කැඩිය යුතුයි.කඩා ඉවත් කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

කඩා ඉවත් කරන් ගියාම එක්කෙනාම වෙනවා. එකයි ප්‍රශ්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී.ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි,මේ පාර ගැන කතා කරද්දි මට ආ ප්‍රතිපාදන වලින් ලක්ෂ දහයක මුදල් යෙදෙව්වා මෙම පාරට. එම මුදල් යොදවා තමයි එය කරනු ලැබුවේ. ඉතිරි ටිකකත් කරන්න තමයි හැදුවේ. ඔය බාධකය නිසා තමයි නොහැකි වුණේ. අපට ඒ අවස්ථාවේ ප්‍රතිපාදන ලබා ගැනීමට තිබුණා ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන්.කොහෙම හරි ගරු සභාපතිතුමනි , මේ සඳහා මුදල් ගෙවලා තිබෙන්නේ.පාරක් ඒ අයට. එම නිසා මේ අයට කරුණාවෙන් කියන්න.කියලා මෙයට මොකක් හරි ක්‍රමයක් හදන්න.මෙය අත්පත් කරගෙන ගෙවීම් කර තිබෙන්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

දැන් මෙහෙමයි. මේ පාර අත්පත් කර ගැනීමේ යෝජනාව දමා මුදල් බැඳ තිබෙන්නේ.ඒ සඳහා අඩි 20ට පළල් කිරීමට යෝජිතයි.ඒ අනුව ජනතාව කිවුවා අඩි 20ක් ගන්න එපා. අපි පාර දෙන්නම් කියා.ඒ අනුව තමයි අපි ඔය ටික හැදුවේ.දැන් මේවා කරනවා නම් අපි ඉතිරි කෑලිත් හදන්නම්.හැබැයි සමහර ගෙවල් තාප්ප ඔක්කොම කඩාගෙන යනවා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ  මහතා කතා කරමින්</u>**

මොකක්ද එහෙම වැසිකිළිය විතරක් කඩා දමන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එහෙම කරන්න වෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, අපි කමිටුවේදි සාකච්ඡා කරලා තීන්දුවක් ආවා. පොන්නම්පේරුම මහතාගේ කොටස දුන්නා.තාප්පය බැඳ දුන්නා. එක එදා කළා.දැන් මෙතැන වෙලා තිබෙන්නේ එක නෙමේ.එහා පැත්තේ කට්ටියත් මේ ඇළ පුරව පුරවා මෙහෙට එනවා.එකයි වෙලා තිබෙන්නේ.දැන් මෙකේ තිබෙන ප්‍රමාණයත් සමඟ මෙය වසන විට කඩාගෙන ගියොත් එහෙම ගරු නගර සභා මන්ත්‍රී ලක්ෂ්මි මෙනවිය මෙම පාර නැතිවෙනවා.ඇළත් නැතිවෙනවා, පාරත් නැති වෙනවා.එම නිසා එයට පැති බැමි දමා එය කරන්න.මටත් හරි දුකයි. අපිට දුක තිබෙන්නේ. ගරු උප සභාපතිතුමා මෙය අසා ගන්න.එදා ගිහිල්ලා මඩ නාගෙන තමයි ගරු සභාපතිතුමලා එහෙම ආවේ. මට හරි දුකයි ගරු සභාපතිතුමා ගැන.මා මෙය හදන්න කියන්නේ එකයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.පී.ලක්ෂ්මි හේමන්තා මෙනවිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමා , ඒ ගැන විශේෂ අවධානය යොමු කරන්න. මෙය අත්‍යවශ්‍ය දෙයකි. මෙය කරන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එක කරනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි,මේ වෙලාවේ කතා කරමින් සිටියේ ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතාගේ යෝජනාව සම්බන්ධව.ඉතිං එයට අදහස් ප්‍රකාශ කිරිමට අපට අවස්ථාව ලබා දුන්නේ නැහැ.එමනිසා මා අදහස් ප්‍රකාශ කළ යුතව තිබෙනවා.එතුමා ගෙන ආ යෝජනාව පිළිබඳව යම් යම් ප්‍රදේශවල මෙතුමා ගෙන ආ යෝජනාව සාක්ෂාත් වෙනවා. දැඩි අපහසුතාවයට ජනතාව පත්වෙනවා.යම් යම් ප්‍රදේශ වල ඒ පිහිටිම අනුව එතුමා කියන මේ කාරණය ක්‍රියාත්මක කිරිම ගැන ගැටළු මතුවෙනවා.විශේෂයෙන්ම අද මේ ගරු සභාව නියෝජනය කරන්නේ නැහැ. ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා. එම කළුවඩුමුල්ල ප්‍රදේශය බැලුවොත් සෑම නිවසකටම යන්න තිබෙන්නේ මේ අකාරයේ ඇතුළත් විමකිනි.එම නිසා අපේ ප්‍රදේශවල එතරම් ගැටළුවක් ඇති වුණත් යම් ප්‍රදේශවල මේ පිළිබඳව ගැටළුවකි.මෙය ජනතාවට පීඩනයට ලක්විය හැකි කාරණයකි.එමනිසා මා ඉල්ලා සිටිනවා අපේ තාක්ෂණසේවා නිලධාරි මහත්ම මහත්මින්ගෙන් එවැනි ප්‍රදේශවල මා හිතන්නේ ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා මේවා අධ්‍යනය කර තිබෙනවා.ඒ ප්‍රදේශවල ඒවා නිරික්ෂණය කරලා ඒ පදිකයන්ට අවහිරතාවයක් නොවන පරිදි ඒවා සකස් කිරිමට නගර සභාවට පුළුවන්ද කියා උපදෙසක් ලබා දීමට.මොකද නගර සභාව තමයි බලයලත් ආයතනය.නැතිනම් එතුමාගේ යෝජනාව අපි අයින් කළහොත් සමහර විට පාරෙන් භාගයක්ම අල්ලා එම කොන්ක්‍රිට් එක දැමිය හැකියි.අවංකවම එවැනි තැන් තිබෙනවා. එහෙම නොවි එයාගේ අවශ්‍යතාවයත් ඉටුකර ගැනිමට තාක්ෂණසේවා නිලධාරින්ට උපදෙස් දිමේ ක්‍රියාවලියකට අනුගත වීමේ ක්‍රමයකට යන්න පුළුවන් නම් මෙතුමාගේ කාරණාව සාක්ෂාත් කරගැනීමට අපි උපකාර කළ යුතුයි

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

එම යෝජනාව ස්ථිරයි.

**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, මේ සම්බන්ධ තීරණයක් ගත්තාද ?

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

එක සම්මතයි.මිළඟට ගරු මන්ත්‍රිවරු 14ක් අත්සන් කර මට යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා.එම යෝජනාව ඉදිරිපත් කරන්න අවසර දෙනවා.

**05.05 ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා**

05.05.01 2020 වර්ෂයේ පාසැල් ළමුන් ඇතුළත් කිරීමේදි තල්ගස්ගොඩ ටි.එච්.ඩබ්.නිවාස යෝජනා ක්‍රමයේ හා ධම්මිකපුර නිවාස යෝජනා ක්‍රමයේ පදිංචිකරුවන්ට ලකුණු ලබා දීමේදි ඔවුන්ට ලකුණු ලබානොදීම ඔවුන්ට කරන අසාධාරණයක් බැවින්,මෙතෙක් ඔප්පු ලබා නොදුන්නද ලබා දී ඇති ලිපිලේඛණ ඔවුන් සතුව ඇති බැවින් පදිංචිය සඳහා සම්මුඛ පරික්ෂණයේ ලබා දී ඇති ලකුණු අභියාචනා මණ්ඩලයේදි ලබා දෙන මෙන් අම්බලන්ගොඩ පාසැල් වල විදුහල්පතිවරුන්ට දන්වා යවන ලෙස යෝජනා කරනවා.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

මෙය කතා කරන්න ගනු ලැබුවේ තව මාසයක් යන විට අභියාචනා කැඳවනවා.2020 වර්ෂයේ පාසැල් ළමුන් ඇතුළත් කිරීමේදි තල්ගස්ගොඩ ටි.එච්.ඩබ්.නිවාස යෝජනා ක්‍රමයේ හා ධම්මිකපුර නිවාස

යෝජනා ක්‍රමයේ පදිංචිකරුවන්ට ලකුණු ලබා දීමේදි ඔවුන්ට ලකුණු ලබානොදීම ඔවුන්ට කරන අසාධාරණයකි.මෙතෙක් ඔප්පු ලබා නොදුන්නද ලබා දී ඇති ලිපිලේඛණ ඔවුන් සතුව ඇති බැවින් පදිංචිය සඳහා සම්මුඛ පරික්ෂණයේ ලබා දී ඇති ලකුණු අභියාචනා මණ්ඩලයේදි ලබා දෙන මෙන් අම්බලන්ගොඩ පාසැල් වල විදුහල්පතිවරුන්ට දන්වා යවන ලෙස යෝජනා කරනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා කතා කරමින්</u>

එම යෝජනාව ස්ථිර කරනවා.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි,මෙය අදාල වන්නේ නැහැ තල්ගස්ගොඩ ප්‍රදේශයට.මෙය මුළු අම්බලන්ගොඩ නගරයටම බලපාන ප්‍රශ්නයකි.මෙය ඉදිරිපත් කළේ විශේෂයෙන්ම අබලන්ගොඩ ටී.එච්.ඩබ්.නිවාස යෝජනා ක්‍රමයේ හා ධම්මිකපුර නිවාස යෝජනා ක්‍රමයේ සිටින ජනතාව 2004 සුනාමි ව්‍යාසනය නිසා තමයි තල්ගස්ගොඩ පදිංචියට ගියේ.අද 2006 සිට මේ වන තෙක් වසර 14ක් මෙම ජනතාව මේ ප්‍රදේශයේ පදිංචිවෙලා සිටිනවා.නමුත් ධම්මිකපුර නිවාස යෝජනා ක්‍රමය යටතේ එම ජනතාවට ලබා දුන්නේ නිවාස 72ක් පමණි.ඒවගේම නිවාස 76ක් ටී.එච්.ඩබ්.නිවාස යෝජනා ක්‍රමයේ සිටිනවා.එම 76 ලබා දි තිබෙන්නේ අම්බලන්ගොඩ නගර සභාව හරහා.එතකොට මේ නගර සභාව හරහා ලබාදුන් නිවාස වලට ඔප්පු ලබා දෙන තෙක් ලිඛිත ලිපියක් ලබා දී තිබෙනවා එම ජනතාවට.ඒ වගේම ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙන් ලබා දුන් ධම්මිකපුර නිවාස යෝජනා ක්‍රමයටත් මේ ප්‍රාදේශිය ලේකම්තුමිය මඟින් අත්සන් කළ ලිපියක් මඟින් තමයි මෙය ලබා දී තිබෙන්නේ.හැබැයි අම්බලන්ගොඩ එම ප්‍රදේශවල දෙමාපියන්ගේ දරුවන් පාසල් වලට ඇතුළත් කිරීමේදි ඔප්පුව සඳහා ලබාදෙන ලකුණු 20න් ලකුණු ලබා දෙන්නේ නැහැ. ලකුණු බින්දුවකි. ඔවුන්ට ලැබෙන්නේ.ඔප්පුව නැතෙයි කියන විට ලකුණු ලබා දෙන්නේ නැහැ. අනෙක් සියළුම කරුණු වලට ලකුණු බින්දුවයි ලබා දෙන්නේ.මෙය ඉතාම අසාධාරණ ක්‍රියාවකි.අද අම්බලන්ගොඩ නගර සභාව කියන්නේ මෙය රජයේ ආයතනයකි.ඒ වගේම ප්‍රාදේශිය ලේකම් කාර්යාලයත් රජයේ ආයතනයකි. ප්‍රාදේශිය ලේකම්තුමිය තමයි මෙහි ඉඩම් වලට බලධාරියා.නමුත් ඒවගේ ලිපියක් තිබේද්දි එයට ලකුණු ලබා නොදීම ඉතාම අසාධාරණ ක්‍රියාවකි.නමුත් මන් දන්නේ නැහැ චක්‍රලේඛ වල මෙහෙම තිබෙනවාද කියා. මෙය නිවැරදි විය යුතුයි.මොකද වසර 14ක් පදිංචියේ සිටින ජනතාවට එම අයගේ දරුවා පාසලට ඇතුළත් කර ගැනිමේදි ඔප්පුව මා හිතන්නේ ඉදිරි කාලයේදි ටී.එච්.ඩබ්.නිවාස යෝජනා ක්‍රමයේ ඔප්පු ලබා දෙයි. හැබැයි ධම්මිකපුරටත් ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙන් ලබා දෙයි. එහෙම තිබේද්දි ගරු සභාපතිතුමනි, ඔබතුමා ලිපියක් ලබා දි තිබේද්දි එවකට, ගරු ප්‍රාදේශිය ලේකම්තුමිය අත්සන් ලිපියක් තිබේද්දි මොනම හේතුවක් නිසාවත් ලකුණු ලබා නොදිමට ඇයි මේ වගේ පියවර ගන්නේ කියන ගැටළුව අපට තිබෙනවා.මේ ජනතාව අසරණ වෙලා ඉන්නේ. මේ අම්බලන්ගොඩ නගරයේ ජීවත් වු මිනිස්සු . අම්බලන්ගොඩ දේවානන්ද විද්‍යාලයට , ධර්මාශෝක විද්‍යාලයට ඇතුළත් විය යුතු ජනතාව. අද පොල්වත්තේ බුද්ධදත්ත විද්‍යාලයටත් ලකුණු බින්දුවයි.කුලරත්න විද්‍යාලයට ලකුණු බින්දුවයි.ඒ එක අවස්ථාවක කුලරත්න විද්‍යාලයට ලකුණු පහක් ලබා දි තිබෙන්නේ.එතකොට මේ ලකුණු 15 ඇතුළත් නොවිම නිසා ඒ ළමයා එම පාසලට ඇතුළත් වෙන්නේ නැහැ.එතකොට මේ දරුවන් කොහේටද පාසල් යන්නේ. නගර සභා සීමාවේ සිටින පාසැල් දරුවන් කොහේටද පාසැල් යන්නේ.මෙය එක්කෝ විදුහල්පතිවරු දැන ගන්න ඕන කොහේටද පාසැල් යන්නේ.මොන චක්‍රලේඛ අනුවද මේ ගැන සානුකම්පිතව බලන්නේ.එක විශේෂයෙන්ම කියන්න ඕන.අපි ඉල්ලා සිටින්නේ , මා මේ ගරු සභාවේ මේ යෝජනාව ගෙන එනු ලැබුවේ එකයි.ඒකමතිකව මේ ගරු සභාවේ තින්දු කරලා මේ දරුවන්ට සිදුවන ආසාධාරණය ගැන තින්දු කරලා මේ සම්බන්ධව සාකච්ඡා කරලා මේ ළමයිට ලකුණු ලබා දීමට කටයුතු කරන ලෙසට ඉල්ලිම් කරන්න.ගරු විපක්ෂනායකතුමාගෙන් මා ඉල්ලා සිටිනවා. මෙය කරන්න බැරිනම් අධ්‍යාපන අමාත්‍යාංශයට ගිහින් හරි මේ ළමුන්ට සාධාරණයක් ඉෂ්ඨ වෙන්න මේ සභාවේ යෝජනා කරලා ගරු අමාත්‍යවරයා හරි පළාත් අධ්‍යාපන ලේකම්වරයෙක්

යටතේ අද තිබෙන්නේ ගරු ආණ්ඩුකාරතුමාගේ හරි අනුමැතියක් හරි ගෙන සාධාරණයක් ඉටුකරන ලෙස ගරු සභාවට යෝජනා කරනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා කතා කරමින්**</u>

ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා ඉදිරිපත් කළ යෝජනාව මා මෙන්න මෙහෙම පොඩි විග්‍රහ කිරිමක් කරනවා. දැන් මේ ගරු ප්‍රාදේශිය ලේකම්තුමිය තමයි මේ ඉඩම් ලබා දී තිබෙන්නේ. එතකොට ප්‍රාදේශිය ලේකම්තුමියට ධර්මාශෝක විද්‍යාලයේ අල්ලපු ඉඩමේ තැනක් ගන්න බැරි වුණ නිසා තමයි මෙය ලබා දී තිබෙන්නේ.එහෙමනම් ධර්මාශෝක අයිනේ ඉඩමක් ගන්න පුළුවන් කම තිබුණා නම් ඒ ළමුන් ධර්මාශෝක විද්‍යාලයට හසුවන්නේ.මේ වගකිමේ කාර්යය. එහෙම තැනක් ගන්න බැරි නිසා තමයි ඒළමුන්ට ධර්මාශෝක විද්‍යාලයට ලකුණු ලබා නොදුන්නේ.එහෙම කරන්න පුළුවන් වුණානම් එම දරුවන්ට එම ලකුණු ප්‍රමාණය ලබා දෙනවා.මා කතා කරන්නේ ඔබතුමාගේ කිමට එකඟවයි.

<u>**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමා ලිපියක් දි තිබෙනවා මේ ඉඩම අයිති ඔහුටයි කියා.ධම්මිකපුරට ප්‍රාදේශිය ලේකම්තුමිය දී තිබෙනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, ගරු උප සභාපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව ඉතාමත්ම වැදගත් යෝජනාවකි.මොකද මානසිකව බැලුවහොත් ඒ ළමුන්ට පාසලක් දිය යුතුයි. අපි සභාවම එයට අනුමැතිය ලබා දෙනවා. එතැනදි ප්‍රශ්නයක් හට ගන්නේ නැද්ද චක්‍රලේඛයක් වෙනස් කිරිම ප්‍රාදේශිය ලේකම්තුමියටවත් විදුහල්පතිතුමාටවත් කරන්න බැරි දෙයකි. මා හිතන්නේ අපට ඉහළට යන්න වෙනවා.අධ්‍යාපන අමාත්‍යාංශයට ගිහින් මේ චක්‍රලේඛය වෙනස් කිරිමේ කටයුත්ත කරන්න වෙනවා.මොකද ගරු විදුහල්පතිතුමා කැමති නැහැ චක්‍රලේඛයට පිටින් කටයුතු කරන්නේ නැහැ.ප්‍රාදේශිය ලේකම්තුමියත් ඒ අදහසේ ඉන්න පුළුවනි.එමනිසා ක්ෂණිකව අධ්‍යාපන අමාත්‍යාංශයට මෙය යොමු කරලා චක්‍රලේඛය වෙනස් කිරිමේ කටයුත්තකට වගේ තමයි යන්න වෙන්නේ.එය කරගත්තොත් ඉතා වැදගත් යෝජනාවකි.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි,ගරු උප සභාපතිතුමා ඉදිරිපත් කළ මෙම යෝජනාව ඉතාමත් වැදගත් යෝජනාවකි අම්බලන්ගොඩ ජනතාව දිහා බැලුවාම.මෙහි අපට නගර සභාවට බැහැ ගරු විදුහල්පතිවරුන්ට බලපෑමක් කරන්න. අපි කළ යුත්තේ නගර සභාව සියළු මන්ත්‍රිවරුන්ගේ එකඟත්වයෙන් ප්‍රාදේශිය ලේකම්තුමියට ලියන්න මේ සුනාමි ව්‍යාසනය නිසා අපට මේ ඉඩම් දෙන්න බැරිව මේ පදිංචි වෙච්ච අයට වසර ගණනාවක් එදා සිට පදිංචිවෙලා සිටින අයගේ ළමයා පාසලට දැම්මේදි අපි දෙනවා මෙම දරුවා පාසලට ඇතුළත් කිරිමේදි එතකොට ප්‍රාදේශිය ලේකම්තුමිය ලඟත් තිබෙනවා මෙම ලේඛණයේ මේ මේ අය මේ නිවාස වල පදිංචිකර තිබෙනවා කියා. එතකොට විදුහල්පතිවරුන්ට කියන්න පුළුවනි එතුමියට මේ ඔප්පු ලබා දීමේ තාක්ෂණික හරි මොකක්හරි ප්‍රශ්නය සඳහන් කර මේ අය අදාල ග්‍රාමසේවා වසම් වල මෙච්චර කාලයක් පදිංචි කියා ඒ අයට ලබා දෙන ලකුණු ප්‍රමාණය ලබා දීමට කටයුතු කරන්න කියා.එහෙමත් නැතිනම් එතුමියට කියන්න ඊළඟ සංවර්ධන කමිටුවට ඇතුළත් කරලා සංවර්ධන කමිටුව හරහා ජනාධිපති ලේකම් කාර්යාලයටත් අධ්‍යාපන අමාත්‍යාංශයටත් යවලා එයට අවශ්‍ය කරන අනුමැතිය ගන්න.එහෙම නම් මේ පිළිබඳව දැනුවත් කරලා මේ පිළිබඳව අවසර ගන්නවා කියා එයින් ජනාධිපති ලේකම් කාර්යාලයත් අධ්‍යාපන අමාත්‍යාංශයත් දැනුවත් කරලා ඒ සම්බන්ධව ගන්න. නැතිනම් විශාල ආසාධාරණයක් වෙනවා අපේම මේ මුහුදුකරයේ සිටි අයගේ ළමුන්ට.

ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්

අපේ ගරු උප සභාපතිතුමා පාසැල් වලට දරුවන් ඇතුළත් කිරීම පිළිබඳව ගෙන එනු ලැබූ යෝජනාව ඉතාමත්ම හොඳ යෝජනාවකි.තල්ගස්ගොඩ කියා දමා තිබුණේ. මොකද මෙය මුළු ලංකාවටම එන ප්‍රශ්නයකි.විශේෂයෙන් මේ චක්‍රලේඛ තුළ මේ යම් යම් කොන්දේසි තිබෙනවා.නමුත් මේවා ගලප්පලා කරන අවස්ථාවලුත් තිබෙනවා.උදාහරණයක් ගත්තාම පොල්වත්තපුර, තව මේ පනියන්දූව පැත්තේ ඒවාගේ පදිංචි වෙලා සිටින සමහර උදවිය. මේ ඔක්කොම ප්‍රශ්න එන්නේ මේ නැති බැරි උදවියට. තියෙන මිනිහා මෙය කරකවා කොහොම හරි කරලා ළමුන් දමා ගන්නවා.නමුතු මේ නැතිබැරි ජනතාවට මෙය ප්‍රශ්න වෙලා තිබෙන්නේ. පොල්වත්තපුර නගර සභා නිවාස වල ජනතාවට වසර 30ක් ඔප්පු නැහැ. නමුත් ඒ ජනතාව එදා සිට සිටින මිනිස්සු.මේ ළමයෙක් දැමීමට ගියාම මේ චක්‍රලේඛය තමයි හරස් වෙන්නේ.එම නිසා අපි කරන්න ඕන මෙකයි. ඔය සිතල කාමර වල සිට චක්‍රලේඛ හදනවා. අර නැතිබැරි මිනිහා දිහා බලා නෙමේ මෙය හදන්නේ.මෙය හදන්නේ පොදුවේ කොළඹට හරියන විදියට තමයි හදන්නේ.ඒ විදියට තමයි බලලා තිබෙන්නේ. මොකද කොළඹ ජනප්‍රිය පාසැල් ගොඩක් තිබෙනවා.අම්බලන්ගොඩ තිබෙන්නේ ජනප්‍රිය පාසැල් සීමිත සංඛ්‍යාවකි.ඔවුන් සිටින්නෙත් මේ අම්බලන්ගොඩ නගරය තුළ . විශේෂයෙන්ම මේ ඔප්පුවට ලකුණු නොලැබුණොත් වසරකට 5 ගණනේ වසර 5ට ලකුණු 25ක් එනවා.පාසැල් වලටත් ඒ ආසන්නතාවය මත ලකුණු කපනවා.එතකොට මේ ලකුණු ලැබෙන්නේ නැත.එකයි තත්ත්වය. මේකට ලකුණු ලැබීම විශේෂයෙන් බලපානවා කුලරත්න විද්‍යාලයට. මොකද විදුහල්පතිතුමාට විශේෂයෙන් අපි ස්තුති වන්ත විය යුතු වෙනවා. මොකද එතුමා ගන්න පුළුවන් මොනවා හරි ක්‍රමයකට ගන්න දැඩි උත්සාහයක් ගන්නවා.මොන ප්‍රශ්න තිබ්බත්. අනෙක් පාසැල් වල එය නොකෙරුණාට එය කරනවා. අපි එකත් කියන්න ඕන.උදාහරණයක් ගත්තාම අර පැත්තෙන් ගත්තාම තල්ගස්ගොඩ ,කළුවඩුමුල්ල, කෙරමිණිය, පෝරඹ , මේ පැත්තෙන් පනියන්දූව වගේම ප්‍රශ්න ගැටළු ගොඩක් තිබෙනවා.ගියපාරත් ඔය ඔප්පු ප්‍රශ්නයට විශාල ගැටළුවකි. අපේ සංවිධායකතුමා එක්සත් ජාතික පක්ෂයේ සිටින නිසා මෙයට අපේ ගරු අධ්‍යාපන අමාත්‍ය වශයෙන් සිටින අකිල විරාජ් මැතිතුමා මේ ගැන දැනුවත් කරලා මෙයට මොකක් හරි අතුරු දෙයක් හරි එවන්න.ඒ ප්‍රදේශවල නැතිබැරි මිනිහාට යාගන්න පුළුවන්.ඒ මිනිස්සු නැතිබැරිකමට නගර සභා ඉඩමේ ඉන්නවා. ඒ අයගේ ළමයිත් ළමයි.අධ්‍යාපනය ලබා ගන්න ඕන.අපි මොනවා කිවත්.එයට මහජන නියෝජිතයන් හැටියට අපේ වගකීමක් තිබෙනවා. අපි ඒ අයගේ ඡන්දයත් ගන්නවා.අර ප්‍රශ්නය කියනවා. නමුත් අපිට බලයක් නැහැ.අපිට පුළුවන් කාර්යක් කරන්න මෙයට මැදිහත්වෙලා මෙය අනිවාර්යෙන්ම කරන්න.කුලරත්නේ ප්‍රශ්නේ. එම විද්‍යාලයටත් ආවා ඔය සම්බන්ධව.මොකද ඔය ලියුම් ගත්තා කියා එහි ඇතුළත් වෙනවා නම් හරි.විදුහල්පතිතුමා බේරිලා මෙය කරගෙන යන්න පුළුවනි.විදුහල්පතිතුමාටත් අපි කියන්නේ මොන ප්‍රශ්නයක් ආවාත් සාධාරණයක් ඉටු කරනවා නම් අවැඩක් නොකර එයින් විදුහල්පතිතුමාට එයිනුත් ගැලවීමක් තිබෙනවා. එම නිසා අපි ඉල්ලා සිටිනවා ඔබතුමා මේ නගරයේ ප්‍රධානියා හැටියටත් අපේ පාලන තන්ත්‍රය තිබෙන්නේ එක්සත් ජාතික පක්ෂයට. එහි සංවිධයකවරයා විදියට මෙතුමාට මැදිහත් වෙන්න පුළුවනි.සාකච්ඡා කර මේ ප්‍රදේශ කිහිපයක් තිබෙනවා නගර සභාව තුළ පදිංචි වෙලා. නගර සභා ඉඩම් වල . තමන්ට ඉඩම් නොමැති වුවත්. යම් ඒ ඉඩම් අයිති බලධාරීන්ගේ නිර්දේශයක් තිබේ නම් එම ළමයින් ඇතුළත් කර ගැනීමට කටයුතු කරන ලෙස අපි ඉල්ලා සිටිනවා.මොකද මෙය ඉදිරියට හරි ප්‍රශ්න ගැටළු රාශියකට මුහුණ දෙන්න පුළුවනි.සමහර පිටින් ළමුන් එනවා කියා එපාර ගැටළුත් තිබෙනවා.ඉතිං ඔය ප්‍රශ්න වලට මුහුණ දෙන්න වෙනවා.එම නිසා ඔබතුමා මැදිහත් වෙන්න කියා අපි ඉල්ලා සිටිනවා.ඉතාමත්ම හොදයි. අපේ ගරු උප සභාපතිතුමා ගෙන ආ යෝජනාව.අපි එයට අපේ සියළු දෙනාගේම සහායෝගය ලබා දෙනවා.

ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්

ගරු සභාපතිතුමනි, වර්ෂයක් පසා මේ මාතෘකාව අපි කතා කරනවා.ගරු උප සභාපතිතුමා මේ සභාවට ඉදිරිපත් කරනු ලබන යෝජනාව 2020 වසරට ජාතික පාසැල් වලට හා පළාත් පාසැල් වලට ළමුන් ඇතුළත් කිරීම පිළිබඳ චක්‍රලේඛය.ගරු සභාපතිතුමනි, ගොඩක් අවස්ථාවල අපි කතා කර තිබෙනවා.නමුත් එකම පිළිතුර කවදාවත් මෙය නිවැරදි වෙලා නැහැ.හැම අවුරුද්දෙම.එතකොට අපි මේ පාසැල් වලට සම්බන්ධවෙලා කටයුතු කරන නිසා අපි දන්නවා මේ සම්බන්ධව.අමාත්‍යාංශයට ගියත් අධිකරණයට ගියත් ඉතිරිවෙලා තිබෙන්නේ මේ කාරණාව විතරයි.මේක චක්‍රලේඛය සමඟ බැඳිලා තිබෙන්නේ.එතකොට අපි චක්‍රලේඛණයට ඌනපුරණයක් ඇතුළත් කිරීම පමණක් හැර වෙන විකල්පයක් නැහැ ගරු සභාපතිතුමනි.ලංකාවටම එන චක්‍රලේඛණය අම්බලන්ගොඩට විතරක් වෙනස් කරන්න බැහැ.එතකොට අපට කරන්න පුළුවන් වෙන්නේ මෙයට ලේකම්වරයා හා චක්‍රලේඛ අධ්‍යක්ෂකවරයා ලවා මෙයට යම් යම් දේවල් එකතු කරන්න.අම්බලන්ගොඩට අදාල වන පරිදි අපි ඉතිහාසයේ ඒ ඌන පුරනය කර තිබෙනවා.ඇතුල් කිරීම් කර තිබෙනවා.ඉතිං එක තමයි අපට දැනුත් ඉතිරි වෙලා තිබෙන්නේ.මේ චක්‍රලේඛණයේම යම් යම් පරස් පරතා තිබෙනවා.දැන් දෙමාපියන්ගේ පදිංචිය පිළිබඳව සහතිකය දෙන පලවෙනි නිලධාරියා තමයි ග්‍රාමසේවක නිලධාරියා.ග්‍රාමසේවක නිලධාරියා හෝ නිලධාරිණිය තමයි මේ අය මේ ස්ථානයේ පදිංචිද නැද්ද කියා වාර්තාව සපයන.එතකොට එම වාර්තාව ප්‍රාදේශිය ලේකම්තුමා හෝ තුමිය හරහා එතැනට ගිහින් තමයි මේ වාර්තාව සහතික කරලා තමයි පාසලට ලබා දි තිබෙන්නේ.එතකොට ඒ වාර්තාව පිළිගන්නවානම් ග්‍රාමසේවක මහතාගේ හෝ මහත්මියගේ එම වාර්තාව පිලිගන්නවානම් මේ තැනැත්තා මේ ස්ථානයේ අවුරුදු පහකට වඩා පදිංචිවෙලා සිටින බව කියා තිබෙනවා නම් එය තමයි පළමු පදිංචිය සහතික කරන ලියවිල්ලවෙන්නේ. එතකොට ඒ හා සමානව මෙය ඔප්පු කර ගන්න චක්‍රලේඛය ප්‍රකාරව මෙය ඔප්පු කර ගන්න යම් යම් විධිවිධාන පනවා තිබෙනවා.ඉන් ප්‍රධානම එක තමයි ඔප්පුව.පදිංචි ස්ථානයේ පදිංචිය සහතික කරන පලමු ලියවිල්ල ඔප්පුව.එතකොට මේ ඔප්පුව පිළිබඳ කතා කිරිමේදි එක එල්ලේ මේ ඉල්ලුම් කරන තැන්ත්තාගේ හෝ තැනැත්තියගේ නමට ඔප්පුව තිබිම.හැබැයි පදිංචිය සනාථ කිරිමේ ලියවිල්ල කියා ගත්තාම ඒ අදාල පුද්ගලයා මේ ගරු උප සභාපතිතුමා කිවු පරිදි හෝ ටී.එච්.ඩබ් නිවාස හෝ වෙන වෙන නිවාස යෝජනා ක්‍රමවල හෝ එහෙම නැතිනම් මේ මුහුදු කරයේ අනවසර නිවාස වල හෝ ග්‍රාමසේවක මහතා දි තිබෙනවා නම් මොහු මේ ස්ථානයේ පදිංචිවෙලා සිටින බව ඡන්ද නාමලේඛණයේ නම තිබෙනවානම් ඔහුගේ හෝ ඇයගේ එය නිත්‍යානුකූලයි.එතකොට පරස් පරතාවය තිබෙන්නේ මේ ඔප්පුවේ.එම ගැටළුව අපි නිරාකරණය කර ගැනීමට තිබෙනවා දේශපාලන අධිකාරිය හරහා.එකට මේ පාසැල් වල විදුහල්පතිවරුන්ට ඇඟිල්ල දික් කර වැඩක් නැහැ.එය අපේ හිතවත්කම් මත යම් යම් උදවු උපකාර ලබා ගැනීමට උත්සාහ ගත්තාත් චක්‍රලේඛණ අනුව ජනතාවගේ අයිතිය බලයේ සිටින දේශපාලන අධිකාරිය හරහා මේ චක්‍රලේඛ හදන ජාතික පාසැල් ලේකම්වරයා , ඒ නිලධාරියා හරහා මෙය නිවැරදි වෙන්න ඕන.එයිනුත් ග්‍රාමසේවක මහතා හෝ මහත්මියගේ රජයේ පළමු නිලධාරියා විදියට ප්‍රාදේශිය ලේකම් සහතික කරන ලද සහතිකය පලවෙනි ලියවිල්ල හැටියටත්, ඊළඟට මේ නගරය මෙහෙයවන දෙවෙනි රාජ්‍ය ආයතනය විදියට නගර සභාවත්, නගර සභාවෙන් සහතික කර දෙනු ලබන සහතිකයත් ඒ දෙක පිලිගැනිමට පුළුවන් කමක් තිබෙන්න ඕන.හැබැයි මේ චක්‍රලේඛණයේ මේ ප්‍රතිපාදන වලට එන්න ඕන.මේ ප්‍රතිපාදන නිවැරදි නොකර අපි මෙතැන කෑ ගැසුවාට වැඩක් නැහැ.එය නිවැරදි කර ගන්නා ලෙස මෙම ඉල්ලීම කරනවා.මොකද අපි දේශපාලන අධිකාරිය විදියට, නගර සභාව විදියට එක්සත් ජාතික පක්ෂයේ සංවිධායකවරයා විදියට එතුමාට පුළුවනි මේ කාරණාව ගරු අමාත්‍යවරයාගෙන් අහන්න.ලිඛිතව ඉදිරිපත් කරන්න.එ වගේම ගරු ප්‍රධාන අමාත්‍යතුමා කලින් නියෝජනය කළා. එතුමාලාට සම්බන්ධයි ගරු ආණ්ඩුකාරතුමා.එතුමාට පුළුවනි ගරු අධ්‍යාපන අමාත්‍යතුමාට මේ කාරණාව ඉදිරිපත් කරන්න. දේශපාලන අධිකාරිය හැර සිවිල් සමාජයට මෙයට විසඳුම් සොයා ගැනීමට ඇති ඉඩකඩ අඩුයි.එම නිසා මා ඉල්ලා සිටිනවා ඒ අනුව කටයුතු කරන්න කියා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්.නිලානි මෙනවිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ගරු උප සභාපතිතුමා ගෙන එනු ලැබූ යෝජනාව පිළිබඳ මාත් කතා කරන්න හිතුවේ මහ අම්බලන්ගොඩ , දූව කියන ප්‍රදේශවලටත් බලපා තිබෙනවා.මා විශ්වාස කරනවා මෙයට හොඳම විසඳුම වශයෙන් හල්වතුර යෝජනා ක්‍රමයට නගර සභාව පවරා ගත් ඉඩම් නිසා අවුරුදු 30 , 25,40 සිටින අය ඉන්නවා ඇත්තටම ඒ ඉඩම් වල.එම නිසා මා ගරු සභාපතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා සියළුම ගරු මන්ත්‍රීවරු වෙනුවෙන් මොකද ගරු උප සභාපතිතුමා ගෙන එනු ලැබූ යෝජනාවට අපි සියළු දෙනා එම විදුහල්පතිවරුන්ගෙන් ඉල්ලීමක් කරන්න ගරු සභාපතිතුමා විසින් එම ඉඩම් වල සිටින අය අතර ළමයින් පාසැල් වලට ඇතුළත් කරනවා නම් එම ලිපියක් ඉදිරිපත් කරනවා නම් එම ලිපියට නිත්‍යානුකූලව ලකුණු ලබා දිමට කටයුතු කළහොත් එය සාර්ථක විසඳුමක් කියා හිතනවා. දෙමාපියන් හැටියට තමන්ගේ දරුවන් පාසලකට ඇතුළත් කර ගැනිම තමයි ප්‍රධාන අරමුණ.එමනිසා සාමාන්‍ය ජනතාවට ලොකු ප්‍රශ්නයක් වෙලා තිබෙනවා.එය විසඳුමක් වශයෙන් ක්‍රියාත්මක කරන්න මා යෝජනා කරනවා. ඒ වගේම ගරු උප සභාපතිතුමා ගෙන ආ යෝජනාව විශේෂයෙන්ම තල්ගස්ගොඩ ඒ නිවාස යෝජනා ක්‍රමවල ජීවත්වන ජනතාව සුනාමි ව්‍යසනය නිසා තමයි ඒ ප්‍රදේශවල පදිංචි කළේ . ඇත්තටම මා දකිනවා එම ජනතාවගේ තිබෙන අඩුපාඩුවක් නෙමේ දූදරුවන්ට එම පාසැල් වලට අහිමිවෙලා තිබෙන්නේ.අපෙන් ඒ වගේම ඒ වෙන්න ඕන යුතුකම රජයෙන් මේ වනතෙක් ඔප්පුවක් ලබා නොදිම නිසා තමයි ඒ ජනතාවට අද ඒ වරප්‍රසාදය අහිමිවෙලා තිබෙන්නේ.එහෙම නම් අපට කළහැකි දේ  තමයි මා විශ්වාස කරන්නේ.ඔබතුමාට ගරු සභාවෙන් ඒ බලය පවරන්නම්. එම ලිපිය අනුව එම ජනතාව ඒ ප්‍රදේශයේ ජීවත් වෙනවා නම් ඒ අවශ්‍ය කරන ලකුණු ප්‍රමාණය ලබා ගන්න කියා.එතකොට ඒ කාරණාව ඉෂ්ඨ වෙනවා.නැතිනම් හැමදාම පැමිණ පාසැල් වලට ළමුන් ඇතුළත් කිරිමේදි මේ සභාවට පැමිණ අපි කතා කරනවා.පුළුවන් ඔය හයිය තිබෙන මිනිසා කොහොම හරි කොහෙන් හරි ඒ දේ කර ගන්නවා.නමුත් බැරි අසරණ අය තමයි ඇවිත් ඔය ඉල්ලිම කරන්නේ.මේ ලකුණු මොකද අපි මෙච්චර කල් ඉන්නවා නේද ? අපිත් දන්නවා මේ අය මෙහෙම ජිවත් වෙනවා කියා.එමනිසා අපට කළහැකි දේ මේ සභාව තුල ඔබතුමා ඒ විදුහල්පතිවරු සමඟ කතා කරලා ඒ ලිපියක් ලබා දෙන්න. සමහර අයට මා දන්නවා ඒ ලිපි දෙනවා.ගොඩක් අය ඒ සම්මුඛ පරික්ෂණවලට ගොස් එම ලිපිය ඉදිරිපත් කර එම ලකුණු ලබාගෙන තිබෙනවා.එමනිසා මා හිතනවා යම්කිසි නිත්‍යානුකූලභාවයක් එම ලිපියට ලබාගෙන අම්බලන්ගොඩ ජනතාව වෙනුවෙන් ඒ යුතුකම ඉටුකරන්න සූදානම් වෙන්න කියා සියළුම ගරු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඊ.ඉන්ද්‍රා අයිරාංගනි මහත්මිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම අපේ දරුවන් . අම්බලන්ගොඩ ප්‍රදේශයේ පදිංචි වෙලා ඉන්න අයට ලොකු ආසාධාරණයක් වෙනවා.ගරු උප සභාපතිතුමා ඉදිරිපත් කළේ ඉතාමත් කලෝචිත ප්‍රශ්නයකි, මේ ඔප්පු නැති එක තවත් ප්‍රශ්නයකි.නමුත් මා ඔබතුමාගේන් ඉල්ලීමක් කරනවා සුනාමි ව්‍යාසනය සඳහන් කරලා ගරු සභා තීරණයක් යොමු කරන්න. ගරු සභාවේ මන්ත්‍රීවරුන්ගේ හා ඔබතුමාගේ නිර්දේශයක් මත ගරු අධ්‍යාපන ඇමති අකිල විරාජ් මැතිතුමාටත් ,එහි පිටපතක් අපේ සංවිධායකතුමාටත් , අපිටත් ලබා දූන්නාම අපිටත් කතා කළ හැකියි. ඒ වගේම ගරු ආණ්ඩුකාරතුමාට.විශේෂයෙන්ම දැන් සිටින ආණ්ඩුකාරතුමාට, විශේෂයෙන්ම පළාත් සභා පාසැල් නිසා, අනිකි පාසැල් මධ්‍යම රජයේ තිබෙන්නේ. එම නිසා දෙපැත්තම මෙයට බලපාන නිසා ඒ අදාල ලිපි සභාවේ ඉල්ලිමක් කළා. සභාවේ ඒකමතිකව තීරණයක් අනුව දැනුම් දිමක් කරන්න. එහෙම කරලා අපි පොඩි උත්සාහයක් ගන්න. ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා කිවුවා වගේ චක්‍රලේඛ වෙනස් කරන්නේ නැතිව නොදිම තීරණය විදුහල්පතිතුමාට තිබෙනවා.විදුහල්පතිතුමාට චක්‍රලේඛ කඩලා ලකුණු දිමේ ක්‍රමයකුත් තිබෙනවා.ඉල්ලිමක් කලාම මේ ළමයාගේ පදිංචි සහතිකය අනුව ලකුණු ලබා දීමේ හැකියාවකුත් තිබෙනවා.එහෙම නොදි ඉන්නේ නැහැ. නමුත් එතුමාට එහෙම නොකර ඉන්නත් බලය තිබෙනවා.වැඩියෙන්ම විදුහල්පතිවරු චක්‍රලේඛ කඩලා වැඩ කරන්නත්

කැමති නැහැ.තමන් තමන්ගේ රැකියාවට රාජකාරියට ආදරේයි.එම නිසා මා ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා ගරු සභාපතිතුමනි, ඔබතුමා මෙම ඉල්ලීම දෙපැත්තටම යොමු කරන්න.යොමුකරලා අපේ ප්‍රධාන සංවිධායකතුමා මෙතැන ඉන්නවා. අණ්ඩු පක්ෂයේ. එතුමා ගොඩක් හිතවත් ගරු අධ්‍යාපන අමාත්‍යතුමා සමඟ එතුමා සමඟ සාකච්ඡා කර මෙතුමා තීරණයක් අරගෙන දෙයි.හැබැයි මෙය ලංකාව පුරා වෙච්ච දෙයක් නෙමේ. සුනාමි ව්‍යසනයෙන් කියන එක විශේෂයෙන් සඳහන් කරන්න.සුනාමි ව්‍යාසනය නිසා අපි විසින් ඔප්පු මෙතෙක් ලබා දී නැති නිසා මේ අය මේ නගර බදයේ සිටි අය මෙම අයට මේවා අහිමි වුණේ සුනාමි ව්‍යසනය නිසා මෙය ලබා දීමට යොමු කරන්න කියා ඉල්ලීම කළහොත් ගරු අධ්‍යාපන ඇමතිතුමා බුද්ධිමත් තරුණ නායකයෙක්.එතුමා මෙයට උදවු කරයි.එතුමා එතකොට අතුරු ලිපියක් හරි ඉදිරිපත් කරයි.මේ ගැන සානුකම්පිතව සලකා බලා ගරු ආණ්ඩුකාරතුමාගෙනුත් ඉල්ලීමක් කරන්න.කොහොමහරි මේ අම්බලන්ගොඩ සිටින ආදරණිය දරුවන්ට ලබාදීමට කටයුතු සලසා දෙන ඉල්ලා සිටිනවා.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, ගොඩක් ස්තුති වන්ත වෙනවා. ගරු මන්ත්‍රීවරු අදහස් දැක්වුවාට මේ අපේ ළමයින් වෙනුවෙන්. හැබැයි විදුහල්පතිවරුන්ට නිවැරදි කරන්න කිවුවාට මා එය පිළිගන්නේ නැහැ එකපාරට.විදුහල්පතිවරුන්ට. අම්බලන්ගොඩ පිටස්තර ළමයින් ඕන තරම් අරගෙන තිබෙනවා.එය ගන්නවා . අපි දන්නවා.හැබැයි අපි ගරු මන්ත්‍රීවරු හරි කවුරුහරි කිවුවාම සානුකම්පිතව බලන්න ඕන.2004 සුනාමි ව්‍යාසනය එන විට මේ විදුහල්පතිවරු ගොඩක් සිටින්නේ අම්බලන්ගොඩ අවට.2004 සුනාමි එනවිට මේ ජනතාව දන්නවා. එතකොට මතක නැති වෙන්න විදිහක් නැහැ.අවුරුදු 15ක් පමණයි වෙන්නේ.සුනාමි ඇවිල්ලා.එතකොට ඒ ජනතාව දන්නවා මේ සුනාමියට තමයි මේ ජනතාව එතැනට ගියේ.තල්ගස්ගොඩ පවුල් සිටිනවා 250ක් තල්ගස්ගොඩ ප්‍රදේශයේ. සුනාමියට ගිහින් නිවෙස්.සමහර විදුහල්පතිවරුන් කථා කරනවා තල්ගස්ගොඩට එක පංතියක් දමන්න ඕන.එහෙනම් ළමයින් හදන්නේ නැතිව ඉන්න ඕන දෙමාපියෝ.එහෙම කියන එක වැරදි කතාවක්.අපි හැම අවුරුද්දෙම හැමදාම මෙය කතා කරනවා.ඒ ළමයින්ට වෙන ආසාධාරණය.මේ ඔප්පුව සම්බන්ධව වෙන ආසාධාරණය.හැබැයි මෙය මේ වසරේ පමණයි මා කතා කරන්නේ.මේක සිද්ධ නොවුණොත් ගරු නගර සභා මන්ත්‍රී රාහුල මහතාණෙනි, මට සහායෝගය දෙන්න ගරු ආණ්ඩුකාරතුමා හම්බ වෙන්න යන්න.මේ ළමයි එක්ක දෙමාපියන් සමඟ ගිහින් ළමයින් 20 ගණනාවක් සිටිනවා.විදුහල්පතිවරුන්ට ඕන ළමයා කොහොම හරි ගන්නවා.ගරු මන්ත්‍රීතුමිය කිවු පරිදි.ගරු ආණ්ඩුකාරතුමා මුණ ගැසීමට ගිහිනුත් මෙය කිරීමට නොහැකි වුණොත් එහෙම මේ ජනතාව සමඟ මා අනිවාර්යෙන්ම පාසල ළඟ වාඩි වෙනවා.මේක ගන්නකම් මා වාඩි වෙන වාඩිවෙනවා කියන එක ප්‍රකාශ කරනවා. මෙයට ගරු සභාපතිතුමා සහායෝගය ලබා දෙන්න.මොකද මෙය අපි දිගින් දිගටම මේ සභාවේ කතා කරනවා.දැන් අවුරුදු 14ක්ම මේ ළමයින් වෙනුවෙන් කතා කරනවා. එහි සාධාරණය ඉෂ්ඨ වෙන්නේ නැහැ. මා මෙය කෙරුණේ නැතිනම් අනිවාර්යෙන්ම පාසැල ළඟ වාඩි වෙනවා.මට සහායෝගය දෙන්න කියන ඉල්ලීම කරනවා.මෙය මුළු ලංකාවම දකිනවා. එතකොට විදුහල්පතිවරුත් දැන ගනිවි සානුකම්පිතව උදවු කරන්න ජනතාවට .විදුහල්පතිවරුන්ට ඕන ඕන විදියට ගන්න බැහැ.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මේ යෝජනාව එම ඉල්ලීම් කරන ලද අදාළ ආයතන වලට යවන්න.මෙය සම්මත වෙනවා.

තීරණය

ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් 2020 වර්ෂයේ පාසැල් ළමුන් ඇතුළත් කිරීමේදී තල්ගස්ගොඩ ටී.එච්.ඩබ්.නිවාස යෝජනා ක්‍රමයේ හා ධම්මිකපුර නිවාස යෝජනා ක්‍රමයේ පදිංචිකරුවන්ට ලකුණු ලබා දීමේදී ඔවුන්ට ලකුණු ලබානොදීම ඔවුන්ට කරන අසාධාරණයක් බැවින්,මෙතෙක් ඔප්පු ලබා නොදුන්නද ලබා දී ඇති ලිපිලේඛණ ඔවුන් සතුව ඇති බැවින් පදිංචිය සඳහා සම්මුඛ පරීක්ෂණයේ ලබා දී ඇති ලකුණු අභියාචනා මණ්ඩලයේදි ලබා දෙන මෙන් ගරු දකුණු පළාත් ආණ්ඩුකාරතුමාට දන්වා යවන ලෙස කරන ලද යෝජනාවට අනුව එය දන්වා යැවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

## 06. කාරක සභා වාර්තා :-

**06.01 2019.09.16 දින පැවති පරිසර , සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටු වාර්තාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

2019.09.16 දින පැවති පරිසර , සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටු වාර්තාව මා යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා කතා කරමින්</u>**

එම යෝජනාව ස්ථිර කරනවා.

**තීරණය**

2019.09.16 දින පැවති පරිසර , සෞඛ්‍ය හා සනිපාරක්ෂක කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**06.02 2019.09.20 දින පැවති මුල්‍ය කමිටු වාර්තාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

2019.09.20 දින පැවති මුල්‍ය කමිටු වාර්තාව මා යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමිණයගේ මහතා කතා කරමින්</u>**

එම යෝජනාව මා ස්ථිර කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

අපි මුල්‍ය කමිටුව ගැන කතා කළාට කමක් නැහැ නේද?

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

කමක් නැහැ. කතා කරන්න.

ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්

අපි මුල්‍ය කමිටුවට එන්නේ ගරු සභාපතිතුමනි, ඔබතුමාලාට සහායෝගය ලබා දෙන්න.පාලන තන්ත්‍රයේ වැඩ කටයුතු වලට සහායෝගය දෙන්න.නමුත් යම් යම් ප්‍රශ්න ගැටළු ආවාම අපි එය කතා කරනවා. අපි එය නිත්‍යානුකූල පැත්තට හරවන්න බලනවා.එතකොට ගරු සභාපතිතුමා පොඩ්ඩක් කෙන්ති ගැනීම තමයි ප්‍රශ්නය තිබෙන්නේ.එතකොට අපිත් සමඟ වචන් හුවමාරු වෙලා ප්‍රශ්න ගැටළු ඇති වෙනවා. අපි කියන දෙයට පොඩ්ඩක් ඇහුම්කන් දීම නගර සභාවේ නායකයා විදියට ඔබතුමා ඒ ගැන පොඩ්ඩක් හිතන්න ඕන.ඒ වේලාවේ පොඩි වචන හුවමාරුවකුත් වුණා.විදුලි ලාම්පු එකක්වත් දෙන්නේ නැහැ කිවුවා දාන්න.උඹගේ වැඩ කරන්නේත් නැහැ කිවුවා.අනේ මගේ වැඩ කරන්න එපා. ඔබතුමා මහජනතාවගේ වැඩ කරන්න.හැබැයි ඔබතුමා සමඟ අපි තරහා නැහැ.මොකද හේතුව එහෙම දෙයක් නෙමේ.මුල්‍ය කමිටුවේ විරෝධතාවයට මා එය ලියා ඇති.

ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

දැන් ඔගොල්ලන් බලෙන් අපිත් එක්ක එකතු වෙනවා කියා ආරංචියක් තිබෙනවා.

ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්

ඕකට ගන්න තමයි මා මේ කතා කරන්නේ.මටත් හරි දුකයි. ඔබතුමා මගේ කෙනෙකු සමඟ එකතුවෙලා සහායෝගයෙන් වැඩ කරන්න බැහැ කියන එක ගැන.ඒක තමයි ප්‍රශ්නය තිබෙන්නේ.මේ අතිගරු හිටපු ජනාධිපති මහින්ද මැතිතුමා අනාගතයේ මේ ජන්දය ඉල්ලන ගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාටයි අපේ පක්ෂයේ ඉහල නිලධාරින් තින්දු තීරණ ගන්නවා. එතුමන්ලා තින්දු තීරණ ගන්නවා එහේ ඉහල ඉදගෙන.අපි මේහේ අරගන්නවා. රණ්ඩු කරනවා ප්‍රශ්න ගැටළු කෙරෙහි තින්දු තිරණ ගන්නවා. අපි ඒවා අර ගන්නවා මහජනතාවට නියම සේවය ලබා දෙන්න ඕන නම්.සාධාරණීකරණය කරන්න ඕන නම්.ඔබතුමා යහමග අරින්න ඕන නම්.නැතිනම් ඔබතුමාට මේ ප්‍රශ්න ගැටළු වලට ඔබතුමාට තේ මුහුණ දෙන්න වෙන්නේ.අහිංසක ලේකම්තුමියත් ඕවට වග කියන්න වෙනවා.ඔබතුමා පොඩ්ඩක් බලන්න. මා දන්නේ නැහැ හෙට අනිද්දා වෙන විට මොනවා වෙයිද කියා.පොඩ්ඩක් ඇහුම්කන් දිලා කේන්ති ගැනීම පොඩ්ඩක් අඩුකරගෙන වැඩ කරන්න කියා ඉල්ලා සිටිනවා. මාගේ විරෝධතාවය එහෙමම තියෙනවා.අපි මුල්‍ය කමිටුවට සහභාගි වෙන්නේ ඔබතුමලාට සහායෝගය දෙන්න මිසක් නැතිව මේ කඩා කප්පල් කරන්න නෙමේ කියන එකත් මා මේ අවස්ථාවේදි කියා සිටිනවා.ඉදිරියේදි මොනවා වෙයිද කියා ඉදිරියේදි බලන්නම්.

ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්

ගරු සභාපතිතුමනි,මට පොඩ්ඩක් කතා කරන්න ඕන මේ සම්බන්ධව. ඇත්තටම අපි ගරු මන්ත්‍රීවරයෙක් විදියට මුල්‍ය කමිටුව සම්බන්ධ වෙන්නේ අපේ ප්‍රශ්න කතා කරලා හරියට එය නිවැරදි කිරිම සම්බන්ධයෙන්.ගරු සභාපතිතුමා විදියට ඔබතුමාට පහර ගැසිමට වත් කිසිම දේශපාලනිකව පහර ගැසිමකට වත් නෙමේ.මේ සභාවේ අපේ ගරු නගර සභා මන්ත්‍රී රාහුල මහතා අභය කරනවා මේ සභාවේ.මොකද ජේෂ්ඨ මන්ත්‍රීවරයෙක්. දැනුම අවබෝධය තිබෙනවා.අපි නවක මන්ත්‍රීවරුන්. අපේ ගරු මන්ත්‍රීවරුන් කිහිප දෙනෙක් සිටිනවා ඒ වගේ.මුල්‍ය කමිටුවට සම්බන්ධ වෙලා ඔබතුමාට අපි යම්කිසි දෙයක් ප්‍රකාශ කරන්නේ ඔබතුමාට විරුද්ධ විමට වත් දේශපාලනික මතිමතාන්දර හින්දා වත් නෙමේ. එම නිසා ඔබතුමා එම දේශපාලනික මතිමතාන්දර දුරු කරලා ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියා ඉල්ලා සිටිනවා.

තීරණය

2019.09.20 දින පැවති මුල්‍ය කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමිණයගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**06.03 2019.09.23න පැවති පුස්තකාලකමිටු වාර්තාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

2019.09.23න පැවති පුස්තකාල කමිටු වාර්තාව මා යෝජනා කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමිණයගේ මහතා කතා කරමින්</u>**

එම යෝජනාව මා ස්ථිර කරනවා.

**තීරණය**

2019.09.23 දින පැවති පුස්තකාල කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු ග්‍රේෂන් කෙරමිණයගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**06.04 2019.09.27 දින පැවති ත්‍රි රෝද රථ කමිටු වාර්තාව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

2019.09.27 දින පැවති ත්‍රි රෝද රථ කමිටු වාර්තාව මා යෝජනා කරනවා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

එම යෝජනාව මා ස්ථිර කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී දිනයාදූර ධර්මදාස මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ත්‍රි රෝද රථ කමිටුව සම්බන්ධව එම කමිටුවේ ගනු ලැබූ තීරණ වලට කිසිදු ක්‍රියාත්මක වීමක් නැහැ.මොකද පසුගිය දිනවල පුංචිපොළ පාරේ වෙළඳාම් කරන අර කාන්තාව ටික අයින් කරන්න කිවුවා.පසුගිය සතියේ සිද්ධියක් ඇතිවුණා. යතුරු පැදියක එනවිට අපේ කෙනෙකු මේ පැත්තෙනුත් කෙනෙක් පැමිණියා. අනික් පැත්තෙනුත් කෙනෙක් පැමිණි නිසා එම කාන්තාවට කියා තිබෙනවා බඩු ටික අයින් කරන්න කියා. අයින් කරන්න කිවුවාම කුණුහරුපයෙන් එම පුද්ගලයාට බැණලා තිබෙනවා.ඒ වගේ සිද්ධි ඇතිවෙන්නේ ඔය පාරේ වෙළඳාම් කිරීමෙන්.මා හිතන්නේ අපි මේ කමිටුවල යෝජනා කරන ඒවා කිසි දෙයක් ක්‍රියත්මක වෙන්නේ නැහැ.ත්‍රිවිල් කමිටුවේත් එහෙමයි. නිලධාරි මහතුන් කියා සිටින්නේ වාහන නැහැ. මේවා ගෙනියන්න යන්න වාහන නැහැ කියා.මා දින ගණනාවක් කිවුවා මෙය අයින් කරන්න කියා. නමුත් ඒ ගැන කිසිම තැකිමක් කරන්නේ නැහැ.කමිටුවල ගන්න තීරණ ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඒ ගැන ඔබතුමාගේ අවධානය යොමු කරන්න සිද්ධ වෙනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි,මේ ත්‍රි රෝද රථ කමිටුව ගැන කතා කරද්දි මෙම ත්‍රි රෝද රථ නැවතුම්පොළවල් වලට ත්‍රි රෝද රථ නතර කරන සංඛ්‍යාව තීරණය කරන්නේ කොහොමද? අහවල් ත්‍රි රෝද රථ ගාලට මෙපමණයි කියා.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ඒ කමිටුව විසින් තීරණය කරන්නේ.

**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, එක තමයි මේ කමිටුව විසින් තීරණය කළහොත් මෙතැනට 20ක් කියා අනික් අයට වෙළඳ ව්‍යාපාර කිසිවක් කරන්න බැරි වෙනවා. එක පැත්තකින්.අනික් පැත්තෙන් මේ ත්‍රි රෝද රථ එකපෙළට ගාල් කලාම පාරිභෝගිකයාට සේවයක් ලබා ගන්න බැරි වෙනවා . එම නිසා මේ කුඩා නගරයේ අනවශ්‍ය ප්‍රමාණයට වඩා බලපත්‍ර දුන්නොත් අපි ඉතාම බලපතල අපරාධයක් කරන්නේ ජනතාවට. එතකොට මා මෙයින් අදහස් කරන්නේ නැහැ ත්‍රි රෝද රථ රියදුරන්ට කිසිම අහේනියක් කරන්න. ඒක නොකර කරන්න පුළුවන් ප්‍රධානම කාරණාව තමයි අපි ත්‍රි රෝද රථ ගාලකට ත්‍රි රෝද රථ 5කට 6කට සීමා කරලා අඩුම වශයෙන් දෙකෙන් දෙක හෝ එකෙන් එක ස්ථානයක් ඉඩ තබලා එම ත්‍රි රෝද රථ ගාලේ 20ක් තිබෙනවා නම් එම ත්‍රි රෝද රථ නම් කළාට අපට ප්‍රශ්නයක් නැහැ. බෝඩ් එකේ ගැහුවාට කමක් නැහැ.එක වර ගාල් කර හැක්කේ ත්‍රි රෝද රථ 6ක් පමණි. මෙක තමයි ලංකාව පුරාම ත්‍රි රෝද රථ ගාල් කරන ක්‍රමවේදය.එතකොට අම්බලන්ගොඩ නගර සභාව ඉන් පරිභාහිරව ගියොත් ජනතාව අතරමං. එහෙම නිතිය භාගයට ක්‍රියාත්මක කළහොත් අපි ආමාරුවේ වැටෙනවා.එම නිසා බෝඩ් එකේ ගසන්න එකවර ගාල් කළ හැක්කේ ත්‍රි රෝද රථ 5ක් හරි 6ක් හරි එම ස්ථානය අනුව.ඉඩකඩ අනුව .මොකද මේ අපි දීලා තිබෙන්නේ ප්‍රධාන මංසන්ධිවල.මාර්ග නීතිය අනුව ගොල්පෙස් හෝටලයේ සිට කතරගම බෝඩ්එක දක්වා මහා පාරේ කිසිම වාහනයක් නතර කරන්න බැහැ . පොලිස් නීතිය අනුව.එහෙම පාකින් දෙන්න බැහැ.අපි මේ නීති කඩ කරලා තමයි මේ පාකින් දෙන්නේ.පොලිසියත් එයට නිහඬව ඉන්නවා. අපි ඒ ජනතාව වෙනුවෙන් එම ත්‍රි රෝද රථ රියදුරන් කලක සිට මෙහි සිටින නිසා අපිත් මේවා අනුමත කරලා දෙනවා. හැබැයි අතුරු ව්‍යවස්ථාවේත් සඳහන් වෙලා නැහැ අහවල් තැන අහවල් ත්‍රි රෝද රථ ගණන කියා. කලින්ම තිබුණ අපේ පණතේ තිබෙනවා රථ වාහන 4ක් ගාල් කරන්න පුළුවන් කියා ජී.එල්.පී ගොඩනැඟිල්ල ඉදිරිපිට කියා.ඊටපසු අතුරු ව්‍යවස්ථාවල තමයි දීලා තියෙන්නේ රණසිංහ එක ළඟ 7යි, ඊට එහා පැත්තට පොදු වෙළඳපොළ ඉදිරිපස 4යි ,මෙතැන කුලරත්න මංසන්ධියේ යම් ප්‍රමාණයක්.බස්නැවතුම්පොළ දෙපැස නිත්‍යානුකූලව අපි එයට අවසර දී තිබෙනවා. එක හරි.එහි අවශ්‍ය ප්‍රමාණයට අපි අවසර දි තිබෙනවා.අනික් ඒවා අපි නිත්‍යානුකූලව ප්‍රමාණයන් සඳහන් කරලා නැහැ. මා කියන්නේ ඒ අයටත් අගතියක් නොවෙන්න.බදු ගෙවන ජනතාවටත්, බදු ගෙවන වෙළඳුන්ටත් අහේනියක් නොවන විදියට අර බෝඩ් එකේ එකවර ගාල් කළ හැකි ප්‍රමාණය සඳහන් කරන්න. දැන් වෙන කොට තාක්ෂණය සමඟ සියළුම රියදුරු මහත්වරු ජංගම දුරකථනය හරහා තමයි මේ සේවාව සපයන්නේ.මෙය ඉතාම සරල කාරණයකි.එමනිසා කරුණාකරලා මේ වීථිවල ඇති රථගාල් සඳහා ත්‍රි රෝද රථ 5කට වඩා අවසර දෙන්න එපා.උපරිම ලොකුනම් 6ක් දෙන්න. එහිදීත් තුනකට එකක් වගේ ඉඩතබා එම කඩවලට මනුස්සයකුට බයිසිකලයක් නතර කර දැම්මට බඩු බැමට ඉඩක් සපයා දෙන්න. මේ ත්‍රි රෝද කට්ටිය නිත්‍යානුකූලව අවසර දුන් පසු ඒ අය කිසි දෙයක් තකන්නේ නැහැ. ඒක ඒගොල්ලන්ගේ හැටි.ඒ අයට එහෙම ලොකු අවබෝධයකුත් නැහැ. ඒ අයට නිත්‍යානුකූලව බෝඩ් එක ගසා තිබෙනවා.අපිට බලපත්‍රයක් නගර සභාවෙන් අරගෙන තිබෙනවා. එතකොට ජනතාවට හුළං.එහෙම වෙන්න බැහැ.මා ඒ අය ගැනත් අගතියෙන් නෙමේ කතා කරන්නේ.ඒ අය කරන්නේ රක්ෂාවක් , සේවයක් . එම සේවයත් නගරයට අවශ්‍යයි.හැබැයි අපට හැකිවෙනවා නම් එකවර ගාල් කළ හැක්කේ

ත්‍රි රෝද රථ 5ක් කියා එච්චරයි. එකයි නිත්‍යානුකූල වෙන්න ඕන.එය කරන්න කියා මා ඉල්ලීමක් කරනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි,කොහොමත් අපි ත්‍රි රෝද රථ කමිටුව තීරණය ගනු ලැබුවේ එහෙම ගහන්න නෙමේ.ඒ ඒ තැන්වල නතර කල තැබිය හැකි ත්‍රි රෝද ගණනක්.හැබැයි මෙතුමා කිවු දේ පොඩි අදහසක් අපිට ගන්න වෙනවා.මොකද එක දිගට ගැහුවොත් එහෙම අර කඩවල් වලට ඇතුල් වීමේ ප්‍රශ්නයක් එනවා.එතකොට අපි කඩවල් වලට ඇතුල් වීම ඇරලා ඕන ලකුණු කරන්න .කඩවල් වලට ඇතුල්වීමේ පොඩි බාධාවක් එනවා.මෙතුමා කිවු දෙය අරගෙන අපි ක්‍රියා කලානම් හරි.නැතිව අපි එම ත්‍රි රෝද රථ ඔක්කොම ගාල් කරන්න අවසර දුන්නේ නැහැ.

**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**

විපක්ෂනායකතුමනි, එම බෝඩ් එකේ ගසා තිබෙනවා ත්‍රි රෝද රථ අංක. දැන් මෙතැන උදාහරණය 9ක් ගසා තිබෙනවා.එතකොට 9ක් ගැසුවොත් අර දිපාල් මහතාගේ කඩය ළඟට වෙනකම් ඇහිරෙනවා.එතකොට දැනට හොඳ වේලාවට රක්ෂණ සංස්ථාව වසා තිබෙනවා.එකෙත් සේවා සපයන්න ගත්තොත් කිසිදු වෙළඳ ස්ථානයකට පාපැදියක් ඇතුල් කරන්න බැරි වෙනවා.එතකොට අතන හංදියේ සිට සුසාන්ත මහතාගේ කඩය ළඟට වෙනකම්ම ත්‍රි රෝද රථ ටික ගසාවි.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

9ක් කිව්වාට 3ක් 4ක් ගාල් කරන්නේ.

**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**

හරි එක තමයි බෝඩ් එකේ ගහන්න කියන්නේ.එකවර ගාල් කළ හැක්කේ ත්‍රි රෝද රථ 5ක් පමණි.බොහොම සරලයි.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, මා හිතන්නේ අපි අනවශ්‍ය විදියට ත්‍රි රෝද රථ ගහන්න තින්දු ගත්තේ නැහැ.අපි තීරණය ගෙන ඇත්තේ අම්බලන්ගොඩ නගරයේ 220කට වගේ තමයි බලපත්‍ර දෙන්න තින්දුව ගෙන තිබෙන්නේ.එම 220 තාම ගිහිලත් නැහැ.එම නැවතුම් පොළවල් ලබා දිමේදි දීර්ඝ කාලයක් නැවතුම් පොළවල් තිබුණු තැන් තමයි දි තිබෙන්නේ.එම අංක ගසන විට එම අය සිටි තැන් තමයි මෙතැන ඇවිත් ඉල්ලා ඇත්තේ.ඒ අනුව තමයි අපි ඒ අයගේ අංක ගසා ඇත්තේ.සියළු දෙනාගේම මේ කමිටුවේ තිරණය ගෙන තමයි කටයුතු කළේ. අර කඩවලට යන්න ඉඩක් ලබා දීම අපි කමිටුවේදි කතා කරලා තීරණයක් ගන්නම්. අපි කොටු දිගටම ගසා තිබෙනවා.මේ අවස්ථාවේදි කමිටුවේදි කතා කරලා එක කොටුවක් හරි අතහැරිම සුදුසු බවට මගේත් හැඟිම තිබෙනවා.මා ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා මම තව මාසයක් දෙකක් බලනවා. මේ කමිටුව ක්‍රියාත්මක වුණේ නැතිනම් මා මේ කමිටුවෙන් ඉල්ලා අස්වෙනවා. මොකද අපිට මිනිසුන්ට මුහුණ දෙන්න බැහැ.කතා කරන්නත් බැහැ . මෙම කමිටුව ක්‍රියාත්මක වුණේ නැතිනම් දිගින් දිගටම.සභාව ගන්න තීන්දු කමිටුව ගන්න තීන්දු ක්‍රියාත්මක වෙන්නේ නැතිනම් අපි මේ කමිටුවල ඉදලා වැඩක් නැහැ. තේරුමක් නැහැ. එමනිසා තමයි ඉල්ලා අස්වෙන්නේ.මේ මාගේ මේ යෝජනාව මා කරන්නේ අම්බලන්ගොඩ නගරයේ තිබෙන සියළුම අනවශ්‍ය ඉදිකිරිම අයින් කරන්න.මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා අපි කමිටුවෙන් ගත් තීරණයක් මෙය ඉවත් කරන්න කියා.මෙම ඉල්ලිම ඉතා ඉක්මනින් ක්‍රියාත්මක කරනා හැටියට ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා. නැතිනම් අපි මේ කමිටුව නියෝජනය කරන්නේ නැහැ කියා ප්‍ර කාශ කරනවා.

**ගරු නගර සභා මන්ත්‍රී දිනයාදූර ධර්මදාස මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, අර සමුපකාර මන්දිරයට ඇතුළු වන තැන ග්‍රාමීය බැංකුවට ඇතුළු වන තැන අර සුදු පාටින් බොදා වෙන්කරන ලද තැනට වාහන හා ත්‍රි රෝද රථ ගහනවා.එතකොට අපිට එතැනට ඇතුළු වන විට ඒ අය කාටහරි කියා තමයි ඇතුළු වන්න වෙන්නේ.එතැන එම දොරටුව අවහිර වන විදියට ගසන්න එපා කියා තීරණයක් ගන්න ඕන. නැතිනම් මෙය කරන්න බැහැ.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

ඔබතුමාට කියන්නේ. ඔබතුමාට උදාහරණයක් හැටියට පෙන්නුම් කර දෙන්නම් මෙතැන තැපැල් කාර්යාලය යන තැන සිට ගාලු පාරේ අද බලන්න තත්ත්වය.තැපැල් කාර්යාලයේ සිට ගාලු පාරට වාහනයක් දමන්න බැහැ.අර තාවකාලිකව ගසන ලද කඩ ඔක්කොම පාරට ඇවිත් දැන්.මේ පැත්තෙන් බතල ලැලි, මේ පැත්තෙන් වට්ටක්කා ලැලි.දිගටම පාරේ තිබෙන්නේ. මේවා ඉවත් කරන්න. එකයි ඉල්ලා සිටින්නේ.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

ඇත්තටම මාත් එදා ත්‍රි විල් කමිටුවට සහභාගි වුණා. ගරු උප සභාපතිතුමාට ස්තුතිවන්ත වෙනවා. මේක මහා හිසරදයක් වෙච්ච ප්‍රශ්නය. මා හිතන්නේ අපේ හිටියා අනිකුත් ගරු මන්ත්‍රීවරුත් .අපි ස්තුතිවන්ත වෙනවා මේ නගරය ක්‍රමවත් කරලා මේ නගරය ලස්සන කරලා මාර්ග තදබදය අවම කරලා යන්න වැඩපිළිවලට දායක වීම පිළිබඳව.අපිත් සහභාගි විලා යම්කිසි ප්‍රශ්න ගැටළු කිවුවාම . ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා ඉදිරිපත් කළෙත් එකත් ප්‍රශ්නයකි. ඒ සම්බන්ධව අවධානය යොමු කරලා අපි පිළිතුරු ලබා දීම කළයුතුයි.මා හිතන්නේ මෙය සංචාරක වෙළඳුන්ගේ පාරාදිසයක් වෙලා තිබෙන්නේ දැන්.මොකද මෙහේ වරිපණම් ගෙවනවා , බලපත්‍ර ගාස්තු ගෙවන ව්‍යාපාරික කරන උදවිය ඉන්දෙද්දි කොහොන් වත් අරගෙන ඇවිත් මේ මහ පාරේ . මා දන්නේ නැහැ. පොලිසියට පෙනෙන්නේත් නැද්ද කියා. මේ මහ පාරේ නතර කර ගන්නවා. එයාට ඕන විදියට එයා වෙළඳාම් කරනවා.ප්‍රශ්න ගැටළුව තිබෙන්නේ මෙයට වරිපණම් ගෙවන කෙනායි බලපත්‍ර ගාස්තු ගෙවන කෙනායි මෙයට ආදායම දෙන්නත් ඕන ව්‍යාපාරයත් අසාර්ථකයි.ඔය ගැටළු කිහිපයක් තිබෙනවා.එතකොට අරගොල්ලන් මාර්ගයට අවහිරතාවයකුත් සිදු වෙනවා. ඒ අයට නීතිය ක්‍රියාත්මක විමකුත් නැහැ.මා හිතන්නේ අපි මෙය සැලසුමක් සහගතව කළ යුතුයි.ඔබතුමලාට මේ එකපාර 10එන්න බලය දිලා තිබෙන්නේ.එතකොට මෙය දි තිබෙන්නේ මහජනතාවට මේ නගරයේ යම් සේවාවක් ඉටු කර ගන්න.එම ඉටු කරන සේවාව දැන් මදි තත්ත්වයකට පත්වෙලා තිබෙනවා. දැන් ප්‍රශ්න ගැටළුත් මතුවෙලා තිබෙනවා.ගරු උප සභාපතිතුමාම කියනවා මේ ප්‍රධාන රැස්විමේ කියනවා මා මාස 3ක් බලනවා මා අයින් වෙනවා කියා.කවුද මෙය භාර ගන්නේ.මෙහෙම බැහැ.එම නිසා ඔබතුමාටත් ප්‍රශ්න ගැටළු තිබෙනවා. පළාත් සභාවට යන්න හරි පාර්ලිමේන්තුවට යන්න හරි.මේ දිස්ත්‍රික් ඡන්ද ක්‍රමය තුළ ගැටළුව තිබෙන්න පුළුවනි. එහෙනම් ඔබතුමා මෙතුමාට බලය පවරන්න. මෙතුමා ඒ ටික ගාණට කරගෙන යාවි.කියන්න වගේ බතල මේවායි ඔක්කොම දමාගෙන මේ පාර අවහිර කිරිම.ඉතාමත් අශෝභනයි සමහර තැන්වල. බෝඩ් කැලියි මේවා කැලියි තබා ගෙන.නගරය ලස්සන කරන්න. දැන් ඔබතුමා මෙච්චර කාලයක් සිටියා. හොඳට වැඩ කරගෙන ආවා. මෙහෙමයි වැඩ කරන විට තමයි බැනුම් අහන්න වෙන්නේ.එකත් තිබෙනවා. එක වෙනම කතාන්දරයක්.අපි මොන දේ කළත් 5ක් තරහා වෙන විට 10 දෙනෙක් කැමැත්ත ප්‍රකාශ කරනවා.එකයි තිබෙන්නේ.එමනිසා ඔබතුමා මෙය අරගෙන ඉදලා ප්‍රශ්න ගැටළු අදාල කට්ටිය සමඟ සාකච්ඡා කරලා ත්‍රිවිල් ප්‍රශ්නයට 10ක් ගහන්න ඕන තැනට 3ක් හරි 5ක් හරි ගහලා ගෙන්න ගෙන තාක්ෂණය දියුණුයි. එම තාක්ෂණය දියුණුව තුළ වැඩ කටයුතු කරන්න පුළුවනි.අපි යම්තැනකින් හරි මෙය මතකයට සවි කරලා මේ යන ක්‍රමයක් ඇති කරලා එම ක්‍රමයට හදන්න කියනවා. අනික් එක මේ කොහේවත් නගරයක නැහැ මේ වගේ. කරන්න දෙන්නෙත් නැහැ. ඒ මිනිසුන් සමඟ එකතු වෙලා අනික් අය.

නගර සභාවට ම භාරදීලා. වෙළඳ හා කර්මාන්ත මණ්ඩලය තිබෙනවා.මොනවාද කරන්නේ. වෙළඳුන් වෙනුවෙන් කතා කරනවාද ? මට නම් පෙනිලා නැහැ.මේ වගේ ප්‍රශ්න වලදී ඔබතුමාට හයිය දීලා මෙය නිරාකරණය කරන්න ඕන.අපිට හරි ලැජ්ජායි . මෙතුමා අයින් වෙනවා කිවුවාම. මෙතුමා මේ බර කරට ගෙන කතා කරලා මෙක කරන්න දෙන්න එපා කිවුවා.ලේකම්තුමියටත් උපදෙස් දුන්නා. එක අපි අගය කළ යුතුයි. අපි හරි දෙයට හරියි කියනවා.එකයි කියන්නේ. අපි ඉල්ලා සිටිනවා මේ ප්‍රශ්න ගැටළු කෙරෙහි අනුකම්පාවෙන් බලා මෙයට යහපත් ප්‍රතිචාරයක් දක්වා මේවාට විසඳුම් ලබා දෙන්න කියා.ඉදිරි මැතිවරණ කාල සීමාවෙ එන්නේ. අපි හරි කැමතියි මේ නගරය ලස්සනට තියෙනවාට.ටොෆිකොළයක්වත් බිම දමන්නේ නැති තත්ත්වයක් ඇති කරන්න පුළුවන් නම් එකතමයි අපේ බලාපොරෝත්තුව .දැන් සුසාන භූමි දෙකක් හදලා තිබෙනවා ලස්සනට.එම අවශ්‍ය කරන යටිතල පහසුකම් ලබා දෙනවා වගේම මේ නගරයට තිබෙන අවහිරතා ඉවත්කරන්න කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා. අපි විපක්ෂ කණ්ඩායම හැටියට ඉල්ලා සිටිනවා ඔබතුමා අයින් වෙන්න එපා. ඔබතුමා සිටිය යුතු කෙනෙක්.ඕන දෙයකට කරදෙන නිසා . එමනිසා ඔබතුමා මෙහි හැපි හැපි හරි මෙහි වැඩ ටික ඉවර කරන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්.නිලානි මෙනවිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ඇත්තටම ඒ සම්බන්ධව මා කතා කරන්නේ. මා දැනුවත්වම ඔබතුමා ඒ ගැන දන්නවාද දන්නේ නැහැ. ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙන් තමන්ගේ ආර්ථික තත්ත්වය නංවා ගැනීම සඳහා දෙනු ලැබු කඩයක් තිබුණා. ප්‍රාදේශිය ලේකම් කාර්යාලය ඉදිරිපිට. එම කඩය ආදායම් පාරිපාලක මහතා විසින් ගිහින් අරගෙන ඇවිත් තිබුණා. ඒ සඳහා සාමාන්‍ය පංතියේ අහිංසක නගර වැසියෙක් ජීවත්වීම සඳහා කරන කඩයක් උස්සා ගෙන එනවා.ලොකු ව්‍යාපාරිකයෝ තමන්ගේ ලොතරැයි කුටි ,එතකොට එක එක දේවල් බද්දෙන් බද්දටත් දීලා ව්‍යාපාර කරගෙන යනවා.එමනිසා ගරු සභාපතිතුමනි, සාමාන්‍ය ජනතාවත් සමඟ සිටින අපි දන්නවා ඒ අයට තිබෙන ප්‍රශ්න.එමනිසා ඔබතුමා නීතිය එක විදියකට ක්‍රියාත්මක කරන්න එම නිලධාරින්ට උපදෙස් දෙන්න ඕන. ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙන් අහිංසක මනුස්සයකුට එම කරිත්තය ලබා දෙන්නේ තමන්ගේ ජීවනෝපාය යම්කිසි තත්ත්වයකට නඟා සිටුවා ගන්න.එහෙම තත්ත්වයක් යටත් එම කරිත්තය ගෙනවිත් මෙහෙ කඩලා දාලා තිබෙනවා. ඇත්තටම මා ගරු උප සභාපතිතුමාට ස්තුතිවන්ත වෙනවා.ගරු උප සභාපතිතුමා තමයි මැදිහත්වෙලා එම අයට එම රථය නැවත ලබා දී තිබෙන්නේ.මා හිතනවා ඔබතුමාත් කෙනෙකුගේ ප්‍රශ්න කෙරෙහි සාවධානව ඇහුම්කන් දෙන කෙනෙක්.එමනිසා මේ නීතිය කරවන අයට කියන්න එම කාර්ය හරියට කරන්න. එක එක උස් පහත් මිටි ඒ අනුව කටයුතු කරන්න එපා කියා.මොකද ත්‍රි රෝද කමිටුවේ ගරු උප සභාපතිතුමා ගරු සභාපති වශයෙන් සිටිනවා. අපිත් ඒ සඳහා එතුමාට සහායෝගය ලබා දෙනවා.එතනදි එතුමා ඒ ඍජු තීරණ ගනිද්දි එම ඍජු තීරණ ක්‍රියාත්මක කරන්න අපේ සභාවට ශක්තියක් නැතිනම් එතුමා එම කමිටුවලින් අයින් වෙනවා නම් අපිටත් සිද්ධ වෙනවා එම කමිටුවලින් අයින් වෙන්න.එමනිසා ඔබතුමා විශේෂයෙන් අවධානය යොමු කරන්න ඕන.ඇත්තටම අපි විපක්ෂයේ සිටින්නේ. අපි විපක්ෂයේ ඉඳගෙනත් මේ සියළු දේවල් වලට එකඟ වෙන්නේ අපේ අම්බලන්ගොඩ ජනතාවට සේවය කිරිම සඳහායි.එමනිසා ඔබතුමා ගරු උප සභාපතිතුමා සමඟ සාකච්ඡා කරලා ත්‍රි රෝද රථ සම්බන්ධයෙනුත් අනවසර කඩ සම්බන්ධයෙනුත් එම ක්‍රියාමාර්ග ගන්න. ගරු නගර සභා මන්ත්‍රී ලසන්ත මහතා දන්නවා ව්‍යාපාරිකයෙක් වශයෙන් අම්බලන්ගොඩ නගරයේ අද අනවසර ලෙස පැමිණ ව්‍යාපාරික කටයුතු වල කොපමණ පිරිසක් නියලි සිටිනවාද කියා.එමනිසා ඔබතුමා ඒ සම්බන්ධව අවධානය යොමු කරන්න .

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මේ සම්බන්ධව මා කිවයුතුයි. මේ ත්‍රි රෝද කමිටුව සම්බන්ධව ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කිවු කාරණය ගැන ඔබතුමාලා සලකා බලන්න.ගරු උප සභාපතිතුමනි , ඔබතුමා අස්වෙන්න කාරණයක් නැහැ. මා ත්‍රි රෝද රථ කමිටුවේදි ඔබතුමලා ගත් තින්දුවක් කවදාවත් වෙනස් කරන්න

කියා නැහැ.ඒක බලපෑමක්වත් මා කර නැහැ.ඒ කියපුවා ඒ විදියට ක්‍රියාත්මක කරන්න කියන එකයි මාගේ මතය.එම ගන්නා තීන්දු ගරු උප සභාපතිතුමා , ඔබතුමන්ලා සියළු දෙනා එකතු වෙලා ගන්නා ඒ තීන්දු ගන්න.දැන් මෙතනදි වුණත් බලන්න . එක්කෙනෙක් කියනවා අනවසරෙන් කඩය ඉවත් කරන්න. අනෙක් කෙනා කියනවා අනවසර කඩය ඉවත් කරන්න දෙන්න කියා. ඉතිං මේ ගරු සභාපති කියන්නේ මේ දෙකටම මැදිහත් වන මනුස්සයෙකි.කවුරු කියන දෙය අහන්නද? එක්කෝ ගරු සභාව එක මතයක ඉන්න ඕන.

<u>**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**</u>

අපි කියන්නේ නීතිය දෙවිදියකට ක්‍රියාත්මක වෙනවා කියා .

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

සමහර වෙලාවට ගරු මන්ත්‍රීතුමාම පැමිණිලි කරනවා.ගරු මන්ත්‍රීතුමාම කියනවා අනෙක් කෙනාට පැමිණිල්ලක් තියෙනවා කියා. ඒ වගේ තමයි.

<u>**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**</u>

ඇත්තටම මා කතා කරන්න යන්නෙත් නැහැ. ඇත්තටම ඔබතුමා හොඳ වැඩකට යන්න ඉන්නේ.නිකං යකා වගේ යන්න ඕනේ නැහැනේ.

**තීරණය**

2019.09.27 දින පැවති රථ වාහන හා ත්‍රි රෝද රථ කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**06.05 2019.09.17 දින පැවති ක්‍රිඩා කමිටු වාර්තාව සභාගත කරන ලදී.**

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

2019.09.17 දින පැවති ක්‍රිඩා කමිටු වාර්තාව මා යෝජනා කරනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්**</u>

එම යෝජනාව මා ස්ථිර කරනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි, විශේෂ යෝජනාවක් කියන්න තිබෙනවා. දීර්ඝ කාලයක් තිස්සේ අපි විශාල පරිශ්‍රමයක් දැරුවා මෙම ක්‍රීඩාංගණය නවීකරණය කටයුතු කිරීම සඳහා.නොබෝදා එම ක්‍රිඩාංගණයේ තණකොළ ඇල්ලීමේ කටයුත්ත අපි සියළු ගරු මන්ත්‍රිවරුන්ගේ ප්‍රධානත්වයෙන් සිදු වුණා.එහෙත් සමහරක් ගරු මන්ත්‍රිවරු සහභාගි වුයේ නැහැ.එය ගරු මන්ත්‍රිවරු දැන ගැනීම හොඳයි. මාස 2 ½ ක කාලයක් ඇතුළත එම ආයතනයෙන් අපට තණකොළ අල්ලා දෙන බව කිවුවා.සුවිශේෂි කරුණක් තිබෙනවා . වර්ෂාවෙන් බාධා නොවුණහොත්.ක්‍රීඩාවට සම්බන්ධ අය නිරන්තරයෙන් අසන නිසා තමයි මා මේ ක්‍රිඩාවට සම්බන්ධ නිසා තමයි මෙය කිවුවේ.මාස 2 ½ ඇතුළත මෙය ඉදිවෙනවා.වැස්සේ නැති වුණොත්. හැබැයි ගොඩක් වෙලාවට දෙසැම්බර් මාසය වැසි කාලය නිසා මා හිතන්නේ පෙබරවාරි මාර්තු වන විට මෙහි වැඩ කටයුතු අවසන් වෙයි කියා අපි විශ්වාස කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ඊට කලින් බැරිද?

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, පොඩි ඉල්ලීමක් තිබෙනවා. අර එළිමහන් ක්‍රීඩා උපකරණ ගැනීමට ටෙන්ඩර් කැඳවා තිබෙනවා. එම ක්‍රිඩා කට්ටලයක් තල්ගස්ගොඩ ප්‍රදේශයට ලබා දෙන මෙන් මා ඉල්ලා සිටිනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මා බැලුවා එම ලේඛණය. එහි තින්දු කර තිබෙන්නේ . මා නෙමේ එහි ප්‍රධානත්වය දරා ඇත්තේ ඔබතුමාමයි.එහිදි තීරණය කර තිබෙන්නේ ප්‍රධාන නගරයයි, මානාන ක්‍රීඩාංගණයයි,කළුවඩුමුල්ලයි එතකොට මේ ක්‍රීඩාංගණ තුනේම ඒවා ගන්න ලක්ෂ 24 ½ යනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්</u>**

කවුද දෙන්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

අපි දෙන්නේ. නගර සභා මුදල්.අපේ බලාපොරෝත්තුව තමයි සෑම කොට්ඨාශයකටම සවි කළාට කිසිම ප්‍රශ්නයක් නැහැ.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මා තින්දු කරන්න ඇති. මා මේ ගරු සභාවෙන් ඉල්ලීම් කරන්නේ අද මේ වනවිට තල්ගස්ගොඩ තමයි වැඩිම ජනගහණයක් සිටින්නේ.තල්ගස්ගොඩ තමයි වැඩිම රාජ්‍ය සේවකයන් පිරිසක් මේ වන විට සිටින්නේ. එමනිසා මා ඉල්ලා සිටින්නේ ඔබතුමා තමයි තින්දු කරන්න ඇත්තේ. මෙය ඉතාම හොඳ යෝජනාවකි.එමනසා මා ඉල්ලා සිටින්නේ ඒ ප්‍රදේශයේ ජනතාවටත් ලබා දෙන්න කියා. ලොකු දුරක් මෙහෙට එන්න වෙනවා. අම්බලන්ගොඩ නගරයට එනවා කියනනේ කිලෝමීටර් තුනක් විතර මෙහෙට එන්න වෙනවා.ඒ ජනතාවටත් මේ පහසුකම් ලබා දෙනමෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ඒක වෙනම ප්‍රාන්තයක්ද ? නැහැනේ.

**තීරණය**

2019.09.17 දින පැවති ක්‍රිඩා කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

07. **ටෙන්ඩර් හා මිළ ගණන් :-**

07.01 ටෙන්ඩර්

07.02 මිළ ගණන්

07.02.01 ජාතික කියවීමේ මාසය වෙනුවෙන් පැවැත්වෙන උත්සවයේ සතිකපත්‍ර මුද්‍රණය සඳහා මිළ ගණන් සභා ගත කරන ලදී.

| ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | සක්වා ප්‍රින්ටර්ස් | D.R.S. ප්‍රින්ටර්ස් | Sumudu printers |
|---|---|---|---|---|
| සහතික පත්‍ර ( කෝන්කර් පේපර් A4ප්‍රමාණය 4කලර් | 230 | 65/= | 77.50 | 85/= |
| ලිපිගොණු කවර (මෙරූන් පාට) | 230 | 65/= | 80/= | 100/= |
| ආරාධනා පත්‍ර | 300 | 22.50 | 28/= | 37.50 |
| මෙරූන් කලර් බැජ් | 1000 | 4.25 | 4.40 | 6/= |

තීරණය

ජාතික කියවීමේ මාසය වෙනුවෙන් පැවැත්වෙන උත්සවයේ සහතිකපත්‍ර මුද්‍රණය කිරිම සඳහා මිළ ගණන් ඉදිරිපත් කර ඇති ආයතන අතරින් අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති සක්වා ප්‍රින්ටර්ස් ආයතනයේ මිළ ගණන් පිළිගැනිම සුදුසු බව ගරු සභාව තීරණය කරන ලදී.

07.02.02 ජාතික කියවීමේ මාසය වෙනුවෙන් පැවැත්වෙන උත්සවයේ ශබ්ද විකාශන යන්ත්‍ර සඳහා මිළ ගණන් සභා ගත කරන ලදී.

| ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | Rock Music Engin | උපේන්ද්‍ර එගොඩගේ | සරත් ඉලෙක්ට්‍රිකල් |
|---|---|---|---|---|
| හෝන්ස් | 02 | 750/= | 600/= | 800/= |
| බෆල් | 08 | 2500/= | 2000/= | 2250/= |
| එෆ්.එම් මයික් | 07 | 750/= | 500/= | 600/= |
| නොටේෂන් ස්ටෑන්ඩ් | 01 | 600/= | 500/= | 750/= |
| පෝඩියම් මයික් | 01 | 750/= | 500/= | 700/= |
| කොලර් මයික් | 05 | 1500/= | 1000/= | 1250/= |
| කලර් ලයිට් | | 10000 | 8000/= | 10000/= |

තීරණය

ජාතික කියවීමේ මාසය වෙනුවෙන් පැවැත්වෙන උත්සවයේ ශබ්ද විකාශන උපකරණ සඳහා මිළ ගණන් ඉදිරිපත් කර ඇති පුද්ගලයන් අතරින් අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති උපේන්ද්‍ර එගොඩගේ මහතා විසින් ඉදිරිපත් කළ ඇති මිළ ගණන් පිළිගැනිම සුදුසු බව ගරු සභාව තීරණය කරන ලදී.

07.02.03 ජාතික කියවීමේ මාසය වෙනුවෙන් පැවැත්වෙන උත්සවයේ සමරු ඵලකය සඳහා මිළ ගණන් සභා ගත කරන ලදී.

| ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | විස්කම් ආට්ස් | සමාරා ප්ලාස්ටික් | වීරසිරි ඩිසයිනර් |
|---|---|---|---|---|
| සමරු ඵලක (ප්ලාස්ටික්) | 17 | 850/= | 750/= | 900/= |
| විශේෂ සමරු | 7 | 1550/= | 1475/= | 1650/= |

තීරණය

ජාතික කියවීමේ මාසය වෙනුවෙන් පැවැත්වෙන උත්සවයේ සමරු ඵලක සඳහා මිළ ගණන් ඉදිරිපත් කර ඇති ආයතන අතරින් අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති සමාරා ප්ලාස්ටික් ආයතනය විසින් ඉදිරිපත් කළ ඇති මිළ ගණන් පිළිගැනිම සුදුසු බව ගරු සභාව තීරණය කරන ලදී.

07.02.04 පොල්වත්ත ක්‍රීඩාංගණයේ විදුලි අලෝකරණකරණ විවෘත කිරිමේ උත්සවයේ සමරු ඵලක සඳහා මිළ ගණන් සභා ගත කරන ලදී.

| ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | වර්ගය | වීරසිරි ඩිසයිනර් | සමාරා ප්ලාස්ටික් | විස්කම් ආර්ට් කැෆේ |
|---|---|---|---|---|---|
| සමරු ඵලකය | අඩි 3*2 | ග්‍රැනයිට් | 25500/= | 24000/= | 26000/= |
| සමරු ඵලකය | අඩි4*2 | ටයිල් | 32000/= | 28000/= | 35000/= |

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල මහතා කතා කරමින්</u>**

කියද ගණන.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

රු.24000/= කි. පළමු සමරු පලකය. දෙවැනි සමරු පලකය රු.28000/= කි.නැහැ එය තිබිය යුතුයි. නැතිනම් ඔගොල්ලන්ගේ නම්ටික වත් වදින්නේ නැහැනේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල මහතා කතා කරමින්</u>**

නැහැ අපේ නම් ඕන නැහැ. බර ගාණක්.රු.24000/= ක් ද කොහේද?

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

හරි ඉතිං අපි හොඳ වැඩක් කරලා තිබෙන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල මහතා කතා කරමින්</u>**

ඔකේ නම දැම්මේ නැති වුණාට ඔබතුමාගේ නමනේ වැටෙන්නේ. අර උණුසුම් දීමනා එහෙම ගෙන පුහුණුවට ගිහිල්ලා එහෙමනේ ඇවිත් තිබෙන්නේ. එමනිසා මතකයේ තිබෙනවා.එමනිසා ඕක නැති වුණත් කමක් නැහැ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මෙකට විරුද්ධද කවුරුත්. නැහැනේ.

තීරණය

පොල්වත්ත ක්‍රීඩාංගනයේ විදුලි ආලෝකකරණ විවෘත කිරිමේ උත්සවයේ සමරු ඵලක සඳහා මිළ ගණන් ඉදිරිපත් කර ඇති ආයතන අතරින් අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති සමාරා ප්ලාස්ටික් ආයතනය විසින් ඉදිරිපත් කළ ඇති මිළ ගණන් පිළිගැනිම සුදුසු බව ගරු සභාව තීරණය කරන ලදී.

07.02.05 RA8796මහේන්ද්‍රා Q575 ට්‍රැක්ටරයේ අමතර කොටසස් සඳහා මිළ ගණන් ඉදිරිපත් කර ඇති මිළ ගණන් සභා ගත කරන ලදී.

| ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | රත්න මෝටර්ස් | එම්.එස් මෝටර්ස් | රුහුණු මෝටර්ස් |
|---|---|---|---|---|
| ක්ලච් ප්ලේට් | 01 | 5900/= | 6950/= | 6350/= |
| ප්‍රේෂර් ප්ලේට් | 01 | 12675/= | 14200/= | 13500/= |
| ක්ලච් රේසර් | 01 | 1150/= | 1625/= | 1425/= |
| ක්‍රෑන්ක් ඔයිල් සීල් | 01 | 750/= | 1250/= | 950/= |
| ප්‍රයියිප් රේසර් ( 6204) | 01 | 275/= | 595/= | 325/= |

තීරණය

RA8796 මහේන්ද්‍ර DI 575 ට්‍රැක්ටරයට අමතර කොටස් මිලදී ගැනිම සඳහා මිළ ගණන් ඉදිරිපත් කර ඇති ආයතන අතරින් අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති රත්න මෝටර්ස් ආයතනය විසින් ඉදිරිපත් කළ ඇති මිළ ගණන් පිළිගැනිම සුදුසු බව ගරු සභාව තීරණය කරන ලදී.

07.02.06 Inter Log ගල් සඳහා මිළ ගණන් සඳහා ඉදිරිපත් කර ඇති මිළ ගණන් සභා ගත කරන ලදී.

| ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | K.D.A. වීරසිංහ සහ සමාගම | K.G.Sකන්ට්‍රැක්ක් | R.N.U කොන්ක්‍රිට් | ජයන්ත කොන්ක්‍රිට් |
|---|---|---|---|---|
| Imter Log ගල්(222*80mm)25Nmm² | 36/= | නැත | නැත | 55/= |
| (ප්‍රවාහනයසමඟ)30 Nmm² | 40/= | නැත | නැත | - |

තීරණය

නගර සභාවට අවශ්‍ය Inter Log ගල් මිලදී ගැනිම සඳහා මිළ ගණන් ඉදිරිපත් කර ඇති ආයතන අතරින් අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති කේ.ඩී.ඒ. වීරසිංහ සහ සමාගම විසින් ඉදිරිපත් කළ ඇති මිළ ගණන් පිළිගැනිම සුදුසු බව ගරු සභාව තීරණය කරන ලදී.

07.02.07 252-0730 රථය සඳහා අමතර කොටස් ඉදිරිපත් කර ඇති මිළ ගණන් සභා ගත කරන ලදී.

| | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | වර්ගය | රුහුණු මෝටර්ස් | S.M.මෝටර්ස් | ඉසුරු මෝටර්ස් |
|---|---|---|---|---|---|---|
| 01 | තඹ කොපර් | 04 | | 25/= | 25/= | - |
| 02 | ෂොකබ් ෂොකර් | 04 | | 4950/= | 4250/= | 5200/= |
| 03 | ටයර් රොඩ් | 04 | | 3750/= | 3250/= | |
| 04 | බැලන්ස් බාර් බ්‍රෂ් | 02 | | 1025/= | 950/= | 1100/= |
| 05 | බැලනස් බාර් බ්‍රෂ් පොඩි | 04 | | 375/= | 325/= | - |
| 06 | කුරුස ෆොයින්ට් ( | 03 | | 2650/= | 2500/= | - |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | යුනිවර්සල් ජොයින්ට්) | | | | | |
| 07 | දුනු බුෂ් | 08 | | 195/= | 175/= | 220/= |
| 08 | වයිපර් බ්ලේඩ් | 02 | | 600/= | 500/= | 650/= |
| 09 | ඒඑම් ආම් බුෂ් | 02 | | 125/= | 650/= | 675/= |
| 10 | අපර් ආම් බුෂ් | 02 | | 1200/= | 1150/= | 1100/= |
| 11 | පොපියුලර් ෂාප් මවුන්ට් රේසර් | 01 | | 3450/= | - | - |
| 12 | හොන් ( japan ) 12v | 02 | | 1950/= | 1875/= | 2200/= |
| 13 | සෙලස්ටික් ගම් | 01 | | 575/= | 550/= | 600/= |
| 14 | රබර් ප්‍රිස් | 01 | | 480/= | 450/= | 450/= |
| 15 | mp90ගියර් ඔයිල් ලීටර් | 04 | | 1150/= | 1140/= | 1150/= |
| 16 | කොයිල් ස්ප්‍රින් පෑඩ් | 02 | | 1250/= | 1100/= | |

තීරණය

252-0730 රථය සඳහා අමතර කොටස් මිලදී ගැනිම සඳහා මිළ ගණන් ඉදිරිපත් කර ඇති ආයතන අතරින් අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති එස්.එම් මෝටර්ස් ආයතනය විසින් ඉදිරිපත් කළ ඇති මිළ ගණන් පිළිගැනිම සුදුසු බව ගරු සභාව තීරණය කරන ලදී.

07.02.08 LED Screen කියවීමේ මාසය වෙනුවෙන් පවත්වන උත්සවය සඳහා ඉදිරිපත් කර ඇති මිළ ගණන් සභාගත කරන ලදී.

| අනු අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | Emerging Events | Cool Zone | $H_2$Enterainwend |
|---|---|---|---|---|---|
| 01 | 12w*08h high resolution Led with transport | 01 | 36000/= | 50000/= | 45000/= |
| 02 | 16*8 Led Panel | 01 | 18000/= | - | 60000/= |
| 03 | 1610 High Definition P3LED Screen | 01 | 34000/= | 60000/= | 70000/= |

තීරණය

කියවීමේ මාසය වෙනුවෙන් පවත්වන උත්සවයේ LED Screen සඳහා මිළ ගණන් ලබා දී ආයතන අතරින් Cool zone Entertainers H2 Entertainment ආයතන දෙකෙහි LED පැනල් පරික්ෂා කර මිල ගණන් පිළිගැනිම සුදුසු බව ගරු සභාව තීරණය කරන ලදී.

07.02.09 අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍ය ලියුම් කවර මිලදී ගැනිමේ මිළ ගණන් සභාගත කරන ලදී

| ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | සුමුදු ප්‍රින්ටර්ස් | DRS ප්‍රින්ටර්ස් | සක්වා ප්‍රින්ටර්ස් |
|---|---|---|---|---|
| ලියුම් කවර (16*12) | 100 | 22.50 | 25/= | 19.75 |

තීරණය

අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍ය ලියුම් කවර මිලදී ගැනිම සඳහා මිළ ගණන් ඉදිරිපත් කර ඇති ආයතන අතරින් අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති සක්වා ප්‍රින්ටර්ස් ආයතනය විසින් ඉදිරිපත් කළ ඇති මිළ ගණන් පිළිගැනිම සුදුසු බව ගරු සභාව තීරණය කරන ලදී.

07.02.10 පොල්වත්ත පියසේන ළමා ක්‍රිඩාංගනය ආලෝකරණය ජනතා අයිතියට පත් කිරිමේ වැඩ සටහනේ ප්‍රදර්ශනාත්මක පාපන්දු තරඟාවලියේ කණ්ඩායම් වලට පාපන්දු ලබා දීම සඳහා මිළ ගණන් සභාගත කරන ලදී.

| ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | GDM Sports Gads | Kavindi Sports | Githmi Sports |
|---|---|---|---|---|
| පාපන්දු | 06 | 2850/= | 2950/= | 2600/= |

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එදින තරඟ කරන ක්‍රිඩා කණ්ඩායම් හය සඳහා පාපාන්දුවක් ත්‍යාගයක් වශයෙන් පරිත්‍යාග කරනවා.අනුමත කරන්නේ මේ සභාවේදි .

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

මේවා ලබා දෙනකොට සභාවට පැමිණ යෝජනා කර අනුමත කරගෙන යන්න ඕන.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

දැන් වෙනත් කරුණු යටතේ එය යන්නේ.

තීරණය

පොල්වත්ත පියසේන ළමා ක්‍රිඩාංගනය ආලෝකරණය ජනතා අයිතියට පත් කිරිමේ වැඩ සටහනේ ප්‍රදර්ශනාත්මක පාපන්දු තරඟාවලියේ කණ්ඩායම් වලට පාපන්දු ලබා දීම සඳහා මිළ ගණන් ඉදිරිපත් කර ඇති ආයතන අතරින් අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති Githmi Sports ආයතනය විසින් ඉදිරිපත් කළ ඇති මිළ ගණන් පිළිගැනිම සුදුසු බව ගරු සභාව තීරණය කරන ලදී.

07.02.11 පොස්ටර් මුද්‍රණය සඳහා ඉදිරිපත් කර ඇති මිළ ගණන් සභාගත කරන ලදී.

| ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | සක්වා ප්‍රින්ටර්ස් | සුමුදු ප්‍රින්ටර්ස් | DRS ප්‍රින්ටර්ස් |
|---|---|---|---|---|
| අඩි15*2.5 පොස්ටර් වර්ණ | 325 | 26/= | 37.50 | 30/= |

තීරණය

පොස්ටර් මුද්‍රණය සඳහා මිළ ගණන් ඉදිරිපත් කර ඇති ආයතන අතරින් අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති සක්වා ප්‍රින්ටර්ස් ආයතනය විසින් ඉදිරිපත් කළ ඇති මිළ ගණන් පිළිගැනිම සුදුසු බව ගරු සභාව තීරණය කරන ලදී.

07.02.12 අම්බලන්ගොඩ නගර සභා පෙර පාසැල් අධ්‍යාපන චාරිකාව සඳහා අවශ්‍ය බස් රථ සැපියීම සම්බන්ධව ඉදිරිපත් කර ඇති මිල ගණන් සභාගත කරන ලදී.

| ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | වර්ගය | R.P.R නිලන්ති පෙරේරා | A.M.D.S.P දිල්කරුක්ෂි | අනුර ප්‍රේමතිලක |
|---|---|---|---|---|---|
| පෙර පාසල් අධ්‍යයන චාරිකාව ( අ/ගොඩ -උඩවලව) එක්දින | 07 | ලේලන්ඩ් | 24000/= | 22500/= | 30000/= |

තීරණය

අම්බලන්ගොඩ නගර සභා පෙර පාසැල් අධ්‍යාපන චාරිකාව සඳහා අවශ්‍ය බස් රථ සැපියීම සම්බන්ධව මිල ගණන් ඉදිරිපත් කර ඇති පුද්ගලයන් අතරින් අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති A.M.D.S.P දිල්රුක්ෂි මහත්මිය විසින් ඉදිරිපත් කළ ඇති මිළ ගණන් පිළිගැනීම සුදුසු බව ගරු සභාව තීරණය කරන ලදී.

07.02.13 K.Form ( දේපල තක්සේරු දැන්වීම් මුද්‍රණය සඳහා ඉදිරිපත් කර ඇති මිල ගණන්

සභාගත කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ශ්‍රැක් කම්පියුටර්ස් | සක්වා ප්‍රින්ටර්ස් | ආරියදාස ප්‍රින්ටර්ස් |
|---|---|---|---|---|
| 01 | දේපළ තක්සේරු දැන්වීම් මුද්‍රණය සඳහා ( 15"*8"(DWB) 60gsm ආනයනය කළ කඩදායියේ තනිවර්ණයෙන් පැති දෙකම මුද්‍රණය සඳහා | කඩදාසි 1000 යුත් එක් පැකට්ටුවක මිල රු.2800/= | රු.3250/= | රු.3500/= |

තීරණය

අම්බලන්ගොඩ නගර සභාවේ දේපල තක්සේරු දැන්වීම් මුද්‍රණය සඳහා මිල ගණන් ඉදිරිපත් කර ඇති ආයතන අතරින් අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති ශ්‍රැක් කම්පියුටර් ෆෝට්ස් ආයතනය විසින් ඉදිරිපත් කළ ඇති මිළ ගණන් පිළිගැනීම සුදුසු බව ගරු සභාව තීරණය කරන ලදී.

07.02.14 අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍ය ලිපිද්‍රව්‍ය මුද්‍රණය සඳහා ඉදිරිපත් කර ඇති මිල ගණන් සභා ගත කරන ලදී.

| කය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | D.R.Printers | සුමුදු ප්‍රින්ටර්ස් | සක්වා ප්‍රින්ටර්ස් |
|---|---|---|---|---|---|
| 01 | වෙළඳ බලපත් පොත් | 02 | 1700/= | 1500/= | 1375/= |
| 02 | වවුචර් පොත් | 25 | 820/= | 800/= | 780/= |
| 03 | කැෂියර් බිල්පත් ( 4000) බන්ඩල් | 5000 | 14.25 | 12.50 | 10950/=(1000 බන්ඩල් 1ක් ) |

තීරණය

අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍ය ලිපිද්‍රව්‍ය මුද්‍රණය සඳහා මිල ගණන් ඉදිරිපත් කර ඇති ආයතන අතරින් අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති සක්වා ප්‍රින්ටර්ස් ආයතනය විසින් ඉදිරිපත් කළ ඇති මිළ ගණන් පිළිගැනිම සුදුසු බව ගරු සභාව තීරණය කරන ලදී.

07.02.15 අනතුරුදායක පොල්ගස ඉවත් කිරිම සඳහා ඉදිරිපත් කර ඇති මිල ගණන් සභාගත කරන ලදී.( A.G.පාලිත මහතාගේ)

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | M ලක්ෂාන් සංජය | K.G චතුරංග | වීබඩගේ ධර්මදාස |
|---|---|---|---|---|
| 01 | කෙරමිණිය , අම්බලන්ගොඩ A.G.පාලිත මහතාගේ ඉඩමේ ඇති අනතුරුදායක ගස් ඉවත් කිරිම | 2500/= | 2800/= | 3000/= |

තීරණය

අනතුරුදායක පොල්ගස ඉවත් කිරිම සඳහා මිල ගණන් ඉදිරිපත් කර ඇති පුද්ගලයන් අතරින් අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති එම්.ලක්ෂාන් සංජය මහතා විසින් ඉදිරිපත් කළ ඇති මිළ ගණන් පිළිගැනිම සුදුසු බව ගරු සභාව තීරණය කරන ලදී.

07.02.16 අම්බලන්ගොඩ නගර සභා පුස්තකාල පොත් බැඳිම සඳහා ( අමුද්‍රව්‍ය යොදා අදාල කාර්ය කිරිමට ) ඉදිරිපත් කර ඇති මිල ගණන් සභාගත කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | S.W. හරිස්චන්ද්‍ර |
|---|---|---|
| 01 | 7 ½ *10" ප්‍රමාණයේ පොත් ( අමුද්‍රව්‍ය සහිතව) | 225/= |
| 02 | 8 ¼ "*11 ½ ප්‍රමාණයේ පොත් ( අමුද්‍රව්‍ය සහිතව) | 250/= |

තීරණය

අම්බලන්ගොඩ නගර සභා පුස්තකාල පොත් බැඳිම සඳහා ( අමුද්‍රව්‍ය යොදා අදාල කාර්ය කිරිමට ) මිල ගණන් ඉදිරිපත් කර ඇත්තේ එස්.ඩබ්. හරිස්චන්ද්‍ර මහතා විසින් පමණි. එම මිළ ගණන් පිළිගැනිම සුදුසු බව ගරු සභාව තීරණය කරන ලදී.

07.02.17 අනතුරුදායක පොල්ගස ඉවත් කිරිම සඳහා ඉදිරිපත් කර ඇති මිල ගණන් සභාගත කරන ලදී (තිලක් දිලිප මහතාගේ ඉඩමේ)

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | M ලක්ෂාන් සංජය | K.G චතුරංග | වීබඩගේ ධර්මදාස |
|---|---|---|---|---|
| 01 | චන්ද්‍රවංශ පාර , අම්බලන්ගොඩ පදිංචි තිලක් දිලිප මහතාගේ ඉඩමේ ඇති අනතුරුදායක ගස් ඉවත් කිරිම | 6000/= | 6500/= | 7000/= |

තීරණය

පොල් ගස් කැපීම සඳහා ( තිලක් දිලිප මහතාගේ ඉඩමේ ) මිල ගණන් ඉදිරිපත් කර ඇති පුද්ගලයන් අතරින් අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති ලක්ෂාන් සංජය මහතා විසින් ඉදිරිපත් කරන ලද මිළ ගණන් පිළිගැනිම සුදුසු බව ගරු සභාව තීරණය කරන ලදී.

07.02.18 අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍ය විදුලි උපරකරණ මිලදී ගැනිම සඳහා ඉදිරිපත් කර ඇති මිල ගණන් සභා ගත කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | වර්ගය | Asian Elecrical | ජිනදාස ඉලෙක්ට්‍රිකල් |
|---|---|---|---|---|---|
| 01 | 1/044දුඹුරු පාට වයර් රෝල් ( 100mm) | 05 | SLS | 1950/= | 2000/= |
| 02 | 1/044 නිල්පාට වයර් රෝල් | 05 | | 1950/= | 2000/= |
| 03 | 7/067 අර්ත් වයර් රෝල්( 100mm) | 02 | | 4700/= | 5000/= |
| 04 | 1Gan ස්විච් | 100 | Kavilion | 125/= | 150/= |
| 05 | CG හෝල්ඩර් | 100 | | 75/= | 35/= |
| 06 | ¾ කන්ඩියුබ් බට | 20 | Arrow | 90/= | 90/= |
| 07 | ¾ කන්ඩියුබ් බට T සොකට් | 30 | | 5/= | 10/= |
| 08 | ¾ ජන්සන් බෝක්ස් | 30 | | 10/= | 15/= |
| 09 | 1 කන්ඩියුඩ් බට | 10 | Arnas | 125/= | 125/= |
| 10 | ¾ බෙන්ඩ් | 30 | | 7/= | 10/= |
| 11 | සිවිලින් ෆෑන් | 05 | KDK | 4750/= | 4000/= |
| 12 | 125v මර්කරි බල්බ් | 100 | Oszan | 690/= | 390/= |
| 13 | 125Chalk | 50 | V.S | 850/= | 750/= |

තීරණය

අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍ය විදුලි උපරකරණ මිලදී ගැනිම සඳහා ඉදිරිපත් කර ඇති මිල ගණන් ප්‍රමාණවත් නොවන බැවින් නැවත මිල ගණන් ඉදිරිපත් කිරිම සුදුසු බවට ගරු සභාව තීරණය කරන ලදී.

07.02.19 අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍ය ටෝනර් මිලදී ගැනිම සඳහා ටෝනර් 85A වර්ගය සඳහා ඉදිරිපත් කර ඇති මිළ ගණන් සභාගත කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | වර්ගය | Omark Technology | කම්පියුටර් | Tulip Computer |
|---|---|---|---|---|---|---|
| 01 | ටෝනර් 85A | 05 | HP | 9750/= | 1500/= | 11250/= ( HP ) |
| 02 | ටෝනර් T-230Gp (Toshiba) | 10 | | - | - | 1600/= |
| 03 | ටෝනර් T-250 IP | 05 | | - | - | |

තීරණය

අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍ය ටෝනර් මිලදි ගැනිම සඳහා ටෝනර් 85A වර්ගය සඳහා ඉදිරිපත් වී ඇති මිල ගණන් අතුරින් සාපේක්ෂව ඉතා අවම මිලක් සහිත ECO PluS වර්ගයේ ටෝනර් ඉදිරිපත් කර තිබුනද HP වර්ගය සඳහා සාපේක්ෂව ඉහල මිලක් ලබා දී තිබුනද ටෝනර් මිලදී ගැනීමේදි ප්‍රමිතිය පිළිබඳ සැලකිලිමත් වීම වැදගත් බැවින් නගර සභා තොරතුරු තාක්ෂණ නිලධාරරිගේ පරීක්ෂාවෙන් අනතුරුව ආයතන 3ම අයිතම පරීක්ෂා කර සුදුසු අයිතමය මිලදී ගැනීම සුදුසු බව ගරු සභාව තීරණය කරන ලදී.

07.02.20 අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍ය කොසු සඳහා ( කොහු වලින් නිෂ්පාදිත ) ඉදිරිපත් කර ඇති මිල ගණන් සභාගත කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | නයන රංජන | ටී.එච්.හේමසිරි ද සිල්වා | රවින්ද්‍ර රාජපක්ෂ |
|---|---|---|---|---|
| 01 | කොහු වලින් නිෂ්පාදිත කොහු | 125/= | 100/= | 140/=<br>210/=<br>210/= |

තීරණය

අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍ය කොසු සඳහා ( කොහු වලින් නිෂ්පාදිත ) මිල ගණන් ඉදිරිපත් කර ඇති පුද්ගලයන් හා ආයතන අතරින් අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති ටී.එච්.හේමසිරි ද සිල්වා මහතා විසින් ඉදිරිපත් කරන ලද මිළ ගණන් පිළිගැනිම සුදුසු බව ගරු සභාව තීරණය කරන ලදී.

07.02.21 අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍ය ලිපිද්‍රව්‍ය සඳහා ඉදිරිපත් කර මිල ගණන් සභාගත කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | රජයේ මුද්‍රණ නිතිගත සංස්ථාව |
|---|---|---|
| 01 | ගම් බෝතල් මිලිලීටර් 750 | 98/= |
| 02 | කාබන් කොල - තනිපැත්ත ( පැකට් 01) | 450/= |
| 03 | කාබන් කොල - දෙපැත්ත ( පැකට් 01) | 450/= |
| 04 | පර්මනත් මාකර් පෙන් | 60/= |
| 05 | තීන්ත පෑඩ් | 150/= |
| 06 | කතුරු ලොකු | 90/= |
| 07 | අනුපිටපත් පොත් 1 / 8 ( SPC) | 140/= |

තීරණය

අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍ය ලිපිද්‍රව්‍ය සඳහා මිල ගණන් ඉදිරිපත් කර ඇත්තේ රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව මඟින් පමණි. එම මිල ගණන් පිළිගැනිම සුදුසු බව ගරු සභාව තීරණය කරන ලදී.

07.02.22 ත්‍රි රෝද රථ ගාල් කිරීමේ ස්ථාන වලට අවශ්‍ය බෝඩ් සෑදිමට අවශ්‍ය ද්‍රව්‍ය මිලදි ගැනිමට ඉදිරිපත් කරන ලද මිළ ගණන් සභාගත කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ස්ටර්ලින් හාඩ්වේයාර් | පූර්ණ හාඩ්වේයාර් | B.K.S හාඩ්වේයාර් |
|---|---|---|---|---|
| 01 | 1½"ගැල්වනයිස් බට( 1.8mm) | 4675/= | 1700/= | 4275/= |
| 02 | 1"boxbar ( 1.8mm) | 1600/= | 1350/= | 1425/= |
| 03 | 8"0"*4"-0"GI Sheet ( 1/8 "ඝනකම ) | - | - | 7700/= |
| 04 | Cutting Wheel | 100/= | 75/= | 70/= |
| 05 | Grinding Wheel | 160/= | 140/= | 160/= |
| 06 | 1000 Gauge (ඉටිකොළ 1Kg3ක්) | 450/= | - | 240/= |
| 07 | වෙල්ඩින් කූරු (12) | 300/= | 675/= | 615/= |

තීරණය

ත්‍රි රෝද රථ ගාල් කිරීමේ ස්ථාන වලට අවශ්‍ය බෝඩ් සෑදීමට අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීමට මිල ගණන් ඉදිරිපත් කර ඇති ආයතන අතරින් අඟල් 1*1 box bar ( 1.8mm) හා වෙල්ඩින් කූරු මිලදී ගැනීම සඳහා අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති ස්ටාර්ලයින් හාඩ්වේයාර් ආයතනයේ මිල ගණන් පිලිගැනීමටත් , අඟල් 1 ½ ගැල්වනයිස් බට ( 1.8mm) හා Grinding wheel ( 4 ½ ) සඳහා අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති පූර්ණා හාඩ්වේයාර් ආයතනයෙන් මිලදී ගැනීමටත්, , අඟල් 8-අඟල්0*4-අඟල් 0 GI Sheet ( 1 / 8 ඝනකම ) ,Cutting wheel ( 4 ½ ") හා 100 gauge ඉටිකොල (1kg ක් ) මිලදී ගැනීම සඳහා අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති B.K.S. හාඩ්වේයාර් ආයතනයේ මිළ ගණන් පිළිගැනිම සුදුසු බව ගරු සභාව තීරණය කරන ලදී.

07.02.23 අම්බලන්ගොඩ නගර සභා ඉහල මාලයේ ඉදිකිරිම් වලට අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා ඉදිරිපත් වී ඇති මිල ගණන් සභාගත කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | B.K.S හාඩ්වේයාර් | Starling හාඩ්වේයාර් | පූර්ණ හාඩ්වේයාර් |
|---|---|---|---|---|---|
| 01 | වැලිකොළ නො 60 ( අඩි1 ) | 15 | 85/= | 75/= | 70/= |
| 02 | වැලිකොළ නො 80 ( අඩි1 ) | 25 | 85/= | 75/= | 70/= |
| 03 | වැලිකොළ නො 120 ( අඩි1 ) | 25 | 85/= | 75/= | 70/= |
| 04 | මල්ටිබොන්ඩ්ගම් 250g | | 400/= | 655/= | 850/= |
| 05 | ඉපිෆැන්ගම් කිලෝ01 | | 1635/= | 3100/= | 1475/= |
| 06 | යකඩ ඇණ අඟල්1 | | 200/= | 200/= | 210/= |
| 07 | යකඩ ඇණ අඟල් 1 ½ | | 200/= | 200/= | 210/= |
| 08 | යකඩ ඇණ අඟල්2 | | 200/= | 200/= | 210/= |
| 09 | පිත්තල ස්කුරුප්පු ඇණ ¾*7 | | 978.30 | 950/= | 7.50 |
| 10 | පිත්තල ස්කුරුප්පු ඇණ ¾*6 | | 809.10 | 850/= | 6.50 |
| 11 | පිත්තල ස්කුරුප්පු ඇණ 1 ½ *7 | | 1785.60 | 1800/= | 17/= |

| | | | | | |
|---|---|---|---|---|---|
| 12 | පිත්තල පැනල් පීනිෆැන් ඇණ | | 1075/= | 1180/= | 1050/= |
| 13 | | | 600/= | 500/= | 475/= |

තීරණය

අම්බලන්ගොඩ නගර සභා ඉහල මාලයේ ඉදිකිරීම් වලට අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා ඉදිරිපත් වී ඇති මිල ගණන් අතුරින් අයිතම අංක 01,02,03,05 හා 13 සඳහා අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති පූර්ණා හාඩ්වේයාර් ආයතනයේන්ද අංයිතම අංක 04,06,07.08,09,10,11,12 අයිතම පරීක්ෂාකර බලා මිල ගණන් පිලිගැනීම සුදුසු බව ගරු සභාව තීරණය කරන ලදී.

## 08 ගෙවීම් :-

08.01 2019 සැප්තැම්බර් 01-15 දක්වා වැට් මුදල් වන රු.145879.13ක මුදලක් දේශිය ආදායම් කොමසාරිස් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතික සභා සම්මත විය.

08.02 නගර සභාව මගින් පාලනය වන පුස්තකාල සඳහා පුවත්පත් සැපයීම වෙනුවෙන් රු.50650/= ක මුදලක් එම්.එස් වීරසිංහ මහතා වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි සරත් ශ්‍රී ලාල් මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතික සභා සම්මත විය.

08.03 නගර සභා මන්ත්‍රිවරුන්ගේ ගමන් වියදම් ගෙවීම සඳහා රු.33000/= ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි සහා අනුමැතියට යටත්ව ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතික සභා සම්මත විය.

08.04 පොදු වෙළඳපොල පරිපාලක I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීමේ හිඟ වැටුප්වන රු.60817.08/= ක මුදලක් එච්.ටී.සී.එච්. ද සිල්වා මහතා වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතික සභා සම්මත විය.

08.05 හල්වතුර කසලාංගනය සඳහා ජල සම්බන්ධතාවය ලබා ගැනීම සඳහා ඇස්තමේන්තු මුදල වන රු. 26995.50 ක මුදලක් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතික සභා සම්මත විය.

08.06 ඕකන්ද ප්‍රජා ශාලාවට ජල සම්බන්ධතාවය ලබා ගැනීමට ඇස්තමේන්තු මුදල වන රු 26650/=ක මුදලක් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතික සභා සම්මත විය.

08.07 විහාරගොඩ පාර හරස් කාණුව ඉදිකිරීම සඳහා රු231595.06ක මුදලක් පොල්වත්ත ප්‍රජා මණ්ඩලයට ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතික සභා සම්මත විය.

__ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්__

ගරු සභාපතිතුමනි, මේ විහාරගොඩ කාණුව මොකක්ද?

__ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්__

පෙට්ටි බෝක්කුව.අර පොල්වත්ත පාරට ඇතුළුවන තැන.

__ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්__

ගරු සභාපතිතුමනි, මේ විහාරගොඩ කියා තිබෙන්නේ.

__ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්__

මෙය විහාරගොඩට ද අයිති

__ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්__

නැහැ. විහාරගොඩට නෙමේ. එකතමයි නම.එම පාරේ නම විහාරගොඩ මාවත.

08.08 විලේගොඩ එස්.ජී.ඒ. ද සිල්වා පාර (ඩෙන්සිල් මහතාගේ නිවස අසළ ) කාණුව ඉදිකිරීම සඳහා රු.157132.59ක මුදලක් විලේගොඩ ප්‍රජා මණ්ඩලයට ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතික සභා සම්මත විය.

08.09 විලේගොඩ එස්.ජී.ඒ. ද සිල්වා පාර (ලුම්බිනි ස්ටුඩියෝ අසළ ) කාණුව ඉදිකිරීම සඳහා රු.90908.97ක විලේගොඩ ප්‍රජා මණ්ඩලයට ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතික සභා සම්මත විය.

08.10 හින්ඇල පාර හරහා ඇති බෝක්කුව කොන්ක්‍රීට් කිරීම වෙනුවෙන් රු.360143.33/=ක මුදලක් විලේගොඩ ප්‍රජා මණ්ඩලයට ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතික සභා සම්මත විය.

08.11 RA -2509 දරණ ට්‍රැක්ටර් රථයේ පිටුපස රිම් සඳහා රු.113400.01/=ක මුදලක් Wimal Agro Tractors (Pvt) Ltd වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතික සභා සම්මත විය.

08.12 ලෝක ළමා දිනය වෙනුවෙන් සෙල්ලම් උපකරණ ලබා ගැනීම වෙනුවෙන් සහා අනුමතියට යටත්ව රු.51500/=ක P.G.Martin Wonder World ආයතනය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතික සභා සම්මත විය.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

මේක ගැටළුවක් නැහැ මේවා කරන එක.නමුත් මා එදා ඇසුවා ලෝක ළමා දිනයට මුදල් සොයා ගැනිම පිළිබඳ විස්තරයක්.මොකක්ද මෙහි මුදල් හම්බ වුණාද?කොච්චර හම්බවුණාද?

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ප්‍රජා සංවර්ධන නිලධාරිතුමිය කියන්න.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

නැහැ . මා කියන්නේ මේවාට මුදල් සොයා ගත්තේ ආයෝජකයන්ගෙන්ද?

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

රු.150000/= ක මුදලක් තමයි ආයෝජකයන් මඟින් හම්බ වී තිබෙන්නේ.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

එතකොට එකතු කර බැලුවාම කොච්චර මුදල් අපෙන් යනවාද? මොකද දන්නවාද මා මේ අහන්නේ. දැන් ඔබතුමලා ආරාධනා පත්‍රයක් එවා තිබුණා.ගරු මන්ත්‍රීවරයෙකුගේවත් නමක් නැහැ.නිකමටවත් එය සඳහන් වෙලාත් නැහැ.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ඒ කියන්නේ මොකක්ද ? ගරු මන්ත්‍රීවරයෙක් නැහැ කියන්නේ.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

දැන් එම ආරාධනා පත්‍රයේ ඔබතුමාගේ නම ලස්සනට තිබෙනවා.ගරු මන්ත්‍රීවරුන්ගේ නැහැ.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

නැහැ . එක පොඩි ළමුන්ට දිපු එකක්.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

පොඩි ළමුන්ට දිපු එකේ තමයි මා කියන්නේ.එතකොට ඔබතුමාගේ ෆොටෝ එක විතරක් තිබුණාම ඇත්ද? මේ දේශපාලනික වැඩ.අන්න එකයි මා කියන්නේ.වැඩක් කරන විට අපි සහායෝගයෙන් වැඩ කරන්න. ගෙවීම ප්‍රශ්නයක් නැහැ. පොඩි ළමයින්ගේ එක ප්‍රශ්නයක් නැහැ.නමුත් අපි ඇසුවේ ඒකයි. පුළුවන්තරම් මුදල් සොයාගෙන ඒක කරන්න.දැන් ඕක කළා වගේ නෙමේ . ක්‍රීඩාංගණයේත් හැටි බලන්න.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

හරි දැන් අපි ක්‍රිඩාංගණය හදනවා.එය හදා දැන් විදුලි ආලෝකය දමා තිබෙන්නේ.

**ගරු නගර සභා මන්ත්‍රි රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

මේ නගර සභාවේ මුදල් තමයි මේ අපතේ යන්නේ.එකයි අපි කියන්නේ . වැඩක් කරන කොට ඒ විදියට කරන්න.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

දැන් මෙහෙමයි ගරු මන්ත්‍රීතුමා , අපි වැස්ස බලාපොරෝත්තු වෙලා ඕක කළේ නැහැ.දැන් වහිනකොට ඒ වගේ දේවල් වෙනවා.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

හරි ඒක හරි . මේක කරන කොට මුදල් සොයාගෙන කරන්න කිවුවේ එකයි.එම ක්‍රීඩාංගණයටත් අපිට වියදම් කරන්න වෙන නිසා.ඒකයි අපි කිවුවේ. කමක් නැහැ අනුමත කරන්නම්.නැතිනම් ඕක කියයි . මෙය අනුමත කළේ නැහැ කියා.

**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්**

මෙතුමා කිවුව එකේ පොඩි කරුණක් තිබෙනවා.දැන් නගර සභාවෙන් මෙයට මුදල් යොදවා සැමරිම අපට ගැටළුවක් නැහැ.එතකොට එකතු වෙලා තිබෙන්නේ රු.150000/=කි.දැන් මෙහි වියදම තිබෙනවා ලක්ෂ 5කට වැඩිය.එතකොට දැන් ක්‍රීඩාංගණය හදන්න තවත් මුදල් යනවා.එතකොට මේ මුදල් මෙහෙම යනකොට මේ නගරයේ මුදල් යන්නේ.මා මේ කිසිම කුහකභාවයකින් කියන කතාවක් නෙමේ. එතකොට ඔබතුමාගේ එම ඡායරූපය පමණක් දමා එහෙම කිරිම වැරදියි.එය අම්බලන්ගොඩ ගරු නගර සභාවේ සභාපතිතුමා ඇතුළු සියළු ගරු මන්ත්‍රිවරුන්ගේ කියන වුණානම් හොඳයි.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මා එයට පිළිතුරක් දෙන්නම්.එය මුද්‍රණය කර දුන්නේ අජිත් එගොඩගේ කියන මහතායි.එය නොමිලේ එතුමා ගණනේ ගසා දුන් එකක්.එතුමාගේ නිර්මාණයක් ඒක.එය අපි බෙදුවා.එයට සතයක්වත් නගර සභාවෙන් ගිහින් නෑ.

**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්**

නැහැ . එම කාඩ් එකට විතරයිනේ මුදල් යන්නේ.එතකොට මේවාට මුදල් ගෙවන්නේ අපිනේ.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

දැන් එතුමා එම කාඩ්එකට මාගේ රූපය දැම්මානේ.

**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්**

දැන් එතුමා මේකටත් මුදල් ගෙවනවානම් ප්‍රශ්නයක් නැහැ.එක නෙමේ මා කියන්නේ . එතුමා එයට මුදල් ගෙවනවා නම් එතුමා මේ ටිකත් ගෙව්වානම් ප්‍රශ්නයක් නැහැ.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

දැන් මේ ගම්පෙරළිය එකේ ඔබතුමාගේ ෆොටෝ එක තිබෙන්නේ. ඒ ඔබතුමා ගෙදරින් ගෙනවිත් හදලා නිම කළ පාරවල් නෙමෙනේ.අන්න ඒ වගේ තමයි.

**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්**

ඔබතුමලාගේ ආණ්ඩුව කාලේ උත්තර දෙන්න අපිට.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපි පාරවල් හදා තිබෙනවා මේ අම්බලන්ගොඩ. කිසිම දිනයක බෝඩ්එකක් දමා නැහැ අපේ රූපය දමා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

මේවා ඔබතුමලාගේ ආණ්ඩු කාලේ ගහපු ෆොටෝ ඕනතරම් තිබෙනවා. ඔබතුමා ඇහුව එකට උත්තර දෙන්න.මා කියන්නේ අපි මෙකට විරුද්ධ නැහැ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඒක එම මහතා විසින් ලබාදුන් පරිත්‍යාගයකි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

එහෙනම් එය ඔබතුමා එය නිවැරදි කරන්න.අපි එය ඔබතුමාට කිසිම අහිතකට කියපු දෙයක් නෙමේ.එය නිවැරදිව මේවා කරන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

දැන් ගරු නගර සභා මන්ත්‍රී රාහුල මහතාට මෙය ඇසිය හැකියි. ඔබතුමාගේ ලැයිස්තුග මන්ත්‍රීවරයෙක් තමයි මන්ත්‍රීධුරය සඳහා ඉල්ලන ලද කෙනෙක් තමයි අජිත් එගොඩගේ කියන්නේ. ශ්‍රීලංකා නිදහස් පක්ෂයේ.එම මහතා එතුමාගේ වියදමින් මෙය ගෙනවිත් අපට දුන්නා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

එතුමා දිපු එකට සතුටු වෙනවා.මෙය කතා කරන්නේ අරයට බෝලය පාස් කරලා මෙයාට බෝලය පාස් කරන්න නෙමේ.අපි කියන්නේ මේ මුදල් ඉතිරි කරගෙන මේ නගරයේ ජනතාවට ක්‍රමවත් වැඩක් කරන්න කියන එකයි මේ සත්භාවයෙන් කියන්නේ.එකයි ප්‍රශ්නය.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

දැන් අපි මේ වැඩය ලෝක ළමා දිනය පටන් ගන්න කලින් ගරු සභාපතිතුමා කිවුවේ අපි මෙය කරන්නේ මුදල් සොයාගෙන . නගර සභාවෙන් සතයක්වත් ගන්නේ නැහැ කියා. එහෙම ප්‍රකාශයක් කළාද?

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඔව්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

එතකොට දැන් මේ වනවිට ලක්ෂ කියක්ද මන්දා අපි නගර සභාවෙන් ගෙවන්න ඕන.කමක් නැහැ අපි එය කරන්නේ ළමයි වෙනුවෙනි. එතකොට නගර සභාවෙන් පොඩි දරුවන් වෙනුවෙන් මෙය කළානම්. මා මෙය දකින්නේ දේශපාලන ප්‍රවර්ධන වැඩ සටහනක් හැටියටයි මෙය දියත් වුණේ.නීහතමානිව පිළිගන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එහෙමනම් කිසිසේත්ම නැහැ. අපි ආරම්භක අවස්ථාවේ සිටියා . අපි ඇල්පිටියේ ඡන්ද වැඩවලට ගියා. අප සියළු දෙනා.ඔබතුමාගේ පක්ෂයේ ගරු මන්ත්‍රීතුමිය පැමිණියා. එහෙම දෙයක් තිබුණාද කියා අහන්න.එහෙම දෙයක් තිබ්බේ නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

මේ සභාවේ කතා කරන දෙය නෙමේ ප්‍රායෝගිකව සිද්ධ වෙන්නේ.එහෙම ගැටළුවක් තිබෙනවා.එක නිසා තමයි ඔබතුමා බලාපොරෝත්තු වන සහයෝගය අපට දෙන්න බැරි.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේක ඔබතුමා කළත් දේශපාලනය කරන කොට හැම මිනිහාම කුමන හෝ දේශපාලන පක්ෂයකට අයිතියි.එතකොට අපි මේ හොඳ වැඩක් කරයි කියා එම හොඳ වැඩයට දේශපාලනයක් නැහැ මෙතනදි. කිසිසේත්ම දේශපාලනයක් නැහැ.අඩුම ගණනේ අපේ පක්ෂයේ නම එකම තැනක වත් කියා නැහැ.මේ පාර මතක තියා ගන්න. මැතිවරණයක් පවත්වන නිසා අපේ දිස්ත්‍රික්කයේ නායක දෙපලක් ඉන්නවා. ඒ දෙපලටම වේදිකාවට එන්න කියා හරි මෙතනට එන්න කියා හරි අපි ආරාධනා කළේ නැහැ.අපි එහෙමවත් මෙතැන දේශපාලනය කළේ නැහැ.දැන් පාපාන්දු තරඟවගයක් තිබෙනවා 19 දින. එයට ආරාධනා කළේ එම සංගමයේ සභාපතිතුමාට.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

වෙනදා මෙය කළේ අපි ආයෝජකයින් සොයා ගෙන මුදල් හොයාගෙන එම එන්ජීඕ හරි කොහොන් හරි අරගෙන.දැන් මෙතැන වුණේ වෙනස වෙන එකක්.අපි කියන්නේ ඔබතුමාට එම හොයා ගැනීමේ හයිය තිබෙනවා.එය ගත්තානම් හොඳයි කියන එක තමයි අපි කියන්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ගරු මන්ත්‍රීතුමා , මේ රටේ දැන් ආණ්ඩුව යන ආර්ථික කාබාසිනියාව අනුව ජනතාව ළඟ මුදල් නැහැ.එකයි වෙලා තිබෙන්නේ.එකයි මේ කඩා වැටිම වෙලා තිබෙන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

හැබැයි එහෙම නම් පෙනෙන්න නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

හොඳ මාතෘකාවකට ආවේ.මේ රටේ ආර්ථික කාබාසිනියාවක් වෙලා තිබෙනවා. මේ අවුරුදු 71තුළ.ඉතා හොඳ මාතෘකාවකට ප්‍රවිශ්ඨ වෙන්නේ. එහෙම නම් මෙයට වගකියන්න ඕන ඔබ දෙපල තමයි.පක්ෂ දෙක.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා කතා කරමින්</u>**

ඇයි ඔබතුමලාත් ඉන්නවානේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඇයි ඔබතුමලා හවුල් ආණ්ඩුවේ හිටියානේ.

**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්**

අවුරුදු 76 කියන එකේ බර කිරා බලන්න.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

එකට ඔබතුමලාගේ පක්ෂයේත් කොටස් කරුවන් සිටිනවා.

**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්**

මෙතුමා දෙන ලුණු කන්න එපා.රටේ කාබාෂිනියාව කළේ එම පක්ෂ දෙකයි. එම පක්ෂ දෙක විසින් භාර ගන්න වෙනවා කියන එක හොඳට මතක තියා ගන්න.

**ගරු නගර සභා මන්ත්‍රී ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්**

කාබාෂිනියා කියා කතා කරනවා. රටේ සංවර්ධනය වෙනවා . ඒවා ගැන කතා කරන්නේ නැහැනේ කවුරුවත්.ඒවා කතා කරන්නකෝ.

**ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, අපි කල්වේලා නොබලා ඉදිරියට යායුතුයි.

**ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ සෝභිත රංජිත් මහතා කතා කරමින්**

ලෝක ළමා දිනය ගැන කතා කරන්න ඕන. දැන් මේ ප්‍රජා සංවර්ධන නලධාරිතුමිය කියනවා රු.150000/=ක් පමණයි එකතු වෙලා තිබෙන්නේ කියා. ඔබතුමා ගිය සභාවේ කියා තිබුණා ලක්ෂ 250000/= එකතු වෙනවා කියා.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

වෙලා තිබෙන්නේ මෙයයි. අපට සෙනෙවිරත්න කියන මහත්මයෙක් රු.200000/=ක්. ලලිත් හැලඹගේ මහතා රු.25000/=ක් . මේ දෙදෙනාම අපට මුදල් ලබා දුන්නේ නැහැ.එතැන රු225000/=ක මුදලක්. අන්තිම මොහොතේ වෙනකම් දෙනවා කියා දුන්නේ නැහැ.ඉතිං එහෙම වුණාම ප්‍රශ්න තිබෙනවා.ඔන්න ඔතන තමයි තිබෙන්නේ.අන්තිමට කිවුවා ව්‍යාපාර බඩුයි කියා. මා කිවුවේ එකයි.

**ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**

නම කියපු නිසා කතා කර කියන්න වෙනවා.පෙරේදා මේ සභාවේම මේ මේසයේම රැස්වීමක් තිබුණා. එතුමා සහභාගි වුණ.එතුමා කිවුවා අනාථ ආධාර වලට. නගර සභාවේ නිලධාරින් ඇවිත් අරගෙන ගියා කිවුවා. එවායි කිවුවා දුන්නේ.එතුමා ප්‍රකාශ කළ දෙය මා මේ කියන්නේ.නැතිනම් වැරදි අර්ථ කථනයකට යන නිසා. මට අදාල නැහැ ඕක ද මෙකද කියා.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමා එතුමාගේ නම ප්‍රකාශ කළ නිසා විශේෂයෙන්ම කියන්න ඕන.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මොකද මා එම මුදල් ගන්න . ලේකම්තුමියයි, ප්‍රජා සංවර්ධන නිලධාරිතුමියයි ඔය තැන් දෙකටම ගියා.ඒ ගිහින් තමයි කතා කළේ.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමා එතුමාගේ නම ප්‍රකාශ කළ නිසා කිව යුතුයි. පසුගිය කාලයේ ගංවතුර උවදුර නිසා සභාවෙන් වැඩ කටයුතු කරගෙන ගියත් තුන්වෙනි දිනයේ ලේකම්තුමිය විසින් ප්‍රකාශයක් කළා මැතිවරණ කොමසාරිස් කිවුවා කියා මෙහේ කරන්න එපා කියා. හැබැයි අපි දේශපාලනයක් හදාගෙන නෙමේ එම ජනතාවට උදවු කළේ. ගරු නගර සභා මන්ත්‍රී අතුල මහතා පැමිණ සිටියා.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

අර මුහුණු පොතේ දමා තිබුණු ඒවාද?

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

මා නම් දැම්මේ නැහැ. කවුරු දැම්මාද කියා මා දන්නේ නැහැ.මොකද අපි ගියෙත් නැහැ බෙදන්න.ඒ අවස්ථාවේ තුන්වෙනි දිනයේ ලොකු ගැටළුවක් ඇතිවුණා. ලලිත් මහතාට මා කතා කර කිවුවා මට මෙන්න මේ දේ ලබා දෙන්න කියා. එතුමා ඇත්තටම ඒ දේ ලබා දුන්නා.අපි ස්තුති වන්ත වෙනවා එතුමාට.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

දැන් වැඩය කියන්නේ ඔබතුමා ඉල්ලුවාම දුන්නේ නැහැ. ගරු උප සභාපතිතුමා ඉල්ලුවාම දුන්නා.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මේ ගංවතුර උවදුර එන විට මගේ මාමාණ්ඩියගේ මළගෙදර සිදුවූ දිනවල.එතකොට ඒ වැඩ කොටස් ටික කළේ ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රී මණ්ඩලය. මා එයට සම්පූර්ණව ස්තුති වන්ත වෙනවා.ලේකම්තුමිය ඒ කාර්ය මණ්ඩලය ඒ සියළු දෙනා ගංවතුරෙන් හානියක් වෙච්ච ඒ සියළු දෙනාටම සහනය සලසන්න මේ මුළු සමස්ත කාර්ය මණ්ඩලයම වෙහෙසුනා.ඒ ගැන මා ස්තුතිය පුද කරනවා.අපි නැහැයි කියා කිසිම අඩුවක් වුණේ නැහැ.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

අපට දින දෙකයි දෙන්න වුණේ. අපට ඉතිරි දින දෙක පෞද්ගලික මහත්වරුන් තමයි ලබා දුන්නේ.හාල්මිටියක් සහ කරවල වගයක් ලබා දුන්නා.හාල් මිටියක් කරවල කිලෝ 20ක් පරිප්පු ඒ වගේ දේවල් ලබා දුන්නා.පොල්වත්ත එළවළු කඩේ දිමුතු මහතා බඩුවක් දුන්නා. තවත් කට්ටිය බඩු දුන්නා.එ සියළු දෙනාටම ස්තුති වන්ත වෙනවා.අම්බලන්ගොඩ නගරයේ ජනතාව අවතැන් වූ අවස්ථාවේ සහායෝගය ලබා දුන් සියළු දෙනාටම ස්තුතිය පුද කරනවා.ගරු නගර සභා මන්ත්‍රී ලසන්ත මහතාට ස්තුති වන්ත වෙනවා.පළමු දිනයේ දහවල් එතුමාගේ මුදල් වලින් තමයි කෑම ලබා දුන්නේ.අපට ඒ වෙලාවේ කරගන්න අවස්ථාවක් ලැබුණේ නැහැ. විශේෂයෙන්ම කර්මාන්ත අංශයේ සියළුම දෙනාටම , ඒ වාගේම සෞඛ්‍ය අංශයේ සියළු දෙනාටම , ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයට ඒ දින තුනම තමන්ගේ වගකීම මැනවින් ඉටු කළා . ඒ සියළු දෙනාටම ස්තුතිය පුද කරනවා. ගරු සභාපතිතුමා එතුමාගේ මාමාණ්ඩියගේ මළගෙදර නිසා කොළඹ හිටියේ. ඒ සියළු දෙනාටම නගර සභාවක් විදියට අපේ ගෞරවණීය ස්තුතිය මේ අවස්ථාවේ පුද කරනවා.

**ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා කතා කරමින්**

ගංවතුර වේලාවේ එම කටයුතු සිදු කරද්දි අපට දැනුම් දිමක් කරන්නේ නැහැ. මොකද හතර පස් දෙනයි දන්නේ.අපි ගරු මන්ත්‍රීවරු පාලක පක්ෂයේ මන්ත්‍රීවරු 10ක් සිටිනවා. ඔක්කොම මන්ත්‍රීවරු 21ක් සිටිනවා.හතර පස් දෙනෙක් සමඟ කතා කරලා තමයි මෙය සිදු කරන්නේ.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මෙවගේ අවතැන් වුණාම ස්වේච්ඡාවෙන් ඇවිත් වැඩ කරන්න.

**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමා අපිටත් කිසිම කෙනෙක් දැනුම් දුන්නේ නැහැ. අපිත් ස්වෙච්ඡාවෙන් ඇවිත් වැඩ කරන්නේ.අපිත් පැමිණ හොයා බලා තමයි ඒ වගේ වේලාවක කටයුතු කළේ.අපිට කිසි කෙනෙක් දැනුම් දුන්නේ නැහැ.මෙහෙම ගංවතුරක් ගලා තිබෙනවා. ජනතාව ආපදාවට ලක්වෙලා තිබෙනවා . අපට තෙරුණා.අපට තෙරෙනවා මිනිසුන්ගේ හද ගැස්ම.එමනිසා තමයි අපි පැමිණ ලේකම්තුමිය , ගරු උප සභාපතිතුමා අපි පැමිණ ස්වේච්ච්ඡාවෙන් එකතු වෙලා ගංවතුරේ බැහැලා ගිහින් කෑමටික බෙදුවේ.හැබැයි පස්සේ පොඩි ගැටළුවක් ආවා . මෙය මේ මැතිවරණ අල්ලස් දීමක් ද කියා ලේකම්තුමිය මට කිවුවා.එතුමිය මැතිවරණ පංතිවලට ගියාට පස්සේ තමයි කියා එයාට එම අදහස ආවේ කියා.මා කිවුවා එහෙම නම් කමක් නැහැ. ඒ වනවිටත් මා දින දෙකක් කෑම දීලා ඉවරයි.නමුත් මා ඔය ප්‍රශ්නය කතා කළේ නැහැ. ලේකම්තුමිය සමඟ මට ගැටෙන්න උවමනා නැහැ.ඒ ලේකම්තුමිය කිවුවේ ඒ නීති ප්‍රශ්නයක්.එමනිසා මා එයට ගරු කරලා නිහඩ වුණා එදා.ඉන්පසු මා පැමිණියේ නැහැ. හැබැයි එතකන් ස්වේච්ඡාවෙන් අපි සහභාගී වුණා.

**ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, ඇත්තටම මේ අපදාව පැමිණි අවස්ථාවේ ඔබතුමාගේ මාමාණ්ඩි නැතිවෙලා ඔබතුමා සිටියේ කොළඹ . ඔබතුමා බලය පැවරුවා ලේකම්තුමියටත් ගරු උප සභාපතිතුමාටත් .ඉතිං මා මෙතැනට ඍජුව සම්බන්ධ වුණා.මහජන නියෝජිතයෙක් විදියට ආපදාවක් සිදු වූ විට දැනුවත් කරන්න අවශ්‍ය නැහැ.මා ඇත්තටම ලැජ්ජා වෙනවා. මා දැක්කා ඇත්තටම හිටිය ගරු මන්ත්‍රීවරු ගණන.පක්ෂ විපක්ෂව.ඔබතුමා බලය පැවරුවා . මා උදෙන්ම 7.00වන කොට පැමිණියා. මා මුළු දවසම හිටියා. ගරු මන්ත්‍රීවරයෙක් විදියට අපේ යුතුකම්. මගේ කොට්ඨාශයේ පමණක් නෙමේ. සියළුම තැන්ගැන බැලුවා. මා අපේ ගරු උප සභාපතිතුමාට ඇත්තටම විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා.එතුමාගේ රාජකාරිය අවංකම කළා. ලේකම්තුමියත් අවංකම එය ඉටු කළා.ඇත්තටම මහජන නියෝජිතයෙක් විදියට දැනුවත් කිරිම අවශ්‍ය නැහැ කිසිම ආපදාවකදි.ගරු නගර සභා මන්ත්‍රී ලසන්ත මහතා , ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා , ගරු නගර සභා මන්ත්‍රී නිලානි මෙනවිය ආදි අය. මා ඇත්තටම ලැජ්ජා වෙනවා පක්ෂ විපක්ෂව මෙයට සහභාගී නොවූ මන්ත්‍රීවරු පිළිබඳව. ඊට පසු පොඩි දෙවලුත් සිද්ධ වුණා.ඉතිං ඒවා මෙතැන කතා කරලා වැඩක් නැහැ.ඇත්තටම මා සතුටු වෙනවා සහභාගී වූ සියළු මන්ත්‍රීවරුන්ගෙන්.එක්සත් ජාතික පක්ෂයේ ගරු මන්ත්‍රීවරයෙක් විදියට මා සතුටු වෙනවා. කෑම බෙදීමේදී පොඩි පොඩි ප්‍රශ්න ගැටළු ඇති වුණා.දේශපාලිනික වශයෙන් කුහක දේශපාලනයක් අපට වැඩක් නැහැ. ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්.ලසන්ත අජිත් කුමාර මහතා තමන්ගේ පුද්ගලික වියදමින් උදවු කළා.අපි අභය කරනවා. ඔබතුමා නොමැති වුණත් ඉන් සහභාගී වූ සියළු ගරු මන්ත්‍රීවරුන් එය මැනවින් ඉටු කළා. මාගේ කකුළේ තුවාලයකුත් තියාගෙන මා අදාළ තැන්වලට ගංවතුරේ ගියා.සමහර තැන්වලට යන්න බැරි වුණා. ඒගැන නගර සභාවට හොඳ ප්‍රසාදයක් ලැබුණා.අපි ඒ ගැන අභය කළ යුතුයි.අපි කියන්නේ දැනුවත් කිරිමක් අවශ්‍ය නැත.එය තමන්ගේ ඇගේ තිබිය යුතුයි දේශපාලනය කියන්නේ කුමක්ද කියා. කිසිම ගරු මන්ත්‍රීවරයෙක් දැනුවත් කළේ නැහැ. දැනුවත් කිරිමක් අවශ්‍ය නැහැ.

**ගරු නගර සභා මන්ත්‍රී ජී . සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්**

ඒ ප්‍රකාශය එච්චර හොඳ ප්‍රකාශයක් නෙමේ.ගංවතුර පිළිබඳ දැනුවත් විය යුත්තේ ඒ අදාල මන්ත්‍රීවරු අදාළ ප්‍රදේශයට යාමටයි.එක හරි .එක අපි පිළි ගන්නවා.ඒ ගරු මන්ත්‍රීවරු නොඅඩුව කවුරු සහභාගී නොවුණද සහභාගී වුවද කියා අපි දන්නේ නැහැ.හැබැයි ගරු සභාපතිතුමනි, අපි නගර සභවෙන් මේ

මැත ඉතිහාසයේ මේ ව්‍යාපෘති කරලා නැහැ.එතකොට යුතුකමක් තිබුණා මේ සියළු මන්ත්‍රීවරු සියළු දෙනාටම දැනුම් දිමක් කරන්න. අපි මේ වගේ වැඩසටහනක් කරනවා .අනාථ අයට කෑමබීම ආදිය ඉවුම් පිහුම් නගර සභාවේ සිදු කරනවා කියා.මෙන්න මෙය බෙදා දීමේ මේ කටයුත්තට සහභාගි වන්න කියන එක.ඒ අඩුව තමයි මේ ගරු මන්ත්‍රීතුමා කිවුවේ.එතුමා දැනගෙන හිටියා නම් එනවා කියන එකනේ. දැන් මෙතැන කිව්වොත් එහෙම ආවේ නැහැ කියා එක වැරදියි.එතකොට එතුමා නගර සභාවෙන් මේ ව්‍යාපෘතිය කරනවා කියන එක දැනීමක් නැහැ අවංකවම. අපි මේ නගරබදව සිටින නිසා මේ විනාඩි 5ට අපට ආරංචි වෙනවා. මා ලේකම්තුමියත් එක්ක ගෙන ගියා. ඇත්තටම බරපතලම ප්‍රශ්නය වෙලා තිබුණේ මෝය ළඟ අස්කරන එක.මායි මෙතුමායි ගිහින්ඉංජිනේරුතුමාට කතා කරලා තමයි ඒ අවශ්‍ය කටයුතු ටික සිදු කළේ.ඊටපසු තමයි අපි ඔය ගංවතුරට යටවුණු ස්ථාන බලන්න ගියේ.ඒ වනවිටත් හල්වතුර ප්‍රදේශයේ ගරු උප සභාපතිතුමා හා ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම් ලසන්ත මහතා කර්මාන්ත අංශයේ සේවකයින් සමඟ විපතට පත් වූවන්ගේ බඩු අස්කරමින් සිටියේ.යම් යම් ප්‍රදේශ ඒ අවස්ථාවලදි යටවෙමින් තිබුණා.ඇත්තටම නගර සභාවෙන් දින දෙක තුනක් එම කෑම වේල දුන්නා.ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙනුතු එම ආධාර දුන්නා.එමනිසා සමස්තයක් වශයෙන් එය කරපු එක හොඳයි.හැබැයි අපි නගර සභාවක් විදියට මේ සඳහා කමිටුවක් පත් කර තිබෙනවා.එතුමාගේ අයිතියක් ඒක.එතකොට මේ ගරු මන්ත්‍රීවරු සියළු දෙනාම දැනුවත් කිරිම යුතුකමක් එක.එමනිසා ඔබතුමා මෙතැන හිටියේ නැති නිසා ගරු උප සභාපතිතුමා මෙය කළා මිස ඒ ගැන කල්පනා කර කළා නෙමේ.ක්ෂණිකව එවැනි අවස්ථාවල ක්ෂණිකව ක්‍රියාත්මක වෙනවා.එය කරපු දේ අපි අභය කරන ගමන්ම නොකරපු අයට බැනුම් අවලාද නගන්නත් එපා.ඒක හොඳ නැහැ. මොකද මේ පළමු අවස්ථාවනේ. දෙවැනි අවස්ථාවේදි මීට වඩා විපතක් යම් දෙයක් වුණහොත් මේ ගරු මන්ත්‍රීවරු සියළු දෙනාම සහභාගි වෙයි.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම  මහතා කතා කරමින්</u>

මමනම් ඕක දන්නවා. අළුත් ගරු මන්ත්‍රීවරු ඕක දන්නේ නැහැ.හැබැයි මා නගර සභාවට ආවේ නැත්තේ ගරු සභාපතිතුමා මාව එළවනවානේ කොහොමත්.ඒකනිසා මා ඇවිත් වැඩක් නැහැ.මා ඒ වුණාට අදාළ කොට්ඨාශවල ඒ අදාල දෙය කළා. පුවත්පත් වල හා මුහුණේ පොතේ දමා ගත්තේ නැති වුණාට.ගරු ආණ්ඩුකාරතුමාත් දැනුවත් කර ඒ කරන්න ඕන ටික කළා.එක නිසා තමයි මෙතැනට නාවේ. ගරු සභාපතිතුමාගේ උපදෙස් පරිදි ක්‍රියා කරන කට්ටිය මෙතැන ඉන්නවානේ.එක නිසා මා පැමිණියේ නැහැ. ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල මහතා එය දන්නේ නැහැ. අපි කිය කිය ගියෝ නැහැ.අපි එම කටයුත්ත කළා. අලුත් ගරු මන්ත්‍රීවරියන් ඇත්තටම දන්නේත් නැහැ. යන්නත් බැහැ. එකට දොස් කියා වැඩක් නැහැ.

<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත  මහතා කතා කරමින්</u>

මට පොඩි අමතක වීමක් සිදු වුණා. ස්තුති කිරිමක් කරන්න. මාගේ කතාවේදි කරන්න. මාර්ග කම්කරු අංශයෙන් ගොඩක් ලොකු කැප කිරිමක් කළා . ඇත්ත වශයෙන්ම ඒ අය කැමටික හදලා දිලා එය මහන්සි වි ඉටු කළා.අපේ චම් මල්ලි ඇත්තටම මහන්සිවෙලා ඒ කටයුත්ත කළා. ඇත්තටම අපි සතුටු වෙන්න ඕන.

<u>ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමිණියගේ  මහතා කතා කරමින්</u>

ගරු  සභාපතිතුමනි, මාදම්පා ගඟට දැඩිසේ ජලය දරාගත නොහැකි වීම නිසා තමයි මේ ගැටළුව උදා වි තිබෙන්නේ. රොන්මඩවලින් ගඟ පිරි තිබිම. මේ විපත නැවත නොවන්නට අපි ඊට පෙර මේ ගඟ සුද්ද කළ යුතුමයි.අපි මීට පෙර මෙය කතා කළා. ගංවතුරට ස්තුති කරනවා.උදවු වුන අයට. නමුත් අනාගතයේදි මේ විපතින් ගැලවීමට කළ  යුත්තේ කුමක්ද? ඉක්මනින් මේ වැලි හූ විද්‍යා හා පතල් කර්මාන්ත අමාත්‍යාංශයෙන්ද , වාරිමාර්ග දෙපාර්තමේන්තුව ආදි මෙවැනි ආයතන සංස්ථාපනය

කොට තිබියදි ඇයි ඔවුන් නිදිද මේවා හොයන්නේ බලන්නේ නැත්තේ.එම නිසා අද අප සභාවේ තීරණයක් ගත් බවත් මෙම විපතින් ගඟ සුද්ද කිරිමට වැලි ගොඩ දැම්මට අවසර පත්‍ර ලබා දිමට ආදි එවැනි විසඳුම් වලට අප යායුතුයි. ඒ පිළිබඳව අවධානය යොමු කරන්න.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

ඒ පිළිබඳව අවධානය යොමු වෙලා තිබෙනවා. දැනට අපට ගඟ පිළිබඳව කටයුතු කරන්න බැහැ.මා අපේ කාර්මික නිලධාරි මහතුන්ට උපදෙස් දුන්නා. මෑත අවුරුදු 15ක කාලයක් පොල්වත්ත ප්‍ර දේශයට ගංවතුර තත්ත්වය තිබුණේ නැහැ.ඒ අපි අක්කර 5ක වැවක් අර ක්‍රිඩාංගණය හදන නිසා අපි සාදා තිබුණා.මට තේරුණ හැටියට එයත් ගොඩවෙලා තිබෙනවා.එමනිසා මා අපේ කාර්මික නිලධාරි මහතුන්ට කිවුවා ඒ මඩ ඉවත් කිරිමට ඇස්තමේන්තුවක් හදා දෙන්න කියා. මෙකත් හදිසි එකක් . එයත් අද ඉදිරිපත් කරනවා.ඒ අනුව කරනවා. ඔබතුමා කිවූ කාරණය ගැන මට අවධානය යොමු වෙලා තිබෙනවා.මා ගරු උප සභාපතිතුමා සමඟත් සාකච්ඡා කළා. මෙය අපේ සභාව මඟින් හෝ ප්‍රාදේශිය සම්බන්ධිකරණ රැස්විමකදි මෙය යෝජනා කළා.අම්බලන්ගොඩ මෙම මාදම්පා ගඟේ මෙම වැලි හැරිම සඳහා බලපත්‍රයක් ලබා දෙන්න කියා.මොකද බලපත්‍ර ලබා දුන්නා නම් මේ ගොඩවන යම් වැලි ප්‍රමාණයක් ඉවත් වෙනවා.බලපත්‍ර ලබා දුන්නාම යම් පිරිසක් ආර්ථික වශයෙන් ශක්තිමත් වෙනවා.අනික් පිරිස මේ අපට අවශ්‍ය දේවල් කරන්න පුළුවනි.එම බලපත්‍ර ලබා දෙන්න කියා යෝජනා වුණාට තාම එය නිවැරදිව භාවිතයේ නැහැ.අපි බලමු මෙය අපේ තියෙන මට්ටමින් හරි බලපත්ර ලබා දිලා මෙය කරන්න.පොඩි ගංවතුරටත් හේත් වෙලා තිබෙන්නේ පොල්වත්ත ප්‍රදේශය අපේ තිබෙන ඇළ ගොඩවෙලා තිබෙනවා.එක අපි හරන්න ඕන.

<u>**ගරු නගර සභා මන්ත්‍රි රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**</u>

මෙය පහළ සිට හරගෙන එනවිට කවුරු හරි පෙත්සම් ගහලා එය නතර කරලා නේද?

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

මා දන්නේ නැහැ.

<u>**ගරු නගර සභා මන්ත්‍රි රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**</u>

පොඩි ඇළ නවත්තලා නේද? අන්න එක ටිකක් බලන්න. එය හැරෙන්න ඕන එකක්.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

ඊළඟට මා තවත් යෝජනාවක් හැටියට කරගෙන යනවා. අපේ පනියන්දුව ප්‍රදේශයේම මේ විදියට කෘතිම වැවක් හැදිමට අපි යෝජනාවක් කළා.මා මෙය වාරිමාර්ග අධ්‍යක්ෂකතුමාගෙන් උපදෙස් ගැනිමට කටයතු කරන්න හදන්නේ.මිට කලින් අපි මේ සභාවේම කතා කරපු දෙයක් තමයි ඔය එඬේරමුල්ල ප්‍රදේශයේම අත්පත් කර ගෙන තිබෙන්නේ.එම කොටස අපට වැඩක් නැහැ කියා.අපි කල්පනා කළේ එතැන වැවක් හැදුවොත් නගරයේ සිට එන වතුර ටික ඇවිල්ලා ඒ ටික හිමිට ගඟට වැටෙන්න .ඒ හරියේ ගංවතුර වැළැක්විම නතර කරන්න පුළුවනි.පොල්වත්තේ හා සමානව අපේ මට්ටමින් මෙවැනි තැන් ටිකක් අපි හැදිය යුතුයි.ඒ වටේ පුළුවනි ජනතාවට ඇවදින්න පුළුවන් විදියට හරි ගස්සන්න.ජනාතාවට ඇවිදින්න. මේ විදියට මෙහෙම එකක් දමා මේ ගංවතුර තත්ත්වය මැඩ ගන්න පුළුවනි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. ජගත් කුමාර  මහතා කතා කරමින්</u>**

එය හොඳ යෝජනාවකි. ඇළ මාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කරලා දෙන්න. මේ ගස්වල අතු පොල්අතු අවිත් මේවාගේ හිරවෙලා තිබෙන්නේ.අන්න ඒ අත්ටිකක් සුද්ද කරලා දෙන්න කියා ඉල්ලා සිටිනවා.නමුත් මෙය වාරිමාර්ගයෙන් කරනකම් හිටියොත් එහෙම මෙය කෙරෙන්නේ නැහැ.එම ඇළට වැටි තිබෙන ගස් ටික ඉවත් කරලා දෙන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්.ලසන්ත අජිත් කුමාර  මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මෝය කටේ දැන් ගල් හිරවෙලා. අයිනේ ආයෙත් ගංවතුර අවොත් වතුර බහින්නේ නැහැ.එදා අස්කලාට යටම තිබෙන ගල් අස්වෙලා නැහැ.ඒවා තිබෙනවා. ඒ මට්ටමට අර ගඟේ වතුර පාර තිබෙනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

එය අපි වාරිමාර්ග අධ්‍යක්ෂකට ලියා යවන්නම්.

08.13 ලෝක ළමා දිනය වෙනුවෙන් ගෙන්වල ලද උත්සව උපකරණ ප්‍රවාහනය වෙනුවෙන් රු.14000/=ක මුදලක්  P.G.Martin Wonder World  ආයතනය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා  විසින් ස්ථිර කරන ලදුව ඒකමතික සභා සම්මත විය.

08.14 ලෝක ළමා දිනය වෙනුවෙන් සෙල්ලම් උපකරණ ලබා ගැනීම වෙනුවෙන් රු රු.350000/=ක මුදලක් Lakshan Entertainment ආයතනය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා  විසින් ස්ථිර කරන ලදුව ඒකමතික සභා සම්මත විය.

08.15 අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍ය 1 ½ ගල් මිලදී ගැනීම වෙනුවෙන් රු.24600.00/= ක මුදලක් P.H.C. ද සිල්වා වෙත වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා  විසින් ස්ථිර කරන ලදුව ඒකමතික සභා සම්මත විය.

08.16 මානාන ක්‍රීඩාංගණයට  අවශ්‍ය පස් කියුබ් 15ක් දැමීම වෙනුවෙන් රු.43500.00/= ක මුදලක් P.H.C. ද සිල්වා වෙත වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා  විසින් ස්ථිර කරන ලදුව ඒකමතික සභා සම්මත විය.

08.17 මානාන ක්‍රීඩාංගණයට  අවශ්‍ය පස් කියුබ් 15ක් දැමීම වෙනුවෙන් රු.43500.00/= ක මුදලක් P.H.C. ද සිල්වා වෙත වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා  විසින් ස්ථිර කරන ලදුව ඒකමතික සභා සම්මත විය.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ සෝභිත රංජිත් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ගෑස් පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපේ අභ්‍යාන්තර විගණන ඉන්නවාද? ඇය ලබන සභාවට වාර්තාව දෙන්නම් කිවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

මේ 7/8 මේ ගිය ආකාරයේ වාර්තාවක් තමයි ඕනේ.එතකොට ඒ තුල ගබඩාවේ කොහොමද ඉතිරි වෙලා තිබෙන්නේ.ආදාහනාගාරයේ කොහොමද ඉතිරි වෙලා තිබෙන්නේ.දැන් මේක කරන්න ඕච්චර දහලන්න දෙයක් නැහැනේ.ඕක කරන්න පුළුවන්නේ. ලබන සභාවට දමනවා නේද? ඒ අවශ්‍ය විදියට

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, ආදාහනාගාරයේ ප්‍රශ්නය මොකද දැන්.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපි කැල්ල ගෙනත් හැදුවා නේද?ඒක හදලා . දැන් ප්‍රශ්නයක් නැහැ.

08.18 අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍ය ගෑස් මිලදී ගැනීම වෙනුවෙන් රු.48280.00/= ක මුදලක් S.H.N.A De Silva සිල්වා වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරම්ණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතික සහා සම්මත විය.

08.19 අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍ය ගෑස් මිලදී ගැනීම වෙනුවෙන් රු.48280.00/= ක මුදලක් S.H.N.A De Silva සිල්වා වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරම්ණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතික සහා සම්මත විය.

08.20 අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍ය ගෑස් මිලදී ගැනීම වෙනුවෙන් රු.48280.00/= ක මුදලක් S.H.N.A De Silva සිල්වා වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්.ලසන්ත අජිත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතික සහා සම්මත විය.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි , මේවාගේ දින දමන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

කෝ සැපයුම් නිලධාරි, මේවාගේ දින දමන්න. එක තමයි අපි මේ පිළිබඳ අභ්‍යාන්තර විගණකට හොයන්න කිවුවේ.ඔයාට ප්‍රශ්නයක් නැහැ. ඔයා දින දමන්න.

08.21 අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍ය විදුලි බල්බ් මිලදී ගැනීම වෙනුවෙන් රු.280500/= ක මුදලක් Asian Eletrical වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතික සහා සම්මත විය.

08.22 අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍ය ටෝනර් මිලදී ගැනීම වෙනුවෙන් රු.80000.00/= ක මුදලක් Omak Technologies වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතික සභා සම්මත විය.

08.23 අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍ය ලිපිගොනු කවර මිලදී ගැනීම වෙනුවෙන් රු.23300/= ක මුදලක් සක්වා ප්‍රින්ටර්ස් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්.ලසන්ත අජිත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතික සභා සම්මත විය.

08.24 අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍ය ලිපිද්‍රව්‍ය මිලදී ගැනීම වෙනුවෙන් රු.43450.00/= ක මුදලක් රජයේ මුද්‍රණ නිතිගත සංස්ථාව වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්.ලසන්ත අජිත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

08.25 අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍ය ලිපිද්‍රව්‍ය මිලදී ගැනීම වෙනුවෙන් 55500/= ක මුදලක් රජයේ මුද්‍රණ නිතිගත සංස්ථාව වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්. ඩබ් . අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතික සභා සම්මත විය.

08.26 අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍ය මැගසින් හෝල්ඩර් මිලදී ගැනීම වෙනුවෙන් 59840/= ක මුදලක් රජයේ මුද්‍රණ නිතිගත සංස්ථාව වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී දිනයාදුර ධර්මදාස මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතික සභා සම්මත විය.

08.27 අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍ය එන්ජින් ඔයිල් බැරල් මිලදී ගැනීම වෙනුවෙන් 78200/= ක මුදලක් අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්. ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතික සභා සම්මත විය.

08.28 LECO New Bulding ඉදිරිපිට කාණුව මත යකඩ දැල් ඇතිරිම සම්බන්ධව රු.326760/=ක මුදලක් ජොෂ්ඨ පුරවැසි කමිටුව වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතික සභා සම්මත විය.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, LECO New Bulding ඉදිරිපිට කියන්නේ මොකක්ද ? එගොල්ලන්ගේ ඉදිරිපස තිබෙන එකක්ද?

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

ඒ අය අලුත් ගොඩනැගිල්ලකට ගියා.ඒ ඉදිරපස ෂැලැබ් වෙනුවට දැල් දමන්න ඕන කිව්වා. ඒ ගොල්ලන්ගෙන් අහලා තිබෙනවා මෙය අපෙන් කර දෙන්න පුළුවන්ද කියා.ඒ අනුව එම ඇස්තමේන්තුව අපට ගෙව්වා.අපි කරලා දුන්නා.

08.29 අම්බලන්ගොඩ ශ්‍රී විජයාරාම කාණු පද්ධතිය කොන්ක්‍රීට් කිරිම වෙනුවෙන් 269980.96 ක මුදලක් කළුවඩුමල්ල සහජීවන ප්‍රජා කමිටුව වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතික සභා සම්මත විය.

## 09. ගිණුම්

09.01 2019 අගොස්තු මාසයට අදාළ වියදම් වාර්තාව , පොදු ගිණුම් හා වියදම් වැය විශ්ලේෂණය සභාගත කරන ලදී.

**තීරණය**

2019 අගොස්තු මසයට අදාළ පොදු වියදම් වාර්තාව , වියදම් වැය විශ්ලේෂණය හා 2019 අගෝස්තු මස ලැබිම් විග්‍රහය පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු නරගු සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභා සම්මත විය.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මට පොඩි දෙයක් නිවැරදි කරගත වෙනවා.අධික ඌණතා කියා රු.51000/= ක් දමා තිබෙනවා . මොකක්ද දන්නේ නැහැ. එකයි අහරු චෙක් කියා රු.25000/=ක් තිබෙනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ගණකාධිකාරිතුමිය උත්තර දෙන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

අධික ඌණතා කියා තිබෙනවා. ගිණුම් වල තිබෙන්නේ . මෙය දැන ගැනිමට අහන්නේ. අනික් එක අහරු චෙක් කියා රු.25360/=ක් තිබෙනවා.අහරු චෙක්පත මොකක්ද දන්නේ නැහැ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මා දන්නේ නැහැ ඕවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

අත්සනක් අඩු වුණාම අණකරු විමසනවා ද කියා නෙමේද යන්නේ එය අහරු චෙක් කියාද යන්නේ .අපි දැන් රාජ්‍ය ආයතනයක්නේ බැංකුවක අහරු චෙක් කියා යොදන සටහන දූර්වලම පාරිභොගිකයෙකුට යොදන සටහනයි.එතකොට අම්බලන්ගොඩ නගර සභාවට එම සටහන යොදපු එක ගැනයි මා මේ හොයන්නේ.සාමාන්‍යයෙන් අණකරු විමසනු , අත්සන යොදන්න . ඒ වගේ එවනේ යොදන්නේ. එවැනි සටහන් තිබෙනවා. ඉතිං බැංකුව සමඟ කතා කරලා මේ සටහන යොදන්න එපා කියන්න.මුදලක් අය නොකළ බවට මා පිළි ගන්නවා. නමුත් අහරු චෙක්පත් කියා යොදපු එක අම්බලන්ගොඩ නගර සභාවට හොඳ නැහැ. ඒ අයට පුළුවනි අණකරු විමසනු වගේ සටහනක් මෙයට යොමු කරන්න පුළුවනි.අනික් කරුණ තමයි මේ රු.51000/= මොකක්ද ?

## 10. ඇස්තමේන්තු :-

**10.01 හින්ඇල පාර හා එස්.ජී.ඒ. සිල්වා මාවත ඉදිකරන ලද කාණු පද්ධති හා බෝක්කු වල මාර්ග අලුත්වැඩියාව සඳහා රු.28000/= ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

තීරණය -

හින්ඇල පාර හා එස්.ජී.ඒ. සිල්වා මාවත ඉදිකරන ලද කාණු පද්ධති හා බෝක්කු වල මාර්ග අලුත්වැඩියාව සඳහා රු.28000/= ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත්, එය සභා අරමුදලින් සිදු කිරිම සුදුසු බවටත් , ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**10.02 අම්බලන්ගොඩ බස්නැවතුම්පොළේ වහල අලුත්වැඩියා කිරිම සඳහා රු.500000/=ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

තීරණය -

අම්බලන්ගොඩ බස්නැවතුම්පොළේ වහල අලුත්වැඩියා කිරිම සඳහා රු.500000/=ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත්, එය සභා අරමුදලින් සිදු කිරිම සුදුසු බවටත් , ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**10.03 බුද්ධ දත්ත මාවත අතුරුමාර්ගය කොන්ක්‍රිට් කිරිම සඳහා රු.890000/= ක ඇස්තමේන්තුව ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

තීරණය -

බුද්ධ දත්ත මාවත අතුරුමාර්ගය කොන්ක්‍රිට් කිරිම සඳහා රු.890000/= ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත්, එය සභා අරමුදලින් සිදු කිරිම සුදුසු බවටත් , ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**10.04 අම්බලන්ගොඩ මහජන ක්‍රීඩාංගණයේ ළිඳ ඉදිකිරිම ( NO 01 ) රු.490000/= ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

<u>ගරු නගර සභා මන්ත්‍රි රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

**ගරු සභාපතිතුමනි, එම ළිඳ කපන්න කියා තිබුණා. ඇයි මෙය කලින් කරනවා කිව්වා නේද**

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

**මෙය දැන් කොන්ත්‍රාත් දෙන්න හදන්නේ.**

තීරණය -

අම්බලන්ගොඩ මහජන ක්‍රීඩාංගණයේ ළිඳ ඉදිකිරිම ( NO 01 ) රු.490000/= ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත්, එය සභා අරමුදලින් සිදු කිරිම සුදුසු බවටත් , ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**10.05 අම්බලන්ගොඩ මහජන ක්‍රීඩාංගණයේ ළිඳ ඉදිකිරිම ( NO 02 ) රු.490000/= ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

තීරණය -

අම්බලන්ගොඩ මහජන ක්‍රීඩාංගණයේ ළිඳ ඉදිකිරිම ( NO 02 ) රු.490000/= ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත්, එය සභා අරමුදලින් සිදු කිරිම සුදුසු බවටත් , ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**10.06 අම්බලන්ගොඩ මහජන ක්‍රීඩාංගණයේ ළිඳ ඉදිකිරිම ( NO 03 ) රු.490000/= ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

තීරණය -

අම්බලන්ගොඩ මහජන ක්‍රීඩාංගණයේ ළිඳ ඉදිකිරිම ( NO 03 ) රු.490000/= ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත්, එය සභා අරමුදලින් සිදු කිරිම සුදුසු බවටත් , ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, මොකක්ද මේ රු.490000/= ඇස්තමේන්තු තුනක්.එතකොට මේ සඳහා සෑහෙන මුදලක් යනවානේ.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

දැන් වේලා තිබෙන්නේ අපේ තාක්ෂණසේවා නිලධාරින්ට අනුමත කළ හැක්කේ ලක්ෂ පහක ඇස්තමේන්තු පමණකි.එමනිසා අදියර වශයෙන් කඩලා තමයි කරන්නේ.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

දැන් කොපමණ මුදලක් යනවාද ඒකට.ළිඳ අංක 1,2,3 කිවත් එකම ළිඳනේ.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

නැහැ. ළිං තුනකි. ක්‍රීඩාංගණයට එකවර ජලය පොම්ප කරන විට ලීටර් හැට හතර දාහක් අවශ්‍යයි.එතකොට ළිඳ ලීටර් හැට හතර දාහක ධාරිතාවයකින් තියෙන්න ඕන.එතකොට නැවත වතුර ඉනුවාට පසු තමයි නැවත ගසන්නට වෙන්නේ.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, සභාවට යෝජනාව ඇවිල්ලා . මේක සංශෝධනය කරනවා. අපි බලන්නේ මුදල ඉතිරි කර ගන්න.එකයි අපි මේ කියන්නේ

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

අපිත් එහෙමයි කරන්නේ.

**10.07 ඕකන්ද විහාරගොඩ මාවත කාණු පද්ධතිය ඉදිකිරිම ( ඒ.එච්.සෝමරත්න මහතාගේ නිවස අසළ) රු.1,100,000.00 ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

තීරණය -

ඕකන්ද විහාරගොඩ මාවත කාණු පද්ධතිය ඉදිකිරිම ( ඒ.එච්.සෝමරත්න මහතාගේ නිවස අසළ) රු.1,100,000.00 ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත්, එය සභා අරමුදලින් සිදු කිරිම සුදුසු බවටත් , ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**10.08 පතිරාජ පාර පටුමග කොන්ක්‍රිට් පුවරු දැමිම (පුවරු 2ක් පමණි ) රු.35000/=ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

තීරණය -

පතිරාජ පාර පටුමග කොන්ක්‍රිට් පුවරු දැමිම (පුවරු 2ක් පමණි ) රු.35000/=ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත්, එය සභා අරමුදලින් සිදු කිරිම සුදුසු බවටත් , ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**10.09 පතිරාජ පාර පටුමග කොන්ක්‍රිට් පුවරු දැමිම (සියලුම පුවරු ) රු.35000/=ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

තීරණය -

පතිරාජ පාර පටුමග කොන්ක්‍රිට් පුවරු දැමිම (සියලුම පුවරු ) රු.35000/=ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත්, එය සභා අරමුදලින් සිදු කිරිම සුදුසු බවටත් , ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**10.10 පොල්වත්ත පාරේ රත්නගිරි නිවස අසළ කාණු පද්ධතියේ කොන්ක්‍රිට් පුවරු දැමීම සඳහා රු.290000/= ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

තීරණය -

පොල්වත්ත පාරේ රත්නගිරි නිවස අසළ කාණු පද්ධතියේ කොන්ක්‍රිට් පුවරු දැමීම සඳහා රු.290000/= ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත්, එය සභා අරමුදලින් සිදු කිරිම සුදුසු බවටත් , ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**10.11 හිරිකැටිය පාර කොන්ක්‍රිට් බෝක්කුව සෑදීම (නිලානි මන්ත්‍රීතුමියගේ හෝටලය ලඟ ) රු.440000/= ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

තීරණය -

හිරිකැටිය පාර කොන්ක්‍රිට් බෝක්කුව සෑදීම (නිලානි මන්ත්‍රීතුමියගේ හෝටලය ලඟ ) රු.440000/= ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත්, එය සභා අරමුදලින් සිදු කිරිම සුදුසු බවටත් , ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**10.12 හල්වතුර කසළ අංගණයේ කසළ තුනිකිරිමට D4E යන්ත්‍රය වෙනුවෙන් රු.500000/= ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

තීරණය -

හල්වතුර කසළ අංගණයේ කසළ තුනිකිරිමට D4E යන්ත්‍රය වෙනුවෙන් රු.500000/= ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත්, එය සභා අරමුදලින් සිදු කිරිම සුදුසු බවටත් , ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**10.13 පොල්වත්ත පියසේන ළමා ක්‍රීඩාංගණයේ විදුලි ආලෝක ධාරා වලින් ආලෝකමත් කොට ජනතා අයිතියට පත් කිරිමේ වැඩ සටහන සඳහා රු.48000/= ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

තීරණය -

පොල්වත්ත පියසේන ළමා ක්‍රීඩාංගණයේ විදුලි ආලෝක ධාරා වලින් ආලෝකමත් කොට ජනතා අයිතියට පත් කිරිමේ වැඩ සටහන සඳහා රු.48000/= ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත්, එය සභා අරමුදලින් සිදු කිරිම සුදුසු බවටත් , ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

මෙන්න මේ වියදම් තමයි යන්නේ.පාපන්දු කණ්ඩායම් 6 සඳහා පාපන්දුවක් ප්‍රදානය කිරිම.රු.15000/=, තේ පැන් සංග්‍රහයට රු.2000/=,පාපන්දු කණ්ඩායම් 6 ක්‍රිඩකයන් සඳහා බීම බොතල් 60යි රු.3000/=කි,ක්‍රීඩාංගණයේ විදුලි ආලෝක ඵලකය විවෘත කිරිම සඳහා රු.26000/=

**10.14 පනියන්දුව හරස් පාර කාණුව ඉදිකිරිම සඳහා රු.360000/=ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**තීරණය -**

පනියන්දුව හරස් පාර කාණුව ඉදිකිරිම සඳහා රු.360000/=ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත්, එය සභා අරමුදලින් සිදු කිරිම සුදුසු බවටත් , ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**10.15 තල්ගස්ගොඩ සුදුවැල්ල පෙර පාසැලේ සිවිලිම ඉදිකිරිම සඳහා රු.50000/=ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**තීරණය -**

තල්ගස්ගොඩ සුදුවැල්ල පෙර පාසැලේ සිවිලීම ඉදිකිරිම සඳහා රු.50000/=ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත්, එය සභා අරමුදලින් සිදු කිරිම සුදුසු බවටත් , ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**10.16 පොල්වත්ත පියවර පෙර පාසල සංවර්ධනය කිරිම සඳහා රු.17000/=ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

තීරණය -

පොල්වත්ත පියවර පෙර පාසල සංවර්ධනය කිරිම සඳහා රු.17000/=ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත්, එය සභා අරමුදලින් සිදු කිරිම සුදුසු බවටත් , ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**10.17 පටබැඳිගෙදර වත්තෙන් අතුරුමාර්ගයේ කාණු පද්ධතිය සංවර්ධනය කිරිම සඳහා (කොඩිතුවක්කු මහතාගේ නිවස අසළ ) රු.350000/=ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

තීරණය -

පටබැඳිගෙදර වත්තෙන් අතුරුමාර්ගයේ කාණු පද්ධතිය සංවර්ධනය කිරිම සඳහා (කොඩිතුවක්කු මහතාගේ නිවස අසළ ) රු.350000/=ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත්, එය සභා අරමුදලින් සිදු කිරිම සුදුසු බවටත් , ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**10.18 අම්බලන්ගොඩ නගර සභා ප්‍රධාන කාර්යාලිය ගොඩනැඟිල්ල අලුත්වැඩියාව පලවන අදියර සිදු කිරිම සඳහා රු.410000/=ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

තීරණය -

අම්බලන්ගොඩ නගර සභා ප්‍රධාන කාර්යාලිය ගොඩනැඟිල්ල අලුත්වැඩියාව පලවන අදියර සිදු කිරිම සඳහා රු.410000/=ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත්, එය සභා අරමුදලින් සිදු කිරිම සුදුසු බවටත් , ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**10.19 අම්බලන්ගොඩ නගර මහජන ක්‍රිඩාංගනයේ නැරඹුම් පඩිපෙල ඉදිකිරීම පලමු අදියර පලවන අදියර සිදු කිරිම සඳහා රු.500000/=ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

තීරණය -

අම්බලන්ගොඩ නගර මහජන ක්‍රිඩාංගනයේ නැරඹුම් පඩිපෙල ඉදිකිරීම පලමු අදියර පලවන අදියර සිදු කිරිම සඳහා රු.500000/=ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත්, එය සභා අරමුදලින් සිදු කිරිම සුදුසු බවටත් , ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**10.20 එල්.සී. ද සිල්වා මාවත කාණු පද්ධතිය ඉදිකිරිම රු.450000/=ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

තීරණය -

එල්.සී. ද සිල්වා මාවත කාණු පද්ධතිය ඉදිකිරිම රු.450000/=ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත්, එය සභා අරමුදලින් සිදු කිරිම සුදුසු බවටත් , ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**10.21 එල්.සී. ද සිල්වා මාවත කාණු පද්ධතිය ඉදිකිරිම රු.212000/=ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

තීරණය -

එල්.සී. ද සිල්වා මාවත කාණු පද්ධතිය ඉදිකිරිම රු.212000/=ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත්, එය සභා අරමුදලින් සිදු කිරිම සුදුසු බවටත් , ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**10.22 පතිරාජ මාර්ග සති පාර ABC යොදා සංවර්ධනය කිරිම සඳහා රු.33750/=ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

තීරණය -

පතිරාජ මාර්ග සති පාර ABC යොදා සංවර්ධනය කිරිම සඳහා රු.33750/=ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත්, එය සභා අරමුදලින් සිදු කිරිම සුදුසු බවටත් , ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි රහුල ලලිත වික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**10.23 කළුවඩුමුල්ල ක්‍රිඩාංගනයේ පස් ඇතිරිම සඳහා රු.43500/=ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

තීරණය -

කළුවඩුමුල්ල ක්‍රිඩාංගනයේ පස් ඇතිරිම සඳහා රු.43500/=ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත්, එය සභා අරමුදලින් සිදු කිරිම සුදුසු බවටත් , ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රි නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**10.24 පොල්වත්ත ක්‍රිඩාංගනයේ පස් ඇතිරිම සඳහා රු.58000/=ක ඇස්තමේන්තුව ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

<u>ගරු නගර සභා මන්ත්‍රි රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

එම පස් අතුරන්නේ අර ප්‍රශ්නයෙන් පසුවද?

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

ඔව්

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මට ඔය පාරවල් ටිකේ ලැයිස්තුව ලබා දෙන්න. ප්‍රතිපදාන වෙන්කරන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

දැන් මෙහෙම දෙයක් තිබෙනවා. අපි මේවා අනුමත කළාට මුදල් ලැබෙන විදියක් තිබෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

දැන් මෙම මාර්ග මාත් දැම්මොත් මේ මුදල් අපරාදේ වෙනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඔයා දැම්මොත් මේ මුදල් අපරාදේ වෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

මට ඕක දෙන්න. මා එතකොට ඔබතුමාට කියන්නම් මේ දමන ඒවා මොනවාද කියා.නැත්නම් අපරාදේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම්.නිලානි මෙනවිය කතා කරමින්</u>**

ගරු මන්ත්‍රීතුමා , පෝයසීමාව පාර යන්නම බැහැ. එයට මුදල් ලබා දෙන්න.

**තීරණය -**

පොල්වත්ත ක්‍රීඩාංගනයේ පස් ඇතිරිම සඳහා රු.58000/=ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත්, එය සභා අරමුදලින් සිදු කිරිම සුදුසු බවටත් , ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**10.25 පොල්වත්ත ජලාශයේ සහ ඇල මාර්ගයේ මඩ ඉවත්කර නඩත්තු කිරිම සඳහා රු.450000/=ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මෙය පොල්වත්ත ප්‍රදේශයේ ගංවතුර වැලැක්වීම සඳහා තමයි සිදු කරන්නේ.

තීරණය -

පොල්වත්ත ජලාශයේ සහ ඇල මාර්ගයේ මඩ ඉවත්කර නඩත්තු කිරිම සඳහා රු.450000/=ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත්, එය සභා අරමුදලින් සිදු කිරිම සුදුසු බවටත් , ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**10.26 මහ අම්බලන්ගොඩ පාරේ සි/ස විදුලි පුද්ගලික සමාගම අසළ කාණුව ( In front of the LECO New Building ) සකස් කිරිම සඳහා රු.375000/=ක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.**

තීරණය -

මහ අම්බලන්ගොඩ පාරේ සි/ස විදුලි පුද්ගලික සමාගම අසළ කාණුව ( In front of the LECO New Building ) සකස් කිරිම සඳහා රු.375000/=ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවටත්, එය සභා අරමුදලින් සිදු කිරිම සුදුසු බවටත් , ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

## 11. වෙනත් කරුණු :-

11.01 ක්‍රිඩා කටයුතු පිළිබඳ ස්ථාවර කාරක සභාව පිහිටුවීම සම්බන්ධ වාර්තාව සභාගත කරන ලදී.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

ක්‍රිඩා කටයුතු පිළිබඳ ස්ථාවර කාරක සභාව මා යෝජනා කරනවා. අම්බලන්ගොඩ නගර සභා බල ප්‍රදේශය තුළ ක්‍රීඩාවන් සඳහා උනන්දුවක් ඇතිවන පරිදි විවිධ වූ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ක්‍රිඩාව සඳහා ඇති පහසුකම් වර්ධනය කිරීම සඳහාත් අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීම ඇතුළු ක්‍රිඩාවන් සඳහා අදාල වන ආයතන පවත්වා ගෙන යාම සම්බන්ධව මහ සභාවට උපදෙස් ලබා දීම පිණිස ද එසේම ඊට අදාල වන්නාවූද අම්බලන්ගොඩ නගර සභාව විසින් තීරණය කොට පවරනු ලබන බලතල ක්‍රියාත්මක කිරීම පිණිසද ක්‍රීඩා පිළිබඳ ස්ථාවර කාරක සභාව නමින් කාරක සභාවක් විය යුතුය යන්නත් ,එම කාරක සභාවේ සාමාජිකයන් ගරු සභාපතිතුමා ඇතුළු මහජන නියෝජිතයන් 9දෙනෙකුගෙන් හා නගර වැසියන් 9කුගෙන් සමන්විය යුතු යන්නත් යෝජනා කරන අතර,

**එහි බලතල පැවරීම**

නගර සභා ආඥා පනතේ 29 වගන්තියෙහි සඳහන් විධිවිධාන ප්‍රකාරව අම්බලන්ගොඩ නගර සභාව සතු බලතල අතරින් මෙහි පහත උපලේඛනයේ විස්තර කරනු ලබන බලතල අම්බලන්ගොඩ නගර සභාවේ ක්‍රීඩා පිළිබඳ කාරක සභාව වෙත පවරා දිය යුතුය යන්නත්

**උපලේඛණය**

නගර සභාව විසින්

(අ) පවත්වා ගත යුතු ක්‍රීඩා උළෙල පිළිබඳ තීරණ ගැනීම

(ආ) නගර සභාව විසින් පවත්වා ගත යුතු ක්‍රීඩා පාසල් සම්බන්ධව ශිෂ්‍යයන් ඇතුලත් කිරීම සම්බන්ධව වූ අවසන් තීරණය ගැනීම.

(ඇ) බලප්‍රදේශය තුළ පිහිටියාවූ ක්‍රීඩා පිටි හෝ පිහිනුම් තටාක සංවර්ධනය කිරීම උදෙසා රුපියල් ලක්ෂ 200000/=ක වටිනාකමකට යටත්ව ඉටු කළ යුතු සංවර්ධන කාර්යයන් තීරණය කිරීම ත්

තීරණය -

අම්බලන්ගොඩ නගර සභා බල ප්‍රදේශය තුළ ක්‍රීඩාවන් සඳහා උනන්දුවක් ඇතිවන පරිදි විවිධ වූ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ක්‍රිඩාව සඳහා ඇති පහසුකම් වර්ධනය කිරීම සඳහාත් අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීම ඇතුළු ක්‍රිඩාවන් සඳහා අදාල වන ආයතන පවත්වා ගෙන යාම සම්බන්ධව මහ සභාවට උපදෙස් ලබා දීම පිණිස ද එසේම ඊට අදාල වන්නාවූද අම්බලන්ගොඩ නගර සභාව විසින් තීරණය කොට පවරනු ලබන බලතල ක්‍රියාත්මක කිරීම පිණිසද ක්‍රීඩා පිළිබඳ ස්ථාවර කාරක සභාව නමින් කාරක සභාවක් විය යුතුය යන්නත් ,එම කාරක සභාවේ සාමාජිකයන් ගරු සභාපතිතුමා ඇතුළු මහජන

නියෝජිතයන් 9දෙනෙකුගෙන් හා නගර වැසියන් 9කුගෙන් සමන්විය යුතු යන්නත් යෝජනා කරන අතර,

එහි බලතල පැවරීම

නගර සභා ආඥා පනතේ 29 වගන්තියෙහි සඳහන් විධිවිධාන ප්‍රකාරව අම්බලන්ගොඩ නගර සභාව සතු බලතල අතරින් මෙහි පහත උපලේඛනයේ විස්තර කරනු ලබන බලතල අම්බලන්ගොඩ නගර සභාවේ ක්‍රීඩා පිළිබඳ කාරක සභාව වෙත පවරා දිය යුතුය යන්නත්

**උපලේඛණය**

නගර සභාව විසින්

(අ) පවත්වා ගත යුතු ක්‍රීඩා උළෙල පිළිබඳ තීරණ ගැනීම

(ආ) නගර සභාව විසින් පවත්වා ගත යුතු ක්‍රීඩා පාසල් සම්බන්ධව ශිෂ්‍යයන් ඇතුලත් කිරීම සම්බන්ධව වූ අවසන් තීරණය ගැනීම.

(ඇ) බලප්‍රදේශය තුළ පිහිටියාවූ ක්‍රීඩා පිටි හෝ පිහිනුම් තටාක සංවර්ධනය කිරීම උදෙසා රුපියල් ලක්ෂ 200000/=ක වටිනාකමකට යටත්ව ඉටු කළ යුතු සංවර්ධන කාර්යයන් තීරණය කිරිම ත්

සුදුසු බවට , ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරම්ණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.

## 11.02 අම්බලන්ගොඩ නගර සභා පෙර පාසැල් ළමුන් සඳහා බෙදාදෙනු ලබන පොත් කට්ටල සාම්පලය සභාගත කරන ලදී.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

අම්බලන්ගොඩ නගර සභා පෙර පාසැල් ළමුන් සඳහා බෙදාදෙනු ලබන පොත් කට්ටල සාම්පලය ඉදිරිපත් කරනවා. මෙය ගිය සභාවේදි ගරු මන්ත්‍රිවරුන් විසින් ඉල්ලා සිටියා.එක ගැසුවොත් මාගේ ඡායරූපය යන්නේ. එක දැන් ඒ අය විසින් එය ගහනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්**</u>

ගරු නගර සභා මන්ත්‍රි රාහුල මහතාගේ ඡායරූපයත් ගසාවි මහ පුටුවට ගියාම.

තීරණය-

අම්බලන්ගොඩ නගර සභා පෙර පාසැල් ළමුන් සඳහා බෙදාදෙනු ලබන පොත් කට්ටල සාම්පලය ගරු නගර සභා මන්ත්‍රිවරුන්ගේ දැන ගැනීම පිණිස ඉදිරිපත් කරන ලදී.

## 11.03 නගර සභා පරිශ්‍රය හා කර්මාන්ත අංශ අංගණය පිරිසිදු කිරීම සඳහා ( වැඩ පරිපාලක කේ.ජේ.ඒ. සිල්වා මහතා )විසින් ඉදිරිපත් කළ ඇති ලිපිය සභාගත කරන ලදී.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නගර සභා පරිශ්‍රය හා කර්මාන්ත අංශ අංගණය පිරිසිදු කිරීම. ඒ අනුව නගර සභාවේ සියළු වාහන පිරිසිදු කිරිම සඳහා හල්වතුර ළමා ක්‍රීඩාංගණය යාබදව ගල්කිරිමේ අංගණයක් තැනීමට යෝජනා කරනවා.

**තීරණය-**

නගර සභා පරිශ්‍රය හා කර්මාන්ත අංශ අංගණය පිරිසිදු කිරීම සඳහා ( වැඩ පරිපාලක කේ.ජේ.ඒ. සිල්වා මහතා )විසින් ඉදිරිපත් කළ ඇති ලිපියට අනුව හල්වතුර කරිත්තකන්ද ග්‍රාම නිලධාරි වසමට ප්‍රවේශ වන ස්ථානයේ හල්වතුර ළමා උද්‍යානයට යාබදව නගර සභා ඉඩමෙහි යන්ත්‍ර සූත්‍ර හා වාහන ගාල් කිරිම සඳහා නව අංගනයක් ඉදිකිරිමටත් ,වාහන සේදීමත් අළුත්වැඩියා කිරිමටත් හා අනෙකුත් අබලි ද්‍රව්‍ය විධිමත්ව තැබිමත් සුදුසු බවට , ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.

**11.04 කැළි කසල බැහැර කිරීම සම්බන්ධ ගිවිසුම් එකඟතා ගිවිසුම සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

කැළි කසල බැහැර කිරීම සම්බන්ධ ගිවිසුම් එකඟතා ගිවිසුම ඉදිරිපත් කර තිබෙනවා. එය අනුමත කරන ලෙස ඉල්ලා සිටිනවා.

තීරණය-

කසළ බැහැර කිරිම පිළිබඳව එකඟතා ගිවිසුම් කෙටුම්පත අනුමත කිරිම සුදුසු බවට , ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්.ලසන්ත අජිත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.

**11.05 බස්නැවතුම්පොළ ඉදිරිපිට රථගාල සඳහා බාහිර සේවකයකු යෙදවීම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

බස්නැවතුම්පොළ ඉදිරිපිට රථගාල සඳහා බාහිර සේවකයකු යෙදවීම සම්බන්ධ ලිපිය සභාගත කිරිම.

## 12. න්‍යාය පත්‍රයට ඇතුළත් නොවූ වෙනත් කරුණු

**12.01** ඇල්පිටිය වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන පරිශ්‍රෙය් වැසිකිළි පද්ධතිය පිරිසිදු කිරීම සඳහා නගර සභා ගලි බවුසරය සභා අනුමැතියට යටත්ව නොමිළේ ලබා දීම (පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - ඇල්පිටිය ප්‍රාදේශීය සභාවේ ) සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මැතිවරණ කාර්යාලය , පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - ඇල්පිටිය ප්‍රාදේශීය සභාවේ 2019.10.11 ඇල්පිටිය වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන පරිශ්‍රෙය් වැසිකිළි පද්ධතිය පිරිසිදු කිරීම සඳහා නගර සභා ගලි බවුසරය ඔබ නගර සභාව විසින් ලබා දෙන ගලි බවුසරය නොමිළේ ලබා දෙනමෙන්

කරුණිකව ඉල්ලා සිටින බවට සහාකාර නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස් ගාල්ල දිස්ත්‍රික් ඉල්ලීමක් කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්</u>**

ගංවතුරට හසු වූ අපේ අයගේ වැසිකිළි පද්ධති ඉසිමේ වැඩය බොහොම ඉක්මනට සිදු වෙනවාද?

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නැහැ. දිනකට දෙකයි කරන්න පුළුවනි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්</u>**

අපේ වැසියෝ 26 කුගේ වගේ ඉල්ලීම් තිබෙනවා.නමුත් ඒ අයට පොඩි වැසිකිළි වළවල් තිබෙන්නේ. ඒ අයට එක බවුසරයකට 4ක් වගේ ගැසිමට පුළුවනි.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඒ ඔබතුමාට අවස්ථාව දෙන විට එය කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්</u>**

දැන් අද උදයේ 7කු ජීවත්වන බටපොළ ප්‍රදේශයේ කුලියට සිටින කෙනෙකු දුවගෙන ආවා . ඒ අය අන්ත අසරණ තත්ත්වයට පත්වෙලා.ඒ වගේ අයට මොකද කරන්නේ.නෑ මොවුන් අපේ ගමේ පදිංචි

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මහජන සෞඛ්‍ය පරික්ෂකතුමනි , දැන් කොහොමද කරන්නේ මේවා.මේ දිනවල මෙය කරන්න ඕන.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා කතා කරමින්</u>**

මුලින්ම හල්වතුර ප්‍රදේශයේ කරන්න කියන්න. නැතිනම් අපට කුණු දැම්මටත් නොහැකි වෙනවා. ඉන්න හම්බ වෙන්නේත් නැහැ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මුලින්ම හල්වතුර කොටසේ කරන්න.මහජන සෞඛ්‍ය පරික්ෂකතුමනි , දැන් අපේ ගරු මන්ත්‍රීවරු ලැයිස්තු කොච්චර දුන්නත් ඔබතුමා නිර්දේශ කරන්න ඕන මෙය ගංවතුරට හසුවෙලා තිබෙනවා.මෙය කළයුතුයි කියා.නැතිනම් අපට හරි ගැටළුවකි.

**තීරණය-**

ඇල්පිටිය වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන පරිශ්‍රෙය් වැසිකිළි පද්ධතිය පිරිසිදු කිරීම සඳහා නගර සභා ගලි බවුසරය සහා අනුමැතියට යටත්ව නොමිළේ ලබා දීම (පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - ඇල්පිටිය ප්‍රාදේශීය සභාවේ ) සුදුසු බවට , ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.

**12.02 ගා/බුද්ධදත්ත විද්‍යාලය අසළ පරණ ගොඩනැඟිල්ල හා පොල්වත්ත හන්දියත් අතර ඇති අතුරු මාර්ගය නගර සභාවට පවරා ගැනීම සම්බන්ධව කරන ලද ඉල්ලීම සභාගත කරන ලදී.**

ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

ගා/බුද්ධදත්ත විද්‍යාලය අසළ පරණ ගොඩනැඟිල්ල හා පොල්වත්ත හන්දියත් අතර ඇති අතුරු මාර්ගය නගර සභාවට පවරා ගැනීම සම්බන්ධව පස් දෙනෙකු පැවරුම් නියෝග ඉදිරිපත් කර තිබෙනවා. මේ පාර ඇවිත් පාසල ඉදිරිපිට ඇති පොඩි පාර. එක පවරා ගැනීමට සභාවේ අනුමැතිය ඉල්ලා සිටිනවා.

තීරණය-

ගා/බුද්ධදත්ත විද්‍යාලය අසළ පරණ ගොඩනැඟිල්ල හා පොල්වත්ත හන්දියත් අතර ඇති අතුරු මාර්ගය නගර සභාවට පවරා ගැනීම සම්බන්ධව පහත ඉඩම් හිමියන් විසින් ඉදිරිපත් කර ඇති පැවරුම් නියෝග හා තාක්ෂණසේවා නිලධාරිගේ වාර්තාව අනුව එම පාර පවරා ගැනීම සුදුසු බවට , ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී නන්දන රාජපක්ෂ මහතා විසින් ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.

- ස්ටැන්ලි ජයරත්න ගුණතිලක මයා
- එච්.එල්.චූලවතී මිය
- එස්.එම්.කරුණාවති මිය
- පී.එච්.කේ.ජී.ආරියපාල මයා
- බී.එච්. සුමතිසිරි ද සිල්වා මයා

**12.03 අම්බලන්ගොඩ නගර සභා මහජන ක්‍රීඩාංගනය සංවර්ධනය කරමින් පවතින අතර මීට පෙර භාවිතා කරන ලද පැරණි ලකුණු පුවරුව භාවිතයට සුදුසු නොවනලෙස අබලන් තත්වයේ පවතින බැවින් මෙම ගොඩනැඟිල්ල කඩා ඉවත් කිරිමත් ,ක්‍රිඩාංගණයේ විකට්ටු සකස් කර පසු නව ලකුණු පුවරුව ඉදිකිරීම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.**

ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

අම්බලන්ගොඩ නගර සභා මහජන ක්‍රීඩාංගනය සංවර්ධනය කරමින් පවතින අතර මීට පෙර භාවිතා කරන ලද පැරණි ලකුණු පුවරුව භාවිතයට සුදුසු නොවනලෙස අබලන් තත්වයේ පවතින බැවින් මෙම ගොඩනැඟිල්ල කඩා ඉවත් කිරිමත් ,ක්‍රිඩාංගණයේ විකට්ටු සකස් කර පසු නව ලකුණු පුවරුව ඉදිකිරීමට සුදුසු බව නිරික්ෂණය වේ. ඒ අනුව ඉදිකෙරමින් පවතින ක්‍රිඩාංගණයේ අබලන් තත්ත්වයේ පවතින ලකුණු පුවරුව කඩා ඉවත් කිරිමට නගර සභාවේ අවසරය ඉල්ලා සිටිනවා කියා තාක්ෂණසේවා නිළධාරි වාර්තා කරනවා.

ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්

ගරු සභාපතිතුමනි ,කැඩුවාට කමක් නැහැ. ට්‍රප් ටික දැම්මාට පසු.වෙනස් වෙනවානේ .එම නිසා ඊට පසු හදන්න කියන්න.

ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

ට්‍රප් තුන වැටෙන්නේ ඔය පැත්තටයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් මහතා කතා කරමින්</u>**

නැහැ. දිශාව වෙනස් වෙන්න පුළුවනි. නැතිනම් ට්‍රප් තුන එක පැත්තක . නාම පුවරු එක පැත්තක වෙන්න පුළුවනි.අපි දන්නේ නැහැනේ ට්‍රප් තුන සැලසුම් කරන්නේ ක්‍රිකට් සංගමයෙන්.ඒ අනුව තීරණය කරන්න.

තීරණය-

අම්බලන්ගොඩ නගර සභා මහජන ක්‍රීඩාංගනය සංවර්ධනය කරමින් පවතින අතර මීට පෙර භාවිතා කරන ලද පැරණි ලකුණු පුවරුව භාවිතයට සුදුසු නොවනලෙස අබලන් තත්වයේ පවතින බැවින් මෙම ගොඩනැඟිල්ල කඩා ඉවත් කිරිමත් ,ක්‍රිඩාංගණයේ විකට්වු සකස් කර පසු නව ලකුණු පුවරුව ඉදිකිරීම සුදුසු බවටත් , ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම් සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමා , මේ පොතේ ඔබතුමාගේ පිංතූරය ලස්සනට තිබෙනවා. හරිද ඒක.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නරක නැහැනේ . හොඳයි ඒක.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම් සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

මැතිවරණ අල්ලස් තමයි මේවා.මීට වඩා හොඳයි ඉදිරිපස පිටුවේ දැම්මා නම් හොඳයි . ළමයාගේ ෆොටෝ එක අයින් කරලා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

බලන්නම්. ඊළඟ පාර සලකා බලා. ලබන වසරේ පැමිණෙන කට්ටියට.දැන් ඉස්සෙල්ලා කට්ටියට දීලා ඉවරයි. මේ අවුරුද්දේ ඒවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

මේ පොත් සඳහා කොපමණ මුදලක් වැය වෙනවාද?ළමයින් 200 ක් නම් එක ළමයෙකුට පොත් කියක්ද ?

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

දැන් කවදාද ඕවා දෙන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමා, අපේ ගරු නගර සභා මන්ත්‍රී එස්.එම් සරත් චන්ද්‍ර මහතා නගන ලද ප්‍රශ්නය. මෙයට නගර සභාවෙන් ලක්ෂ ගණනක් මුදල් වැය කරනවා නම් ඔබතුමාගේ ඡායාරූපයක් දැම්ම සුදුසු නැහැ. පුද්ගලයෙකු දෙනවා නම් එය එතරම් ප්‍රශ්නයක් නැහැ.එක සම්පූර්ණ වැරදි ආදාර්ශයක්.මොකද නගර සභාවේ පොදු මුදල්. ඔබතුමාගේ ඡායාරූපයක් පමණක් දමා සුභශිංෂණ පතලා ළමයාට දෙන එක නරකයි. එක එහෙම කරන්න එපා කියා මා යෝජනා කරනවා. මොකද ලක්ෂ ගණනක් මුදල් යනවා.පොඩි මුදලක් තමන්ගේ තනි කැමැත්තට දෙනවා නම් එය ලබා දෙන්න පුළුවනි.නමුත් නගර

සභා පොදු මුදල් නිසා එවැනි දෙයක් නොකරන ලෙස මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.මොකද ලක්ෂ ගණනක් යන වියදමක්.ඒ ගැන කියන්න නෙමේ මා මේ නැගිට්ටේ. ගිය සභාවක මා නොසිටි අවස්ථාවේ සභාවේ කතා වුණු ගම්පෙරළිය පිළිබඳ ප්‍රශ්නයකි.ඊට්පසු අපි මෙය ගිය සභාවක කතා වුණා.ඊට්පසු ඔබතුමා චෝදනාවකුත් නැගුවා මෙය හොරකමක් . මුදල් හොරකම් කිරීමක් කියා චෝදනා නැගුවා.මේ පොතේ තිබෙනවා පිටු අංක 83. මා ඔබතුමාට කියන්න කැමතියි මේ ගම්පෙරළිය යෝජනා ඔබතුමාට ප්‍රාදේශීය ලේකම්තුමිය විසින් 2019.01.31 දින එවලා තිබෙනවා.ඔබතුමා මේවා අනුමත කර යවා තිබෙනවා.ඊටපසුව ප්‍රාදේශීය ලේකම්තුමියට එවා තිබෙනවා තුන්වෙනි මාසයේ.මා වෙන්කරන ලද මුදල් තාක්ෂණ නිලධාරින් අත්සන් කර තිබෙනවා.තාක්ෂණ නිලධාරින් අනුමත කළාට පසු මා ඔබතුමාට කියනවා අනුමත ඇස්තමේන්තුවල ඉතිරි ප්‍රතිපාදන හදලා කියනවා. මොකද ඔබතුමා කිවුවේ ලක්ෂ 7ක් වියදම් කරන ලැබූ තැනක මේ පොඩි ගණනක් කරලා හොරකම් කළා කියා.එමනිසා මා ඔබතුමාට කියනවා එහෙම දෙයක් රජයේ කරන්නේ නැහැ. ඔබතුමා දේශපාලනය වසර ගණනාවක් කළා.එතකොට ඔබතුමාගේ ප්‍රකාශය මා දැඩි ලෙස හෙලා දකිනවා.එවැනි ප්‍රකාශ නොකර ලෙසත් මා ඉල්ලා සිටිනවා.86 පොල්වත්ත බුද්ධදත්ත දෙවන පටුමග අනුමත කළ ප්‍රතිපාදන රු.700500/= කි. ඇස්තමේන්තු ප්‍රතිපාදන රු.100500/= කි. මොකද මෙය දැම්මේ ජනවාරි මාසයේ. ඔබතුමා මේ පාර හදනවා ඊට පසුව.ඊටපසු ඇස්තමේන්තු කරන කොට මේ මුදල අඩු වෙනවා.එතකොට ඉතිරි වන මුදල 520000/= කි.ඔබතුමා මේවා කිසි දෙයක් නොදැන නෙමෙයි. ඔබතුමා දේශපාලනික වශයෙන්

ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

කිසිම වාර්තාවක් ලැබී නැහැ.අපි බලන්නේ ඔබතුමාගේ මුහුණ දමා අර බෝඩ්එක ගහලා තිබෙනවානේ . අන්න ඒ වගේ තිබෙන ගණන් තමයි අපි දන්නේ.

ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්

අම්බලන්ගොඩ වසමේ විතරක් අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම්තුමිය තමයි මේවා ලකුණු කළේ . එවගේ මේ ප්‍රතිපාදන වලින් ඉතිරි වුණු මුදල් ප්‍රමාණය වෙන්කරන ලද මුදල් වලින් විශාල මුදලකි.ඒ ප්‍රතිපාදන සඳහා නැවත දෙනවා ඒවා.ඉතිරිවන ප්‍රතිපාදන ලක්ෂ එකිසිය හතලිස් තුනයි පහලොස් දහස් හයකි. (රු.14315006/=කි) ඒ වගේ ප්‍රතිපාදන ඉතිරි වෙනවා. මුදල් දුන්නාම . දැන් ඔබතුමා ඔය කිවුව පාරවල් වලට මට දමන්න බැහැනේ. මට ඇස්තමේන්තුවක් නැහැනේ.මා දමනවා ලක්ෂ හතරක් කියා.එතකොට තාක්ෂණසේවා නිලධාරි ඇස්තමේන්තුව දෙනවා රු.320000/=කි.එතාකොට අසුවක් ඉතිරිවෙනවා.මේ ඉතිරි වන ප්‍රතිපාදන වලටත් මා තව ටිකකින් කාර්යාලයට ගිහින් ලක්ෂ එකසිය ගණනක ප්‍රතිපාදන.ඒවා නොදැන එහෙම චෝදනා කිරීම වැරදියි. අපි නිතරම උත්සාහ කරනවා නගර සභාවේ ඒ කොටස් ඔබතුමාට බරක් නොවී අපගේ ක්‍රීඩාංගණයත් නගර සභා ගොඩනැගිල්ලත් ඉදිකර ගැනීමට උත්සාහ කරන්න.පුළුවන් ප්‍රතිපාදන මා ඔබතුමාට ලබා දෙනවා ඒ වැඩ කටයුත්ත සඳහා.නැවත වරක් ඒ පිළිබඳ මාගේ අප්‍රසාදය ප්‍රකාශ කරනවා.ඊට අමතරව මාගේ අර කාපට් පාර අවසන්. මගේ කාපට් ඉතිරි වුණා. මා කළේ අතන සිට කාපට් එක ගැසුවා.පල්ලෙහාටටත් ගැසුවා . පන්සල පැත්තටත් ගැසුවා.තව මුදල් වගයක් මට ලැබී තිබෙනවා.මේ ඡන්දේ කාලේ නිසා ප්‍රතිපාදන වල දෙන එකේ පොඩි ප්‍රශ්නයක් තිබෙනවා.ඊටපසු මා එම ප්‍රතිපාදන ටික ලැබුණොත් එහෙම මානාන ක්‍රීඩාංගණය ළඟ සිට මහ අම්බලන්ගොඩ පාර මා නිම කරනවා. ඊළඟ කරුණ තමයි මා මහ අම්බලන්ගොඩ ළමා උද්‍යානය සඳහා ලක්ෂ 30ක් වෙන් කළේ. මේ සභාවේ සභා වාර 4කට 5කට වඩා මා කතා කළා.එය ඉදිකරන්න ඔබතුමා මේ අවශ්‍ය කටයුතු ටික හදලා දෙන්න.නමුත් ඒ කිසිම දෙයක් දුන්නේ නැහැ.ලැබුණේ නැහැ. දැන් ප්‍රාදේශීය ලේකම්තුමිය මට එවා තිබෙනවා ප්‍රතිපාදන අවලංගුයි.මා එකට අද වෙන යෝජනා ඉදිරිපත් කරනවා.කානගාටුයි . අප කුඩා කාලයේ තිබුණ ළමා උද්‍යානයකි.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නැහැ . අපි එය සුද්ද කර දී තිබෙන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

මාස 10ක් තිස්සේ සුද්ද වුණේ නැහැ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපි එය සුද්ද කර දුන්නා. ගරු නගර සභා මන්ත්‍රීතුමා තමයි එය කර දුන්නේ නැත්තේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්</u>**

මා මේ වෙලාවේ ලේකම්තුමිය මා කරුණාකරලා කියනවා අම්බලන්ගොඩ නගර සභාව සතු සියළු දේපළ වල තැන, භූමි ප්‍රමාණය,පර්චස් ප්‍රමාණය ආදි සියළු දේ ඉදිරිපත් කළ යුතුයි.මා හිතන්නේ එකඟයි මා කිවු දෙයට. එකඟද නැද්ද? මොකද හේතුව අයතා ලෙස මේ නගර සභාව සතු දේපල පරිහරනය කරනවා විවිධ පුද්ගලයින්. එක වැරදියි. අපට කියක් හරි නගර සභාවට මුදල් පැමිණිය යුතුයි.ජනතාවට ඒවා තනියම පාවිච්චි කරන්න ඉඩ දෙන්න බැහැ.නගර සභාවට ඔය මුදලත් අවොත් ඔය සංවර්ධන කටයුතු ඔය කරනවා වගේ දෙගුණයක් කළ හැකියි.ඒක එක එක ජනතාව පාවිච්චි කරන විදිය.එමනිසා ගරු ලේකම්තුමිය ඊළඟ සභා වාරයට ඉදිරිපත් කරන්න. නගර සභාව සතු සියළුම දේපල වල විස්තර.ඒ වගේ මහ අම්බලන්ගොඩ ළමා උද්‍යානය ඉදි කරන්න කියන තැන මා දැක්කා ඊයේ පෙරේදා හොඳට ලොරි ගසා තිබෙනවා.මේ යාබද නිවසේ තැනැත්තිය ඔබතුමාට ඒවා තිබෙනවා මේ ලිපිය.එම ලිපිය සභාගත වුණේ නැහැ.එම්.ඩබ්. ප්‍රභාවි නන්දනී ද සිල්වා , ඔබතුමාට එවා තිබෙනවා. නගර සභා භූමිය තුළ කාලයක් තිස්සේ මේ වාහන නතර කර තිබෙනවා. ට්‍රිපර් රථ නතර කර තිබෙනවා.රාත්‍රි කාලයේ ට්‍රිපර් රථ අළුත්වැඩියා කරන නිසා ඇතිවන ශබ්දය, ට්‍රිපර් රථ ගාල් කිරිම,ශරිරික වායු දූෂණය අසල්වැසි නිවැසියන්ගේ සෞඛ්‍යයට තර්ජනයක් වේ.ටිරිපර් රථ තුළ ජලය එක්රැස්විම නිසා ඩෙංගු මදුරු උවදුරට අසල්වැසි නිවෙස්වල නිවැසියන් ගොදුරු වි ඇත.තවද පාරේ ගමන් කරන ජනතාව ට්‍රිපර් රථවලට මුවා වී මුත්‍රා කරන නිසා අපවිත්‍ර ජලය නිවසට මුසුවීම නිසා මහත් අපහසුතාවයට පත්වේ.ගරු නාගරාධිපතිතුමනි, මීට පෙර අසල්වැසි කෙනෙකු මීට පෙරද ඔබව දැනුවත් කළද එයින් කිසිදු ප්‍රතිඵලයක් අත් වි නොමැත.එමනිසා පවතින මේ තත්ත්වය යටතේ ළමා ක්‍රිඩාංගණය ඉදිවිම නිසා මා විසින් මීට පෙර ඉදිරිපත් කරන ලද විරෝධතාවය මෙයින් ඉවත් කර ගන්නා අතර මාගේ නිවසට වාහනයක් ඇතුල් කර ගැනිමට හැකිවන පරිදි ස්ථානය වෙනස් කරගන්න බවද එය නැවත සාදා දිමටද පොල්ගස ඉවත් කර ගන්නා බවටද කැමැත්ත ප්‍රකාශ කර ඇත. මීට පෙරද ළමා ක්‍රිඩාංගණයක් තිබුණ හෙයින් හැකි ඉක්මනින් එය ඉදිකිරිමටද නැතහොත් මෙම භූමියේ වාහන ගාල් කිරිමට නොහැකි වන සේ නිසි පියවර ගන්නා ලෙස ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.මෙය සියළු ගරු මන්ත්‍රිවරුන්ට ඉදිරිපත් කර තිබෙනවා. ඉතිං මෙක තමයි තත්ත්වය.මේක තමයි නගර සභාවේ තත්ත්වය. අපි කියන්නේ මෙය බොහොම කානගාටු දායක තත්ත්වයකි.අපි තේ බිමටයි ආයෙත් තව පාරට තේ බිමටයි නම් මෙතැනට එන්නේ එහෙම වෙන්න බැහැ. අපි කතා කරනවා . ගරු මන්ත්‍රිවරු කියනවා .තීරණ තින්දු ගන්නවා. දැන් ත්‍රි රෝද කමිටුව මෙතැන තේ බිබී කතා කරනවා.කාලය කාලා එහෙම කිසි දෙයක් ක්‍රියාත්මක වන්නේ නැතිනම් නගර සභාවට ඇවිත් වැඩක් වෙන්නේ නැහැ මේ ගරු මන්ත්‍රිවරුන්.එම නිසා මා ලේකම්තුමියගෙන් ඉල්ලා සිටියා මේ ගැන ක්‍රියා කරන්න. නගර සභාව මේ වාර ගණනාවකදි ඉල්ලුවා.සත පහකට වැඩක් වුණේ නැහැ.කිසිම ක්‍රියාමාර්ගයක් ගත්තේ නැහැ.ඒ පිළිබඳව බලවත් අප්‍රසාදය බලවත් කළකිරිමක් පළ කරනවා නගර සභා මන්ත්‍රිවරයෙක් විදියට.මෙහෙම යන්න බැහැ නගර සභාව.එම නිසා මෙය නිවැරදි කරන්න.නීතිය ගෙනියන්න.කාටත් පොදුයි . මේ නගර සභා සතු ඉඩම් මේ විදියට කාටවත් සෙල්ලම් කරන්න දෙන්න ඉඩ දෙන්න බැහැ. එක එක්කෙනාගේ දේශපාලන බලපෑම් ඇති.වහා නතර විය යුතුයි.එහෙමනම් අපි මේ විපක්ෂ

මන්ත්‍රීවරු මෙහි වාඩිවිය යුතු නැහැ.කරුණා කරලා ඔබතුමා මේ පිළිබඳ අවධානය යොමු කරන්න.නගර සභාවේ අපි මෙතැන තේ බිලා වාඩිවෙලා කතා කරලා යනවා නම් මේය වැඩක් නැහැ.මේ ඉඩම් පිළිබඳ සියළු විස්තර අවශ්‍යයි . මේ මහ අම්බලන්ගොඩ මෙම භූමියේ වහාම වැට ගස්වන්න. නගර සභා සේවකයන් දමා හරි. අපේ භූමි ප්‍රමාණය තුළ. ඉල්ලන ඉල්ලන ප්‍රමාණය ඒ අයට දෙන්න බැහැ. අපි ඉතා සාධාරණ ලෙස ඔවුන්ට ලබා දුන්නා. ඔබතුමා ඉතා සාධාරණයි.අපි ගරු මන්ත්‍රීවරු සාධාරණයි.එයාට අපි දුන්නා ගමන් ගන්නා ඕන මාර්ගය.ගරු නගර සභා මන්ත්‍රී නිලානි මෙනවිය, මම , ගරු නගර සභා මන්ත්‍රී ලක්ෂ්මි මෙනවිය අපි කුඩා කාලයේ සෙල්ලම් කළ උද්‍යානයකි.ඔකේ කාටවත් පාරවල් තිබුණේ නැහැ.ඒ අයට පාරවල් තිබුණේ පිටුපස්සේ. අපි ඒවා හාරා අවුසන්න යන්නේ නැහැ. ඔබතුමාගේත් මිත්‍රයෝ , මගේත් මිත්‍රයෝ. මෙතැන සිටින ගොඩක් අයගේ සම්බන්ධකම් තිබෙනවා.අපට දේශපාලනය වැඩක් නැහැ. අර අයටත් අඩි 20 ඒවා දෙන්න බැහැ.මෙහි වැට ගහන්න. ලේකම්තුමිය ඊළඟ සභාවට කලින් මෙහි වැට ගසන්න.මේක නොකොළොත් අපි සභාව වර්ජනය කරන එක මිට හොඳයි. අපි මේ සභාවට එන එක නතර කරන එක හොඳයි කොමසාරිස්තුමියට කියා.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මේ සම්බන්ධව කතා කරනවා නම් ඔබතුමා මෙය කණ්ඩායම් රැස්වමේදි කතා කළානම් වඩා හොඳයි.මේ වගකීම සම්පූර්ණම පැහැර හැරලා තිබෙන්නේ ගරු නගර සභා මන්ත්‍රී සෝභිත රංජිත් මහතා විසිනි.මා එතුමාට බොහොම පැහැදිලිවම කිවුවා මේ වැඩය මෙන්න මේ විදියට කරන්න කියා.එතුමා මට කිවුවා මට බැහැ මිනිසුනු එක්ක තරහා වෙන්න එපා කියා.ඔබතුමා මිනිසුන් එක්ක තරහා වෙන්න බැරිනම් මන්ත්‍රීකමින් අයින් වෙන්න.ඔබතුමාට ගරු සංවිධායකතුමා ලක්ෂ 25ක් ලබා දුන්නාම ඒ ලක්ෂ 25න් පව්විචියට ගන්න මිනිසුන් එක්ක රණ්ඩු වෙන්න බැහැ කියා කියා ඉන්නවා. මා රණ්ඩු වෙන්න ඕන නැහැ.අනික් එක මතක තියා ගන්න ඔබතුමාට විරුද්ධව ගසා ගැවා කියා හරි කියපු ප්‍රකාශයක් අපි ඉල්ලා අස්කර ගන්නේ නැහැ.ඔය හැමතැනම ගසා තිබෙන බෝඩ්ටික තමුන්නාසේලාගේ ගෙදරින් ගෙනෙල්ලාද ඔය පාරවල් ටික හැදුවේ.ඔය හැම එකෙන්ම අරවගෙන් මෙවාගෙන් රූපටික ගලවන්න කියනවානම් ඔබතුමාගේ බෝඩ්ත් ගලවනවා හෙටම.මොකද ඔබතුමාගේ මුදල් වලින් නෙමේ නේද මේවා හදලා තිබෙන්නේ.ඒවා ආණ්ඩුවේ මුදල් වලින් ඒවා හදලා තිබෙන්නේ. එහෙනම් එහෙම අයිතියකුත් නැහැ. තමන් තමන්ගේ ෆොටෝ එක දමා ගෙන අනික් කෙනාගේ ෆොටෝ එක දමන්න එපා කියනවා.එක වැරදි ක්‍රියාවක්.තමුන්නාසේට කියන්න තමුන්නාන්සේ කරන ලද හිරේවත්තේ කාණුවේ පතුල විතරයි දමා තිබෙන්නේ. එතැන ගිය මුදල කියද? එහි ගසා තිබෙනවා බෝඩ් එක. මෙන්න මෙච්චරත් ගියා කියා.මිනිස්සු අපෙන් අහනවා. මේ පතුලේ සිමෙන්ති විතරයි දමා තිබෙන්නේ. මොනවාද මේ කර තිබෙන්නේ කියා.ඉතිං ඒ වගේ තමයි කොන්ත්‍රාත්කර තිබෙන්නේ.ඔය ජාතික සවියට අපේ විපක්ෂනායකතුමා හොඳ සත්භාවයෙන් මුදල් වෙන්කරන්න ඇති.නමුත් සත්භාවයෙන් නෙමේ ඇතුළේ වැඩය වෙලා තිබුණේ. අපි දැමූ වෙලේගොඩ පාර සම්පූර්ණයෙන්ම කඩලා ආපහු දැම්මා.රු.454000/=ක මුදලක් එයට උඩින් කඩලා තාර දැම්මට.ඉතිං ඒ වගේ බොරු වංචා කළා.ඔබතුමා සත්භාවයෙන් කරන්න ඇති.නමුත් කෙරමිණිය ප්‍රදේශයේ ලූෂන් වඩුතන්ත්‍රි මහතාගේ පාර වළවල් තුනකට වැඩියේ තිබ්බේ නැහැ.එකත් දැම්මා සම්පූර්ණයෙන්ම කඩලා.මට පෙනෙන විදියට මහජන මුදල් නාස්ති කරපු අවස්ථාවක් මේක.එමනිසා අපි කියනවා වැඩය අවශ්‍ය දේ පමණක් යොදවන්න.ගරු නගර සභා මන්ත්‍රී සෝභිත රංජිත් මහතා මෙය උත්සාහ කළානම් කරන්න තිබුණා. මා එතුමාට දෙපාරක් කිවුවා.මේ කතා කරන්න එම ජනතාව සමඟ. ගරු නගර සභා මන්ත්‍රී සෝභිත රංජිත් මහතා මට කියන්නේ මා කැත්තක් පොල්ලක් අරගෙන ගිහින් පාරවල් වෙන්කරන්න ඕන.මට ඕන එක නෙමේ. ඔබතුමා එම ප්‍රදේශයේ ගරු මන්ත්‍රී . මන්ත්‍රීතුමා වශයෙන් ගිහින් පරීක්ෂා කරලා සාකච්ඡා කරලා ඒ සියළු දේවල් කරන්න.අපි වාහන ටිකක් පොලිසියේ දමා එක දවසක් ඒ ටික අරගෙන දුන්නා.එක පාරක් අයින් කර දුන්නා. නමුත් එතුමා එය පැහැර හැරියා.සල්ලි ගියානම් අපිට සභාවට බනින්න එපා. ගරු නගර සභා සෝභිත මහතාට

බනින්න. අපිට බනින්න එපා.එමනිසා එම වගකීම තිබෙන්න ඕන ඔබතුමා එය පවරන ලද ගරු මන්ත්‍රීතුමාට.අදාළ ගරු මන්ත්‍රීතුමා ඡන්දය තියා ගන්න ඒ අය සමඟ රණ්ඩු නොවී සිටින්නායි අපි ගිහින් රණ්ඩු වෙලා එය කරන්නායි.ඒ දෙකක් කරන්න බැහැ. අපි වැඩකට බැස්සොත් අපි එම වැඩය කර ඉවර කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. සෝභිත රංජිත් මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, දැන් මේ පාර ගන්න අඩි 10 අඩි 10 ගන්න සභාවෙන් අවසර දුන්නා ඔබතුමා.අපට දුන්නේ ගිය සභාවෙන්නේ. මා ගිහින් සාකච්ඡා කළා.මේ වාන්දනි කියන කෙනා අඩි 10 දෙන්න කැමතියි.කමල් කියන පුද්ගලයා අඩි 10ට අඩි 20ක් ඉල්ලනවා.ඔබතුමා කිවුවානේ. දැන් ඔබතුමා තමයි කමල් මහතාට කියා තිබෙන්නේ මම තමයි කියා දම්වැල් ගස්වන්න හදන්නේ කියා .දැන් ඔබතුමා හදනවා මා පටලවන්න. අනිත් එක මා කාටවත් දේශපාලනයේදි භය නැහැ. මා හොඳ කොන්ද කෙලින් මිනිසෙක්.කාටවත් භය නැහැ අපි දේශපාලනය කරන්න ඇවිල්ලා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඔබතුමා ඇඟ තිබ්බාට භයයි.භය නිසා තමයි උන් එක්ක ගියේ නැත්තේ.භය නිසා තමයි මේ ලක්ෂ 25 නැතිවුණේ. ඔයාගේ භයට.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. සෝභිත රංජිත් මහතා කතා කරමින්</u>**

සභාවේ ප්‍රශ්න වලට මා මිනිස්සු සමඟ ගහගන්න යන්න ඕන නැහැනේ.ඔබතුමාත් දැන ගන්න ඕන සභාවේ නිලධාරින් සමඟ ගිහින් වැට ගසන්න. මා මොකටද මිනිසුන් සමඟ ගහගන්නේ.ගරු සභාපතිතුමා හදන්නේ අපි මිනිමරුවෝ කරන්න ප්‍රශ්න වලදි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම් නිලානි මෙනවිය කතා කරමින්</u>**

අපි කිවුවා අපිත් දැනුවත් කරන්න. අපිත් එන්නම් කියා ඒ වේලාවට.අපිව දැනුවත් කලේත් නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. සෝභිත රංජිත් මහතා කතා කරමින්</u>**

දැන් මේ ළමා උද්‍යානය ගහලා ඉවරයිනේ.දැන් එය අවලංගුයි. දැන් ඔබතුමා නගර සභා ඉඩම කොටු කරන්නොකෝ දම්වැල් ගසා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපි එක ගහන්න ඕන වෙලාවට ගහන්නම්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. සෝභිත රංජිත් මහතා කතා කරමින්</u>**

ඔබතුමා දේශපාලන හිතවත්කමට මෙය කරන්න හදන්නේ . අපි දන්නවා.අපි දන්නවා ඔබතුමා ඕක කරනවා කියා. ඒක මහ හැරියා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපි මහ හරින්නේ නැහැ.ඔබතුමාගේ රක්ෂාව ඔබතුමා කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. සෝභිත රංජිත් මහතා කතා කරමින්</u>**

මා කාටවත් භය නැහැ. මං මොකටද කාටවත් භය වෙන්නේ.

ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

ඔබතුමා මට කිවුවානේ කෙලින්ම.මට බැහැ රණ්ඩු වෙන්න . මා අතහරිනවා කියා.ඔබතුමා මටත් කිවුවානේ.ඔබතුමා ඇයි ඒක ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් මහතාට කිවුවේ නැත්තේ. එතුමාට කියන්නේ නැතිව මට කියන්නේ මිනිසුත් එක්ක රණ්ඩු වෙන්න කියන්නේ.මේවාගේ දේවල් කණ්ඩායම් රැස්විමේ බේරා ගන්න.ගෙන්න එපා සභාවට.

ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්. සෝභිත රංජිත් මහතා කතා කරමින්

ඔබතුමා මොකටද මට කියන්නේ. මා මොකටද ගහගන්න යන්නේ මිනිසුත් එක්ක. සභාවේ නීතියක් තිබෙනවානේ . ඒ අනුව කටයුතු කරන්න.ඔය ඉඩම කොටු කරලා දම්වැල් ගහන්න

ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්

ගරු සභාපතිතුමනි,මේ ගම්පෙරළිය යෝජනා ක්‍රමය යටතේ සංවර්ධනයක් සිදු වෙලා නැහැ කියනවා.කුහක දේශපාලනය තියා ගන්න හොඳ නැහැ.මා ඕනවේලාවක භය නැතිව කියනවා.මා මෙච්චර දවස් දෙක තුනක් බලාගෙන හිටියා. සද්දේ දනවා මේ දෙක තුනේම.ලොකු විනාශයක් වෙලා තිබෙනවා කියා.උදාහරණයක් දෙන්නම් ලක්ෂ 5ක ප්‍රතිපාදන දෙනවා නම් පරිපාලන වියදම් , සමිතිවලට ගෙවන මුදල් ආදියද ඇතුළත්ව.ඔබතුමා දන්නවානේ මටත් වඩා.එහි ප්‍රතිපාදන ඇවිත් ඇස්තමේන්තු හැදුවාට පසු එම ගණන අඩු වෙනවා. අපේ ගරු සංවිධායකතුමා කිවු පරිදි.දැන් මෙතුමා කියනවා මේ පත බෝඩ් ගහනවා කියා. මා මෙන්වන්නම් මේ මගනැගුමේ බෝඩ් ගහලා තිබෙනවා.චක්‍රලේඛයක් ඒවා තිබෙනවා ප්‍රාදේශිය ලේකම්තුමියට ඕනෑම රජයේ ප්‍රතිපාදනයක් ඇවිත් තිබෙනවා.මා මෙතුමාත් සමඟත් රණ්ඩු වුණා.ප්‍රාදේශිය නායකගේ ඡායරූපය ගහන්න කියා.මා මෙතුමා සමඟ රණ්ඩු වුණා පැයක් පමණ. ප්‍රාදේශිය නායකගේ ඡායරූපය ගහන්න කියා.මා හැමදේම දැනුවත් වෙනවා ප්‍රාදේශිය ලේකම් එක හරහා. බොරුවට වාද වෙලා වැඩක් නැහැ.ඔබතුමලාගේ රජයෙන් හොඳ දෙයක් කළානම් කුහක දේශපාලනය නැතිව අපි ඒවා අගය කරනවා.මෙය කෙන්ති ගන්න දෙයක් නැහැ. ලොකු සංවර්ධනයක් සිද්ධ වෙනවා. අම්බලන්ගොඩ නෙමේ. මුළු ලංකාවේම.ඒක අගය කළ යුතුයි.පොඩි පොඩි දේවල් සිද්ධ වෙනවා. ප්‍රාදේශිය ලේකම් හරහා මේ දේවල් සිද්ධ වෙන කොට මෙහෙන් හැදුවාට පසු පොඩි පොඩි ප්‍රශ්න ඇති වෙනවා.පාරක් දැක්කාම කියන්න පුළුවනි මෙය පැච් දමලා ද අළුතින් හැදුවාද කියා.මා පාරවල් පෙන්වන්නම්. ඉන්නවානම් ගරු මන්ත්‍රිවරයෙක්. පැච් දමා තිබෙනවා නම් පැච්එක දමා තිබෙනවාද කියා.අපිට බොරු කරන්න බැහැ.මොකද අපිත් එයට සිටිනවා සම්බන්ධවෙලා.මෙතුමා කිවුවා ලොකු බෝඩ් ගහලා පාරවල් හදන්නේ නැහැ කියා.මා ඇත්ත කතා කරන්නේ.මට මෙතුමාට කතා කරන්න හොඳ කොන්දකුත් තිබෙනවා.මේ සභාවේ හරි දේවල් වලට කතා කරන්න හොඳ කොන්දකුත් තිබෙනවා.එක්සත් ජාතික පක්ෂයේ ගරු මන්ත්‍රිවරයෙක් විදියට හොඳ හඩක් නගන්න ශක්තියක් තිබෙනවා. ඒ කියන්නේ හරි දෙයට. ඔබතුමා හරි නම් ඔබතුමාට.මට දේශපාලනයක් වැඩක් නැහැ.ගරු සභාපතිතුමා හරිනම් එතුමාට.එමනිසා මේ විනාශ කතාන්දරය කතා කරන්න එපා.

ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම් නිලානි මෙනවිය කතා කරමින්

ගරු සභාපතිතුමා, විශේෂයෙන්ම මහ අම්බලන්ගොඩ ළමා ක්‍රීඩාංගණය ගැන කතා කරද්දි ඔබතුමා ඇත්තටම යම්කිසි නිගමනයකට ආවා. මටයි, ගරු නගර සභා මන්ත්‍රී ලක්ෂ්මි මෙනවිය , ගරු නගර සභා මන්ත්‍රී ඉනෝකා මහත්මියට පැවරුවා.ඒ ස්ථානය බලා එකඟතාවයකට එන්න කියා. ඇත්තටම ඒ වෙලාවේ ගරු නගර සභා මන්ත්‍රී සෝභිත මහතා හිටියේ නැහැ. අපි ඒ එකඟතාවය මත තීරණය කළා ඒ අවශ්‍ය අයට පාර දිලා ළමා ක්‍රිඩාංගනය හදන්න.අපේ ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් මහතාට ස්තුතිවන්ත වෙනවා. ලක්ෂ 30ක් ලැබිලාත් ගරු නගර සභා මන්ත්‍රී සෝභිත මහතාට තිබුණා ඒ අවස්ථාවේ අපිටත් එන්න කියලා . ප්‍රදේශයේ ගරු මන්ත්‍රිතුමා සෝභිත මහතා නම් එතුමාට තිබුණා එම

ස්ථානයට පැමිණ අපිවත් දැනුවත් කරන්න.අපිත් දැනුවත් වුනානම් අපිත් එනවා එතැනට එතුමාට ශක්තිය වෙන්න.එහෙම වුණානම් අද ඔය ලක්ෂ 30 යන්නේ නැහැ.ඒ සම්බන්ධව මා කනගාටු වෙනවා.අපි සැහෙන උත්සාහයක් දාලා නගර සභා භූමිය තුළ තිබුණ ළමා ක්‍රිඩාංගණය නැවත හදන්න ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා නැවත ප්‍රතිපාදන දිලත් අපට එම ප්‍රතිපාදන ගන්න නොහැකි විම සම්බන්ධව. මොකද මානාන ළමා ක්‍රිඩාංගණය ඇරුනාම මේ වන විට තිබෙන්නේ හිරේවත්ත , මහ අම්බලන්ගොඩ සියළු දෙනාටම තිබෙන්නේ ඔතැන පමණයි.ගරු සභාපතිතුමනි, මා ඉල්ලා සිටින්නේ ප්‍රාදේශිය ලේකම්තුමිය සමඟ කතා කරලා පුළුවන් කම තිබෙනවා නම් එම ක්‍රිඩාගංනයට ලැබුණු මුදල නැවත ලබා ගන්න. අපි ඒ ශක්තිය ලබා දෙන්න ඒ අවස්ථාවේ අපි කිවුවා අපි එන්නම් කියා.එහෙමනම් නගර සභාවේ තාක්ෂණ නිලධාරින් පැමිණ එම කටයුත්ත කරන කොට අපි එකඟතාවයේ එක තීරණයේ කතා කරලා දුන්නා ඔබතුමා ඊට පසු තමයි තීරණය කළේ දෙපැත්තෙන් අඩි 10 පාරවල් දෙක දිලා එම ස්ථානය ළමා ක්‍රිඩාංගණයට ලබා දෙන්න.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, ඕකන්දේ පොදු නාන ළිඳ මොකද?

**12.04 කෙරමිණිය පතිරාජ පාර III අතුරු මාර්ගය නගර සභාවට පවරා ගැනීම සම්බන්ධව ලිපිය සභා ගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

කෙරමිණිය පතිරාජ පාර III අතුරු මාර්ගය නගර සභාවට පවරා ගැනීම සම්බන්ධව පස්දෙනෙකු ලිපි ලබා දි පැවරුම් නියෝග භාර දිලා තිබෙනවා

තීරණය-

කෙරමිණිය පතිරාජ පාර III අතුරු මාර්ගය නගර සභාවට පවරා ගැනීම සම්බන්ධව පහත ඉඩම් හිමියන් විසින් ඉදිරිපත් කර ඇති පැවරුම් නියෝග වලට අනුව එම පාර පවරා ගැනීම සුදුසු බවට , ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.

- පී.මාලා ද සිල්වා මිය
- ඩී. දිනුෂ ලංකාතිලක මයා
- ඩී. නිලන්ති ද සිල්වා මිය
- ආර්. පුෂ්පා ශ්‍රියානි මිය
- ඩබ්.එල්.පී. සන්ත ප්‍රදිප් මයා

**.12.05 කෙරමිණිය පතිරාජ පාර IV අතුරු මාර්ගය නගර සභාවට පවරා ගැනීම සම්බන්ධව පවරා ගැනීම සම්බන්ධව ගොනුව සභාගත කරන ලදී.**

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>

**කෙරමිණිය පතිරාජ පාර IV අතුරු මාර්ගය නගර සභාවට පවරා ගැනීම සම්බන්ධව පවරා ගැනීම සම්බන්ධව ලිපි** ලබා දි පැවරුම් නියෝග භාර දිලා තිබෙනවා. එය අනුමත කරන ලෙස ඉල්ලා සිටිනවා.

තීරණය-

කෙරමිණියය පතිරාජ පාර IV අතුරු මාර්ගය නගර සභාවට පවරා ගැනීම සම්බන්ධව පහත ඉඩම් හිමියන් විසින් ඉදිරිපත් කර ඇති පැවරුම් නියෝග වලට අනුව එම පාර පවරා ගැනීම සුදුසු බවට , ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.

- ආර්.එම්.ධර්මවතී මිය
- පී. සරත් නිශාන්ත ද සිල්වා මයා
- ආර්.එම්.හේමාල් මයා

**12.06 ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ අවබෝධතා ගිවිසුම සභා ගත කරන ලදී.**

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ අවබෝධතා ගිවිසුම සම්බන්ධව ඉදිරිපත් කර තිබෙනවා. එම ගිවිසුම අත්සන් කිරිමට ගිවිසුම ඉදිරිපත් කිරිම අනුමත කරන ලෙස සභාවෙන් ඉල්ලා සිටිනවා.අවබෝධතා ගිවිසුමයි.

01. මෙහි පලවන පාර්ශවය යයි කියන අම්බලන්ගොඩ නගර සභාවේ පිහිටි අම්බලන්ගොඩ නගර සභාව යයි කියන දෙවන පාර්ශවයයි කියන කොළඹ 07 මෙට්‍රන් පෙදෙස පිහිටි අංක 35E ප්‍රධාන කාර්යාලය ලෙස පවත්වාගෙන යන ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය සමඟ අම්බලන්ගොඩ මහජන ක්‍රිඩාංගණය නවිකරනය කිරිම පිළිබඳ එකඟතා ගිවිසුමයි.මෙම පාර්ශවය විසින් එම ක්‍රිඩාංගණයේ තණතිලි තුනක් සහ ටර්ෆ් විකට් 3ක් සහ ක්‍රිකට් කළාල එලන විකට් 01ක් සහ ක්‍රිඩාංගණයේ තණකොළ ඇල්ලීමේ කටයුත්ත සඳහා අරමුදල් සම්පාදනය කිරිමේ තීරණයට එකඟ වේ.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, ටර්ෆ් විකට් කියක්ද ?

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

ටර්ෆ් විකට් 3කි.

02. ඉහත කී දෙවන පාර්ශවයෙන් ලබා දෙන මුදල් ප්‍රදානය කරන්නේ ඒ පාර්ශවයේ සාමාජිකයන් වන අම්බලන්ගොඩ රියෝ ක්‍රිඩා සමාජය සහ අම්බලන්ගොඩ සිංහ ක්‍රිඩා සමාජයේ ක්‍රිඩකයන්ටද අම්බලන්ගොඩ නගරයේ ක්‍රිඩා කටයුතු වල නිරත පාසැල් වලට සහනදායි පදනම මත ලබා දීමට පලවන පාර්ශවය මින් එකඟවේ.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි , රියෝ එකට විතරක් දෙන්නේ

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

නැහැ. සිංහ එකක් තියෙනවා.

03) මෙම ක්‍රීඩාංගණය සැදීමෙන් පසු එහි නඩත්තු කටයුතු සහ පරිපාලනමය කටයුතු සම්පූර්ණයෙන්ම පලවන පාර්ශවය විසින් සිදු කිරිමට මෙයින් එකඟ වේ.ඉහත කොන්දෙසි වලට පලවන පාර්ශවය වෙනුවෙන් අම්බලන්ගොඩ නගර සභාවේ වර්තමාන ගරු සභාපති මනිමෙල්වඩු අරුණ ප්‍රදීප් සහ වර්තමාන ලේකම් රණසි උත්පලා ගුණවර්ධන යන අය සභාවේ පොදු මුදාව තබා අත්සන් කළ අතර එහි දෙවන පාර්ශවය වෙනුවෙන් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය වෙනුවෙන් සභාපති ශම්මි සිල්වා ද එහි මුදාව තබා 2019 දින අත්සන් කරන ලද අතර එකඟතා ගිවිසුමට අත්සන් තැබීමට අවසර ඉල්ලා සිටිනවා.

ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය ඉල්ලා සිටිනවා මුදල් අපට ලබා දීම මතඑගොල්ලන් මුදල් ලබා දීමට ඒ අයගේ වපසරිය අනුව තිබෙන්නේ ඒ ගොල්ලන්ගේ සාමාජික වන ක්ලාබ් වලට විතරයි.ඔවුන්ගේ සාමාජික වන ක්ලබ් වලට විතරක් නිසා ඒ අය අපෙන් ඉල්ලා සිටියා සාමාජිකයන්ට යම්කිසි සහනදායි පදනම මත මෙහි අවස්ථාව ලබා දෙනවා කියා.එකඟතා ගිවිසුමක් අත්සන් කරන්න කියා. එතකොට ඒගොල්ලන්ට ප්‍රශ්නයක් නැහැ කියා. ඒ සඳහා සභාවේ අනුමැතිය ඉල්ලා සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, මේක දෙන ගමන් මෙහෙම ප්‍රශ්නයක් වෙනවා. දැන් ඒගොල්ලන්ට දෙන එක වෙනම කතාන්දරයක්.එතකොට අනික් ක්‍රීඩා කරන අයට මොකක්ද ඕකේ ඇතුළත් වෙන්නේ.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

කිසිම දෙයක් නැහැ. මෙහි පරිපාලනය අප සතුයි.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

මොකද ඔය ගිවිසුම් ප්‍රකාරව ඒ අය ඒ පාර නීති දමයිද දන්නේ නැහැ.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

නැහැ. ඒක තමයි මෙකට අවසර ඉල්ලුවේ. මෙකෙන් ගම්‍ය වෙන්නේ නැහැනේ.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

එකෙන් සහන මිලකට දෙන්න විතරයිනේ.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

ඒ අය කියන්නේ ඒ අය ලක්ෂ එකසිය පනහකට ආසන්න මුදලක් මෙයට වැය කරනවා.එ වැය කරන කොට ඒ ගොල්ලන්ගේ පරිසාධණයෙන් භාහිරව ගිහින් තමයි මේ කටයුත්ත කරන්නේ.නගර සභාවට සාමාන්‍යයෙන් මුදල් දෙන්නේ නැහැ.ගාල්ල නගර සභාවට දුන්නේ. ගාල්ල නගර සභාව ක්‍රීඩාංගණය ක්‍රිකට් ආයතනයට පැවරුවා. පවරලා තමයි හදා ගත්තේ. එහෙම කොන්දෙසියක් මෙතනදි ඒ අය බලාපොරෝත්තු වෙන්නේ නැහැ.අපෙන් මෙන්න මේ කොළය අත්සන් කරලා ඒ ගොල්ලන්ට ගොණුවට දමා ගන්න වෙන්නේ.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

එක නෙමේ අපි කියන්නේ. මේ පසුව එන ප්‍රශ්න තිබෙන ප්‍රශ්නත් එක්කනේ අපි කතා කරන්නේ..මා කියන්නේ ලක්ෂ 150ක මුදලක් කියන්නේ අද එච්චර මුදලක් නෙමේ.නගර සභාව හැටියට ඔබතුමාට

වියදම් කිරීමේ හැකියාව තිබෙනවා. එක වෙනම ගැටළුවක්.අපි කතා කරන්නේ එක දුන්නාට කමක් නැහැ සභානදායි පදනමට . අනික් කට්ටියට ආසාධාරණයක් නොවන විදියට.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අනික් එක මන්ත්‍රීතුමා මෙහෙම දෙයකුත් කල්පනා කරන්න ඕන.ට්‍රප් විකට් සම්බන්ධව උපරිම දැනීමක් අපි ළඟ නැහැ.අපි මේ අයගෙන් ඉගෙන ගෙන තමයි ඉදිරියට මෙය ගෙනියන්න වෙන්නේ.එමනිසා ඒ විශේෂත්ව හැකියාව තිබෙන්නේ ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය සතුව.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

එක හරි දැනුම තිබෙනවා. දැන් අපි දන්නේ නැහැ . මේ කොන්ත්‍රාත් දිපු කෙනා කොයි තත්ත්වයේද කියා. ඔබතුමානේ දන්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඒ තැනැත්තා කරපු ක්‍රිඩාංගණ බලලා තිබෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

එකනෙමේ අපි  කියන්නේ. මෙය හරියට අපිට ඕන විදියට අදාල තත්ත්වයෙන් නොකෙරුණොත් එහෙම මේ අම්බලන්ගොඩ නගරයේ ක්‍රිඩාව පිළිබඳ දන්න හැමදෙනාම ඉන්නවානේ. එතකොට මොනවා හරි ප්‍රශ්නයක් නැගුවොත් එහෙම අන්න ඒ දෝෂාරෝපණය නොවන විදියටයි වැඩ කර ගන්න ඕන.අනිත් සමිති සමාගම් වලට . දැන් ගාල්ලේ මන්ත්‍රිවරයෙකුටවත් ක්‍රිඩාංගණයට ඇතුළ් වන්න බැරි වුණානේ.ඔබතුමා දන්නවානේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එහෙම තත්ත්වයක් නැහැ මෙතැන.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

එහෙම තත්ත්වයක් නොවන විදියට විය යුතුයි. අනිවාර්යෙන්ම සභාවේ කියන්නේ එකයි.මොනවාහරි ගැටළුවක් ඇති වුණොත් එහෙම. ඒ වෙලාවේ එක කරන්න බැහැ.ඒ පාර වගන්ති අරවා මේවා කියනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එහෙම තත්ත්වයක් නැහැ. ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ සභාපති මගේ පෞද්ගලික මිතුරෙකි. ඒ මත තමයි ඔය මුදල් ලැබෙන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ඔබතුමා සභාතිත්වය දරනකම් හොඳයි. ඔබතුමා පළාත් සභා හරි පාර්ලිමේන්තු හරි ගියාම ඔය තත්ත්වය ඇතිවෙලා තිබෙන්නේ.එක නිසා . ඔබතුමා බේරා ගන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නැහැ. අම්බලන්ගොඩ නගරය වෙනුවෙන් පෙනි සිටිනවා හැමදාම.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

එකයි කියන්නේ ප්‍රශ්න ගැටළු නොවන විදියට . මෙය සටහන් කරලා තබා ගන්න. යම් ප්‍රශ්නයක් ඇති වුණොත් එහෙම ඔබතුමා මැදිහත් වෙන්න ඕන.රියෝ එකටයි සිංහ එකටයි අපි මේවා දෙකක් දිලා තිබෙනවා.අපි කියලා තියෙන්නේ.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මේ මුදල් ගැනීමේදි මා කියපු දෙයක් තමයි එගොල්ලන් කරන දේවල් අපි කරලා තිබෙනවා.ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් ඒ අයට ෆම්හවුස් එකක් හදන්න ඕන.නගර සභාවෙන් ලියුමක් ලබා දී තිබෙනවා.රියෝ එකට අපි ක්‍රීඩා පුහුණු මධ්‍යස්ථානයක් ලබා දී තිබෙනවා. එම නිසා මෙය ලබා දෙන්න කියා. ඒ පැත්ත සාධාරණයි. එක අපි දුන්නා.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

ඒක දුන්නා.එහෙම වුණානම් නගර සභාව සතු දේපල පැත්ත එය වෙන්න ඕන දෙයක්.මොකද දැන් අපිට තර්කයක් විතර්කයක් නැහැ.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

සභාව සතු වත්කම් ලේඛණයක් තිබෙනවා. ඕනෑම කෙනෙකුට බැලිය හැකියි.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

ඒ කියන්නේ නගර සභාවට තිබෙන එම වත්කම අපේ බුදලයක් නෙමෙනේ . අපි මෙකට තාවකාලිකව ඇවිත් ඉන්නේ ගරු මන්ත්‍රීවරු කොටසක්.ඊළඟ පාරම්පාරාවට මෙය ගිහින් ඒ අදාළ ප්‍ර දේශයට එය ගිහින් සංවර්ධනය විය යුතුයි.ඒ වගකිම අප සතුයිනේ.එකනිසා තමයි කියන්නේ ඔබතුමා ඒ සම්බන්ධව කටයුතු කරන්න ඕන.අනිත් එක තමයි මේ රණ්ඩු වුණේ නාම පුවරු සම්බන්ධව. දැන් මේ නාමපුවරු චක්‍රලේඛ අවාම වෙනස් වෙනවා. ගණන් ගත යුතුත් නැහැ.ඔබතුමා ගැටළුවකට යන්න එපා. කවුරු මුදල් ගෙනාවත් මෙතැන පක්ෂයක් පාටක් නැහැ.පොදුජන පෙරමුණේද , එක්සත් ජාතික පක්ෂයද , ශ්‍රී ලංකා නිදහස් පක්ෂයද කියා වැඩක් නැහැ.කවුරුහරි මන්ත්‍රීවරයෙක් මුදල් ගෙනෙනවා ඒක වැඩක් නැහැ.කිසි ගැටළුවක් නැහැ. ඔබතුමාත් එය අභය කරන්න ඕන.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

නැහැ . අපි අභය කරනවා. කිසි ප්‍රශ්නයක් නැහැ.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

මොකද ඔබතුමා මුලිකත්වය දරන පළාත් පාලනය තුළ සංවර්ධනයක් වෙනවා නම් සතුටු විය යුතුයි. හැබැයි නිසි අයුරින් සිදුවිය යුතුයි.එමනිසා ඒ අනුව නිසි කටයුතු කරන්න. දැන් මෙහි සිදුවෙලා තිබෙනනේ මෙතුමලාගේ ප්‍රශ්නයක් නෙමේ. ගරු මන්ත්‍රීවරුත් ප්‍රතිපාදන ගෙනත් දෙනවා.දුන්නාම ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට මෙය යොමු කරනවා. නගර සභාවේ තාක්ෂණසේවා නිලධාරිතුමා දන්නෙත් නැහැ. ඔබතුමා දන්නෙත් නැහැ.සංවර්ධන කටයුත්ත වෙනවා.සංවර්ධන කටයුත්ත සිදු වුණා නම් ඔබතුමා දැනුවත් වෙලා වැඩකටයුතු සිදු කර සංවර්ධනය සිදු කර ගන්න.ගැටුමකට යන්න අවශා නැහැ. නගර සභාව අපි වැඩ කරනවා.නාම පුවරු ගැසිම අනිකුත් වැඩ කිරිම සම්බන්ධව වැඩකටයුතු කරන්න තමයි අපි ඇවිත් ඉන්නේ.අනිත් කරුණ තමයි ඕකන්දේ . ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කිව්වේ නැද්ද දන්නේ නැහැ. ඕකන්දේ පොදු නාන ළිඳ තිබෙන පාර

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

යන්න බැහැ. මෙය ගම්පෙරළිය වැඩසටහන මගින් ඉටු කරන්න බැහැ. මෙතුමා හදන නිසා තමයි. එක හින්දා තමයි මෙය කරන්න බැරි වුණේ. නැත්නම් අපි හදලා. අපි ගියා ඔය පාරේ. දැන් ළිඳ හදනවා.අපි ගියා එය බලන්න.මා කිව්වා කොඩිකාර මේ පාරේ යන්න අමාරුයි.මේක ගම්පෙරළියෙන් හදන එක පැත්තක තියා අපි හදන්න ඕන.මොකද හදනවා කියා ඔබතුමා ලිපිය එව්වාට තාම හදන්න ගත්තේ නැහැ.යන්න බැහැ මනුස්සයකුට.ඒ පාර ඇරෙන්න මුළු ඕකන්දෙම පාරවල් හදලා අවසන්.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

දැන් මෙහෙමයි. ඔය පාරේ කණුවත් සැදිය යුතුමයි. මොකද ඔබතුමාට මතක ඇති . අපි නගර සභාවෙන් හදන ලද ළිඳ තමයි පහළ තිබෙන්නේ. මේ ජලය ඔක්කොම පාර මැදින් ගිහින් ළිඳ උඩට තමයි යන්නේ. එමනිසා කාණු පද්ධතියත් සමඟ හදන්න ගන්න. නැතිනම් අර තත්ත්වයට පත්වෙනවා.කාණුවල පතුල් නැහැ. ජලය බැසීමේ පොඩි අක්‍රමිතතාවයක් තිබෙනවා.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මෙහා පැත්තේ කාණුවක් තිබෙනවාද?

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

කාණුවක් තිබෙනවා. ඒ වායේ පතුල් නැහැ. ජලය බැසිමේ පොඩි අක්‍රමවත් බවක් තිබෙනවා. ඔබතුමා දැක්කේ නැද්ද? ඔබතුමා පොඩ්ඩක් එබිලා බැලුවේ නැද්ද ?

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

අපි බැලුවේ නැහැ. පතුල් නැති කියා. ඔබතුමාට මුදල් දුන්නේ කාණුව සැදිමට ඒ කාලයේ.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

මා ඒවා කළා හරියට. ඔබතුමා මා කිව්වා කියා ඔබතුමා එය කරන්නේ නැහැ.මා කියන්නේ එකයි. ඔබතුමා ගිහින් බලලා හරියට වැඩය කරන්න.

**ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්. ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, එස්.ඒ. ද සිල්වා මාවත ගෞරි මහත්මියගේ නිවස අසළ පාර දැන් හදනවා කියා මාස අටකටත් වැඩියි. එම මුදල් ආපහු ගිහින් කියා එම මහත්මිය මට කතා කර කිව්වා.අදවෙනතුරු මොකක්වත් පාරේ කෙරිලා නැහැ.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

එක ගරු මන්ත්‍රිතුමා හදනවාද?

**ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා කතා කරමින්**

මොකක්ද ඒ පාර.

**ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්. ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්**

එස්.ඒ. ද සිල්වා මාවත ගෞරි මහත්මියගේ නිවස අසළ පාර.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

විලේගොඩ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්. ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්</u>**

පෙරේදා මට කතා කරලා කිව්වා. එම මුදල් ගිහිල්ලා කියා ප්‍රාදේශිය ලේකම් එකෙන් කියලා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නැහැ එය අපිට පවරලා තිබෙන්නේ සභාවට.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්.එම්. ලසන්ත අජිත් කුමාර මහතා කතා කරමින්</u>**

අපි කරන්න හැදූ වැඩක් තමයි මේ අයට භාර දුන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමා අර ගිවිසුමේ පිටපතක් අපිට ගන්න පුළුවන්ද?ක්‍රීඩා කමිටුවේදි පොඩි මුට්ටිය දැම්මා කට්ටිය.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මෙහි පිටපතක් ලබා දෙන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

පාපන්දු ක්‍රීඩාව.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

පාපාන්දු සංගමයේ සභාපති මායි. එමනිසා කිසිම දිනක මා පාපන්දු ක්‍රීඩාවට අගතියක් වෙන්න දෙන්නේ නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ඒ කියන්නේ ඔබතුමා අනික් ඒවාට හානි කරනවාද කියා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

නැහැ අනික් ඒවාට හානි කරන්නෙත් නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

මේ ගිවිසුමේ පිටපතක් ලබා දෙන්න හැම දෙනාටම.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, දැන් කඨින පිංකම් එනවා.මුළු ලංකාවේම. දැන් අර පාරවල් ටික සුද්ද කරලා දෙන්න. මගෙනුත් ගරු අප පෝරඹ විහාරස්ථානයේ නායක ස්වාමින් වහන්සේ ඉල්ලීමක් කළා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතාට අපි කියන්න ඕන. අපිට දැනට ඇවිත් තිබෙන්නේ ඔබතුමා වෙන්කරන ලිපිය පමණයි.ඊළඟ කරුණ ඔබතුමා වෙන්කරන ලද ලිපිය පරිදි ඇස්තමේන්තුව සභාවට කවදාවත් ඇවිත් නැහැ.එම වරද නිසා ඔබතුමා චෝදනාවට ලක්වෙලා තිබෙනවා.එය නිවැරදි කර ගන්න ඕන නම් එකත් එවන්න කියන්න. සභාවේ වැඩකටයුතු මෙයින් අවසන් කරනවා.

තීරණය

**ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ අවබෝධතා ගිවිසුම අනුමත කිරීම සුදුසු බවට ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු ජී.සරත් ශ්‍රී ලාල් මහතා ස්ථිර කරන ලදුව සභා සම්මත විය.**

පස්වරු 01.40 ට පමණ රැස්වීමේ වැඩ කටයුතු අවසන් විය.

| | |
|---|---|
| රණසි උත්පල ගුණවර්ධන මිය | අරුණ ප්‍රදීප් මණිමෙල්වඩු |
| ලේකම් | සභාපති |
| අම්බලන්ගොඩ - නගර සභාව | අම්බලන්ගොඩ - නගර සභාව |

2019.10.31

වන දින

අම්බලන්ගොඩ නගර සභා කාර්යාලයේදීය